

# කිරිත් නැති කැකිරිත් නැති කොළඹ ජීවිත

මේ හැම කෙනෙක්ම උදේ පාන්දර ඉඳලම ගෑස් පෝලිමේ. දැන් පැය හයකටත් වැඩියි. උදේ බීලා ආව තේ එක විතරයි. තාම දවල්ට තියා උදේටවත් කාලා නෑ. ගෑස් එනවා කියලා ඊයේ හවස දැන ගත්තේ. ඇත්තටම කියනවා නම් රෑ තිස්සේම ඒ ගැන හිතලා නින්ද ගියෙත් නෑ. දැන් රෑට නින්දට යන්නේ හෙට වත් ගෑස් එකක් ගන්න පුළුවන් වුණොත් කියන බලාපොරොත්තුවත් එක්ක. ගෑස් එකක් ගන්න එක ලොකුම හීනයක් හැබෑ කර ගැනීමක් කියලා හිතෙන තරමටම ලංකාවේ මිනිස්සු අසරණ වෙලා."

කඩවත ප්‍රධාන ගෑස් අලෙවිසල වෙත ඇදෙන දිගු පෝලිමේදී අපට හමුවූ ඇය නමින් නාලිනී. අනුරාධපුරයේ සිට පැමිණ බෝඩිම් කාමරයක ජීවත් වෙන නාලිනී වගේම තවත් බොහෝ පිරිසක් දවසේ පැය විසි හතරෙන් වැඩි කාලයක් දැන් ගෙවන්නේ පෝලිම්වල. ඇතැම් අවස්ථාවල වතුර උගුරක්වත් නොබී අව් වැසි නොතකමින් නින්දක් විවේකයක් නොලබමින් හැම මනුස්සයෙක්ටම හෙට දවස වෙනුවෙන් දුක් විඳින්න සිද්ධ වෙලා.

ගෑස් හිඟය, ඉන්ධන මිල ඉහළ යෑම සහ ඉන්ධන හිඟය, අත්‍යවශ්‍ය භාණ්ඩ සහ ආහාරවල මිල ඉහළ යෑම, ඖෂධ හිඟය, එළවළු පලතුරු හිඟය හා මිල ඉහළ යෑම ආදී කී නොකී කාරණා නිසා මේ වන විට සමස්ත රටවැසියන්ම කිසිදා කෙලෙසක විසඳේ දැයි නොදන්නා ගැටලු රාශියකට මුහුණ දීලා කියලා අමුතුවෙන් කිව යුතු නැහැ. අද වෙද්දි ජනතාව දවසේ පැය විසිහතරෙන් වැඩිම කාලයක් ගත කරන්නේ පෝලිම් වල. ඇතැම් අවස්ථාවල නිවසේ සියලු සාමාජිකයන් ජීවිතය පවත්වා ගැනීමේ අරමුණ ඇතිව දිවා රෑ නොබලමින් පෝලිම්වල කාලයගත කරන්න පටන් අරන්.

''කොළඹට කිරි ගමට කැකිරි ''ඉස්සර කතාවට එහෙම කිව්වට දැන් ඇත්තටම මුළු රටටම කිරිත් නැති කැකිරිත් නැති තත්ත්වයක් උදාවෙලා කියලා අමුතුවෙන් කිව යුතු නැහැ. තමන්ගේ අනාගත සිහින හැබෑ කරගැනීම අමතක කරලා හැම මනුස්සයෙක්ටම හෙට දවසේ ජීවත් වෙන්න අරගල කරන්න සිද්ධවෙලා. සරලවම කියනවා නම් වේලක් ඇර වේලක් කාලා හරි අමාරුවෙන් ජීවිතේ ගැට ගහගන්න හැම කෙනෙක්ම උත්සාහ කරනවා.

මේ අතර ගමෙන් කොළඹ ඇවිත් රැකියාවක නිරත වෙන, කුලී නිවෙසක හෝ බෝඩිං කාමරයක ජීවත්වෙන මිනිස්සු වගේම, මහල් නිවාස සංකීර්ණවල මිනිස්සුත් වතු නිවාසවල මිනිස්සුත් ගෙවන්නේ දුක්බර ජීවිතයක්. ඉන්ධන හිඟය ගෑස් හිඟය බඩු මිල ඉහළ යෑම මේ මිනිස්සුන්ව අන්ත අසරණ කරලා.

''දැන් අපිට ලොකු ලොකු බලාපොරොත්තු නැහැ. පොඩි උන් හාමතේ නොමැරී බේර ගන්න එක තමයි අපේ ලොකුම හීනය. ඉස්සර පොලේ කෙසෙල් විකුණලා තමයි දරුවෝ තුන්දෙනා ජීවත් කළේ. දැන් බිස්නස් වලින් ඒ තරම් වාසියක් නෑ. රුපියල් දාහකට මොනවද ගන්න පුළුවන්. රුපියල් දාහක් අරගෙන පාරට බැස්සට අඩුම වේලක් පිරිමහ ගන්න වත් දෙයක් ගන්න බෑ. හෙට අනිද්දට අපිට කන්න වෙන්නේ පොළොවේ පස් තමයි."

ඔරුගොඩවත්තේ පදිංචි ජයන්ත ඒ විදිහට කතා කරද්දී ඔහුටත් හොරෙන් ඔහුගේ ඇස්වලින් කඳුළු කඩාගෙන වැටුණා කියලා අපි දැක්කා. ජයන්ත වගේම මේ වතු නිවාසවල බොහෝ දෙනෙක් ජීවත් වෙන්නේ කුලී වැඩ කිරීමෙන් උපයා ගන්නා මුදලින්.

බෙත්තාරාම, ග්‍රෑන්ඩ්පාස් කොටහේන, මට්ටක්කුලිය, මාලිගාවත්ත මරදාන ප්‍රදේශවල පිහිටලා තියෙන හැම වතු නිවාසයකම ජීවත් වෙන මිනිස්සු ගත කරන්නේ දුක්බර ජීවිතයක් කියන එක ඔප්පු කරන්න ඔවුන්ගේ කඳුළු ඕනෑවටත් වැඩියෙන් සාක්ෂි සපයනවා.

මේ හැම වතු නිවාසයක්ම පර්චස් එකකට දෙකකට වැඩියෙන් විශාල නැහැ. ඒ නිසාම ඔවුන්ට වැඩි ඉඩ පහසුවක් ඇත්තෙත් නැහැ. සමහර වෙලාවට දවල්ට වගේම රෑටත් නිවස ඉදිරිපිට තියෙන කුඩා ඉඩ ප්‍රමාණයේ පුටුවක් දෙකක් දාගෙන මේ මිනිස්සු නැති බැරි කම ගැන කතා කරනවා. හැබැයි එන්න එන්නම ඔවුන්ගේ ප්‍රශ්න වැඩිවෙනවා මිසක් පුංචිම සහනයක් වත් ලැබිලා තියෙනවාද කියන එක ගැන නම් අපිටත් තියෙන්නේ සැකයක්.

ගෑස් පෝලිම්වල, ඉන්ධන පෝලිම්වල දුක්විඳින මිනිස්සු පැය දහයකටත් වැඩි වැඩිකාලයක් පෝලිමේ ඉඳලා හිස් අතින්ම ආපහු හැරිලා යනවා කියලා අපිට කිව්වේ ෆාතිමා නස්රිනා.

> **දැන් හැමදේම අකුලගෙන ගමට යන්න කාලෙ හරි**

''ගෑස්, ලාම්පුතෙල් එනවා කියන ආරංචියට පෝලිම්වලට ගියාට සමහර දවස්වලට කිසිම දෙයක් නැතුව අපේ අය ආපහු එනවා. ගෑස් නැති හින්දා භූමිතෙල් ලිප් ගත්තා. දැන් භූමි තෙලුත් නෑ. කරන්ට් එකෙන් හැමදාම උයන්න පුළුවන්ද. කරන්ට් බිල එද්දි අපිට තරු පෙනෙයි. එහෙම උයන්නත් දැන් කරන්ට් එක තියෙන්නෙත් තියෙන්නෙ පැය කීයද? මේ පොඩි කුඩුව ඇතුලේ දර ලිපකින් උයනවා කියන එක කොයි තරම් අමාරුද කියලා කවුරුත් දන්නෙ නෑ."

හුස්මක් ගන්නවත් ඉස්පාසුවක් නැති කුඩා කාමර කෑල්ලක දර ලිපකින් උයන රාජකාරියේ දුෂ්කරතාවය ෆාතිමා විස්තර කළේ ඇඬූ කඳුළින්..

කොළඹ අවට වතු නිවාසවල මෙන්ම මහල් නිවාස සංකීර්ණවල ජීවිතේ ගෙවන මිනිසුන්ගේ කතාවත් මීට වෙනස් නැහැ. ගෑස් එකක් නැතිව උයා ගන්න බැරිව විඳින දුක වගේම පැය ගණන් සිදුවෙන විදුලි කප්පාදුව නිසා සිදුවෙන අපහසුතාවය ගැනත් ඔවුන් දැන් කතා කරන්නත් කැමති නැති තරම්.

''මේ කාමරයක් ඇතුලේ කරුවලේ ජීවත් වුණත් ෆෑන් එකක් නැතිව ජීවත් වෙනවා කියන එක කොයි තරම් අමාරුද? විභාගය හින්දා ලයිට් කපන එක අඩු වුණාට විභාගයෙන් පස්සේ ආයෙත් එක දිගට ලයිට් කපයි. ඒ මදිවට පැය ගණන් වතුරත් නැති වෙන වෙලාවල් තියෙනවා. කන්න බොන්න මොනවා හරි ටිකක් ගන්න කීයක් නම් වියදම් කරන්න වෙනවද? ආහාර හිඟයක් එනවා කියලා මොනවා හරි වගා කරන්න කියනවා. මේ ෆ්ලැට් එකක වගා කරන්නේ කොහොමද?

මහල් නිවාස සංකීර්ණයක ජීවත්වෙන වසන්ති ඒ විදිහට ප්‍රශ්න කරනවා.

> **මුළු රටටම කැකිරිවත් නැති වෙන දවස වැඩි ඈතක නෙමෙයි**

මේ අතර ගමෙන් කොළඹ ඇවිත් විවිධ රැකියාවල නිරත වෙන විශාල පිරිසක් රට තුළ පවතින අර්බුදකාරී තත්ත්වයන් නිසා සෑහෙන්න අසරණ වෙලා. වෙනදට රාජකාරි නිමා වෙලා කෑම කඩේකින් කෑම පාර්සලයකුත් අරගෙන බෝඩිමට ඇවිත් කාලා සැනසිල්ලේ ඇස් දෙක පියා ගත්ත ගොඩක් මිනිස්සු දැන් සැනසිල්ලේ නිදාග න්නෙත් කලාතුරකින්.

''මම ගාල්ලේ. කොලඹ ආවේ පුද්ගලික ආයතනයක රැකියාවකට. අපි යාළුවො තුන්දෙනෙක් බෝඩිමක ජීවත් වෙන්නේ. වෙනදට ජොබ් එකෙන් හොයන සල්ලි වලින් බෝඩිමට ගෙවලා, ගෙදරටත් කීයක් හරි යවලා කඩෙන් කෑම එකක් කාලා අමාරුවෙන් හරි ඔළුව උස්සගෙන හිටියා. දැන් ඒ විදිහට ජීවත් වෙන්න බෑ හම්බවෙන පඩියෙන් භාගයක් තෙල් ගහන්න වියදම්. ඉතුරු එකෙන් බෝඩිමට දුන්නාම අතේ කීයක්වත් ඉතුරු වෙන්නේ නෑ. අමාරුවෙන් හදන්න පටන් ගත්ත ගේ වැඩ ටික එහෙමමයි. ඇත්තටම කියනවා නම් දැන් අපි ජොබ් එක කරන්නේ තෙල් ගහන්නයි බෝඩිමට සල්ලි දෙන්නයි විතරයි."

රෝහිත කතා කළේ අනාගතය වෙනුවෙන් දැකපු හීන දෙපා මුල ම බිඳිලා ගිය වේදනාව හිතේ හිතේ තෙරපවාගෙන. මේ වගේ රජයේ අංශයේ මෙන්ම පුද්ගලික අංශයේ රැකියාවල නිරත වන, ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියාවල නිරත වෙන, විශ්වවිද්‍යාල සහ උසස් අධ්‍යාපන කටයුතු සඳහා ගමෙන් කොළඹට පැමිණි බොහෝ දෙනෙක් ජීවිතය ගත කරන්නේ මහත් දුෂ්කරතා මැදින්.

වෙනදාට කුසගින්න නිවාගන්න ඔවුන්ට පිහිටක් වූ කෙටි ආහාර පාන වර්ගවල මිල ගණන් පවා සීයට සීයකින් ඉහළ ගිහින්.

''මම කැම්පස් එකේ ඉගෙන ගන්න ගමන් පාර්ට් ටයිම් ජොබ් එකක් කරනවා. ගෑස් එක ඉවර වෙලා මාස 2කට කිට්ටුයි. පොඩි ගෑස් කොහෙවත් ගන්න නැහැ. පුළුවන් විදියට රයිස් කුකර් එකේ මොනවා හරි කරන්ට් එක යන්න කලින් හදාගන්නවා. ඒත් හැමදාම රයිස් කුකර් එකේ උයනවාට බෝඩිමේ අයිතිකාරයෝ කැමති වෙන්නේ නැහැ. ඒ නිසා ටික කාලයක් ගෙදර ගිහිල්ලා හිටියා. විභාග තියෙනවා කියලා දැනුම් දුන්න හින්දා නැවත බෝඩිමට ආවත් ආයෙත් දින නියමයක් නැතිව විභාග කල් ගියා. අතේ තියෙන සල්ලි ටික බස් වලටම දීලා ඉවර වෙනවා. හොඳට උගන්නලා හොඳ රස්සාවක් කරනවා දකින්න අපේ අම්මලා තාත්තලත් කැමතියි. ඒත් මේ රටේ පාලකයෝ තරුණයන්ගේ වගේම මුළු රට වැසියන්ගේ ම හීන මරලා දැම්මා."

තෙල් පෝලිම ට ගෑස් පෝලිමට මහමගට දිය වෙන්නේ මේ රටේ අනාගතයයි. ඒ අතර කන්න බොන්න නැතිව දුක් විඳින මිනිස්සුන්ගේ ප්‍රශ්නවලට විසඳුම් නොදී මේ රටේ බලධාරීන් තවමත් දේශපාලනඥයන්ගේ වුවමනා එපාකම් සපුරන්නේ ඇයි දැයි මිනිස්සු එක හඬින් ප්‍රශ්න කරති.

''ත්‍රීවීලර් එකක් හයර් කරලා කීයක් හරි හොයා ගත්ත මං දැන් සති ගාණක් ගෙදර. තෙල් පෝලිම්වල ඉඳලම එපා වෙලා. මිනිස්සුන්ට කන්න බොන්න නෑ. ඒත් ඉතාම පාලකයෝ පාර්ලිමේන්තුවට රැස් වෙලා අපේ සල්ලි විනාශ කරනවා. කුලී වැඩ කරන මිනිස්සුන්ගේ ඉඳලා ඉහළ පෙළේ ජොබ් කරන මිනිස්සු දක්වාම අසරණයි. එහෙම වටපිටාවක් හැදුව උන්ට සාප වෙනව කියන්නෙ නැතුව වෙන මොනවා කියන්නද?"

හතර අතින් ඇසෙන්නේ මිනිසුන්ගේ අඳෝනා ය. සංවේගජනක කතාය. මේ අතර නැවතත් කොළඹ ජීවිතයට සමුදී ගම්බද ජීවිතයට යොමු වීමට කාලය උදා වී ඇතැයි බොහෝ දෙනෙක් පවසන්නේ කොළඹට වඩා ගම සැනසිලිදායක බව සිහිපත් කරමිනි.

මොනවා වුණත්, කැලෑ කොළයක් සම්බෝලයක් බතක් කාලා හරි ගම්වල මිනිස්සු තාමත් ජීවත් වෙනවා. අඩුම තරමේ ඒ මිනිස්සුන්ට වතුර ටික දර ටික හාල් පොල් ටික හරි තියනවා. දැන් පුළුවන් තරම් ගමට ගිහින් මොනවා හරි කරන්න හදනවා මිසක් කොළඹට වෙලා ඉඳලා වැඩක් වෙයි කියලා මම හිතන්නේ නැහැ."

සමන්තගේ සූදානම කොළඹ ජීවිතයට සමු දී හෙට අනිද්දාට නැවතත් උපන් ගම්බිම් බලා යන්නට ය.

ගම්වල මිනිසුන් ට ඉතින් කැලෑ කොළයක් හරි සූරගෙන කන්න පුළුවන් තමයි. හැබැයි තාමත් අපේ ගෙවල් ටික අලි කඩනවා. බෙහෙත් ටිකක් ගන්ඩත් කිලෝමීටර් ගාණක් යන්න වෙලා. ගමට තියෙන එකම බස් එකක් තෙල් නැති හින්දා දුවන්නෙ නැහැ. ගමේ කඩේ මුදලාලිගෙන් මොනාහරි ගන්නවට වඩා බඩගින්නෙ ඉන්න එක හොඳයි කියලා හිතෙනවා. දෙයියනේ කියලා වතුර ටික හාල් පොල් ටික නම් තාමත් ගංවල ගොඩක් මිනිස්සුන්ට තියනවා. ඒත් මේ පොහොර ප්‍රශ්නත් එක්ක ඉස්සරහට වගා කරන එක ගැනත් හිතන්න වෙනවා. ඉස්සර අපි කිව්වේ කොළඹට කිරි ගමට කැකිරි කියලා. කොළඹටත් කැකිරි නැති වෙද්දි ඇත්තටම දැන්නම් අපිටත් කැකිරි තියා වට්ටක්කාවත් නැතිව තමයි ගම් වල අපිත් ජීවත් වෙන්නේ. ඔය මොනවා වුණත් අර ලොකු මහත්තුරුන්ගේ කඩපු ගෙවල්වලට සාධාරණයක් කරනකන් ඉතින් අපි බලාගෙන ඉන්න එපැයි"

ගමේ තියෙන තත්ත්වය ගැන ඒ විදිහට බණ්ඩාර අපිත් එක්ක කීවේ රටම පත්වී ඇති ඛේදනීය තත්ත්වය පිළිබඳ වූ වේදනාව සඟවා ගනිමින්.

● කුමාරි ඉරුගල්බංඩාර

---

# තේ පිටරට යවලත් ඉවරයි.... බීලත් ඉවරයි



තේ කර්මාන්තය අපේ රටට ඩොලර් උපයාදෙන ප්‍රධාන ආදායම් මාර්ග යකි. කොටින්ම කිවහොත් ශුද්ධ විදේශ විනිමය මෙරටට ලබාදීමට තේ කර්මාන්තයෙන් ලැබෙන්නේ ඉහළ දායකත්වයෙකි. ඒකොයිහැටිවුවද තේ නිෂ්පාදනය අඩුවීම, විදුලි කප්පාදුව, ඉන්ධන අර්බුදය, භාණ්ඩ ප්‍රවාහන වියදම ඉහළයෑම, ඇසුරුම් ද්‍රව්‍ය තේ පොහොර ඇතුළු අනිකුත් යෙදවුම් මිල ගණන් ඉහළයෑම නිසා මෙරට තේ කර්මාන්තය දැඩි අවදානමකට ලක්ව ඇත. ශ්‍රී ලංකා මහබැංකු වාර්තාවට අනුව 2021 වර්ෂයේ දි මෙරට තේ නිෂ්පාදනය සියයට 7.2කින් පහළ ගොස් ඇත්තේය. ඒ සඳහා එම වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවල පැවති අයහපත් කාලගුණික තත්ත්වය දැඩි බලපෑමක් එල්ල කරනු ලැබීය.

ඒ විතරක් නොව අපනයන කළ තේ පරිමාවන් සහ මිල ගණන් පහළයෑම හේතුවෙන් මෙම වර්ෂයේ මාර්තු මාසයේ තේ අපනයන ආදායම සියයට 24.0කින් පහළ ගියේය. 2021 වර්ෂයේ මාර්තු මාසයේ මෙරට තේ අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 124.6කි. එහෙත් මෙම වර්ෂයේ මාර්තු මාසයේ තේ අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 94.7 දක්වා අඩුවී ඇත. මෙම වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, මාර්තු යන මාසවල තේ අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 286.8කි. ඉකුත් වර්ෂයේ (2021) මෙම කාර්තුව හා සැසැඳීමේදී තේ අපනයන ආදායම ඩොලර් මිලියන 15.2කින් අඩුවී ඇත.

ජාත්‍යන්තර තේ වෙළෙඳ පොළේ ප්‍රධානතම සැපයුම්කරුවා වන්නේ ශ්‍රී ලංකාවයි. මැදපෙරදිග රටවල්, මෙන්ම රුසියාව හා ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් රටවල් මෙරට තේ නිෂ්පාදනයෙන් විශාල ප්‍රමාණයක් මිලදී ගනිති. කෙසේවුවද මේ වනවිට අපේ රට මුහුණ පා ඇති අර්බුදකාරී තත්ත්වය හමුවේ ඉන්දියාවට නව තේ වෙළෙඳ පොළක් නිර්මාණය වී ඇති බැව් ඒ. එන්. අයි. පුවත් සේවය වාර්තා කොට තිබුණි. රටේ පවතින ආහාර අර්බුදය, විදුලි කප්පාදුව, විදේශ මුදල් හුවමාරු ගැටලු, නැව් ගාස්තු හා කන්ටේනර් ගාස්තු වැඩිවීම යන හේතු නිසා තේ අපනයනය කිරීමේදී ගැටලු රැසක් ඇතිවී තිබේ. අපේ රට සාම්ප්‍රදායික ක්‍රමවේදයට තේ කොළ නිෂ්පාදනයේ ප්‍රමුඛයාය. ශ්‍රී ලංකාව කිලෝග්‍රෑම් මිලියන 03ක පමණ තේ කොළ නිෂ්පාදනය කළ අතර ඉන් වැඩි ප්‍රමාණයක් යුරෝපීය රටවලට හා ඇමරිකාවට අපනයනය කරනු ලැබීය. එහෙත් රටේ පවතින අර්බුදකාරී තත්ත්වය මත නිසි වෙලාවට තේ නිෂ්පාදනය අපනයනය කිරීමට නොහැකිවීම හේතුවෙන් තේ ගැනුම්කරුවන්ගේ අවධානය ඉන්දියාව වෙතට යොමුවී ඇති බැව් සිලිගුරු තේ වෙන්දෙසි කමිටුවේ සභාපති කමල් කුමාර් තිවාරි මහතා පවසා තිබුණි.

ලංකාවේ තත්ත්වය මේ විදියට දිගටම පැවතුනහොත් ඉන්දියාවේ තේ වෙළෙඳ පොළ ඉහළට යනවා. එමෙන්ම ගැනුම්කරුවන් බලාපෙරොත්තුවන උසස් ප්‍රමිතියෙන් යුතු තේ කොළ අපිට නිෂ්පාදනය කරලා දෙන්න පුළුවන් මේ සමග ඉන්දියාවේ සාම්ප්‍රදායික තේ වෙළෙඳපොළ වැඩිදියුණු වෙනවා තිවාරි කියන්නේය. තිවාරිලා පමණක් නොව උතුරු බෙංගාලයේ තේ කර්මාන්තකරුවන්ද මගබලා සිටින්නේ මෙරට පවතින අර්බුදකාරී තත්ත්වය හමුවේ ඉන්දියාවට තේ වෙළෙඳපොළේ නව අවස්ථාවක් උදාවන තුරුය. මෙරටින් අවශ්‍ය තේ නිෂ්පාදනය නොලැබෙන විට ගැනුම්කරුවන් ඉන්දියාව දෙසට යොමුවනු හැර වෙනත් විකල්පයක් නොමැති බව ඉන්දියාවේ සිලිගුරිවල තේ වතු හිමිකරුවෝ පවසති.

තේ වගාව සඳහා රසායනික පොහොර තහනම් කිරීමේ ප්‍රතිඵල අත්විඳීමට මෙරට තේ නිෂ්පාදකයාට මේ වනවිට සිදුවී තිබේ. තේ පොහොර මිල අහස උසට නැග තිබේ. මේ නිසා කුඩා තේවතු හිමියන් තේ වගාව සඳහා පොහොර යෙදීම නවතා දමා ඇත. මෙහි ප්‍රතිඵලය වන්නේ අපේ රටේ තේ දලු අස්වැන්න අඩුවීමයි. ඒ විතරක් නොව තේ වල ප්‍රමිතිය අඩුවීමට මෙය බලපානු ඇත. ගැනුම්කරුවන්ට අවශ්‍ය තේ සැපයුම සපයා ගැනීමට නොහැකි වුවහොත් තේ ගැනුම්කරුවන් තේ නිෂ්පාදනය කරනු ලබන වෙනත් රටවල් සඳහා යොමුවීම වැළැක්විය නොහැකි කරුණකි.

ඒ විතරක් නොව විදුලි කප්පාදුව ඉන්ධන අර්බුදය නිසා තේ කම්හල් හිමියන් ගැටලු රැසකට ලක්ව ඇත. නිෂ්පාදන වියදම ද විශාල ලෙස ඉහළ ගොස් ඇති අතර තේ නිෂ්පාදනය කිරීමේදී බරපතළ ගැටලු රැසකට මුහුණදීමට තේ කම්හල් හිමියන්ට සිදුවී තිබේ. ජෙනරේටර් යොදාගෙන තේ කම්හල් ක්‍රියාකරවීමට ද ඩීසල් අවශ්‍ය වේ. ඩිසල් හිඟකම ඒ සඳහා බාධාවක් වී අත. තේ කම්හල් හිමියන් පවසන්නේ මෙම තත්ත්වය නිසා ප්‍රමිතියෙන් යුතුව ගුණාත්මක ලෙස නිමි තේ නිෂ්පාදනයක් කිරීමට බාධා එල්ල වී ඇති බවය. ඒ විතරක් නොව අමු තේ දලු සැපයුම අඩුවීම නිසා තේ කම්හල්වල ධාරිතාවද අඩුවී ඇත.



මෙරට තේ කර්මාන්තය එකම දම්වැලක පුරුකක් ලෙස බැඳී ඇත්තේය. කුඩා තේ වතු හිමියා, තේ කම්හල් හිමියා, බෝකර්වරු හා තේ අපනයනකරුවන් මත මෙරට තේ කර්මාන්තය රැඳී ඇත්තේය. තේ කම්හල් හිමියන් පමණක් නොව තේ පොහොර මිල ඉහළයෑම නිසා කුඩා තේවතු හිමියන්ද ගැටලු රැසකට ලක්ව ඇත. තේ පොහොර මිල අහස උසට නැග තිබේ. රුපියල් 1500ට තිබූ තේ පොහොර කොට්ටයක මිල මේ වනවිට රුපියල් විසිදහස තිස්දහස දක්වා වැඩිවී ඇත. තේ පොහොර මිල මේ අයුරින් වැඩිවීම කුඩා තේ වතු හිමියාට දරාගත නොහැකිය.

මෙරට දිස්ත්‍රික්ක 14ක ලක්ෂ 05කට ආසන්න කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාවක් විසිරී සිටිති. මින් වැඩිම කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ රත්නපුර හා ගාල්ල දිස්ත්‍රික්කවලිනි. කුඩා තේ වතු හිමියන්ගෙන් ඍජුවම යැපෙන පවුල් සංඛ්‍යාව ලක්ෂ 20කට ආසන්නය. කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ගණන් හිලව්වලට අනුව කුඩා තේ වතුබිම් ප්‍රමාණය හෙක්ටයාර් 122,900කි. ඉඩම් කැබලි සංඛ්‍යාව 397,223කි. කුඩා තේ වතු අංශයේ වාර්ෂික නිමි තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 225,728කි. මෙරට ජාතික තේ නිෂ්පාදනයෙන් සියයට 75.21ක දායකත්වයක් ලබාදෙන්නේ කුඩා තේ වතු හිමියාය.

අනික් කාරණය වන්නේ කුඩා තේ වතු හිමියන්ගෙන් සියයට 75ක් පමණ අක්කර 01ට අඩු කුඩා තේ වතු හිමියන්ය. මොවුන් තම දරුපවුල් නඩත්තු කරන්නේ තේ වගාවෙන් ලැබෙන ආදායමෙනි. මෙරට තේ කර්මාන්තයට වැඩිම දායකත්වයක් ලබාදෙන කොටස්කරුවා වන්නේ කුඩා තේ වතුහිමියාය. ඒ කොයිහැටි වුවද රසායනික පොහොර තහනම් කිරීමත් සමග කුඩා තේ වතුහිමියාට එල්ලවූයේ මරු පහරකි. කුඩා තේ වතු හිමියන් කාබනික පොහොර තේ වගාව සඳහා යොදනු ලැබුවද එමගින් සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකි වූහ. ඇතැම් කුඩා තේ වතුහිමියන් තම වගාව සඳහා තේ පොහොර යෙදීම අත්හරිනු ලැබීය.

පුද්ගලික තේ කම්හල් හිමියන්ගේ සංගමයේ සභාපති ලයනල් හේරත් මහතා කීවේ මෙවැනි කථාවකි.

තෙල් අර්බුදය තේ කර්මාන්තයට දැඩිලෙස බලපා තියෙනවා. 2022 වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ නිමි තේ කිලෝ මිලියන 04ක අඩුවීමක් තියෙනවා. අපේ රටේ තේ නිෂ්පාදනය අඩුවුවහොත් තේ නිෂ්පාදනය කරන වෙනත් රටවල් සඳහා ගැනුම්කරුවන් යොමුවීමේ අවදානමක් තියෙනවා. දැනට නම් එහෙම තත්ත්වයක් නැහැ. තේ පොහොර කොට්ටයක මිල රුපියල් 20000ක් 30000ක් අතර වෙනවා. මේ නිසා රසායනික පොහොර යොදන්නේ ඉතා සුළු පිරිසක්. මේ නිසා සිදුවන්නේ තේ අස්වැන්න හා තේවල ප්‍රමිතිය අඩුවීමයි. තේ පොහොර මිල අඩුකරලා යම් සහනයක් ලබාදිය යුතුයි.

කුඩා තේ වතු හිමියන් මුහුණ දී ඇති ගැටලු සම්බන්ධයෙන් සමස්ත ලංකා කුඩා තේ වතු සමිති සංවිධානයේ සභාපති. කේ. එල්. ගුණරත්න මහතා කීවේ මෙවැනි කතාවකි.

කුඩා තේ වතුහිමියන් ලංකාවේ දිස්ත්‍රික්ක 14ක ලක්ෂ 05කට ආසන්න සංඛ්‍යාවක් ඉන්නවා. මේ අයගෙන් යැපෙන සංඛ්‍යාව ලක්ෂ 20කට ආසන්නයි. තේ ගසකින් සතිපතා තේ දලු නෙළනවා. දලුවලින් ඉවත්වෙන්නේ නයිට්‍රජන් ආපසු නයිට්‍රජන් ගසට ලබාදිය යුතුයි. නයිට්‍රජන් ලබාදීමට රසායනික පොහොර යෙදිය යුතුවෙනවා. රසායනික පොහොර තහනම ඉවත් කළත් වෙළෙඳපොළේ තියෙන මිලට කුඩා තේ වතු හිමියාට රසායනික පොහොර මිලදී ගන්න බැහැ. තේ පොහොර මිටියක මිල රුපියල් 20000 වඩා වැඩියි. කුඩා තේ වතු හිමියන්ගෙන් සියයට 70ක් පමණ ඉන්නේ අක්කරයකට අඩු කුඩා තේ වතු හිමියන්. තේ වගාවෙන් ලැබෙන ආදායමෙන් තමයි දරුපවුල් නඩත්තු කරන්නේ. පොහොර ගැටලුව නිසා යම් ප්‍රමාණයක තේ දලු අස්වැන්නේ අඩුවීමක් තියෙනවා. වාසනාවකට අපේ රටේ පසුගිය වසරේ හොඳ දේශගුණික තත්ත්වයක් තිබුණා. එනිසා පොහොර නැතිවුණා කියලා තදින්ම කුඩා තේ වතු හිමියන්ට දැනුනේ නැහැ. තවමත් කුඩා තේ වතු හිමියන්ට විශාල මුදලක් දීලා පොහොර මිලදී ගෙන වගාවට යෙදවීමට අපහසුයි. වසරකට කුඩා තේ වතු හිමියන්ගෙන් කෝටි 400ක් 450ක අතර මුදලක් බදු වශයෙන් අයකර ගන්නවා. එකට කියන්නේ සෙස් බද්ද කියලා. එම බදු මුදලින් කුඩා තේ වතු හිමියන්ට පොහොර සහනාධාරය ලබාදෙන්න කියලා අපි යෝජනා කළා. වැවිලි කර්මාන්ත ඇමැතිතුමා මෙම යෝජනාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරලා තියෙනවා. එහි අවසාන ප්‍රතිඵලයක් ලැබිලා නැහැ. අපි තවත් යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. පොහොරවල මිල සංශෝධනය වනතෙක් කුඩා තේ වතු හිමියන්ට වාරික තුනකින් ගෙවීමේ පදනම මත පොහොර ලබාදෙන්න කියලා. තේ කම්හල් හිමියන්ටද ණයට පොහොර දෙන්න බැහැ. එම නිසා තේ මණ්ඩලය මේ සඳහා මැදිහත් වෙලා තේ කම්හල්වලට පොලී රහිත ණයක් ලබාදීලා එම මුදලින් කුඩා තේ වතු හිමියන්ට වාරික තුනකින් ගෙවීයන ලෙස පොහොර ලබාදෙන්න කියලා තේ අපනයනකරුවන්ට ඩොලර් වලින් තමයි මුදල් ලැබෙන්නේ එම මුදල් රුපියල් බවට පත්වන විට එහි වාසිය කුඩා තේ වතු හිමියන්ට ලැබෙන්න ඕන.

● ලලිත් චාමින්ද



# මෙච්චර තෙල් ඉවරවෙන්නේ ටැංකිවල හිල්ද?

උපයන දේ වැය කර හොඳින් කා බී නටා ගයා මදි වූ කල්හි ණයට ගෙන සැප සොයා යෑම මෑත ඉතිහාසයේදී රටක් වශයෙන් ශ්‍රී ලාංකිකයන් වූ අප ජීවිතය ගෙවූ ක්‍රමවේදය විය.

අප ඒ ගමන ආරම්භ කරනු ලැබුවේ ඉකුත් 1977 වසරෙන් පසු ක්‍රියාත්මක කෙරුණු වූ විවෘත අර්ථ ක්‍රමය සමඟින් යැයි කිවහොත් එය නිවැරදිය. එහිදී ක්‍රමය නිවැරදි නොවූවද කිසිවකුත් එම වරද නිවැරදි කරන්නට කටයුතු නොකළේය.

රට කරවූ සැමට අවැසි වූයේ බල ලෝබය හමුවේ රට සහ ජනතාව ඉදිරියේ සුරංගනා ලෝක මවා කෙසේ හෝ බලයට පැමිණීම වූහ. එහිදී දශක හතරකටත් අධික කාලයක් ගෙවී යන තෙක්ම සමස්ත රටවැසියන් සිටියේ ව්‍යාජ වූ සර්වපිත්තල ලෝකයක අතරමංවය.

දැන් රට හමුවේ උදා වී තිබෙන්නේ අවබෝධයෙන් තොරව එසේ සර්වපිත්තල කොදෙව්වක සිරවී සුවසේ සිටි අප සියලු දෙනාම යථාර්ථයට මුහුණ දීමේ කාලය බව දිනෙන් දින පැහැදිලි වෙමින් තිබෙන්නකි. එහිදී ඇතැමුන් කියන කතා ඇසෙන විට කාගෙ කාගේත් සර්වාංගයම හිරිවැටී යනවාටද සැක නැත.

අගමැති රනිල් වික්‍රමසිංහ මහතා නම් නොබෝදා ඔහුට සුපුරුදු නව ධුරයේ යළි වැඩ භාර ගැනීමෙන් පසු රට අමතා කියනු ලැබුවේ ඉතා අසීරුම කාලය තවත් මාස දෙකින් පමණ උදාවන බවකි.

එහෙත් මේ මොහොත වන විට රටේ විද්වතුවන් පෙන්වා දෙනු ලබන්නේ එළැඹෙන ජූනි මාසය වන විට උග්‍ර ආහාර හිඟයකට මුහුණ දෙන අතරේ සමස්ත රට වැසියන්ටම කිසිදා නොවිඳි දුෂ්කරතා රාශියක් විඳීමට සිදුවන බවකි. සැබැවින්ම කාගෙ කාගේත් සර්වාංගයම හිරිවැටී යන්නේ එවැනි අනාවැකි කියැවෙන විටය.

එහෙත් රට ඉදිරියේ ඇති අවදානම එතරම්ම බරපතළ තත්ත්වයක තිබියදී මේ මොහොතේත් රට කරවන දේශපාලනඥයන් සේම එහි ජීවත් වන රටවැසියන් ලෙස අපි එය නිවැරදිව වටහාගෙන සිටිමුද. පැහැදිලිවම දේශපාලනඥයා එය වටහාගෙ නද නැත. රට වැසියන් අති බහුතරයටද ඒ පිළිබඳ නිවැරදි අවබෝධයක් ඇත්තේම නැත.

එයට පැහැදිලි උදාහරණය ලෙස මේ වන විට රට පුරා පවතින ඉන්ධන අර්බුදය සහ එහිදී දේශපාලනඥයන් මෙන්ම ජනතාව හැසිරෙන ආකාරය පෙන්වා දිය හැකිය. සියල්ලන්ටම ඇවැසිව ඇත්තේ තෙල්ය. තෙල් ගෙන එන්නට නැත්තේ ඩොලර්ය. මේ ඉල්ලුම සහ ආනයනික සැපයුම තුළ සිදුවන සිදුවීම් රැසක් පැවතියද කිසිවකුටත් ඒවා අදාළම නැත.

මිනිස්සු ඉන්ධන ඉල්ලන්නාහ. ඒ ඉල්ලීම උපරිමයෙන් සපුරාලන්නට පාලකයෝ තවදුරටත් ඩොලර් හිඟා කන්නාහ. ජනතාව ඉන්ධන ඉල්ලා සිටිනුයේ සිය රථ වාහනවලට යොදා පුළුස්සා දමන්නටය. පාලකයන් ඩොලර් හිඟන්නේ එසේ හිතු මතේ පුළුස්සා දමනු පිණිස ජනතාවට ඉන්ධන ගෙනවිත් දීමටය.

ඇතැමුන් මෙහිදී ඉන්ධන භාවිතය පසෙක දමා ඉන්ධන හිඟය කූට ජාවාරමක් බවටද පත්කරගෙන ඇත්තේ රජය මංමුලා වූ පරිදි කටයුතු කරමින් තිබියදීය.

මෙසේ සැපයීම, පිළිස්සීම සහ යළි සැපයීම යන චක්‍රීය ක්‍රියාවලිය ඇරඹී මේ වන විට මාස දහයක පමණ කාලයක් ගෙවී ගොස් අවසන්ව ඇත. රට පුරා තෙල් පෝලිම් ඇති කෙරෙමින් එය ආරම්භ වූයේ මුළු රටම දරුණු ආර්ථික අර්බුදයක සිරවීමටත් මාස තුන හතරකට පෙරය. එසේ නැතහොත් ආර්ථික අර්බුදයේ සෙවැනැලි රටට එබිකම් කරමින් තිබියදීය.

එහෙත් මේ ආරම්භයේදී ඩොලර් අහේනිය ඉදිරියේ තෙල් පෝලිම් රට පුරා ඇති වෙද්දී සහ උහුලාගත නොහැකි ණය බරක රටම සිරවී තිබුණද පාලකයන් මෙකී චක්‍රීය ක්‍රමයට අනුව සැපයීම සහ පිච්චීමේ ක්‍රියාවලියට පණ දුන්නා මිසක තත්ත්වය කළමනාකරණය කරගෙන ඉදිරියට යෑමේ වැඩපිළිවෙළක් ඇති කිරීමට මෙතෙක් කටයුතු කර තිබේද?

කනගාටුවෙන් කිවයුතු කරුණ වී තිබෙන්නේ එවැනි කිසිදු පැහැදිලි වැඩපිළිවෙළක් කිසිවකුටත් නොතිබුණු බවය. නිශ්චිත විසඳුමක් පෙනන මානයක නැති ඉන්ධන අර්බුදයක් රට තුළ පවතිද්දීත් ලීටරයකට කිලෝ මීටර් තුන හතරක් ධාවනය වන සුපිරි රථ අදටත් මහමඟ ධාවනය වීමෙන් කියැවෙන්නේ එවන් සැලසුමක් නැති බව නොවේද?

අවම තරමින් පොදු ප්‍රවාහනය මුලට ගෙන සීමා පනවමින් ගැටලුව මතුවෙද්දීම කිසියම් වැඩපිළිවෙළක් ආරම්භ කිරීමට රජයට හැකියාව තිබුණද එවැන්නක් සිදු කෙරුණේද නැත. ඒ වෙනුවට සිදු වූයේ ඛනිජ තෙල් සංස්ථාවේ පාඩුව පෙන්වා රටේ ජනතාව තෙලෙන් බදින තැනට වැඩ කටයුතු කිරීමය.

මෑතකදී අවස්ථා තුනකදීම ඉන්ධන මිල ඉහළ නංවද්දී එය සාධාරණීකරණය කිරීමට රටට පෙන්වනු ලැබූ කරුණ වූයේ ඛනිජ තෙල් සංස්ථාව ලබන පාඩුවය. එහෙත් ඛනිජ තෙල් සංස්ථාව අද පාඩු ලබමින් තිබෙන්නේ රටේ ජනතාවගේ වරදින්ද?

එයට හේතු වී තිබෙන්නේ දේශපාලනඥයන්ගේ සිට ඉහළම නිලධාරීන් දක්වා ඇතැම් බොහෝ දෙනා කරන වංචා දූෂණ සහ ගසා කෑම් මෙන්ම දේශපාලනඥයන්ගේ හෙංචයියන් ලෙස ලීටරයෙන් ලීටරයට මීටරයක් ගානේ සංස්ථාවට බඳවා ගනු ලැබූ සංස්ථාවට දරා ගත නොහැකි අධික සේවක සංඛ්‍යාව නිසා නොවේද?

ඉකුත්දා සිදු කෙරුණු ඉන්ධන මිල ඉහළ නැංවීමේදී කැබිනට් මාධ්‍ය හමුවට පැමිණි විදුලිබල සහ බලශක්ති ඇමැති කංචන විජේසේකර මහතා කීවේ ගෙවී ගිය සඳුදා වන විට ඛනිජ තෙල් සංස්ථාව ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයකින් රුපියල් 83.71 ක්, 95 ලීටරයකින් රුපියල් 71 ක්, ඔටෝ ඩීසල් ලීටරයකින් රුපියල් 111.60 ක් සහ සුපර් ඩීසල් ලීටරයකින් රුපියල් 115. 95 ක් පාඩු ලබමින් සිටි බවය.

එනිසා නව මිල සූත්‍රයකට අනුව ඉන්ධන මිල ඉහළ නංවමින් පාඩුව පියවා ගැනීමට කටයුතු කළද ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයකින් තවදුරටත් සංස්ථාව එක් රුපියලක් පාඩු ලබන බවද ඇමැතිවරයා සඳහන් කළේය.

මෙහිදී මිල සූත්‍රයට අනුව රුපියල් 83.71 පාඩු ලබමින් තිබූ ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක් රුපියල් 420 දක්වා රුපියල් 82 කින් ඉහළ නංවද්දී ඉතිරි රුපියලේ පාඩුවත් මඟ හැරෙන පරිදි ඇමැතිවරයාට එය සිදු කරන්නට නොහැකි වීමද හාස්‍ය ජනකය. එසේ කියනු හැර වෙන කියන්නට දෙයක් අපට නැත.

අද දවසේ අයිඕසී හෙවත් ඉන්දීය ඔයිල් සමාගමට සාපේක්ෂව ඛනිජ තෙල් සංස්ථාව පාඩු ලබමින් තිබෙන්නේ ඉන්දීය ඔයිල් සමාගම භූමිතෙල් අලෙවි නොකරන නිසා බවද කී ඇමැතිවරයා වර්තමානයේ සංස්ථාව අධිකම අලාභය ලබන්නේ භූමිතෙල් අලෙවියෙන් බවද පෙන්වා දුන්නේය.

සැබැවින්ම ඇමැතිවරයා කියන පරිදි අද ඛනිජ තෙල් සංස්ථාව ඉන්දීය ඔයිල් සමාගම හා සැසඳීමේදී පාඩු ලබන්නේ ඉන්දීය ඔයිල් සමාගම භූමිතෙල් අලෙවි නොකරන නිසාද?

අද වන විට මෙරට ඉන්ධන වෙළෙඳ පොළෙන් සියයට 88 ප්‍රමාණයක් ඛනිජ තෙල් සංස්ථාව සතුව තිබියදී සියයට 12 ක් ඉන්දීය ඔයිල් සමාගම සතුව ඇත. සංස්ථාව සතුව ඉන්ධන පිරවුම් හල් 1325 ක් තිබියදී ඉන්දීය ඔයිල් සමාගමට හිමිව ඇත්තේ ඉන්ධන හල් 210 කි.

එසේම සංස්ථාවේ වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 326 ක් වෙද්දී ඉන්දීය ඔයිල් සමාගමේ වත්කම් ප්‍රමාණය බිලියන 65 කි. ඛනිජ තෙල් සංස්ථාව වාර්ෂිකව රුපියල් බිලියන 631 ක ආදායමක් උපයද්දී ඉන්දීය ඔයිල් සමාගමේ ආදායම රුපියල් බිලියන 65 කි.

මෙම ආයතන දෙකෙහි සේවක සංඛ්‍යාව ගෙන බැලීමේදී ඉන්දීය ඔයිල් සමාගම සමස්ත මෙහෙයුම් සඳහා සේවකයන් 160 ක් පමණක් යොදා ග නිද්දී ඛනිජ තෙල් සංස්ථාවේ සේවක පිරිස 2616 කි.

මේ තත්ත්වය තුළ ඉන්ධන අලෙවියෙන් ඉන්දීය ඔයිල් සමාගම බිලියන 4.88 ක ලාභයක් ලබද්දී සංස්ථාව ලබන ශුද්ධ අලාභය රුපියල් බිලියන 11.83 කි.

එහෙත් සංඛ්‍යා ලේඛන මෙසේ වුවද ඛනිජ තෙල් සංස්ථාවේ මෙකී අධික සේවක පිරිස තුළින් ඉන්ධන මිල කෙරෙහි එල්ලවන බලපෑම ශත ගණනක් වූ ඉතා අල්ප එකක් බවද මෙහිදී සඳහන් කළ යුතුය.

එසේනම් අද සංස්ථාවට මේසා පාඩුවක් සිදු වන්නේ කුමක් නිසාද? එයට එක් හේතුවක් වන්නේ සහනාධාර මත ඉන්ධන අලෙවි කිරීමය. එහෙත් ඉන්ධන මිල දැවැන්ත ලෙස ඉහළ යෑමට එය හේතු වී නැත. එසේනම් ඉන්ධන මිල මේ අන්දමට ඉහළ යෑමට බලපාන කරුණ කුමක්ද?

මේ මොහොතේත් රජය රටට සඟවන දෙය ද එය වී ඇත. සැබැවින්ම ඉන්ධන මිල මෙතරම් ඉහළ යෑමට බලපානු ලබන එක් කරුණක් වන්නේ ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ඉහළ යෑමය.

එයටත් වඩා වැදගත්ම කරුණ බවට අද පත්ව තිබෙන්නේ එසේ ලෝක වෙළෙඳ පොළේ ඉන්ධන මිල ඉහළ යද්දී රට තුළ ඇතිවූ ආර්ථික අර්බුදය සමඟ ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය රුපියල් තුන්සියයද ඉක්මවා යමින් 380 දක්වා ඉහළ ගොස් මේවන විට රුපියල් 365 සීමාවේ නතර වී තිබීමය.

අපට එය කිසිසේත්ම අද හෙට විසඳාගත නොහැකි තත්ත්වයකි. ඇතැම්විට මේසා විශාල ලෙස ඉන්ධන මිල ඉහළ යෑමේදී රටේ පොදු ජනතාව ඉන්ධන භාවිතය කෙමෙන් අඩු කරනු ඇතැයි රජයේ ඇතැමුන් සිතනවාද විය හැක.

එහෙත් මේ වන විට ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 420 දක්වා ඉහළ ගොස් තිබියදීත් ඉන්ධන හල් වටා ඇති දිගු පෝලිම් තුළින් කියැවෙන්නේ එයද සිදු නොවන බව නොවේද?

ඒ අනුව බලන කල පැහැදිලිවම පෙනී යන කරුණ වන්නේ රට අද පත්ව ඇති තත්ත්වය තුළ ඉන්ධන පරිභෝජනයේ යම් සීමාවක් අනිවාර්යයෙන් ඇති කළ යුතු තැනකට මේ මොහොත වන විට අප ළඟා වී සිටින බවය. එම යථාර්ථය බලධාරීන් වටහා ගන්නා බවක් නම් පෙනෙන්නට නැත.

සිදු වෙමින් තිබෙන්නේ දිගින් දිගටම ලෝකයට ණය වී ඉන්ධන ලබා ගනිමින් මැති ඇමැතිවරුන් ඇතුළු සියලු ධනවතුන්ගේ සුපිරි රථ තවදුරටත් මහමඟ ධාවනය කරවමින් ජනතාවට හැකි තරම් ඉන්ධන පුච්චා දමන්නට අමාරුවෙන් හෝ කටයුතු කරගෙන යෑම වී ඇත.



එසේ නොමැතිව රජයේ ඉහළ ඉන්ධන භාවිතය අවම කරමින් මැති ඇමැතිවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලවල සහ ඉහළ රාජ්‍ය නිලධාරීන්ගේ ඉන්ධන වියදම්ද අහෝසි කර ඔවුන්වද පොදු ප්‍රවාහන ක්‍රමයක් තුළ රඳවා රටක් වශයෙන් ඉන්ධන භාවිතය හැකිතාක් අවම කරන වැඩපිළිවෙළක් වෙත ගමන් කිරීමට කටයුතු කරන්නේ නම් අපට මේ ගැටලුවෙන් යම් තාක් දුරට සහනයක් ලබා ගත හැකිය.

එසේම සියයට හැත්තෑවක් දක්වා ඉන්ධන භාවිතයෙන් සිදු කෙරෙන රටේ බලශක්ති උත්පාදනය පුනර්ජනනීය ක්‍රමවේදයන් වෙත ගමන් කරමින් හැකිතාක් අවම කිරීමද මේ මොහොතේ කඩිනමින් සිදුවිය යුතුව ඇත.

තවදුරටත් එසේ නොවුණහොත් අවසන් ප්‍රතිඵලය කුමක් වනු ඇතිද? දිගින් දිගටම මෙසේ කටයුතු කිරීමෙන් තවදුරටත් බාල්දු වන්නේ රුපියලය. පාලනයක් කිසිසේත්ම සිදුනොවන්නේය. අවසානයේ අද තිබෙන තැනටත් වඩා වළකට රටම ඇද වැටීම නම් අනිවාර්යයෙන්ම සිදු වන්නේ තවදුරටත් කිරෙන් කා තෙලෙන් අත සෝදන්නට යෑම හමුවේ එක පොදියට වැලලෙන්නටය.

**● සමන් ගමගේ**

---




# තිබෙන මිලටත් වැඩි මිලකට ගහපු හාල් පාලන මිල ගැසට්ටුව

අප රටේ ජනතාව මිලදීගන්නා එදිනෙදා පරිභෝජනයට ගනු ලබන ආහාර ද්‍රව්‍ය අතුරින් වැඩිම මිලක් ගෙවීමට සිදුව ඇත්තේ සහල්වලට යැයි කිවහොත් නිවැරදිය. වෙළඳපොළේ එහි මිල දිනෙන් දින ඉහළ යමින් තිබෙනුයේ ඉතාමත් සීඝ්‍රයෙනි. එසේ වුවද රජය සහල් සඳහා පසුගියදා පනවනු ලැබූ පාලන මිල පාරිභෝගිකයා ආරක්ෂා කිරීමට නොව මෝල් හිමියන් සහ වෙළෙඳුන් ආරක්ෂා කිරීමට යැයි මහජනතාව පෙන්වා දෙති. ඒ අනුව මෙරට මහාපරිමාණ සහල් මෝල් හිමියන්ද අභිබවා යමින් රජය සහල් මිල ඉහළ දමා ඇතැයි පාරිභෝගික ජනතාව චෝදනා නඟමින් කියා සිටිති.

මේ වනතෙක් වෙළෙඳපොළේ දේශීය සහල් වර්ග බොහොමයක මිල පැවැතියේ රජය නියමකර ඇති එම පාලන මිලට වඩා අඩුවෙන් බවද ඔවුහු කියා සිටිති. නාඩු සහල් කිලෝවක රජයේ පාලන මිල ලෙස රුපියල් 220ක් ලෙස සඳහන් කර ඇතත් වෙළෙඳපොළේ නාඩු සහල් කිලෝවක් මේ දක්වා අළෙවිකළේ රුපියල් 200ක් හෝ ඊටත් වඩා අඩු මිලකට බවයි මහජනතාව පෙන්වා දෙන්නේ. එමෙන්ම සම්බා සහල් කිලෝවක සිල්ලර මිල රුපියල් 215ක් හෝ220කි. එහෙත් රජයේ පාලන මිලට අනුව එහි උපරිම සිල්ලර මිල වනුයේ රුපියල් 230කි. දැන් වෙළෙඳපොළේ සහල් අළෙවි වන්නේ ඒ නව මිලටය. කීරි සම්බා මිලද එපරිද්දෙනි. දැනට පනවා ඇති රජයේ පාලන මිලට වඩා පහළින් වෙළෙඳපොසේ කීරි සම්බා තිබූ බව පාරිභෝගික ජනයා කියා සිටිති. එහෙයින් මේ පාලන මිල එක්තරා අකාරයකින් සහල් මෝල් හිමියන්ට සහ වෙළෙඳුන්ට සහල් මිල වැඩිකිරීම සඳහා අවස්ථාව ලබාදීමේ උප්පරවැට්ටියක් වියහැකි බවද ඔවුහු කියා සිටිති. එහෙයින් රජය පැනැවූ සහල් සිල්ලර මිල පාරිභෝගිකයා රකින්නට නොවන බවට නැඟෙන චෝදනාව නොසලකාහැරිය නොහැක. වෙළෙඳපොළේ සහල් සිල්ලර මිල ගණන් පිළිබඳව විමසා බැලීමේදී ද ඒ බැව් මනාව තහවුරු වෙයි. ඒ අන්දමට වෙළෙඳපොළේ දැනට පවතින මිලට වඩා සහල් කිලෝවේ සිල්ලර මිල ගැසට් පත්‍රයක් මගින් ඉහළ දැමීම අහම්බෙන් සිදුවූවක් නොව හිතාමතා සැලසුම් සහගතව කරන ලද්දක් බවද පෙනීයයි. කෙසේ නමුත් ඒ හේතුවෙන් පාරිභෝගිකයා මහත් අසීරුවකට පත්වන බව ඉතා පැහැදිලිය. රජය සහල් සම්බන්ධයෙන් පාලන මිලක් පනවන්නට ගත් තීරණය හිටිඅඩියේ ගනු ලැබූවක් නොව සහල් මෝල් හිමියන්ද සමඟ එකට හිට ගනිමින් ඔවුන්ගේ වාසියට පමණක්ම ගෙනයැයි මහජනතාව නඟක චෝදනාව බොහෝවිට අසාධාරණ නොවිය හැක.

පසුගිය වසරේ (2021) සැප්තැම්බර් මාසය පමණ වනතෙක් මේ රටේ සහල් සඳහා පාලන මිලක් පැවැතුණු බව අපි දනිමු. එක්වරම ඒ පාලන මිල ඉවත් කිරීමට පියවර ගැනීමත් සමඟ සහල් මිල තීරණය කිරීමේ ඒකාධිකාරී බලයක් සහල් මෝල් හිමියන්ට පැවැරිණි. එකෙණෙහිම එහි වාසිය සියතට ගනිමින් මහාපරිමාණ සහල් මෝල් හිමියෝ සහල් සඳහා උපරිම තොග සහ සිල්ලර මිලක් එදා නියම කරනු ලැබීය. ඒ අනුව නාඩු සහල් කිලෝවක තොග මිල රුපියල් 110ක් සහ එහි සිල්ලර මිල රුපියල් 115ක් විය. සම්බා සහල් කිලෝවක තොග මිල රුපියල් 135ක්වූ අතර සිල්ලර මිල රුපියල් 140ක් වශයෙන් නියම කෙරිණි. කීරි සම්බා සහල් කිලෝවක තොග මිල ප්‍රකාශ වූයේ රුපියල් 160ක් ලෙසටය. එහි සිල්ලර මිල රුපියල් 165කි. සහල් මිල මේ අන්දමට තීරණය කරමින් එදා මහා පරිමාණ මෝල් හිමියන් පැවසුවේ ප්‍රධාන සහල් නිෂ්පාදකයන් හැටියට අපි එකට එකතුවෙලා සාකච්ඡාකර පාරිභෝගික ජනතාවටත් ගොවි ජනතාවටත් අසාධාරණයක් නොවන විදියට වී මිලත් සහල් මිලත් පිළිබඳව අවශ්‍ය වැඩපිළිවෙළක් සකස් කළ බව කියමිනි. මේ සහල් වර්ගවල මිල කිසිසේත්ම මීට වඩා වැඩිවෙන්නේ නැතැයිද ඔවුහු එදා කීහ. මේ රටේ වගකියුතු ව්‍යාපාරිකයන් සහ ප්‍රධාන පෙළේ සහල් නිෂ්පාදකයන් හැටියට අපි ඒ බව ඉතාමත් වගකීමකින් කියන බව හමුවක් කැඳවමින් ඔවුහු අවධාරණය කළ අයුරු සිහියට නැඟේ. එසේ වුවද ප්‍රකාශ කළ පරිදි සහල් ඒ මිලට පැවතියේ කොපමණ දවසක්ද යන්න මේ රටේ සහල් මිලදී ගන්නා ජනතාව හොඳින්ම දනිති. ඉන්පසු වෙළෙඳපොළේ සහල් මිල ඉහළ යෑම දිගින් දිගටම සිදුවූ අතර දැනට පවතිනුයේද ඒ මහා පරිමාණ සහල් මෝල් හිමියන් විසින් සිය හිතුමතේට ඉහළ දමනු ලැබූ සහල් මිලය. මෙවර රජය මගින් පාලන මිලක් පනවන බව පවසමින් මිල නියමකර ඇත්තේ සහල් මෝල් හිමියන්ද අභිබවා ගොසිනි. එය පාරිභෝගිකයා සූරාකන මිල නියම කිරීමක් යැයි මහජනතාව පෙන්වා දෙන්නේ එම නිසා විය හැක.

මේ අතර හිතුමතේ සහල් මිල ඉහළ දැමීමට මහාපරිමාණ සහල් මෝල් හිමියන්ට හැකියාව ලැබුණු හේතු ගණනාවක් වන බව සුළු හා මධ්‍ය පරිමාණ සහල් නිෂ්පාදකයෝ පෙන්වා දෙති. එයට ප්‍රධානම හේතුවක් වූයේ සහල් නිෂ්පාදනයේ ඒකාධිකාරියක් නිර්මාණයවීම යැයි කීහ. දේශීය සහල් අවශ්‍යතාවයෙන් හරි අඩක් පමණ මෙතෙක් සපයන ලද්දේ සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් විසින් බවයි ඔවුන් කියා සිටියේ. එසේ වුවද මේ වනවිට එම සහල් මෝල්වලින් බොහෝ සංඛ්‍යාවක් වැසීයෑම නිසා මෙතෙක් වෙළෙඳපොළට සපයන ලද සහල් ප්‍රමාණය විශාල වශයෙන් අඩුවී ඇති බවද කියා සිටී. එම නිසා වෙළෙඳපොළේ දේශීය සහල්වල හිඟයක්ද ඇතිවී තිබෙන බව කියති. වෙළෙඳපොළ තොරතුරු විමසීමේදීද මේ බව තහවුරු කරගැනීමට අපට හැකිවිය. සහල් නිපදවීම සඳහා අවශ්‍ය වී තොග නොමැතිකමින් දිවයිනේ ප්‍රදේශ රැසක සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් රාශියක් වැසී ගොස් තිබෙන බවද කියති. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ පමණක් මේ වන විට එසේ වැසීගොස් තිබෙන සහල් මෝල් සංඛ්‍යාව 450කට වැඩි බවද අපට දැනගන්නට ලැබිණි. එය මේ දිස්ත්‍රික්කයේ පමණක් නොව සහල් නිෂ්පාදනය කළ බොහෝ ප්‍රදේශවල ඇතිවී තිබෙන තත්ත්වයක් බවද සුළු හා මධ්‍යපරිමාණ සහල් මෝල් හිමියෝ සඳහන් කළහ.

අප මේ සම්බන්ධයෙන් කළ කරුණු විමසීමකදී බදුල්ල දිස්ත්‍රික්කයේ වී සහ සහල් නිෂ්පාදකයන්ගේ සංගමයේ සභාපති සුසිල් ජයතිස්ස මහතා කියා සිටියේ තම සංගමයට අයත් සහල් මෝල් 36ක් අතුරින් සහල් මෝල් 34ක්ම මේ වන විට වැසීගොස් තිබෙන බවය. දැනට ක්‍රියාත්මක වන්නේ සහල් මෝල් දෙකක් පමණක් බවද ඒ මහතා කීය.

සමස්ත ලංකා සහල් මෝල් හිමියන්ගේ සංගමයේ සභාපති බී. කේ. රංජිත් මහතා සහල් මිල සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ මැදිහත්වීමක් අවශ්‍ය බව තමන් මුලසිටම පෙන්වා දුන් බව කියා සිටියේය. සහල් පාලන මිලෙන් තොරව පවත්වාගත යෑමට ඉඩදීම සම්බන්ධයෙන් සංගමයේ සභාපතිවරයා ලෙස විරුද්ධවූ බවද හෙතෙම කීය. එම නිසා ප්‍රමාදවී හෝ නැවත රජය සහල් පාලන මිල පැනවීම අගය කරන බවද කීවේය. වෙළෙඳපොළේ මේ අන්දමට සහල් මිල ඉහළ යෑමට බොහෝ සෙයින් බලපා ඇත්තේ එයම බවද රංජිත් මහතා කීය.

''අපි මුල ඉඳලම දරපු ස්ථාවරය තමයි රජය සහල් පාලන මිල ඉවත් කිරීම වැරදියි කියන එක. අද මේ ඇතිවෙලා තිබෙන සහල් මිල ඉහල යෑමට ප්‍රධාන හේතුව එයයි. අද මේ නිසා පාරිභෝගික ජනතාව විශාල පීඩාවකට පත්වෙලා ඉන්නවා. දවසින් දවස හාල් මිල වැඩිවෙනවා. මේක අපිට පාලනය කරන්න පුළුවන්කමක් නෑ. මේ සහල් මිල වැඩිවීමට හේතුව රටේ වී නිෂ්පාදනය පහළ බැසීම සහ වී මිල ඉහළ යෑම. පසුගිය කන්නයේ මේ රටේ වී අස්වැන්න සියයට පණහකට වැඩි ප්‍රමාණයක් අඩුවුණා. ගොවීන්ට රසායනික පොහොර නොලැබීමයි එයට හේතුව වුණේ. ලබන කන්නයේ අස්වැන්න ගැන පසුගිය කන්නයේ තරම්වත් බලාපොරොත්තු තියන්න අමාරුයි කියලා ගොවීන් කියනවා. එහෙම වුණොත් වී මිල තවත් ඉහළයෑම වළක්වන්න බැරි වෙනවා. ඒ තත්ත්වය තුළ සහල් මිල ඉහළ යෑමත් අනිවාර්යයි. ඒක වළක්වන්න බෑ. ඒ වගේම දැනට රටේ විශාල වී හිඟයක් තිබෙනවා. ඒ නිසා වී මෝල් විශාල ප්‍රමාණයක් මේ වනවිට වැහිලා. මේ රටේ සහල් අවශ්‍යතාවයෙන් සියයට පණහක් පමණ වෙළෙඳපොළට සැපයීම කළේ සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්. නමුත් මේ අර්බුදයට මුහුණ දෙන්න බැරිව රට පුරාම සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් 500කට වැඩි ප්‍රමාණයක් මේ වනවිට වැහිලා. එයට හේතුව වී තොග නොමැතිකම. විශාල වී සංචිත තිබෙන්නේ මහා පරිමාණ සහල් මෝල් හිමියන් ළඟයි. සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ට විශාල වී තොග ඇත්තේ නෑ. ඒ අය සහල් නිෂ්පාදනය කරන්නේ එදිනෙදා පවතින මිලට වී අරගෙනයි. අද වී කිලෝ එකක මිල රුපියල් 120කට ආසන්න වෙනවා. මේ මිලට වී අරගෙන සහල් නිෂ්පාදනය කරන්න කුඩා මොල් හිමියන්ට බෑ. අනෙක් කාරණය තමයි රටේ වී නිෂ්පාදනය සාමාන්‍ය විදියට කෙරෙනකම් වී මිල සහ සහල් ඉහළ යෑම වළක්වන්න බැරිවේවි. ගොවීන්ට අවශ්‍ය තරම් පොහොර ලැබිලා, අනෙකුත් යෙදවුම් පහසු මිලට ලැබිලා ගොවිතැන් කරලා අස්වැන්න වැඩිවුණොත් සහල් මිල අඩුවෙයි කියලා අපි හිතනවා. එහෙම නොවුණොත් සහල් නිෂ්පාදන කර්මාන්තයත් අනතුරේ සහල් මිලත් ඉහළ යාවි. කොහොම නමුත් 2023 මාස් කන්නයේ වී අස්වැන්න වෙළෙඳපොළට එනතෙක් මේ තත්ත්වය පවතීවි කියලා අපි විශ්වාස කරනවා.''

**හාල් කිලෝව රුපියල් 500ට යයිද?**

මේ වනවිට රටේ වී නිෂ්පාදනය විශාල වශයෙන් අඩුවී තිබෙන බව ප්‍රකට කාරණයෙකි. එය ඉබේ ඇති වූවක් නොව ආණ්ඩුවේ අදූරදර්ශී ක්‍රියාපිළිවෙත් නිසා ඇතිවූ බවද නොදන්නා කෙනකු නොමැත. කාබනික පොහොර භාවිතය එක රැයකින් ක්‍රියාත්මක කිරීමට වෑයම් කිරීමේ අසාර්ථක උත්සාහයේ අහිතකර ප්‍රතිඵලය මේ රටේ ගොවි ජනතාවට ඉතාමත් අහිතකර අන්දමින් බලපෑවේය. එපමණක් නොව එම ඔලමොට්ටල ක්‍රියාව නිසා සමස්ත මහජනතාවටද පීඩා විඳින්නට සිදුව තිබේ. රටක් වශයෙන් බත් පතට පිටරටට අතපාන්නට සිදුවූයේ පාලකයන් ගොවියාත් ගොවිතැනත් වළපල්ලට ඇදදැමූ නිසාවෙන් බවට කිසිදු විවාදයෙක් නැත. එමෙන්ම දේශීය සහල් මිල මෙපමණට ඉහළ යෑමටද මේ තත්ත්වය සෘජුවම බලපෑ බව නොරහසකි. පසුගිය මාස් කන්නය ආරම්භයේ ආණ්ඩුව රසායනික පොහොර තහනම ප්‍රකාශයට පත්කරද්දී එයින් ඇතිවන භයානක ප්‍රතිඵලය පිළිබඳව මේ රටේ ගොවිජනතාව කල්වේලා ඇතිවම අනතුරු ඇඟවූහ. එහෙත් ඊට කන්දෙන්නට රටේ ජනාධිපතිවරයා, කෘෂිකර්ම ඇමැතිවරයා පටන් ආණ්ඩුවේ කිසිම වගකිවයුත්තෙක් අකමැතිවීම මේ විනාශකාරී තත්ත්වයට බලපෑ බව පෙන්වාදිය යුතුය. එපමණක් නොව ඊට නොදෙවෙනි නිලධාරීන් පිරිසක්ද ආණ්ඩුවේ අත්තනෝමතික ක්‍රියාපිළිවෙතට ගොංපස් අල්ලමින් උඩගෙඩි දුන් බව අප අමතක කළයුතු නැත. දේශීය කෘෂිකර්මාන්තය කඩාවැටී රට වැටෙන මරඋගුල පෙන්වා දෙන්නට කිසිවෙකුත් උනන්දු නොවීමේ වාසිය වඩාත් සැලසුණේ අපට සහල් අලෙවිකරන විදෙස් රටවලටය. ඊට අමතරව රටේ නිපදවන සුළු වී අස්වනු ප්‍රමාණය මිලදීගෙන යටිමඩි ගහගැනීමට හැකියාව තිබෙන මහා පරිමාණ සහල් මෝල් හිමියන් අතළොස්සටය.

රටේ වී නිෂ්පාදනය කඩාවැටීම එක් රැයකින් සමනයකර ගත හැකි කාරණයක් නොවන බව අමුතුවෙන් කිවයුතු නොවේ. ඒ හේතුවෙන් දැනට පැනනැඟී තිබෙන අර්බුදය වන රටට අවැසි සහල් ප්‍රමාණය මේ රටේ නිපදවීමේ නොහැකියාව තවදුරටත් අඛණ්ඩව පැවැතීම තවදුරටත් ස්ථිර වනු ඇත. අනෙක් පැත්තෙන් වී නිෂ්පාදනය සඳහා ගොවියාට දැරීමට සිදුවී තිබෙන අසීමිත වියදම් ප්‍රමාණය දෙස බලනවිට වී කිලෝවෙක මිල දැනට පවතින මිලට වඩා බෙහෙවින් ඉහළ යනු ඇතැයි දැනටමත් අනාවැකි පලවී තිබේ. ඒ අනුව දේශීය සහල් මිලද ඊට සාපේක්ෂව ඉහළ යෑම අනිවාර්යයෙන්ම සිදුවන්නකි. වී කිලෝවක දැනට පවතින මිල රුපියල් 120ක් පමණ වන අතර එය රුපියල් 150ක් දක්වා ඉහළ ගියහොත් දේශීය සහල් කිලෝවක මිල රුපියල් 300ක් පමණවනු ඇතැයි ගම්මට්ටමේ සහල් නිෂ්පාදකයෝ පෙන්වා දෙති.

ඒ අනුව බලන කල රජය දැනට පනවා තිබෙන සහල් පාලන මිල වෙළෙඳපොළේ පැවැති මිලටත් වඩා ඉහළින් සඳහන් කර ඇත්තේ කිසියම් ප්‍රමාණයකට අනාගතයට පෙරහුරුවක් ලබාගනු පිණිස වන්නට ඇතැයි යන සාධාරණ සිතුවිල්ලක් අප තුළ පහළවිය යුතුය. ඒ හැර කළයුතු අන් කිසිවක් අපට නොමැත. එසේ වුවද සහල් කිලෝවේ මේ පාලන මිල පවතිනුයේ කොපමණ කාලයක් සඳහාද, කවදාතෙක්ද යන්න තීරණය වනු ඇත්තේ රටේ පවතින වී මිල සහ මහා පරිමාණ මෝල් හිමියන්ගේ තීරණය මත බවට ඉඳුරාම කිව හැක. ඇතැම්විට නුදුරු අනාගතයේදීම සහල් කිලෝවක මිල රුපියල් 450ක් 500ක් දක්වා ඉහළ ගියද අප එතරම් පුදුම වියයුතු නැත. මන්දයත් පාලකයන්ට දෙවියන්ගේ හාල් කැවී උන්මත්තකයන් බවට පත්ව රටේ වී ගොවිතැන කාබාසිනියාකර දැමූවිට ලැබෙන උත්තරය ඒ හැර අන්දෙයක් නොවන නිසාවෙනි.

**● කරුණාරත්න ගමගේ**

# • උපන් බිමට නුඹ වැඩියක් වීද දුවේ...



**හල්දුම්මුල්ල කම්පා කළ ඛේදවාචකය**

දින දෙකක් පමණ වයසැති සිඟිති දියණියක් මියගොස් අවසන්ය. රටම බරපතළ අඳුරක පසුවන මොහොතක හල්දුම්මුල්ල සොරගුණේ රදාකඳුර ප්‍රදේශයේදී මෙලොව එළිය දකින එම සිඟිත්තිය ඉකුත් 21 වැනි දින අවසන් ගමන් යන්නීය. අකල්හි එම මල් කැකුළ පරව යන්නේ ඇය මෙලොවට දායාද කළ දෙමාපියන්ගේ වරදින් හෝ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පැවැති අඩුපාඩුවකින් නොව වෙනත් කරුණක් මුල්කර ගනිමින්ය. රටක් ලෙස එම අනුවේදනීය සිදුවීම සම්බන්ධයෙන් අප කම්පා විය යුතුය. කම්පා වීම පමණක් ප්‍රමාණවත් නැත. ලජ්ජා විය යුතුය. ඊට හේතුව බවට පත්වන්නේ දේශපාලන මඩ ගොහොරුවක් බවට පත්වූ බිමක උපන් ඇය, ඒ බිමට බර වැඩි වූ බිලිඳියක ලෙස මිය පරලොව යන්නට සිදුවීම හේතුවෙන්ය. මෙම සටහන තබන අවස්ථාව වන විටත් අලුත කපන ලද වළක් තුළ ඇය මිහිදන්ව ගොස් දින කිහිපයක් ගතව ඇත.

මල් කැකුළක් බඳු සිඟිත්තියක් අකල්හි මියයෑමත් ඉන් උපන් කම්පනයත් හේතුවෙන් සිඟිත්තියගේ පශ්චාත් මරණය පරීක්ෂණය සිදු කළ දියතලාව රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී ශානක රොෂාන් පතිරණ මහතා එම අනුවේදනීය සිදුවීම සම්බන්ධව මුහුණු පොතට සටහනක් එක් කිරීමත් සමග බොහෝ දෙනෙකුගේ අවධානය ඒ කෙරෙහි යොමුවිය. ඇස හරහා හදවතට ගමන් කළ එම අනුවේදනීය සටහනෙහි සඳහන්ව ඇත්තේ තමන් විසින් දියතලාව රෝහලේදී සිදුකළ 86 වැනි පශ්චාත් මරණ පරීක්ෂණය එම බිලිඳියගේ මරණය සම්බන්ධයෙන් සිදු කළ බවත් එම කටයුත්ත තමන්ට අතිශය වේදනාත්මක අත්දැකීමක් ගෙන දුන් සිදුවීමක් බවට පත් වූ බවත්ය. වෛද්‍යවරයා විසින් මුහුණුපොතට එක් කළ සටහන නිමා කරමින් ලියා තබන්නේ... "මිනිය කපන්නත් දුකයි... සියලු අවයව හොඳින් හැදුණු දරුවෙක්. හෙණ ගහනව මේ කාලකන්නි දේශපාලුවන්ට... පස්සේ හිතුන මේ කාලකන්නි රටේ ජීවත් වෙන්නෙ නැතුව ඒ ළමය ගිය එක හොඳයි කියල..." යනුවෙන්ය.

අධිකරණ වෛද්‍ය නිලධාරී වෘත්තීය ගත් කල පශ්චාත් මරණ පරීක්ෂණයක් යනු එම වෘත්තියේම කොටසක්ය. ඉහත නම් සඳහන් වෛද්‍යවරයා විසින් සිදුකළ පළමු පශ්චාත් මරණ පරීක්ෂණය දින දෙකක් වයසැති මියගිය සිඟිත්තියගේ නොවන අතර එය අදාළ වෛද්‍යවරයා විසින් සිදු කරනු ලබන අවසන් පශ්චාත් මරණ පරීක්ෂණය ද නොවනු ඇත. දියතලාව රෝහලේ දී පමණක් එම වෛද්‍යවරයා විසින් මේ වන විට පශ්චාත් මරණ පරීක්ෂණ 86 ක් පමණ සිදු කොට ඇති බවට වෛද්‍යවරයා විසින් මුහුණු පොතට එක් කරන ලද සටහනෙහි සඳහන්ව ඇත. අත්දැකීම් බහුල වෛද්‍යවරයකු ඒ සා කම්පනයට පත් කිරීමට තරම් දින දෙකක් වයසැති මියගිය සිඟිත්තියක සමත් වූවේ කෙසේද? ඒ අන් කිසිවක් නිසා නොව අකල්හි මියගිය සිඟිත්තියගේ මරණය පිටුපස කටුක යථාර්ථයක් සැඟව පැවතීම හේතුවෙන්ය. එය රිදුම් උපදවන සුළුය. එම යථාර්ථය වෛද්‍යවරයා විසින් සිය ෆේස්බුක් ගිණුම හරහා වචන බවට පත් කරන ලද්දේ එබැවින් විය යුතුය.

මියගිය බිලිඳියගේ මරණය සම්බන්ධයෙන් රටක් ලෙස අප ලජ්ජා විය යුතුය යනුවෙන් ඉහත තැනක සඳහන් කරන ලද්දේ දින දෙකක් වයසැති තම දියණියගේ අකල් මරණය සම්බන්ධයෙන් දියතලාව මූලික රෝහලේ දී පැවති මරණ පරීක්ෂණයේදී සාක්ෂි ලබාදුන් ඇයගේ පියා වන මුහන්දිරම් රාලලාගේ ප්‍රියන්ත ඉඳුනිල් රත්නසිරි විසින් පවසා සිටී කරුණු කාරණා හේතුවෙන්ය. තම ආදරණීය දියණිය නිසි වේලාවට රෝහල්ගත කිරීමට නොහැකි වූ පශ්චාත්තාපයත් රෝහල් ගත කිරීම ප්‍රමාදවීම සඳහා බලපෑ සමාජ ඛේදවාචකයත් ඒ තාත්තා ගේ දුක්බර කටහඬෙහි විය. ඉහළට ගත් හුස්මක් "සුසුමක්" කොට මුදා හරිමින් ඔහු සාක්ෂි ලබාදෙන්නෙ මේ ආකාරයෙන්ය.

"...මම රැකියාව විදිහට කරන්නෙ වඩුවැඩ. 20 වෙනිද අපි රෝහලෙන් දරුවා ගෙදරට ගෙනාව. දරුව හොඳින් හිටිය. 21 රාත්‍රී 8.00 ට විතර දරුවව ගැහෙන්න පටන් ගත්ත. බිරිඳ දරුවාට කිරි දුන්නත් හොඳින් කිරි උරා බිව්වෙ නෑ. දරුවා ටිකෙන් ටික කහ පාට වුණා. අපි බය වුණා. බිරිඳ කිව්වා පුළුවන් තරම් ඉක්මනට දරුව අරගෙන රෝහලකට යමු කියල. මම කරුවලේම දුවගෙන ගොස් වාහනයක් සොයා ගැනීමට කීපදෙනෙකුටම කතා කළා. නමුත් පෙට්‍රල් නැති හින්ද ත්‍රිරෝද රථයක්වත් හොයා ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. පැයකට වැඩි කාලයක් එහෙ මෙහෙ දුවල මහන්සි වෙලා තමයි ත්‍රීවිල් එකක් හොයා ගත්තෙ. ඊට පස්සේ දරුවව හල්දුම්මුල්ල රෝහලට අරන් ආවා. ඒ වෙද්දී අසාධ්‍ය තත්ත්වයේ හිටපු නිසා එතනින් මූලික ප්‍රතිකාර කරල දරුවව දියතලාව මූලික රෝහලට ගෙනාව. එහි හදිසි ප්‍රතිකාර ඒකකයේ දී දරුවා මිය ගියා. ඊට ටික වේලාවකට කලින් ගෙනාව නම් මගේ දරු පැටියා බේරගන්න පුළුවන්කම තිබුණ කියල වෛද්‍යවරු කිව්වා. පෙට්‍රල් හිඟය නිසා ඉක්මනින් වාහනයක් හොයාගන්න නොහැකිවීම නිසා තමයි මගේ දුවට මෙහෙම වුණේ..."

සියල්ල සිදුවී හමාරය. සිඟිත්තිය මෙලොව හැරයන්නේ තවමත් හුස්ම ගනිමින් සිටින අපට සිතන්නට බොහෝ දේ ඉතිරි කොට තබමින්ය. රට තුළ උද්ගතව ඇති ආර්ථික අහේනියේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාණවත් තරම් ඉන්ධන රට තුළ නැත. හදිසියේ රෝගාතුර වන තම සිඟිති දියණිය නිසි වේලාවට රෝහල්ගත කිරීමට එම දෙමාපියන්ට නොහැකි වන්නේ එබැවින්ය. එම "පමාව" හේතුවෙන් තරුණ දෙමාපිය යුවලකට තම ආදරණීය දරු පැටියා අහිමිව ගොස් ඇත. දස මසක් කුස දරා මෙලොවට බිහි කළ කිරි කැටි දියණිය දින දෙකක් ජීවත්ව සිට අකල්හි මිය යෑම ඒ අම්මා විසින් කෙසේ දරා ගනු ඇතිද? ඇයගේ කඳුළට වගකිව යුත්තේ කවුරුන්ද? රට හිඟමනට ඇද දැමූ පාලකයන්ට ශාප කිරීම මිස ඇයට කළ හැකි වෙනත් යමක් වේද? පුංචි මල් කැකුළිය අකලට මෙලොව හැර යන්නේ මේ ආදී වශයෙන් සිතන්නට බොහෝ දේ ඉතිරි කොට තබමින්ය.

උපදිනු විනා ජීවත් වීමට වරම් අහිමි ඇය මවු කුස පිළිසිඳ ගැනීමට පෙර, පෙර කල බෝසතාණන් දුටු පස් මහා බැලුම් බැලීමට සමත් වූයේ නම් වෙනත් දේශයක්, දීපයක් තෝරා ගනු නොඅනුමානය. ඊට හේතුව බවට පත් වන්නේ මේ මොහොත යනු මෙරට අන් කවරදාටත් වඩා කැත හිරිකිත දේශපාලන, ආර්ථික, සමාජයීය මඩ ගොහොරුවක ගිලී තිබීමය. ඇය වේලාසන නික්ම යන්නේ එබැවින්ය. උපන් බිමට බර වැඩි වූ බැවින් සුරලොව ගිය කිරිකැටි දියණියට තනියක් නොදැනෙනු ඇත. ඇගේ තනිකම පිණිස සුර දූතියන් තනි රකිනු ඇත.

**• රුවන් ජයවර්ධන**

# කැනඩා පාර්ලිමේන්තුව කොටි ගිලගනී



**• කැනඩා ගෝත්‍රික කාන්තාවන් 1000ක් සමූල ඝාතන යෝජනාව ඉවතට**
**• කොටි ත්‍රස්තයන්ව කැනඩා පාර්ලිමේන්තුව පිළිගනී**
**• කැනඩා තානාපති මැකෙන්සි පිටුවහල් කිරීමට රජය බිය වෙයි**

**ආරක්ෂාව**

**කීර්ති වර්ණකුලසූරිය**

කොටි සංවිධානය පරාජයකර වසර 13කට පසු කැනඩා පාර්ලිමේන්තුව කොටි ග්‍රහණයට නතු විය. ඒබව තහවුරු වූයේ අගමැති ජස්ටින් ට්‍රෑඩෝගේ දකුණු අතයයි හඳුන්වන ගැරි ආනන්දසංගරී නැමැති කොටි හිතවාදියා ඉදිරිපත් කළ ද්‍රවිඩ ජනසංහාර යෝජනාවට මුළු පාර්ලිමේන්තුවම ඡන්දය භාවිත කිරීමයි.

මේ යෝජනාව මියගිය ද්‍රවිඩ ජනතාව සැමරීමට නොව කොටි ත්‍රස්තයන් සැමරීමට ය. ලොව පාර්ලිමේන්තු අතරින් ත්‍රස්තවාදීන් සැමරීමේ යෝජනාවක් සම්මත කළ මුල්ම පාර්ලිමේන්තුව කැනඩා පාර්ලිමේන්තුවයි.

ශ්‍රී ලංකා හමුදාව ද්‍රවිඩ ජනතාව සංහාරය කළ බවට දක්වමින් ශ්‍රී ලංකාවට එරෙහිව එම යෝජනාව ඉදිරිපත් කිරීමට පෙර කැනඩාවේ ගෝත්‍රික කාන්තාවන් සංහාරය වී ඇති බව දක්වන යෝජනාවක් ද පාර්ලිමේන්තුව මන්ත්‍රීවරුන් වෙත ඉදිරිපත් වී තිබුණි. කැනඩා පොලිසියේ වාර්තාවක සඳහන් වූයේ දහසකට අධික ගෝත්‍රික කාන්තාවන් ඝාතනය වී ඇති බවයි.

එහෙත් එම යෝජනාවට අනුමැතිය හිමිනොවී ගැරී ආනන්ද සංගරීගේ දැඩි බලපෑම මත ශ්‍රී ලංකා විරෝධී යෝජනාව සම්මත විය.

කැනඩාව 2010 දී ශ්‍රී ලංකාවට එරෙහිව තවත් යෝජනාවක් ගෙනඒමට උත්සාහ කර තිබුණි. මේ සියලු ක්‍රියාදාමයන් පසුබිමේ 40000ක්වූ කොටිඩයස්පෝරාව විය.

2008 සහ 2009 දී කොටි අවසන් සටනේදී අරමුදල් එකතුකර යුද අවි මිලයට ගැනීමට ක්‍රියාකළේ කැනඩාව බව කැනඩා පොලිසියේ ඔපරේෂන් ක්‍රිබල් මෙහෙයුමින් අනාවරණය විය.

ප්‍රභාකරන් විසින් මිසයිල ලබාදෙන ලෙස කැනඩා කොටිඩයස්පෝරාවට එවූ ලිපිය ද කැනඩාවේ වර්ල්ඩ් ටැමිල් කොංග්‍රස් මූලස්ථානයේ තිබී හමුවිය. එසේම කැනඩා පොලිසිය එරට කොටි ත්‍රස්තයන් 8000කට අධික සංඛ්‍යාවක් සිටින බව ද සොයාගෙන තිබුණි.

ශ්‍රී ලංකාව තුළ ත්‍රස්තවාදය ව්‍යාප්ත කිරීම සඳහා කැනඩාව දායක වූ අයුරු මේ වනවිට හෙළිවී ඇත.

මේ ඊට නිදසුන්ය.

- කොටි නෞකා ජාලයේ ප්‍රධානි රවිශංකර් හෙවත් සංගිලිට කැනඩාවේ දේශපාලන රැකවරණ සැපයීම.
- සන්සි නැවේ සිටි කොටි හමුදා නායකයන් රැසක් ඇතුළු 452කට දේශපාලන රැකවරණ ලබාදීම
- අත්අඩංගුවේ සිටි සෙබළුන් 28 ක් ඝාතනය කිරීම සම්බන්ධ කොටි ත්‍රස්තයන් දෙදෙනාට එරෙහි යුද අපරාධ චෝදනා ඉදිරිපත් කර නොකර දේශපාලන රැකවරණ සැපයීම
- කොළඹ හා කටුනායක සහ වව්නියාවට බෝම්බ දැමූ කොටි නියමුවන් දෙදෙනා කැනඩාවේ පුහුණුව ලැබූවන් බව හෙළි වීම.
- වන්නියේදී හමුදාවට අසුවූ කැනඩා කොටි ක්‍රියාකාරීන් දෙදෙනා කැනඩා රජයේ ඉල්ලීම මත නිදහස් වීම.
- කැනඩාවෙන් එකතු කරන අරමුදල් ස්විට්සර්ලන්තයට යවා සිංගප්පූරුවේ අවි ජාවාරම්කරුවන්ගෙන් අවි ලබාගැනීමට උත්සාහ කිරීම.

මේ පසුබිම මැද කැනඩාවේ ඔන්ටාරියෝ ප්‍රාන්ත රජය ද්‍රවිඩ ජනසංහාර යෝජනාවක් සම්මත කරනු ලැබීය. මේ යෝජනාව ඉදිරිපත් කරනු ලැබුවේ ප්‍රාන්ත මන්ත්‍රී විජේ තනබාලසිංහම් නැමැති කොටි ක්‍රියාකාරියා යි.

මේ සිද්ධිය ශ්‍රී ලංකාවට වාර්තා වීමට පෙර ආරක්ෂක විශේෂාංගය විසින් හෙළිදරව් කරනු ලැබීමෙන් පසු එවකට කැනඩාවේ සිටි ශ්‍රී ලංකා තානාපති සහ ඔහුගේ සහචර කණ්ඩායම එම යෝජනාවට ආණ්ඩුකාරවරියගේ අනුමැතිය ලැබී නැතැයි කියමින් අප වෙත නිවේදනයක් එවනු ලැබීය. ඉන්පසු ජාඇල ප්‍රදේශයේ සිට වෙබ් අඩවියක් මෙහෙයවන්නකු අප අමතමින් එවැනි යෝජනාවක් සම්මත වී නැති බව කියමින් වහාම නිවැරදි කිරීමක් නොකළහොත් ඩොලර් ලක්ෂ ගණනක් වන්දි ගෙවීමට සිදුවන බවට තර්ජනය කළේය. එහෙත් ප්‍රාන්ත ආණ්ඩුකාරවරිය එම යෝජනාවට අනුමැතිය දුන්නාය. එම යෝජනාව අද වර්ධනය වී කැනඩා පාර්ලිමේන්තුව මුල්වරට ජනසංහාර යෝජනාව සම්මත කළේය. මේ නිසා කැනඩාවේ සිටින හිටපු තානාපතිගේ සහචරයෙක් සහ ජාඇල වෙබ් අඩවි මෙහෙයවන්නා ගොළු වී ඇත.

මේ අතර පසුගියදා කැනඩා මහකොමසාරිස් ඩේවිඩ් මැකෙන්සිගේ ඉල්ලීම මත මා ඔහුගේ නිවසේදී හමුවූයෙමු.

කැනඩා සෙබළුන් යුද අපරාධ කිරීම ගැන චෝදනා එල්ල වී ඇති බව මා සෘජුව මහකොමසාරිස් මැකෙන්සිට පැවසූ විට ඔහු පැවසුවේ ඒවා චෝදනා බවයි.

එසේනම් කැනඩාවේ ගෝත්‍රික කාන්තාවන් 1000ක් ඝාතනය කිරීම සහ ප්‍රභාකරන්ගේ නෞකා ජාලයේ ප්‍රධානි රවි ශංකර් හෙවත් සංගිලිට දේශපාලන රැකවරණ ලබාදුන්නේ කෙසේද යන්න විමසූවිට ඔහුට කටඋත්තර නැතිවිය. මෙහිදී කැනඩා මහකොමසාරිස් මැකෙන්සි පැවසුවේ ඔහු මා අතර පැවැති සාකච්ඡාව නිල නොවන බවයි.

මේ තත්ත්වය මත හිටපු විදේශ ඇමැති දිනේෂ් ගුණවර්ධන කැනඩා මහකොමාරිස් මැකෙන්සි හමුවී ඔන්ටාරියෝ යෝජනාවට එරෙහිව දැඩි විරෝධය පෑවේය. එහිදී කැනඩා මහ කොමසාරිස් පැවසුවේ එය රජයේ යෝජනාවක් නොවන බවයි. එහෙත් අද එය රජයේ යෝජනාවක් බවට පත්වී ඇත.

එහෙත් කැනඩා රජය වසර ගණනාවක්ම කොටි ත්‍රස්තවාදය පෝෂණය කළේය. කොටි ත්‍රස්තයන්ට දේශපාලන රැතකවරණ සැපයී ය. අවි ආයුධ මිලයට ගැනීමට කොටි හිතවාදී සංවිධානවලට ඉඩදුන්නේය. බිම්බෝම්බ ඇටවූවන්ට සහ කළුකොටි ත්‍රස්තයන්ට ද දේශපාලන රැකවරණ දීමට ක්‍රියාකළේය.

කොටින්ට අරමුදල් එකතු කිරීමේ රාත්‍රී භෝජන සංග්‍රහවලට ද කැනඩා දේශපාලකයන් සහභාගි විය. මේ නිසා කැනඩා ආණ්ඩු ශ්‍රී ලංකාවට එරෙහි යුද අපරාධ කිරීම ගැන වරදකරු විය.

එහෙත් ශ්‍රී ලංකාවේ කිසිදු ආණ්ඩුවක් කැනඩාවේ ත්‍රස්ත පෝෂණයට එරෙහිව විරෝධතා දැක්වීමට ක්‍රියාකළේ නැත. එසේම කැනඩා පාර්ලිමේන්තුව ජනසංහාර යෝජනාව සම්මත කිරීම ගැන විදේශ කටයුතු අමාත්‍යාංශය විහිළු සහගත නිවේදනයක් ප්‍රකාශයට පත්කළේය. ඒ වැනි යෝජනාවක් සම්මත කිරීම කනගාටුවට කරුණක් බවයි. එහෙත් මේ යෝජනාව ගෙන ආ ගැරී ආනන්ද සංගරීගේ අතීතය හෙළිකිරීමට ද ක්‍රියාකළේ නැත.

ශ්‍රී ලංකා රජය නිකුත් කළ නිවේදනයේ මෙසේ සඳහන් විය.


ශ්‍රී ලංකාවේ සිදුවූ බවට සඳහන් වන දමිළ ජන සංහාරය සම්බන්ධයෙන් කැනේඩියානු පාර්ලිමේන්තුව තුළ යෝජනාවක් සම්මත කිරීම සහ මැයි 18 දමිළ ජන සංහාර සැමරුම් දිනය ලෙස හැඳින්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය සිය කනගාටුව පළකර සිටියි. කැනේඩියානු රජයේ නිල ස්ථාවරය වන ''ශ්‍රී ලංකාවේ ජන සංහාරයක් සිදුවූ බවට කිසිවක් අනාවරණය වී නොමැත'' යන්නට පටහැනිව, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ජන සංහාරය පිළිබඳව එම පාර්ලිමේන්තු යෝජනාව තුළ අඩංගු කරන ලද සාවද්‍ය චෝදනාව ශ්‍රී ලංකා රජය තරයේ ප්‍රතික්ෂේප කරයි.

එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා අතරතුර ගැටුම් පැවැති කලාපවල විසූ තම ජනතාව මුදාගැනීම සඳහා ශ්‍රී ලංකා රජය ක්‍රියාත්මක කළ මානුෂීය මෙහෙයුම ඇතුළුව ගැටුමේ අවසන් අදියරේ දී ශ්‍රී ලංකාවේ පැවැති සැබෑ තත්ත්වය පිළිබඳව ශ්‍රී ලංකා රජය විසින් කැනේඩියානු රජය ඉහළම මට්ටමින් දැනුම්වත් කරන ලද බව මෙහිදී සිහිපත් කළ යුතුය. වර්තමානය වනවිට යුද ගැටුම අවසන්ව වසර 13ක් ගතවී ඇති අතර, ශ්‍රී ලංකාව තම ප්‍රතිසන්ධාන ක්‍රියාවලියේ සැලකිය යුතු ප්‍රගතියක්ද ලබා ඇත. එමෙන්ම එය අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඒ පිළිබඳව කැනේඩියානු රජය නිරන්තරයෙන් දැනුම්වත් කොට ඇත.




• ශ්‍රී ලංකාවට එරෙහි ජනසංහාර යෝජනාව

ජන සංහාරය යන යෙදුම සඳහා නිශ්චිත වූ නෛතික අර්ථ ඇති බවත්, එක්සත් ජාතීන්ගේ සංවිධානය හෝ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය ඇතුළු එහි කිසිදු අන්තර් රාජ්‍ය ආයතනයක් ශ්‍රී ලංකාවේ ගැටුම සම්බන්ධයෙන් එම යෙදුම කිසිවිටෙක භාවිත නොකළ බවත් ශ්‍රී ලංකා රජය යළිඳු අවධාරණය කර සිටියි. මෙම යෙදුම ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අත්තනෝමතික ලෙස සහ වැරදි ලෙස යොදනු ලබන්නේ ශ්‍රී ලංකාවේ අභිලාෂයන්ට හිතකර නොවන, ඩයස්පෝරාවේ සිටින දේශපාලනික අරමුණු සහිත ශ්‍රී ලංකාවට විරෝධී සුළුතරයක් විසින් පමණක් බව සඳහන් කළ යුතුය.




• කැනඩාවේ කොටි හිතවාදී මන්ත්‍රී ගැරී ආනන්දසංගරී

වර්තමානයේ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ශ්‍රී ලාංකික ජනතාව දැවැන්ත අභියෝගවලට මුහුණදෙන වාතාවරණයක් හමුවේ ජාත්‍යන්තර ප්‍රජාවගේ ඵලදායී මැදිහත්වීම අවශ්‍ය මෙවැනි අවස්ථාවක, කැනේඩියානු පාර්ලිමේන්තුව මෙවැනි නොමග යවන සුළුක්‍රියාමාර්ග යක් ගැනීම කනගාටුවට කරුණකි. කැනඩාව තුළ කොටි සංවිධානය තහනම්වූවත් එය නමට පමණක් ක්‍රියාත්මක විය. මෙරට කැනඩා මහ කොමසාරිස් ඩේවිඩ් මැකෙන්සි ඉවත් බවක් නැතිව අද මෙරට කටයුතුවලට මැදිහත් වේ.

ශ්‍රී ලංකාවට එරෙහිව බංග්ලාදේශයේ සහාය දීමට එරෙහිව ඔහු බංග්ලාදේශ තානාපති ද හමුවිය. එහෙත් වියනා සම්මුතිය උල්ලංඝනය කළ කැනඩා තානාපතිට එරෙහිව රජය පියවර ගත්තේ නැත.

මේ පසුබිම මැද යුද අපරාධ සිදුකළ කැනඩාව ශ්‍රී ලංකාවට එරෙහිව යුද අපරාධ හංවඩුව ගසා ඇත.

ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය වර්ධනය කිරීම සඳහා අරමුදල් එකතු කිරීමට ඉඩදුන් හිටපු අගමැති හාෆර්ගේ රජය ද වරදකරුවේ.

එසේම ත්‍රස්තවාදීන්ට රැකවරණය සපයා ඇත. ටොරොන්ටො නුවර කොටි ත්‍රස්තයන් විශාල සංඛ්‍යාවකට දේශපාලන රැකරවණ ලබාදී තිබේ.

ඔවුන් අතර කොටි හමුදා නායකයන් රැසක් ද වේ.

මෙවන් තත්ත්වයක් මත ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ද කැනඩාව යුද අපරාධ කළ බවට යෝජනාවක් සම්මත කළ හැකිය.

ඒ සඳහා හොඳම නිදසුන මෙයයි.

හිටපු කැනඩා ආරක්ෂක ඇමැතිවරයා යුද අපරාධ චෝදනා එල්ලවූ විශේෂ බළකා රෙජිමේන්තුව විසුරුවා හැරියේය.

ඩේවිඩ් කොලොන්ගොට් 1993 දී පැවසුවේ සෝමාලියාවේදී 16 හැවිරිදි දරුවකු මරා දැමීම ගැන එරට කැනඩා ගුවන්යාන රෙජිමේන්තුව විසුරුවා හැරීමට තමා ක්‍රියාකළ බවයි.

එසේම කැනඩාවේ තවත් හිටපු මන්ත්‍රීවරයෙක් පැවසුවේ කැනඩාවේ යුද අපරාධකරුවන් ජාත්‍යන්තර අධිකරණයට ගෙනයා යුතු බවයි.

එහෙත් කැනඩා රජය යුද අපරාධ කළ සෙබළුන්ට එරෙහිව කිසිදු පියවරක් ගත්තේ නැත.

මේ හැර ගෝත්‍රික කාන්තාවන් විශාල පිරිසක් ඝාතනය විය. සාක්කිකරුවන් 2300කට අධික පිරිසක් සාක්ෂි දුන්හ.

මෙය ගෝත්‍රික ජනසංහාරයකි.

මේ පිරිස අතර කොන්සර්වේටිව් නායක කැන්සිස්වර් නිව් ඩිමෝක්‍රටික් පක්ෂ නායක විශ්මිට් සිං, නියෝජ්‍ය අගමැති ක්‍රිස්ටින් ප්‍රිලන්ඩ්, ඔන්ටාරියෝ ඩිමොක්‍රටික් නායක ඇන්ඩ්‍රියා හෝර්ඩන්, ෂෙර්වුඩ් මන්ත්‍රී ගැනට් ජිනිසස් ඇජැක්ස් මන්ත්‍රී මාර්ක් හොලන්ඩ් නගරාධිපති පැට්රික් බ්‍රවුන් මන්ත්‍රිනී විවියන් ලැපෝයින් ද වේ.

දිවයින
ඉරිදා සංග්‍රහය
2022 මැයි මස 29 වැනිදා ඉරිදා

# හිතෝපදේශය

2019 අවුරුද්දේ ශ්‍රී ලංකාවේ සමස්ත ආදායම රුපියල් බිලියන 1890 කි. මෙය ඩොලර්වලින් ගත් කල බිලියන 10.4 ක් වෙයි. එම අවුරුද්දේම සමස්ත වියදම රුපියල් බිලියන 2915 කි. එනම් ඩොලර් බිලියන 16 කි. අපේ රටේ තත්ත්වය මේ ආදායම් වලින් සහ වියදම් වලින්ම බලාගත හැකිය. 1948 නිදහස ලැබීමෙන් පසු ගතවූ මුල් අවුරුදු කීපය හැර එතැන් පටන් ඉදිරියට ගතවූ හැම කාලයකදීම ලංකාවේ අය වැය හිඟය වැඩි විය. හැම මිනිහෙක්ම තමන්ට ලැබෙන මුදලට වැඩි මුදලක් වියදම් කළේය. සමස්තයක් වශයෙන් ගත් කල ඔවුන් ඒ වැඩි වියදම දරා ගත්තේ කාගෙන් හෝ ණයට ගැනීමෙනි. ගම මට්ටමින් ගත් කල එසේ ණය දෙන්නා සාම්ප්‍රදායික පොලීකරුවා විය. නැත්නම් ග්‍රාම සංවර්ධන සමිතියේ ණය දෙන අංශය විය. නගර මට්ටමේදී බැංකු වලින්, ණය දෙන ආයතන වලින්, උගස් බඩු කඩ වලින් ණය ලබා ගැනීමට හැකිවිය. ඒ අතර ලංකාවද වෙනත් රටවල ණය දෙන ආයතන වලින්, ලෝක බැංකුවෙන්, ආසියානු සංවර්ධන බැංකුවෙන් සහ බැඳුම්කර වලින් ණය ගත්තේය. ණයට කෑම යනු ඉතා ලොකු ෆන් එකක් දෙන වැඩකි. ණයට ගන්නා මොහොතේදී ඇතැම් ණය ගැතියන් ප්‍රාර්ථනා කරන්නේ ණයට ගත් මුදල ඉවර වෙනවාත් සමගම ලෝක විනාශයක් සිදුවිය යුතු බවය. එවිට ණය ගැතියා මෙන්ම ණය හිමියා ද වාෂ්ප වී යති. නොඑසේ නම් ණය ගැතියා නිතරම අපේක්ෂා කරන්නේ ණය හිමියාගේ මරණ දැන්වීම හෙට උදේ පත්තරේ තිබෙන බවයි. එහෙත් ලෝක විනාශයක් ඇති වන්නේත් නැත; ණය හිමියා මිය යන්නේත් නැත; මේ දෙකම ඒ ආකාර නම් ණය ගැතියාට ඉතිරි වන්නේ ණය ගෙවීම පමණි. එය කරන්නේ කොහොමද?

රටක් වශයෙන් ගත් කල ණය ගැති භාවය අඩු කිරීමට කළ යුතු දේ කිහිපයක් තිබේ. මුලින්ම කළ යුතුව ඇත්තේ Thrift හෙවත් අරපිරිමැස්මෙන් කටයුතු කිරීමය. මෙහිදී ගෙදර පත්තු කරන බල්බ් 10 බල්බ් 5 ට බැස්සිය හැකිය. ත්‍රිරෝද රියේ යන කෙටි ගමන් පා පැදියෙන් හෝ දෙපයෙන් යෑමට හැකිය. මාළු කෑලි දෙකක් කන එකා මාළු කෑලි එකක් කෑ යුතුය. මේ රටේ ඇතැම් මිනිස්සු සෑම ආහාර වේලක්ම ගන්නේ එය ජීවිතයේ අවසන් ආහාර වේල බව මෙනෙහි කරමිනි. ඒ නිසා කාගෙන් හෝ ණයට මුදලක් ගෙන, එහෙමත් නැත්නම් අතේ තියෙන සියල්ල වැය කර චිකන්, මාළු, එළවළු ජාති කිහිපයක් බැදුමක් සමග කීරි සම්බා බත් කන්දක් ගිල දමා කෝපි එකකුත් බීමට ඔවුහු කැමැත්තාහ. අප ජාතියක් වශයෙන් ප්‍රමාණවත් පරිදි නිෂ්පාදනයක් කරනවා නම් මේ ජාතියේ බත් පිඟන් දෙකක් කා කෝපි දෙකක් බිව්වත් ප්‍රශ්නයක් නොවේ. අද අප ඉන්නේ ආර්ථික අගාධයේ අන්තිම තැනය. ජූලි අගෝස්තු මාස වන විට රට වැසියන්ට කන්නවත් දෙයක් නැති වෙතැයි පුරෝකථන පහළ වී තිබේ. මෙයින් කියවෙන්නේ කන්න නැතිව මිනිසුන් මැරි මැරී වැටෙන සාගත තත්ත්වයක් පහළ වන බව නොවේ. වෙනදා තුන්වේලම බඩ පැලෙන තෙක් ආහාර ගිල දැමූ ජනයාට වේල් දෙකක් හෝ එකක් ගිල දමා බඩ ඇලෙන තත්ත්වයක් හටගන්නා බවය. විදේශීය ආයෝජන නැතුව මේ රට දියුණු කරන්නට බැරිය. රුසියාව ලාබෙට සහ ණයට තෙල් දෙද්දීත් ලංකාව එම පහසුකම ලබා නොගන්නේ මන්දැයි ජනතාව ප්‍රශ්න කරති. ආණ්ඩුව රුසියාවෙන් තෙල් ගත්තොත් ඇමරිකාව සහ යුරෝපය රුසියාව සමග තිබෙන බද්ද වෛරය අප පිටින් යවා ජී එස් පී ප්ලස් සහනය ද අත්හිටුවනවා ඇත. එවිට රටේ ඉතිරිව තිබෙන ඉතිරි ගාමන්ට් ෆැක්ටරි තුන් හාරසීයත් වැහී අප හිඟමනටම පත්වීම නියතයකි. මේ ආර්ථිකය කිසිදු දියුණුවක් නොලබා මේ ආකාරයෙන්ම තිබුණොත් තව මාස 6 කට පසු අපට දැකගන්නට ලැබෙනු ඇත්තේ හෝටල් අසල තිබෙන ඉඳුල් කුණු බාල්දි අවුස්සා කන මහත්වරුය. ලංකාව සේම අධික උද්ධමනයකින් පීඩා විඳින වෙනිසියුලාවේද කුණු බාල්දි අවුස්සා කන නෝනලා සහ මහත්වරු අදටත් ඕනෑ තරම් සිටිති. චීනයේ ඇතැම් ප්‍රදේශවල ජනතාව සර්පයන්, මීයන්, කැරපොත්තන් සහ හැකරැල්ලන් අනුභව කරති. ඔවුන් එය පුරුදු වූයේ 20 වන ශතවර්ෂය මුලදී ඒ රටේ හටගත් භයානක ආහාර හිඟයක් නිසාය. මේ පුරුද්ද පරම්පරාවෙන් පරම්පරාවට ඇවිත් අද වන විට චීන සමාජය තුළ තැන්පත් වී ඇත. මේ අනුව අද ඩෙවල් කළ නයෙක් චීන අවන්හලක් තුළදී ප්‍රනීත කෑමක් බවට පත්ව තිබේ. චීනයේ පැවති ආහාර හිඟය හා සමාන ආහාර හිඟයන්ට මුහුණ දී සිටින ඇතැම් අප්‍රිකානු රටක බැදපු කැරපොත්තන් දීසියක් ඩොලර් එකකි. ආයෝජකයෝ ශ්‍රී ලංකාවට එන්නට නොකැමැත්තාහ. මේ රටේ ආර්ථික ප්‍රතිපත්තියක් නැති බවත් ස්ථාවර දේශපාලනයක් නැති බවත් වෘත්තීය සමිති ප්‍රශ්න වැඩි බවත් ජනතාව වැඩ කරනවාට වඩා වැඩ වර්ජනය කිරීමට කැමති බවත් යුරෝපීය ආයෝජකයන්ගේ පිළිගැනීම වී ඇත. මේ නිසා ස්වකීය ආයෝජන ඉන්දියාව, බංගලාදේශය, පාකිස්තානය, නේපාලය වැනි රටවලට පොම්ප කොට ඒවායෙහි කර්මාන්තශාලා පටන්ගෙන පවත්වාගෙන යෑමට ආයෝජකයෝ කැමති වෙති. ශ්‍රී ලංකාවේ ඇඟලුම් කම්හල් පවත්වාගෙන ගිය ඇතැම් දේශීය ව්‍යාපාරිකයන් පවා ස්වකීය ව්‍යාපාර බංගලාදේශයට ගෙන ගොස් තිබේ. ඒ නිසා ලංකාවේ රැකියා හිඟය වර්ධනය වී ෆැක්ටරි වැහෙන්නට පටන්ගෙන ඇත. ශ්‍රී ලංකාව Investor Friendly හෙවත් ආයෝජක හිතැති රටක් බවට පත් කළොත් දැනට තිබෙන ප්‍රශ්නවලින් සෑහෙන තරම් ගොඩඑන්නට අවස්ථාවක් අපට ලැබෙනවා ඇත. එහෙත් අපේ රටේ ජනතාව භුක්ති විඳින තරු පහේ ප්‍රජාතන්ත්‍රවාදයට අනුව එවැන්නක් සිදුවීමට කවදාවත් ඉඩක් නැත. දෛවය අපට නියම කර ඇත්තේ අනාගතයේදී කුණු බක්කි කෑමටය.

අංකඃ 223, බ්ලූමැන්ඩල් පාර, කොළඹ 13.
කර්තෘ මණ්ඩලය - 2448402, 2497500
ෆැක්ස් - 2344253, 2438750
වෙබ් අඩවිය - www.divaina.com
ඊමේල් - divaina@unl.upali.lk
divainapro@unl.upali.lk
www.facebook.com/divainanewspaper
දැන්වීම් අංශය - 2434190 (ප්‍රධාන කාර්යාලය)
ෆැක්ස් - 2344252, 2330024
බෙදාහැරීම් අංශය - 2497568, 2497519, 2497580
ෆැක්ස් - 2334564
කොටුව කාර්යාලය - 011 2334565

## හිටිවනය

කර ආධාර රට දෙන්නැයි ගොඩ දාලා
ජනපති ලෝකයෙන් ඉල්ලයි අතපාලා
විඳවති වැසියෝ පෝළිම්වල නැවතීලා
ලක් මව හඬයි උණු කඳුළැලි වගුරාලා

- අනුරාධ හිරිපිටියගේ



# මෙහෙම ගියොත් 21ටත් 'කපුට' කොටයි!

බයක් හැකක් නැත-නීතිය ගිහින් කැලේ
මුකුත් නොදැනමද බැංකුත් එහෙම කළේ
තවත් වහන්නට බෑ බෑ අපට කොලේ
මහත් හොරු රඟති-වැජඹෙති සඳලු තලේ

නියම සටන ඇත්තේ අද නොවේ හෙටයි
කොහොම කවුරු කිව්වත් මරුකපොලු වැටයි
තවම පොහොට්ටුවෙ බලයට රජය යටයි
මෙහෙම ගියොත් විසි එකටත් 'කපුට' කොටයි

- ගාමිණී

**කෙසේ හෝ අගමැති රනිල්ගෙන් මේ ආර්ථික අර්බුදයට සහනයක් ලබාගත හැකි යැයි සිතන පිරිස්ද වෙති. නීතිඥ සංගමය ඇතුළු ඇතැම් වෘත්තිකයන් අදහස් කරන්නේද ඔහු ලවා මේ අර්බුදය විසඳා ගත යුතු බවය.**

මේ රටේ සමාජආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රවල තවමත් ප්‍රමුඛ මාතෘකා බවට පත්ව තිබෙන්නේ දවසින් දවස උග්‍රවන සමාජ, ආර්ථික අර්බුද හා දේශපාලන ව්‍යාකුලත්වයයි. කොළඹ පමණක් නොව, බොහෝ නගර හා උප නගර ද ඇතැම් ගම් දනව්වල ද සිය දෛනික ජීවිත පවත්වා ගත නොහකිව වීදි බැස සිටින විවිධ ජන කොටස්වලින් ආණ්ඩුවට එරෙහිව නැඟෙන විරෝධාවල උණුසුමෙන් වාතලය ද ගිනියම් වී ඇත්තාක් මෙනි. ඒ ප්‍රබල මහජන ප්‍රතිචාර අබියස පොලිසිය මෙන්ම ආරක්ෂක හමුදාවෝ ද දුර්මුඛව සිටිති. ඉන්ධන හා ගෑස් පෝලිම්වල පමණක් පැය ගණන් නොව, ඇතැම්විට දින ගණනක්ම දුෂ්කර ක්‍රියාකරන ඒ බොහෝ ගැහැනුන් හා මිනිසුන් විසින් සමස්ත ආණ්ඩුවට ම එල්ල කරනු ලබන දෝෂාරෝපණ, ශාප කිරීම්, පළිගැසීම් ආදියෙහි ද කෙළවරක් නැත. ඔවුන්ගේ සාධාරණ කෝපය වෛරයක් බවට සැණකින් පෙරළී ඒ පිරවුම්හල් හා ගෑස් අලෙවි සැල් අබියස ඇන කොටා ගන්නා අවස්ථා ද බොහෝය. මේ කිසිවෙක් වරප්‍රසාද සහිත ජීවිත ගෙවන්නෝ නොවෙති. එදිනෙදා කුලියක් මලියක් කර දවස ගෙවන, අය මෙන්ම සුළු වෙළෙඳාමකින් වේල පිරිමසා ගන්නා අය ද ඒ පෝලිම්වලට දියවී යන තම දුක්බර කතා පිළිබඳ කරන විවරණ ද හද කම්පා කරවන සුළුය. මෙබඳු පුවත් අතරින් මුළු රට ම කම්පාවට පත් කළ එක් පුවතක් මෙහිලා දැක්විය හැකිය. ඒ දියතලාව රෝහලේ වෛද්‍යවරයකු විසින් සිය මුහුණු පොතේ තබන ලද සටහනකි. දින දෙකක් වයසැති බිළිඳියක් රෝහලට රැගෙන එද්දී ත්‍රිරෝද රියෙහි ඉන්ධන අවසන් වූ නිසා ඉන්ධන පිරවුම්හලක පෝලිමකට එක්ව ඇත. පැයකට කිට්ටු කාලයක් එහි ගෙවා, රෝහලට යනවිට ඒ බිළිඳිය අන්තිම අඩියෙහි සිට ඇත. පසුව දැඩිසත්කාර ඒකකයට ඇතුළත් කළ ඒ බිළිඳිය මියගොස් ඇත. වෛද්‍යවරයා පවසා තිබුණේ තව පැය භාගයක් ඉස්සර වූවානම් ඇගේ ජීවිතය බේරා ගත හැකිව තිබුණු බවය. මෙසේ වාර්තා නොවන එබඳු මානුෂික පුවත් තව කොපමණ තිබිය හැකිද?

මෙයට අමතරව ඉන්ධන පෝලිම්වලදී මියගිය අය ගැන ද වාර්තා පළවී ඇත. කුමක් වුවත් මේ වූ කලී වගකීම් විරහිත පාලනයකදී ගොදුරු බවට පත්වන පොදුජන ජීවිතවල ස්වභාවයයි. එපමණක්ද? මෙයට දින කීපයකට පෙර ඉන්ධන පෝලිමක දැඩි නොසන්සුන්තාවක් ඇතිවී තිබේ. එයට හේතු වූයේ පෝලිමට එකතු වනවිට ඉන්ධන ලීටරයක මිල රු. 338/= ක් වුවද ඉන්ධන ලබාගැනීමේදී එහි මිල රු. 420/= ක් වී තිබීමය. මෙය උත්ප්‍රාසනීය සිදුවීමකි. ඇත්තෙන්ම සිදුව ඇත්තේ පෝලිමේ දිනක් ගත වෙද්දී දෙවන දවස වනවිට ආණ්ඩුව තෙල් මිල ඉහළ දමා තිබීමය. මැදියම් රැයෙහිදී මිල ඉහළ දමනවිට රට පුරා ඉන්ධන පෝලිම්ය. එහෙත් ඒ කිසිවක් ආණ්ඩුවේ නිල බලධාරීන්ගේ අවධානයට ලක්ව නැත. මේ වනවිට ඛනිජ තෙල් විෂය භාරව ඇමැතිවරු කීපදෙනෙක්ම ක්‍රියා කළහ. එසේ වුවද ඉන්ධන පෝලිම් දික් වූවා මිස ප්‍රශ්නය විසඳුනේ නැත. තෙල් නැව් මුහුදේ රඳවා තිබෙන බවත්, ඒවායේ විශාල වශයෙන් තෙල් තොග තිබෙන බව කීවත් ඒ එකම ඇමැතිවරයකුට හෝ ඉන්ධන අවුල ලිහා ගත නොහැකි විය. අද වනවිට ඒ ඉන්ධන අර්බුදය විසින් සමාජයේ ගැටලු රැසක්ම නිර්මාණය කරනු ලැබ ඇත. ඒනිසා පෞද්ගලික ප්‍රවාහන සේවා සියල්ලේම මිල ඉහළ දැමීමට සිදුව තිබේ. බස් රියෙහි අවම ගාස්තුව රු. 32 කි. ගෑස් මිලත් ඉන්ධන මිලත් නිසා කුඩා ආපනශාලා විශාල සංඛ්‍යාවක් වැසුණි. ඒ සමගම ඉහළ ගිය පාන් පිටි මිල සමග පාන් ඇතුළු බේකරි නිෂ්පාදන නහුතයටම නැග තිබේ. එහෙත් ආණ්ඩුවේ එක ඇමැති උතුමෙක් හෝ මේ ජනතාවගේ දුකට සංවේදී වූ බවක් වාර්තා වී නැත. ඉවක් බවක් නැතුව හිතක් පපුවක් නැතුව පාන් ගෙඩියේ සිට හැම කන බොන දෙයකම මිල ඉහළ යද්දීත් මේ රටේ පොඩි මිනිහා ජීවත් වන්නේ කොහොමදැයි නිකංවත් විමසා බලන ඇමැතියෙක් නිලධාරියෙක් අද සිටිත්ද?

කලකට පෙර චීනයේ මාඕ සේතුං විසින් කියන ලද අපූරු කතාවක් දේශපාලන ලෝකයේ ඇත. එනම් පරමාණු යුද්ධයකින් ලෝකයේ ජනගහනයෙන් සියයට 90ක් මරුමුවට පත් වුවත් ඉතිරි සියයට 10න් හෝ සමාජවාදය ගොඩනැංවිය යුතු බවය. අපේ ගරු ඇමැතිතුමන්ලාත් මේ රටේ දුප්පත් මිනිසුන් මැරෙන්නට හැර දුප්පත් කමත්, විරැකියාවත් දෙකම නැතිකොට සෞභාග්‍යවත් රටක් ගොඩනැඟිය හැකි යැයි කල්පනා කරත්දැයි සිතන්නෙහිද? අපට තෙල් නැති බව සැබෑය. එහෙත් ජනතාවට තෙල් සිහින පෙන්වූ ඇමැතිවරු ද සිටිති. ඒ වෙනම කතාවකි. තෙල් මිල ඉහළ යනවිට පාඩු පිට තෙල් දිය යුතු යැයි කීමට අපට බැරිය. හැබැයි මේ රටේ තෙල් සංස්ථාව පාඩු ලබා තිබෙන්නේ පොඩි මිනිහාට නිකං තෙල් ලබාදී නොවන බව පමණක් කිව යුතුය. කලින් කලට පාලනය භාරගත් ආණ්ඩුවල ඇමැත්තන්ගේ කෙරුම්වල ආදීනව ලෙස තෙල් සංස්ථාව නට්ටම් වී තිබේ. අනෙක් බොහෝ ආයතන විනාශ වූයේ ද ඒ ඒ දේශපාලන හාල්පාරුවන්ට ඒවා තින්දගම් ක්‍රමයට පවරාදීම නිසාය. හැම ආණ්ඩුවක්ම රට පාලනය කළේ ඒ නොසණ්ඩාල තාලයටය. බඩුත් සමග හොරුත් අසු වුවත් දඬුවම් දෙන සිරිතක් ද මෙ රටේ නැත. මහ දවල් මහ බැංකුව කොල්ලා කෑ එකෙක්වත් තවම හරියට අල්ලා ගැනීමට මේ ආණ්ඩුවමට මෙන්ම යහපාලනයට ද බැරි විය. එහෙව් රටක ආර්ථිකය මේ තරමට ඉතිරිවී තිබීමත් හාස්කමක් වැන්න. 69 ලක්ෂයක් ඡන්දය දී ගෝඨාභය ජනාධිපති පුටුවට ගෙන ආවේ මේ මනුස්සයා නම් හොර බොරු නැති, කෙළින් වැඩ කරන අයෙකියි ජනතාව සිතූ නිසාය. 20 වැනි සංශෝධනයත් පාස්කර රටේ ව්‍යවස්ථාවේ ඇද කුදත් අයින් කර දුන්නේද රට මකා හෝ හදනු ඇතැයි සිතූ හෙයිනි. එහෙත් සිදුවූයේ වෙනත් දෙයකි.

දේශපාලනය යනු මූනිච්චාවට කරන සෙප්පඩ විජ්ජාවක් නොව, පොදු ජනතාවගේ විමුක්තිය උදෙසා කරන සත් ක්‍රියාවක් බව අද ඒ ජනාධිපතිවරයාට පෙන්වා දීමට ගාලු මුවදොරට එක්වූ මේ රටේ බුද්ධිමත් තරුණයෝ උද්ඝෝෂණ කරති. ඔවුන් 'ගෝඨා ගෝ හෝම්' කියන්නේ ද මේ තුච්ඡ දේශපාලනය නඩත්තු කළ පාර්ලිමේන්තුවේ 225ම ඒ විනාශයට වගඋත්තරකරුවන් කරමින්ය. පාර්ලිමේන්තුව ගැන කතා කරන්නට ගොස් ඒ උත්තමයන්ගේ පිත ඇවිස්සුනෝතින් වරප්‍රසාද කෙට්ට මානාගෙන අප ලුහුබඳින්නට ද බැරි නැත. එහෙත් අපේ පාර්ලිමේන්තුවේ මේ ජනතා පීඩනය ගැන මෙන්ම ඔවුන් ගොදුරු බවට පත්ව සිටින ආර්ථික අර්බුදය ගැන බරපතළ සංවාදයක්, විසඳුම් මාර්ගයක් යෝජනා නොවූ බව ද කිව යුතුය. ජනතාවගේ ප්‍රශ්න ගැන කතා කිරීම ද 'දිවයින' සතු වරප්‍රසාදයක් බව අපට සිතේ. අපට රකින්නට රටක් හා ජනතාවක් ඇත. ඒ ජනදුක නිවීමට බැරි ආණ්ඩු ගිනි තැපීමට ද? ගාලු මුවදොර අරගලය වෙත ජනතාවගේ ආකර්ෂණය පමණක් නොව, ආශීර්වාදය හිමි වන්නේ ද ඔවුන්ගේ විරෝධතා ව්‍යාපාරය ප්‍රබල මහජන හඬක් බවට පත්වීම නිසාය. මේ ආණ්ඩුව දණ ගැස්වීමට ද ඒ ව්‍යාපාරයට හැකිවී තිබීම නිසාය. රාජපක්ෂවරුන්ට බලය අතහැර (තාවකාලිකව හෝ) පසු බැසීමට සිදුවී තිබේ. අද ගෝඨාභය ජනාධිපතිවරයා ද 20 වැනි සංශෝධනයෙන් තමන්ට දුන් සුපිරි බලය අත්හැරීමට එකඟතාව පළකර ඇත්තේ ද ඒ ගාලු මුවදොර විරෝධතාකරුවන්ගේ දේශපාලන සංඥා වටහා ගැනීම නිසාය. මෙය මෙරටේ බුද්ධිමත් තරුණයන්ගේ විප්ලවයක් බව සෙසු සම්ප්‍රදායි දේශපාලන පක්ෂ මෙන්ම නායකයෝ ද තේරුම් ගත යුතු වෙති. නිදහසින් පසු මෙරටේ පාලන බලය අතට ගත් ස්වදේශික යැයි කියන බොහෝ ප්‍රභූවරුන්ගේ දේශපාලනයෙන් මේ රට ඉදිරියට ගොස් තිබේ ද යන්න ද මේ තරුණ අරගලකරුවන් විසින් නඟනු ලබන ප්‍රශ්නයකි. 56 දී බණ්ඩාරනායක විසින් සිදුකරන ලද දේශපාලන හා සංස්කෘතික විප්ලවය ගැන ද මෙහිදී සිහිපත් වේ. එහෙත් ඉනික්බිතිව රට යළිත් ආපසු ඒ අධිරාජ්‍යවාදී අනුකාරක පන්තිය සතු අභිමතයට යටත් විය. ඉංග්‍රීසීන්ගේ කතිර කොඩිය බිම දමා සිංහ කොඩිය ඔසවා තිබුණත් රට සිය ජාතික සංස්කෘතික අනන්‍යතාව ද විනාශ කරගෙන ඇත.


කෙසේ හෝ ගාලු මුවදොර විරෝධතාකරුවන් අපේක්ෂා කරන ශ්‍රී ලාංකික අභිමානයෙන් යුත් රටක් අපට ගොඩනැගිය හැකිද? ඒ සඳහා මේ ගතානුගතික හා යල්පිනු දේශපාලන හණමිටිකාරයන්ගෙන් ලැබෙන දායකත්වය කුමක්ද? අද අප මුහුණදී සිටින දේශපාලන අර්බුදය මේ වැඩවසම් ප්‍රභූ, වඩාත් නිවැරදිව කිවහොත් චෞර ප්‍රභූවරුන්ගේ ආධිපත්‍ය බිඳ දැමීමේ අභියෝගයයි. රටම ආර්ථික හා දේශපාලන සුනාමියකට හසුව තිබියදීත් පාර්ලිමේන්තුවේ විපක්ෂවලට ඒ විනාශයෙන් ගොඩ ඒමට වඩා ඇටුවන් බහින ලද දේශපාලන එදිරිවාදිකම් හා න්‍යායාත්මක තර්ක වැදගත්වී තිබෙන බවද රහසක් නොවේ. රනිල් අගමැති වීමේ ක්‍රියාවලිය හා ඔහුගේ භූමිකාව දෙස රටේ අවධානය යොමු වූයේත් ඒ පසුබිම තුළ නොවේද? අගමැති රනිල් ගැලවුම්කාරයා වන්නේ රටේ ද එසේ නොවේනම් රාජපක්ෂවරුන්ගේද යන ප්‍රශ්නය පක්ෂ දේශපාලන තෘෂ්ණාව රහිත සියලු පුරවැසියකු තුළම තිබෙන ස්වභාවික ප්‍රශ්නයකි. රනිල් සිය මාමණ්ඩිය වූ ජයවර්ධන මෙන් ෂේක්ස්පියර් උපුටා නොගෙන අග්‍රගණයේ මාක්ස්වාදී නාට්‍යකරුවකු වූ බර්ටෝල්ඩ් බ්‍රෙෂ්ට් මතක් කරන්නේද නිකම්ම නොවේ. ඔහු හෙට අනිද්දා ධම්මපදය පමණක් නොව භගවත් ගීතාවද උපුටා දක්වනු ඇත. එහෙත් ඔහු පොහොට්ටුවෙන් යැපෙන දේශපාලන සරණාගතයකු පමණි. විමල්ලා, අනුර කුමාරලා කියන අර කපුටා ඔහුට කොටන්නට වුවහොත් කුමක් සිදුවිය හැකිද?

මේ ආණ්ඩුව සර්ව පාක්ෂික ආණ්ඩුවක් නොවන්නා සේම එය අන්තර්කාලීන ආණ්ඩුවක්ද නොවන බව ආණ්ඩුවත් එහි අනුගාමිකයනුත් හැර අන් සියල්ලෝම එකහෙළා පවසති. ශ්‍රීලනිප නායක මෛත්‍රීපාල පවසන්නේද මෙය පැරණි සාම්ප්‍රදායානුකූල ආණ්ඩුවක්ම බවය. ඒ මදිවාට තම පක්ෂයෙන් දෙදෙනකු ද බිලිබා ගෙන ඇමැති ධුර ලබාදීම ගැන ඔහුට කණස්සල්ලක්ද තිබේ. මෛත්‍රීපාල නිවැරදිය. මේ ආණ්ඩුවේ (කැබිනට්ටුවේ) සංයුතිය කුමක්ද? එහි ඇත්තේ මෙයට පෙර ආණ්ඩුවේ සිට ස්වාධීන වූ පක්ෂයක සාමාජිකයෙක් හා ශ්‍රීලනිපයෙන් කඩාගත් දෙදෙනෙකි. ඊට අතරව සිටින හරීන් හා මනුෂ ද ස.ජ.බ. නියෝජනය නොකරති. සෙසු ඇමැතිවරු සියල්ලෝම මෙයට පෙර ඇමැති පදවි ලද්දෝය. සමහරුන්ට අලුත් ඇමැතිකම් ලැබී ඇත. එනිසා ඒ ඇමැතිවරු, අලුත් ඇමැති ඇඳුම් ආයිත්තන්වලින් සැරසුණු පරණ මුහුණුමය. ඔවුන්ගෙන් කී දෙනෙකුට ජනතා ප්‍රසාදයක් තිබේද යන්නත් අපට කිව නොහැක. මේ රට මේ වළට ඇදගෙන ගොස් ඇත්තේද ඔවුන් ක්‍රියාකාරීව සිටි කැබිනට්ටුවක් යටතේම නොවේද? කුමක් වුවත් මුදල් ඇමැති ධුරය ද හිමිවූ අගමැති රනිල් කියන්නේ සංවර්ධන වැඩද තාවකාලිකව නවත්වා සහනසීලී කෙටි අයවැයක් ඉක්මනින්ම ඉදිරිපත් කරන බවය. එබඳු වාතාවරණයක් යටතේ මේ ඇමැතිවරුන්ගෙන් වැඩි දෙනකුගේ කාර්ය භාරය කුමක් විය හැකිද? ඒ මදිවාට තවත් රාජ්‍ය ඇමැතිවරුන් දුසිමක් දෙකක්ද පත්වුවහොත් සිදුවන්නේ කුමක්ද?

කෙසේ හෝ අගමැති රනිල්ගෙන් මේ ආර්ථික අර්බුදයට සහනයක් ලබාගත හැකි යැයි සිතන පිරිස්ද වෙති. නීතිඥ සංගමය ඇතුළු ඇතැම් වෘත්තිකයන් අදහස් කරන්නේද ඔහු ලවා මේ අර්බුදය විසඳා ගත යුතු බවය. එහෙත් ඔහුගේ දේශපාලන වාර්තාව දුර්වල එකකි. අගමැති පදවියට පත්වූ වහාම ඔහු කැඳවා ගත්තේ තම පරාජිත දේශපාලන නඩයයි. එයින් පැහැදිලි වන්නේ ඔහුගේ චින්තන සීමා පථය තවම පරණ රවුමේ හිර වූවක් බවය. එහෙත් මේ අර්බුදයට උරදී සිටින අගමැති රනිල්ගේ කකුලෙන් ඇදීම කෙළවර විය හැක්කේ කිසිවෙක් නොදකින විනාශයකින්ද විය හැකිය. ආර්ථික හා සමාජ පීඩනය උග්‍රවන විට නැඟෙන ජනතා විරෝධතාව මැඩලීම ද පහසු නොවනු ඇත. ඒ සැබෑ ජනතා විරෝධය තුළට රිංගා ගන්නා අවස්ථාවාදීන්, මංකොල්ලකාරයන් ඇතුළු මැර කණ්ඩායම්ද රට යළිත් ගිනි තබන තැනට පත්වුවහොත් ඊළඟට තිබෙන විකල්පය හමුදාව කැඳවීම පමණි. ඉන්පසු ඇතිවිය හැකි තත්ත්වය ගැන කිසිවකුට අනාවැකි කිව හැකිද? මේ වනවිටත් හමුදාව අපේ දොරකඩය. එසේම ප්‍රජාතන්ත්‍රවාදය සූදුවක් ලෙස යටිතලයේ ක්‍රියාකරන බවද අප තේරුම්ගත යුතුය.

මේ සියල්ලටම අමතරව මේ වනවිට තවත් දේශපාලන සංවාදයකට තුඩුදෙන මාතෘකාවක්ද සමාජ ගතවී තිබේ. ඒ 21 වන සංශෝධනය මගින් විධායකයේ බලය අඩුකර, ව්‍යවස්ථාදායකය බල ගැන්වීමය. තවමත් වලංගුව තිබෙන ජනාධිපති හා 225 දෙනාම ගෙදර යා යුතුය යන සටන් පාඨයට සවන් දුන් බව අඟවන යෝජනාවක් ලෙස ද 21 සංශෝධනය හැඳින්විය හැකිය. මේ සමස්ත දේශපාලනයම අවුල් කළ ද්විත්ව පුරවැසි බැසිල් පාර්ලිමේන්තුවෙන් ඉවත් කිරීම ද මෙහිදී සිදුවන බව දැනටමත් සමහරු පවසති. එයට අමතරව විගණනය ප්‍රසම්පාදනය ඇතුළු වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ද පාර්ලිමේන්තුවට එක්වන බව ද පෙන්වාදී තිබේ. එය ප්‍රජාතන්ත්‍රවාදී සියපත විකසිත වීමක් ලෙස පිළිගත හැකිය. ප්‍රජාතන්ත්‍රවාදී හා මානුෂවාදී දේශපාලන සංස්කෘතියක් උදෙසා කෙරෙන යෝජනාවලියක් රටට අවශ්‍යය. ජනතාවාදී පාලනයක මූලධර්ම විනාශ කළ රාජපක්ෂවරුන් යළි ඒවා බලාත්මක කිරීමට පෙළඹී ඇත්තේ ගාලු මුවදොර විරෝධතාවට ප්‍රතිචාර දැක්වීමටය. ප්‍රජාතන්ත්‍රවාදී උල්පත්වලට අවහිර කළ 20 වැනි සංශෝධනය ඉවත් කිරීම ප්‍රබල දේශපාලන පියවරක් ද වේ. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතුය යන සටන් පාඨය විපක්ෂ නායක සජිත්ගේ අතේද තිබෙන්නකි. එහෙත් මේ 21 ගැන ඔහු තුළ පැහැදීමක් නැති බවද පෙනේ. එසේම පොහොට්ටුවේ ලේකම්වරයා පසුගිය දිනක පවසා තිබුණේ මේ වෙලාවේ ප්‍රමුඛතාව දිය යුත්තේ ආර්ථික අර්බුදය විසඳාලීමට බවය. ඔහුගේ කටහඬ අපට මතක් කළේ බයිබලයේ එන 'අත ඊසොප්ගේ වුවද හඬ ජාකොබ්ගේය' යන පාඨයයි.

මේ සම්බන්ධයෙන් සජබ හර්ෂ ද සිල්වා ද පසුගිය දිනක පුවත්පත් සාකච්ඡාවකදී කරුණු දක්වා තිබුණි. තම පක්ෂය විසින්ද 21 සංශෝධනයක් යෝජනා කළ බවද ඔහු සඳහන් කර ඇත. ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම මෙන්ම එම ධුරයෙන් වත්මන් ජනාධිපතිවරයා ඉවත්වන කාල වකවානුවක් ගැන විමසූ බවද ඔහු පවසා තිබුණි. තමන් ඇතුළු කබීර් හෂීම්, ඉරාන් වික්‍රමරත්න හා රංජිත් මද්දුම බණ්ඩාර ද ජනාධිපතිවරයා සමග දීර්ඝ සාකච්ඡාවක් කර තිබියදී ඒවා නොතකා පස්සා දොරෙන් රනිල් අගමැති කළ බවට ඔහු චෝදනාවක්ද කර ඇත. රනිල් කිසිදු කොන්දේසියක් නොමැතිව එම ධුරයට පත්වූ බවද හර්ෂගේ තවත් විවේචනයකි. ඔහුට අනුව නම් රනිල් යනු රාජපක්ෂ රැකඩයකි. මේ සියලු වාතාවරණය තුළ 21 අනාගතය ද රැඳී තිබෙන බව පැහැදිලිය.



● ගාමිණී සුමනසේකර

# රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීම හරි වෙලාවේ ගන්න වැරදි තීරණයක් ද ?



සති හයකින් අන්තර්කාලීන අයවැයක් ගෙනෙන බව අග්‍රාමාත්‍ය සහ මුදල් ඇමැති රනිල් වික්‍රමසිංහ මහතා පවසා ඇත. මේ වසර (2022) සඳහා දැනට ඉදිරිපත්ව ඇති අයවැය අලුත් තත්ත්වයන් අනුව මේ වන විට බොහෝ දුරට යල්පැනගිය එකකි. ඇත්ත වශයෙන්ම හිටපු මුදල් ඇමැති බැසිල් රාජපක්ෂ මහතා 2022 අයවැය ගෙනාවේ ගිය වසරේ නොවැම්බර් මාසයේ දීය. එහෙත් එය ඒ වන විටත් රට මුහුණ දී සිටි විදේශ විනිමය අර්බුදය හෝ ජනයා මුහුණදී සිටි අමාරු ආර්ථික තත්ත්වය සලකා බලා ඒවාට විසඳුම් ලැබෙන පරිදි සැලසුම් කළ අයවැයක් නොවීය. එසේම ඉන් පසුව 2022 මාර්තු මස මුලදී මහ බැංකුව විසින් දීර්ඝ කාලයක් රු. 203 ක අගයේ අල්ලාගෙන සිටි රුපියල එක විටම අතහැර පා කළ නිසා විදේශ විනිමය අනුපාතය දිගින් දිගටම ඉහළ ගොස් විශාල වශයෙන් බඩු මිල වැඩි වී තිබේ. විශාල අගයන්ගෙන් ඉන්ධන මිල ගණන් කිහිප වරක් වැඩි වීමත් සමග තවදුරටත් බඩු මිල වැඩි වෙමින් තිබේ. මේ අනුව උද්ධමනය මේ වන විට සියයට 30 ද ඉක්මවා ගොස් ඇති අතර සියයට 40 ද ඉක්මවා උද්ධමනය ඉහළ යනු ඇති බව ද පැවසේ. එහෙත් ජනයාගේ ආදායම් මට්ටම් හෝ වැටුප් වැඩි වී නැත. මේ නිසා ජනයාට දැන් තිබෙන්නේ ජීවත්වීමට ඉතාම අපහසු තත්ත්වයකි. මෙය ඉතාම දිළිඳු අයට පමණක් නොව සාමාන්‍ය මාසික වැටුප් ලබන අයටත් ඉතාමත් අපහසුවෙන් හිඟා නොකා හිඟාකමින් ජීවත් වීමට සිදුව ඇති මොහොතකි. මේ නිසා ඉදිරි අන්තර්කාලීන අයවැයෙන් අවශ්‍ය කරන්නේ අප සිතන්නේ ජනයාට පොදුවේ සහන සලසන වැඩපිළිවෙළකි.

## ● රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීම

ජීවන වියදම වැඩි වීමට මුහුණ දීම සඳහා සහන අයවැයෙන් රජයේ සේවකයන්ගේ මාසික වැටුප වහාම ක්‍රියාත්මක වන පරිදි වැඩි කිරීමට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා තීරණය කර තිබෙන බව පෙරේදා (27) මාධ්‍ය වාර්තා කර තිබිණි. අග්‍රාමාත්‍යවරයා මෙම තීරණය ගෙන ඇත්තේ දිනෙන් දින වැඩිවන ජීවන වියදමට මුහුණ දීමට රජයේ සේවකයන්ට ශක්තියක් දීම සඳහා බව ද එම මාධ්‍ය වාර්තාවල සඳහන් විය. 2015 වසරේ යහපාලන රජය බලයට පත් වූ විගස දින සියයක් ඇතුළත රජයේ සේවකයන්ගේ වැටුප රුපියල් 10,000 කින් වැඩි කිරීමට පියවර ගත් බව අපට මතකය. අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ උපදෙස් මත යහපාලන රජය සමයේ වැටුප් වැඩි කිරීමට සාපේක්ෂව දෙගුණයක පමණ වැටුප් වැඩි කිරීමක් සහන අයවැයෙන් රාජ්‍ය සේවකයන්ට හිමි වනු ඇතැයි අපේක්ෂා කෙරෙන බව ද එම මාධ්‍ය වර්තාවක සඳහන්ව තිබිණි. රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීමට සමාන්තර ලෙස පෞද්ගලික අංශයේද වැටුප් වැඩිකරන ලෙස අගමැතිවරයා අයවැය ඉදිරිපත් කරමින් ඉල්ලා සිටීමට නියමිත බව ද සඳහන් වුවත් එය කිසිදා සිදුවන දෙයක් නොවේ. එය මේ මොහොතේ බොහෝ පෞද්ගලික ආයතනවලට කළ හැකි දෙයක් ද නොවන බව අපගේ අදහසයි. මේ නිසා මේ ඉදිරි අන්තර්කාලීන අයවැයෙන් මෙසේ රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීමක් සිදු කිරීමට යන බව පැවසුන ද කොපමණ අගයකින් රාජ්‍ය සේවක වැටුප් ස්ථිරවම වැඩි කිරීමට තීරණය කර තිබේ ද යන්න අප තවමත් දන්නේ නැත. මෙය වැටුප් වැඩි කිරීමට පමණක් නොව තිබෙන රාජ්‍ය සේවක වැටුප පවා ගෙවීමට රජයට මුදල් නැති මොහොතකි. එනම් තිබෙන රාජ්‍ය සේවක වැටුප පවා සල්ලි අච්චු ගසා ගෙවීමට සිදුව ඇති මොහොතකි. මේ නිසා රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීම නැවත සලකා බැලිය යුතු තීරණයකි. එය තවත් උද්ධමනය වැඩිවීමට තුඩුදෙන කරුණක් ද වනු ඇත.

## ● සල්ලි අච්චු ගසා වැටුප් ගෙවීම

මෙය ඩොලර් පමණක් නොව රාජ්‍ය බදු ආදායම ද හොඳටම පහත වැටී අපට රුපියල් ද නැති ඉතාම අමාරු රාජ්‍ය මූල්‍ය තත්ත්වයක් ඇති මොහොතකි. මේ පසුබිම තුළ මේ වෙලාවේ රජය සහ මහ බැංකුව නිවැරදි තීන්දු බොහොමයක් ගනිමින් සිටින බව පෙනේ. ඒ සියල්ල අපි අගය කරමු. එහෙත් මේ නිවැරදි තීන්දු අතරේ හරි වෙලාවේ වුවත් වැරදි තීන්දු ගැනීමෙන් අප වැළකිය යුතු වේ. මෙය රාජ්‍ය සේවකයන් පමණක් නොව සියලු දෙනාම අමාරුවෙන් සිටින මොහොතකි. රජයට කෙතරම් මුදල් නැතත් අවශ්‍ය නම් මුදල් අච්චු ගසා හෝ රාජ්‍ය සේවක වැටුප් ගෙවිය හැකිය. තවදුරටත් මුදල් අච්චු ගැසීමේ තීරණය දැනටමත් ගෙන තිබේ. ඒ ගැන අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ද පවසා ඇත. එහෙත් පෞද්ගලික අංශයට තම ආදායම් ප්‍රමාණවත් නැත්නම් සහ පවතින ආර්ථික තත්ත්වය හමුවේ පාඩු සිදු වෙනවා නම් ඔවුන්ට වැටුප් ගෙවීම සඳහා සල්ලි අච්චු ගැසීමට හැකියාවක් නැත. ඔවුන්ට සල්ලි අච්චු ගැසීමේ මැෂින් නැත. රජයට නම් සල්ලි අච්චු ගසා හෝ රාජ්‍ය සේවක වැටුප් ගෙවිය හැකිය. එහෙත් ඒ නිසා ඇතිවෙන උද්ධමනයට සහ බඩු මිල ඉහළ යාමට මුහුණ දෙන්නේ රාජ්‍ය සේවකයන් පමණක් නොව සමස්ත ජනතාවමය. අනිත් අතට රාජ්‍ය සේවකයන්ට වැටුප් ගෙවන්නේ ද බදු ගෙවන ජනතාවගේ මුදලෙනි. භාණ්ඩාගාර බිල්පත් නිකුත් කර මහ බැංකුව රජයට අරමුදල් දෙන්නේ මුදල් අච්චු ගසාය. ඒවා පසුව පොලියත් සමග පියවිය යුතුවේ. ඒ බර දරන්නේ පොදු ජනයායි. මේ ආර්ථික අර්බුදය කෙතරම් දරුණු වුවත් රාජ්‍ය සේවකයන්ගේ රැකියා නැති වන්නේ නැත. ඔවුන්ට දැනට ලැබෙමින් තිබෙන වැටුප් අඩු වන්නේ ද නැත. එහෙත් මේ දරුණු ආර්ථික අර්බුදය හමුවේ පෞද්ගලික අංශයේ ආයතන වසා දැමීම මෙන්ම ඒ නිසා බොහෝ දෙනෙක්ට රැකියා නැති වීම ද සිදුව ඇත. අප දන්නා පරිදි බොහෝ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බොහොමයක් වැසී ගොස් ඇත. එසේම බොහොමයක් පවත්වාගෙන යන ව්‍යාපාර ආයතන පවා ගෙනියන්නේ බොහෝ අමාරුවෙන් සහ පාඩු පිටය. බොහෝ පෞද්ගලික සේවකයන්ට කොරෝනාවට පසු මේ දක්වා කිසිදු වැටුප් වැඩි වීමක් හෝ බෝනස් ලැබීමක් සිදුව නැත. එසේම රැකියා අහිමි වීම ඇතුළුව තවත් තමන්ගේම ව්‍යාපාර කරන අයට නිෂ්පාදන වියදම් විශාල ලෙස ඉහළ ගොස් තම ව්‍යාපාර කටයුතු කිරීමට අපහසු තත්ත්වයන්ට මුහුණ දී සිටී. එනම් ඔවුන්ට දැන් කලින් ලැබුණු ආදායමවත් නොලැබෙන අතර පාඩු විඳීමට ද සිදුව ඇත. මේ නිසා රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීමේ තීරණය මේ සියලු දෙනාම තවත් අමාරුවට සහ පීඩාවට පත් කරන්නකි. ඒ නිසා මේ අතිශය අමාරු වෙලාවේ රාජ්‍ය සේවක වැටුප් වැඩි කිරීමට පියවර නොගෙන සිටීම වඩාත්ම සුදුසු බව අපගේ අදහසයි. මුළු මහත් ජනසමාජයම කැපවීම් කරමින් සිටින මේ මොහොතේ පොදුජනයා මත තවත් බර පටවා රාජ්‍ය සේවක වැටුප් වැඩි නොකළ යුතු බව කිව යුතු වේ. ඔවුන් ද මේ වෙලාවේ අමාරුවෙන් සිටින බව ඇත්තය. ඒ නිසා කළ යුතු වන්නේ රාජ්‍ය සේකයන් ද ඇතුළුව සියලු ජනතාවට පොදුවේ සහනයක් ලබාදෙන වැඩපිළිවෙළකි. රාජ්‍ය සේවකයන් සිටින්නේ ලක්ෂ දාහතරක් පමණකි. එහෙත් පෞද්ගලික අංශයේ සේවකයන් ලක්ෂ 65 කට අධික වන අතර අනෙකුත් සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර කරන අයත් තවත් ලක්ෂ ගණනකි. මේ සියලු දෙනා ගැනම අප සිතිය යුතුය. රාජ්‍ය සේවකයන්ගේ පමණක් වැටුප් වැඩි වී අනෙකුත් සියලු දෙනාගේ වැටුප් හෝ ආදායම් මට්ටම් වැඩි වීමක් සිදු නොවන්නේ නම් එහිදී ඇති වන්නේ විශාල විෂමතාවකි. මේ ගැන අග්‍රාමාත්‍ය සහ මුදල් ඇමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ, මුදල් අමාත්‍යාංශ ලේකම් මහින්ද සිරිවර්ධන මහතාගේ සහ මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා ඇතුළු මේ අවස්ථාවේ තීන්දු තීරණ ගන්නා සියලු ආර්ථික බලධාරීන්ට අපි සිහිපත් කර සිටිමු. අවශ්‍ය කරන්නේ ආර්ථිකය ගොඩ ගැනීමේ සාමූහික මෙහෙයුමකි. එයට රාජ්‍ය සේවකයන් ඇතුළු සියලු දෙනා කැපවීම් කළ යුතු වේ. රාජ්‍ය සේවකයන්ට වැටුප් ගෙවන ඔවුන්ගේ ස්වාමිවරු වන්නේ පොදු මහජනතාවයි.

## ● මූල්‍ය අරමුදලේ ප්‍රකාශය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ශ්‍රී ලංකාව සමග පැවැත්වූ පළමු වටයේ මාර්ගගත සාකච්ඡා ඉකුත් 24 දින අවසන් කළ අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය අරමුදලේ නියෝජිත කණ්ඩායම පසුගිය බ්‍රහස්පතින්දා (26 ) මාධ්‍ය නිවේදනයක් නිකුත් කළේය. එම සාකච්ඡාවලින් පසු ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන මූලික සොයාගැනීම් මෙහි ඉදිරිපත් කරන ඇත. Peter Breuer මහතා සහ Masahiro Nozaki මහතාගේ නායකත්වයෙන් යුත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) කණ්ඩායමක් මැයි 9-24 දක්වා කාලය තුළ ශ්‍රී ලංකා බලධාරීන් සමඟ අයිඑම්එෆ් ණය දීමේ විධිවිධානයකින් සහාය විය හැකි ආර්ථික වැඩසටහනක් ගැන සාකච්ඡා පැවැත්වීය. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති නන්දලාල් වීරසිංහ සහ භාණ්ඩාගාර ලේකම් මහින්ද සිරිවර්ධන ප්‍රමුඛ නියෝජිත කණ්ඩායම සමඟ පැවති තාක්ෂණික සාකච්ඡාවලින් අනතුරුව අයිඑම්එෆ් කණ්ඩායම සමාප්ති රැස්වීමේදී මාර්ගගතව අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා හමුවිය. එසේම එම කණ්ඩායම පෞද්ගලික අංශයේ නියෝජිතයන්, මූල්‍ය අංශය සහ සංවර්ධන හවුල්කරුවන් ද හමුවිය. සාකච්ඡා අවසානයේ දී අයිඑම්එෆ් කණ්ඩායම පහත ප්‍රකාශය නිකුත් කළේය.

"ශ්‍රී ලංකාව දුෂ්කර ආර්ථික තත්ත්වයන්ට සහ දැඩි ගෙවුම් ශේෂ ගැටලුවලට මුහුණ දී සිටී. මෑතකාලීන ආර්ථික දර්ශකවලින් පෙනී යන්නේ ඉන්ධන සහ විදුලි හිඟය හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම්වලට සෘණාත්මක ලෙස බලපා ඇති බවයි. ගෝලීය ආහාර හා තෙල් මිල ඉහළ යෑම ගෙවුම් ශේෂ පීඩනයට තවදුරටත් එකතු වී තිබේ. භාණ්ඩ හිඟය, ඉන්ධන මිල ඉහළ යෑම සහ මුදල් අවප්‍රමාණය වීම ඇතුළු බොහෝ සාධක මගින් උද්ධමනය වේගවත් වී ඇත. මෙම සන්දර්භය තුළ, පවතින අර්බුදකාරී තත්ත්වය ජනතාවට, විශේෂයෙන්ම දිළිඳු සහ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට ඇති කරන බලපෑම පිළිබඳව අපි දැඩි කනස්සල්ලට පත්ව සිටිමු. සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීම සඳහා පුළුල් ප්‍රතිසංස්කරණ පැකේජයක් පිළිබඳ අයිඑම්එෆ් කණ්ඩායම තාක්ෂණික සාකච්ඡා පැවැත්වීය. ආර්ථික තත්ත්වය තක්සේරු කිරීමේදී සහ ඉදිරියට ගත යුතු ප්‍රතිපත්ති ප්‍රමුඛතා හඳුනාගැනීමේදී කණ්ඩායම හොඳ ප්‍රගතියක් ලබා ඇත. අවදානමට ලක්විය හැකි සහ දුප්පතුන් ආරක්ෂා කරමින් මූල්‍ය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීම කෙරෙහි සාකච්ඡාවල අවධානය යොමු විය. මුදල් ප්‍රතිපත්ති සහ විනිමය අනුපාත පාලන ක්‍රමවල විශ්වසනීයත්වය සහතික කිරීම, මූල්‍ය අංශයේ ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සහ වර්ධනය වැඩි දියුණු කිරීමට සහ පාලනය ශක්තිමත් කිරීමට ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අවධානය යොමු වූ අතර මෙම සාකච්ඡා බලධාරීන්ට ඔවුන්ගේ ප්‍රතිසංස්කරණ වැඩසටහන සකස් කිරීමට උපකාරී වනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

රාජ්‍ය ණය තිරසාරභාවය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ වැදගත් පියවරක් ලෙස ඔවුන්ගේ ණයහිමියන් සමඟ සහයෝගී සංවාදයක යෙදීම සඳහා මූල්‍ය හා නීති උපදේශකයන් පත් කිරීම කණ්ඩායම විසින් සාදරයෙන් පිළිගත්තේය. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය තිරසාර නොවන ලෙස තක්සේරු කර ඇති බැවින්, ශ්‍රී ලංකාව සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය දක්වන වැඩසටහනකට විධායක මණ්ඩලයේ අනුමැතිය සඳහා ණය තිරසාර බව ප්‍රතිෂ්ඨාපනය කරන බවට ප්‍රමාණවත් සහතිකයක් අවශ්‍ය වේ.

අයිඑම්එෆ් කාර්ය මණ්ඩලය, ආර්ථික හා දේශපාලන තත්ත්වය ඉතා සමීපව අධීක්ෂණය කරන අතර අයිඑම්එෆ් සහාය දක්වන වැඩසටහනක් යටතේ සංයුක්ත පියවරයන් සැකසීමට බලධාරීන් සමඟ මෙන්ම අර්බුදය කාලෝචිත ලෙස විසඳීමට සහාය වීම සඳහා පුළුල් පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වනු ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිපත්තිවලට අනුකූලව මෙම දුෂ්කර අවස්ථාවේ ශ්‍රී ලංකාවට සහාය දැක්වීමට අපගේ කැපවීම අපි යළිත් තහවුරු කරමු. දූත මෙහෙවර තුළ අයිඑම් එෆ් කාර්ය මණ්ඩලය ඔවුන්ගේ ඵලදායී නියැළීම සහ සහයෝගය සඳහා බලධාරීන්ට ඔවුන්ගේ කෘතඥතාව පළ කරති.''

## ● ආර්ථිකය ස්ථාවර කර ගැනීම

දැනට අපගේ ආර්ථිකයේ ඇත්තේ අස්ථාවර තත්ත්වයකි. බඩු මිල ගණන් ද වේගයෙන් ඉහළ යමින් තිබේ. මේ නිසා උද්ධමනය තවදුරටත් ඉහළ යනු ඇති බව ද බලධාරීන් ප්‍රකාශ කර ඇත. මේ නිසා සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අනුගමනය අපේ ආර්ථිකය ස්ථාවර කර ගැනීමට ක්‍රියා කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් අදහසක් මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා පසුගිය දා ප්‍රකාශ කළේය. ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය සහ මාධ්‍ය සමාජය ඉකුත් මැයි 23 දා සවස කොළඹ හිල්ටන් හෝටලයේදී සංවිධානය කර තිබූ හමුවේ ප්‍රධාන ආරාධිත දෙසුම පවත්වමින් මහ බැංකු අධිපතිවරයා මේ බව කීවේය. එනම් ඔහු කීවේ මේ වනවිට සැලසුම් කර ඇති ප්‍රධාන කරුණු ඉදිරි මාස 6, 7 තුළ සම්පූර්ණ කර ගත හැකි වුවහොත් මාස 12 කින් පමණ ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථාවර තත්ත්වයකට පත්කර ගැනීමට හැකි වනු ඇතැයි තමා සිතන බවයි. එය සතුටුදායක කරුණකි. එහෙත් ඒ සඳහා අප සැලසුම් කර ඇති ප්‍රධාන කරුණු ඉදිරි කාලයේ සාර්ථකව සම්පූර්ණ කරගත හැකි විය යුතු වේ. ඒ සඳහා ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග සාකච්ඡා පැවැත්වීම සහ විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම යන කාරණා ඉදිරි මාස 6, 7 තුළ සම්පූර්ණ කර ගත හැකිවිය යුතුය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් අපට මූල්‍ය පහසුකම් ලබාගත හැකි වන්නේ එවිටය. ඒ සමගම මහ බැංකු අධිපතිවරයා කීවේ තමා කියන්නේ භාණ්ඩ මිල ගණන් පහළ යෑමක් ගැන නොව ආර්ථිකය දැනට පවතින තත්ත්වයට වඩා යහපත් මට්ටමක ස්ථාවර වනු ඇති බවයි. එසේම ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා එහිදී මෙසේ ද කීවේය.

මේ පවතින විදේශ විනිමය අර්බුදයට දිගුකාලීන විසඳුම වන්නේ අප විදේශ විනිමය වියදම් කරනවාට වඩා විදේශ විනිමය උපයන රටක් බවට පරිවර්තනය වීමයි. මේ අනුව මැදිකාලීනව සහ දිගුකාලීනව අපි අපේ රටේ විදේශ විනිමය ඉපැයීමේ හැකියාව වර්ධනය කරගත යුතුයි. එසේ නැතහොත් අපට දිගින් දිගටම ඉදිරියේදීත් විදේශ විනිමය අර්බුදයන්ට මුහුණ දීමට සිදුවෙනවා.''

මේ නිසා මේ අවස්ථාවේ ආර්ථික අර්බුදය සමනය කිරීමට හදිසි පියවරයන් ගන්නා අතරම මැදි හා දිගුකාලීනව අපගේ විදේශ විනිමය උපයන හැකියාවන් වර්ධනය කිරීමට යොමු වීම අත්‍යවශ්‍ය වේ. නැතහොත් මේ වෙලාවේ අමාරුවෙන් හෝ මේ විනිමය අර්බුදය සමනය කර ගත්තත්, ඉදිරියේ දී නැවත නැවත අපට විනිමය අර්බුදයන්ට මුහුණ දීමට සිදුවනු ඇත.

## ● ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමිගේ ස්ථාවරය

පසුගිය දිනවල සමාජජාල මාධ්‍යවල පවා වත්මන් මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා ඉවත් කර නැවත හිටපු මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා පත් කිරීමට යන බවට නොයෙකුත් පුවත් පළ වී තිබිණි. මේ ගැන මේ ලියුම්කරු හිටපු මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතාගෙන් විමසීමක් කළ අතර ඒ සඳහා ඔහු ලබා දුන්නේ මෙවැනි පිළිතුරකි.

''නැවත ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා වීමට මගේ කිසිදු අපේක්ෂාවක් නැහැ. වත්මන් මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා මේ අමාරු අවස්ථාවේ මහ බැංකු අධිපතිවරයා වශයෙන් විශිෂ්ට කාර්යභාරයක් කරගෙන යනවා.''

මේ නිසා වත්මන් මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතාට ආචාර්ය කුමාරස්වාමි මහතාගෙන් ලැබී ඇත්තේ හොඳම සහතිකයකි. ඔහු පැමිණ මෙතෙක් කළ කාර්යභාරය ගැන මහජනතාව තුළ ද ප්‍රසාදයක් ඇතිව තිබේ. මේ නිසා රජයත් මහ බැංකුවත් එක්ව දුකට පත්ව සිටින මහජනයාටත් සහනයක් ඇති වෙන පරිදි මේ ආර්ථික අගාධයෙන් රට මුදා ගත යුතු අතර ඒ සඳහා සියලු දෙනාගේ සහාය සහ දායකත්වය අවශ්‍ය වනු ඇත. එහිදී තවදුරටත් වැරදි ආර්ථික තීරණ ගැනීමෙන් වැළකී සිටින ලෙස අපි රජයට සහ සියලු ආර්ථික බලධාරීන්ට සිහිපත් කරමු.

● ශ්‍යාම් නුවන් ගනේවත්ත
shyam.divaina@gmail.com

# ● රටක හෙටක් වෙනුවෙන් ගත් තීන්දු තීරණ

**වත්මන් අගමැතිවරයා පත්වූ දා පටන් මේ වනතෙක් ගත් ක්‍රියාමාර්ග බොහෝමයක් රටට හිතකර සාධනීය ඒවා බව අග්‍රාමාත්‍ය කාර්යාලය කියන්නේය. ඒ බැව් සනාථ කරනු පිණිස දින වකවානු සහිතව ගත් තීන්දු තීරණ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහිත දිගු සටහනක් අප වෙත ඒවා තිබිණි. වත්මන් දේශපාලන අර්බුද තත්ත්වය ගැන අවධානය යොමු කරන, ඒ ගැන අධ්‍යයනය කරන අයගේ දැන ගැනීම පිණිස ඉන් තෝරාගත් කොටසක් අප මෙසේ ඉදිරිපත් කරන්නෙමු.**

**● 2022.05.13**

(i). ඉන්දියානු මහ කොමසාරිස් හමුවීම
(ii). ජපාන තානාපති හමුවීම
(iii). ඇමෙරිකානු තානාපතිතුමිය හමුවීම
(iv). චීන තානාපති හමුවීම
(v). විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ පවතින අර්බුද පිළිබඳ සාකච්ඡාව
(ඉන්දියානු නියෝජ්‍ය මහ කොමසාරිස්වරයාගේ සහභාගිත්වයෙන්)
(vi). අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයීම හා ඊට අදාළ ගැටලු පිළිබඳ සාකච්ඡාව

සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා හා කාංචන විජේසේකර මැතිතුමාගේ සහභාගිත්වයෙන් පැවැති රැස්වීමේදී විදුලිබල, බලශක්ති හා ගෑස් ක්ෂේත්‍රයන්ට අයත් අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතනවලින් අදාළ තොරතුරු හෙට වන විට (2022.05.14) ගෙන්වා ගැනීමට උපදෙස් දෙන ලදී.

එම ලබා ගන්නා තොරතුරු ආශ්‍රයෙන් පවතින ගැටලු හා ඒ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් 2022.05.16 වන සඳුදා දින ඉදිරිපත් කිරීමට නියමිතය.

**● 2022.05.14**

(i). විදුලිබල හා බලශක්තිය සම්බන්ධයෙන් 2022.05.13 දින පැවැත්වූ රැස්වීමේ පසුවිපරම් කිරීමේ සාකච්ඡාව.
(ii). මූල්‍ය ගැටලු පිළිබඳ සාකච්ඡාව
(iii) අත්‍යවශ්‍ය පාරිභෝගික සේවා පිළිබඳ සාකච්ඡාව
(iv). පෞද්ගලික හා පොදු ප්‍රවාහන සේවය පිළිබඳ සාකච්ඡාව
(v). සෞඛ්‍ය ගැටලු සම්බන්ධ සාකච්ඡාව
(vi). වරාය ගාස්තු හා ඒ ආශ්‍රිත ගැටලු පිළිබඳ සාකච්ඡාව

ඉන්දියානු ණය ක්‍රමය යටතේ ගෑස් ආනයනය කිරීම සඳහා ඩොලර් මිලියන 160ක ප්‍රතිපාදන ඇති අතර, ඒ මගින් ඉදිරි මාස 03ක කාලසීමාවකට ගෑස් ආනයනය සපුරා ගැනීමට නියමිතයි. ඒ සඳහා කඩිනමින් ප්‍රසම්පාදන කටයුතු අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට මේ වන විට අමාත්‍ය මණ්ඩලයක් පත් කොට නොමැති බැවින්, ඒ සඳහා ජනාධිපතිතුමාගේ අනුමැතිය කඩිනමින් ලබා ගැනීම.

ආනයනික භාණ්ඩ අදාළ ගාස්තු ගෙවා වරායෙන් නිදහස් කර ගැනීමට ප්‍රමාද වීම වෙනුවෙන් ගෙවීමට සිදුවන වරාය ප්‍රමාද ගාස්තු සම්බන්ධයෙන් ආනයනකරුවන් සඳහා සහන ලබා ගැනීමට මෙරට ප්‍රධාන පර්යන්ත 03හි ප්‍රධානීන් සමඟ සාකච්ඡා කරන ලදී. එහිදී 2020 වර්ෂයේ සිටම මෙරට පැවති අයහපත් ආර්ථිකය සැලකිල්ලට ගනිමින් දිය හැකි උපරිම සහන සලසා ඇති බවත්, අදාළ මූලික ගාස්තු පමණක් අය කර ඇති බවත් ප්‍රධාන පර්යන්ත 03හි ආයතන ප්‍රධානීන් පැහැදිලි කරන ලදී. එහිදී ආනයනකරු විසින් භාණ්ඩ නිදහස් කර ගැනීමේදී අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත් නිවැරදි අයුරින් ඉදිරිපත් කළහොත් මෙම සහන ලබා ගැනීමේදී කිසිදු ගැටලුවක් ඇති නොවන බවත්, ඒ හැර වෙනත් ගැටලු පැනනැඟුණහොත් අදාළ පර්යන්තවල කාර්ය මණ්ඩලය සමඟ සාකච්ඡා කර විසඳාගත හැකි බවත් දැනුම් දී තිබේ.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් දේශීය සැපයුම්කරුවන්ට ගෙවීමට ඇති හිඟ මුදල් කොටස් වශයෙන් හෝ ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නව අයවැයක් මගින් සපයාදීමට කටයුතු කිරීම. එමගින් නැවතත් එම දේශීය සැපයුම්කරුවන්ගෙන් ණය පදනම මත ඖෂධ සපයා ගැනීමට කටයුතු කිරීම.

විවිධ අමාත්‍යාංශවල වැඩ අරඹා නොමැති හෝ අවලංගු කළ හැකි ඉදිකිරීම් වැනි ව්‍යාපෘති වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන හදිසි හා අත්‍යවශ්‍ය ඖෂධ මිලදී ගැනීම සඳහා යොමු කිරීම.

රෝහල් හා දේශීය ඖෂධ නිෂ්පාදකයන් සඳහා ප්‍රමුඛතා පදනම මත විදුලි ජනන යන්ත්‍රවලට අවශ්‍ය ඩීසල් ලබා දීමට කටයුතු කිරීම.

අදාළ රාජ්‍ය අමාත්‍යාංශය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් දේශීය බෙහෙත් වර්ග නිෂ්පාදනය සඳහා මේ වන විට ආනයනය කොට ගෙන්වා ඇති අමුද්‍රව්‍ය රේගුවෙන් නිදහස් කර ගැනීමේදී ඇති වී ඇති ගැටලු විසඳීම සඳහා අවශ්‍ය වන අනුමැතිය කඩිනමින් ලබා දීමට සුදුසු වැඩපිළිවෙළක් සැකසීම.

බෙහෙත් වර්ගවල මිල තීරණය කිරීම සඳහා මාසික මිල කමිටු රැස්වීමක් පැවැත්වීම. දේශීය ගෝස් නිෂ්පාදනයට අවශ්‍ය යාන් ලබා ගැනීම සඳහා ඉන්දියානු රජය සමඟ සාකච්ඡා කිරීම. දේශීය ඖෂධ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය සඳහා ප්‍රමුඛතාව ලබාදීමට පහසුවීම පිණිස HS කේත හඳුන්වාදීම පිළිබඳ සලකා බැලීම.

අත්‍යවශ්‍ය ආහාර ආහාර ආනයනය සම්බන්ධයෙන් ආනයනකරුවන් මුහුණ දී ඇති ගැටලු සම්බන්ධව අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්ගේ මැදිහත්වීම මත සහන ලබාදීම.

**● 2022.05.15**

ලැබෙමින් පවතින ඩීසල් තොගය මුළු අවශ්‍යතාවයෙන් 75%ක් පමණක් සැපයීමට ප්‍රමාණවත් හෙයින් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව එක්ව අදාළ සියලු පාර්ශ්වයන්ගේ අවශ්‍යතා සපිරෙන පරිදි නිසි බෙදාහැරීම් සැලසුමක් සකස් කරන මෙන් අග්‍රාමාත්‍යතුමා උපදෙස් දෙන ලදී.

මූල්‍ය මණ්ඩලයක් පත් කිරීම සම්බන්ධව අග්‍රාමාත්‍යතුමා හා විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා සමඟ එක්ව ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට යෝජනා විය.

ඉන්ධන නෞකා සඳහා කළ යුතු ගෙවීම් පිළිබඳ නිසි සැලැස්මක් සකස් කරන මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරමින් පැමිණි නිලධාරිනියට උපදෙස් දෙන ලදී.

**● 2022.05.20**

(i). ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සහ සංශෝධනයන්ට අදාළව නීතිපති, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සහ නීති ක්ෂේත්‍රයේ විද්වතුන් සමඟ පැවැත්වූ සාකච්ඡාව.

ආචාර්ය විජයදාස රාජපක්ෂ මැතිතුමා සහ නීතිපතිතුමා විසින් යෝජිත 21 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අදාළ සංශෝධනයන් තවදුරටත් පැහැදිලි කර දෙන ලදී. තවද, නීති කෙටුම්පත් සම්පාදක විසින් අදාළ කෙටුම්පතෙහි සංශෝධනයන් කඩිනමින් සිදු කර යොමු කර තිබෙන බව දන්වන ලදී.

**● 2022.05.23 වන දින අග්‍රාමාත්‍ය කාර්යාලයේ පැවැති සාකච්ඡාවන් හා ගනු ලැබූ තීරණ**

(i). ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා වන තාක්ෂණ කමිටුවේ නීති උපදේශකවරුන් පත් කිරීම මීට අදාළ පත්කිරීම් සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට තීරණය විය.
(ii). වර්තමාන ආර්ථික තත්ත්වය හා අයවැය සමාජ සුබසාධන ගෙවීම සඳහා ප්‍රතිලාභීන් හඳුනා ගැනීමට ඉන්දියානු සහය යටතේ ඉන්දියානු ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.

බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන මෙන් උපදෙස් ලබාදීම.
අන්තර්කාලීන අයවැයක් ඉදිරිපත් කිරීම.
කෘෂිකර්මාන්තය නවීකරණය කිරීම.
ඉන්දියානු ණය යෝජනා ක්‍රමය පිළිබඳ සාකච්ඡාව

**● 2022.05.25**

1. ඖෂධ හිඟය ඇතුළු සෞඛ්‍ය අංශය මුහුණ පා ඇති ගැටලු සම්බන්ධ සාකච්ඡාව

දිගුකාලීන විසඳුම් වශයෙන් ඖෂධ මිල ගණන් ඉහළ යෑමත් සමඟ දේශීය වෛද්‍ය ක්‍රමයට යොමුවන පිරිස වැඩිවන බැවින්, දේශීය වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම.

● අකිත පෙරේරා

**මුදල් අමාත්‍යවරයාගේ, මුදල් අමාත්‍යංශයේ මෙන්ම කැබිනට් මණ්ඩලයේ සාමුහික වගකීම පිළිබඳව බරපතළ අර්බුදකාරී තත්ත්වයක් නිර්මාණය වී ඇත. මුදල් මණ්ඩලය සම්බන්ධයෙන්ද කීමට ඇත්තේ එයමය. සමස්ත පාර්ලිමේන්තු ක්‍රියාවලියම අභියෝගයට ලක්වී ඇත. කොවිඩ් ව්‍යසනය ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් කළත්, රටේ බංකොලොත්භාවයට ප්‍රධානතම හේතුව පොහොට්ටු ආණ්ඩුවේ මුදල් අමාත්‍යාංශය සහ මූල්‍ය මණ්ඩලය බව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියේ අවධාරණය වී ඇත. ශ්‍රී ලංකාව අසරණ කළ නැතහොත් ජාත්‍යන්තරය ඉදිරියේ හිඟමනට පත්කළ ක්‍රියාවලියට වගකිව යුත්තන් හෙළිදරව් වී ඇත.**



# ආර්ථික ඝාතකයෝ !

ශ්‍රී ලංකාව බංකොලොත්භාවයට පත් කළ කණ්ඩායම පසුගියදා පාර්ලිමේන්තුවේදී හෙළි විය. රට බංකොලොත් බව සම්බන්ධයෙන් කිසිඳු වාද විවාදයක් තිබිය නොහැක. විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය යන රටේ බලකණු තුනම මෙම තත්ත්වය හොඳින්ම දනී.

ශ්‍රී ලංකා මහා බැංකුවේ අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ ඇතුළු ඉහළ නිලධාරීන් කණ්ඩායමක් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව (සභාපති අනුර ප්‍රියදර්ශන යාපා) සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (සභාපති මහාචාර්ය චරිත හේරත්) ඉදිරියේ පිළිවෙලින් මැයි 24 සහ 25 කළ හෙළිදරව්ව අතිශය ආන්දෝලනාත්මකය. බරපතළය. සමස්ත රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් ජනතාවගේ විශ්වාසය සම්පූර්ණයෙන්ම බිඳ දමා ඇත.

එවකට මුදල් ඇමැතිධූරය දැරූ (2019 නොවැම්බර් -2021 ජූලි) මෑතකදී ඉල්ලා අස්වූ අගමැති මහින්ද රාජපක්ෂ, මහා බැංකුවේ අධිපති ධූරය දැරූ මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් (2019 දෙසැම්බර් - 2021 සැප්තැම්බර්) සහ අජිත් නිවාඩ් කබ්රාල් (2021 සැප්තැම්බර් - 2022 මාර්තු), ජනාධිපති ලේකම් ආචාර්ය පී. බී. ජයසුන්දර (2019 දෙසැම්බර් - 2021 දෙසැම්බර්), මුදල් ලේකම් එස්. ආර්. ආටිගල (2019 සැප්තැම්බර් - 2022 අප්‍රේල්) සහ සමස්ත කැබිනට් මණ්ඩලයම අනුගමනය කළ අදූරදර්ශී, වගකීම් විරහිත ක්‍රියාදාමය ශ්‍රී ලංකාව බංකොලොත් කළ බවට නිල වශයෙන් ප්‍රකාශ කර ඇත.

මුදල් මණ්ඩලයේ සාමාජික ව්‍යාපාරික සමන්ත කුමාරසිංහද සමස්ත අර්බුදයට වගකිව යුතු බව එම මණ්ඩලයේම සාමාජිකයකු වූ ආචාර්ය රාණි ජයමහ අවධාරණය කර ඇත. ඇයගේ චෝදනාව මුදල් මණ්ඩලයේ සාමාජික ජනාධිපති නීතිඥ සංජීව ජයවර්ධන අනුමත කර ඇත. ආර්ථිකය සම්බන්ධයෙන් තීන්දු තීරණ ගත් කිහිප දෙනකු මහත් අපරාධයක් කර ඇති බව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති මහාචාර්ය චරිත හේරත් පවසා ඇත. පොහොට්ටුවේ ජාතික ලැයිස්තු මන්ත්‍රී හේරත් යෝජනා කර ඇත්තේ විශේෂ පාර්ලිමේන්තු කාරක සභාවක් මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතු බවයි.

විශේෂ පාර්ලිමේන්තු කාරක සභාවක් පත් කිරීමේ කිසිදු අවශ්‍යතාවයක් හෝ ප්‍රයෝජනයක් නැත. විශේෂ පාර්ලිමේන්තු කාරක සභාවක් අවශ්‍ය වන්නේ පොහොට්ටු පක්ෂය තව දුරටත් කල් මැරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ නම් පමණකි. අදාළ පාර්ලිමේන්තු කාරක සභා දෙක තුළ හෙළිදරව් වූ කරුණු කාරණා තවදුරටත් තහවුරු කිරීමට අවශ්‍යතාවයක් නැත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2020 මාර්තු - අප්‍රේල් කාලයේදී පොහොට්ටු ආණ්ඩුවේ ආර්ථිකය මෙහෙයවූ කණ්ඩායමට දුන් බරපතළ අනතුරු ඇඟවීම සම්පූර්ණයෙන්ම නොසලකා කටයුතු කර ඇති බව පාර්ලිමේන්තුවේදී අවධාරණය විය.

එවකට මුදල් ඇමැති සහ ජනාධිපතිවරයා ඇතුළු කැබිනට් මණ්ඩලය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කළ අනතුරු ඇඟවීම සම්බන්ධයෙන් ක්‍රියා කර ඇති ආකාරය පුදුමාකාරය. සමස්ත ආර්ථිකය කඩා වැටෙන තුරු පොහොට්ටු රජය කර ඇති සෙල්ලම අහස පොළොව නුහුලන මහත් අපරාධයකි. රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ඉදිරියේ ආචාර්ය වීරසිංහ මුදල් අමාත්‍යාංශය පසුගිය වසර 20-30 කාලය තුළ කටයුතු කර ඇති වගකීම් විරහිතභාවය රට බංකොලොත් කිරීමට ඉවහල් වූ ආකාරයද පැහැදිලි කර ඇත.

ආචාර්ය වීරසිංහ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ඉදිරියේ මුදල් අමාත්‍යාංශය සම්බන්ධයෙන් කළ ප්‍රකාශය පාර්ලිමේන්තුව මෙලෙස මාධ්‍යයට ඉදිරිපත් කර ඇත. ''පසුගිය කාලය තුළ පිළියෙළ කිරීමේදී ඇස්තමේන්තුගත රාජ්‍ය අදායම සැබෑ තත්ත්වයට එහා ගිය යථාර්ථවාදී නොවන අදායමක් ලෙස ඉදිරිපත් කිරීම නිසා පාර්ලිමේන්තුවද නොමඟ යෑම සිදුවූ බව මහා බැංකු අධිපතිවරයා පෙන්වා දුන්නේය. මෙම නිසා මෙම ඇස්තමේන්තුගත රාජ්‍ය අදායම මත පදනම්ව අමාත්‍යාංශ ඇතුළු වියදම් සඳහා ඉහළ මුදලක් වෙන් කිරීමත් අවසානයේදී එම වියදම පියවා ගත නොහැකිව ඉහළ අයවැය පරතරයක් ඇති වීමත් ණය උගුලක හිරවීමටත් මෙම තත්ත්වය හේතු වූ බවත් ඔහු පෙන්වා දුන්නේය.”

සමස්ත පාර්ලිමේන්තු ක්‍රමයම අසාර්ථක වී ඇති බව අමුතුවෙන් කිව යුතු නැත. එම තත්ත්වය විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණයද වගකිව යුතුය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2020 මාර්තු - අප්‍රේල් කළ අනතුරු ඇඟවීම පොහොට්ටු මන්ත්‍රී කණ්ඩායමේ සාකච්ඡාවට භාජනය නොවූයේ ඇයි? පොහොට්ටු කැබිනට් මණ්ඩලය ජනාධිපතිවරණය ජයග්‍රහණය කළ සැනින් රුපියල් බිලියන 600 ක් බදු කපා හැරියේය. පාර්ලිමේන්තුවේදී සමස්ත ආර්ථිකයටම හෙනයක් වූ එම මඩු කපාහැරීම එවකට ජනාධිපති ලේකම් පී. බී. ජයසුන්දරගේ මැදිහත් වීම කළ බවට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී චෝදනා එල්ලවිය. නමුත් ජනාධිපති ලේකම්වරයා එලෙස මැදිහත් කමක් කළේ නම්, එයට සමස්ත කැබිනට් මණ්ඩලය යටත් වූවාද? එම බදු සහනය ව්‍යාපාරික ප්‍රජාවට දීම කාගේ අවශ්‍යතාවයක්ද? අද ශ්‍රී ලංකාව පත්වී ඇති ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයට සමස්ත කැබිනට් මණ්ඩලයම වගකිව යුතු නොවේද ?

පොහොට්ටු ආණ්ඩුව කොපමණ හොඳට කරලාද කිවහොත් ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයෙන් මානූෂීය ආධාර ලබා ගන්නා තත්ත්වයට රට පත්කර ඇත. ලැජ්ජාවක් තිබෙන එකෙකු පොහොට්ටු පක්ෂයෙන් නැවතත් මහා මැතිවරණයකට තබා පුංචි ඡන්දයකටවත් ඉදිරිපත් වන්නේ නැත. තමිල්නාඩු ප්‍රාන්ත ආණ්ඩුව ඉදිරියේ ශ්‍රී ලංකාව දණගැස්සවූ බව අවධාරණය කළ යුතුමය. එදා ත්‍රස්තවාදය වැපුරවූ තමිල්නාඩුව අද ශ්‍රී ලංකාවේ පිහිටට ඉදිරිපත් වී ඇත. ශ්‍රී ලංකාව තමිල්නාඩුවට ස්තුතිවන්ත විය යුතුය. නමුත් ශ්‍රී ලංකාව එම අවාසනාවන්ත තත්ත්වයට පත් කළ එකෙකුටවත් සමාව දිය යුතු නැත. ලැජ්ජාවක් තිබෙන එකෙකු නැවතත් පොහොට්ටු පක්ෂයෙන් ඡන්දය ඉල්ලාගෙන ජනතාව ඉදිරියට එන්නේ නැත. දවසෙන් වැඩි කාලයක් නොයෙකුත් පෝලිම්වල ගත කරන එකෙකුවත් වර්තමාන පාර්ලිමේන්තුවේ ඉන්නා බොහෝ මහජන නියෝජිතයන්ට ඡන්දය දෙන්නේ නැත.

පාර්ලිමේන්තුව නියෝජනය කරන 225 ම ප්‍රතික්ෂේප කරන බොහෝ ඡන්දදායකයන් පාර්ලිමේන්තුව කරන විනාශය තේරුම් ගෙන නොමැත. පාර්ලිමේන්තු ක්‍රමය නිසියාකාරව ක්‍රියාත්මක කිසිදු රටක ආර්ථිකය බංකොළොත් වනතුරු ආණ්ඩුව පිස්සු කෙළින්නේ නැත. රට බංකොළොත් නොවන්නට ජනතාව පාරට බහින්නේ නැත. 'ගෝඨා ගෝ ගම' හෝ 'මයිනා ගෝ ගම' මෙහෙයුමේ සාර්ථකත්වය විමසා බැලිය යුතු වන්නේ පොහොට්ටුව රට බංකොළොත් කිරීම හේතුවෙන් රටේ පෝලිම් යුගයක් නිර්මාණය වීම තුළය. ප්‍රජාතන්ත්‍රවාදය ඉල්ලා ජනතාව රාජපක්ෂ ආණ්ඩුවට එරෙහිව පාරට අවේ නැත. ආණ්ඩුවට රුපියල් නැත, රටට ඩොලර් නැති තත්ත්වයක් යටතේ පිට රටින් ආනයනය කරන සියලුම ද්‍රව්‍ය හිඟ වීම තුළ ජනතාව ප්‍රකෝපකාරී විය.

ගෑස්, භූමිතෙල්, පෙට්‍රල්, ඩීසල්, කිරි පිටි, සහල්, එළවළු, මිරිස් වෙළෙඳපොළේ හිඟ වීම පොහොට්ටු ආණ්ඩුව පොරොන්දු වූ සෞභාග්‍යයේ දැක්මේ කොටසක් විය නොහැක.

බොහෝ අත්‍යවශ්‍ය බෙහෙත් සහ වෛද්‍ය උපකරණ හිඟවීම සහ ආණ්ඩුව ජාත්‍යන්තරයෙන් බෙහෙත් හිඟමනේ යෑම සම්බන්ධයෙන් ආර්ථිකය මෙහෙයවූ කණ්ඩායම සමස්ත ජනතාවගෙන් සමාව ඉල්ලා සිටිය යුතුය. ද්‍රවිඩ ත්‍රස්තවාදයටවත් පොහොට්ටු ආණ්ඩුව කළ විනාශය කිරීමට නොහැකි විය. ශ්‍රී ලංකාව නැත්තටම නැතිකළ පසුව පොහොට්ටුවේ යම් කොටසක් වියරු වැටුන බව අද ආණ්ඩුවට මතක නැත. අරලියගහ මන්දිරය වියරුවෙන් ක්‍රියාත්මක කළ එම මෙහෙයුම සමස්ත රටම උඩු යටිකුරු කර ඇත. නීතියක් නැත. නොයෙකුත් කණ්ඩායම් තමන්ට අවශ්‍ය පරිදි ක්‍රියා කරන තත්ත්වයක් උදා වී ඇත. පොහොට්ටු පක්ෂය ශ්‍රී ලංකාව නැත්තටම නැති කර ඇත.

යහපාලන සමයේදී ක්‍රියාත්මක කළ බැඳුම්කර මගඩියට චෝදනාවට ලක්වූ එවකට අගමැති එජාප නායක රනිල් වික්‍රමසිංහ වර්තමාන පොහොට්ටු ආණ්ඩුවේ අග්‍රාමාත්‍යවරයා මෙන්ම මුදල් ඇමැති ලෙස පත්වීම අවධාරණය කරන්නේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක තරු පහේ ප්‍රජාතන්ත්‍රවාදය දේශපාලන විකෘතියක් බව නොවේද? බැඳුම්කර මගඩියට සම්බන්ධ සියලුම දෙනාට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා බවට අවසන් ජනාධිපතිවරණයේදී සහ මහා මැතිවරණයේදී පොරොන්දු වූ පොහොට්ටු පක්ෂයට තනි මන්ත්‍රී ආසනයක් හිමි රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා ලෙස මෙන්ම තම පාර්ලිමේන්තු කණ්ඩායමේ නායකයා ලෙස පිළිගැනීමට සිදු වීම ඉතාමත් ව්‍යාකූල තත්ත්වයක් බව අවධාරණය කළ යුතුය. එවැනි තත්ත්වයක් යටතේ ආර්ථිකය ස්ථාවර කළ හැකිද?

හිටපු මුදල් ඇමැති (සති කීපයකට පමණක්) ජනාධිපති නීතිඥ අලි සබ්රි මෑතකදී ආර්ථිකය බංකොළොත් කළ පුද්ගලයන් ලෙස ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාගේ ආර්ථික උපදේශකයන්, එවකට මහා බැංකුවේ අධිපතිවරුන්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් නම් කළේය.

සබ්රිගේ ප්‍රකාශය වර්තමාන මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ පසුගියදා අනුමත කළේය. ඒ පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ඉදිරියේදීය. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී ඔහු මුදල් අමාත්‍යාංශය කාලයක් තිස්සේ ක්‍රියාකරන වගකීම් විරහිත මෙන්ම වංචනික ආකාරයද හෙළි කළේය. ජනතාවට ඇත්ත තත්ත්වය පහදා දීමේ නිසි ගෞරවය ඔවුන්ට හිමි විය යුතුය. නමුත් ඔවුන් දෙදෙනාද රට බංකොළොත් වනතුරුම නිශ්ශබ්දව සිටීම පිළිබඳව වගකිව යුතුය. ඔවුන් ලැජ්ජා විය යුතුය. ජනතාවගෙන් සමාව ගත යුතුය.

**● ශමින්ද්‍ර ෆර්ඩිනැන්ඩෝ**

# මුදල් අච්චු ගැසීමේදී ඒ වරද නැවත කරන්න එපා

රාජ්‍ය සේවක පඩි ගෙවන්න සල්ලි අච්චු ගහන්න වෙයි. අගමැති බී.බී.සී. සිංහල සේවයට කියයි යන සිරස්තලය යටතේ 2022 මැයි මස 16 වැනි සඳුදා දිවයින පුවත්පතෙහි පළ වූ පුවතකින් පැහැදිලි විය. අප මෙහිදී අවධානයට ලක් කරන්නේ ඒ සල්ලි අච්චු ගැසීමේදී ඓතිහාසිකව සිදුකර ඇති ඉතා විශාල වරදක් මේ මෑතක් වන තුරුම මුදල් අච්චු ගැසීමේදී සිදුකර ඇති බව පැහැදිලි කිරීමත් නව අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ අවධානයට එය යොමුකර ඒ වරද ඔබ යටතේ වත් සිදුනොකරන ලෙස ඉල්ලීමටය. මීට ඉහතදී මහ බැංකු අධිපතිවරයෙකුව සිටි අපට පේරාදෙණි විශ්වවිද්‍යාලයේදී ආර්ථික විද්‍යාව පිළිබඳ දේශන පැවැත්වූ හිටපු මහ බැංකු අධිපතිවරයකු වූ මහාචාර්ය ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් මහතාට පුවත්පත් මගින් මේ ලේඛකයා විසින් මේ සියලුම කරුණු හෙළි කළ නමුත් ඔහු ඒ පිළිබඳ නොසැලකීම ගැන අදත් මම කනගාටු වෙමි.



'ශ්‍රී ලංකා මහ බැංකුව' නමින් රු. 5000 නෝට්ටුවක ඉහළින්ම මුද්‍රණය කර ඇත. ඉන් පසු ඊට යටින් 'ඉලංකෙයි මද්දිය බංකි' ලෙස දෙමළෙන් මුද්‍රණය කර ඇත. 'CENTRAL BANK OF SRI LANKA' යනුවෙන් ඉංග්‍රීසියෙන් මුද්‍රණය කර ඇත. මෙම රු. පන්දහසේ නෝට්ටුවේ අගමැති මහින්ද රාජපක්ෂ මහතා ද එවක මහ බැංකු අධිපති ඩබ්ලිව්. ඩී. ලක්ෂ්මන් මහතා ද අත්සන් කර ඇත.

මේ සෙල්ලම දිගටම කරගෙන ඇවිත් තිබෙන බව පෙනේ. මේ රටේ නාමය මෙකල භාවිතා වන්නේ ශ්‍රී ලංකාව යනුවෙනි. දෙමළ අකුරෙන් මේ රටේ නාමය ලිවීමට නොහැකි වී තිබීම ජාතියේ අවාසනාවක් ලෙස මම දකිමි. රටකට භාවිත වන්නේ ග්‍රීක් භාෂාවෙන් ලීවත් ශ්‍රී ලංකාවය. එම නිසා රනිල් වික්‍රමසිංහ නව අගමැතිවරයාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින්නේ මේ වරද නිවැරදි කර ඉදිරි කාලයේදී මුදල් නෝට්ටු මුද්‍රණය කරනවා නම් දෙමළෙන් ද ශ්‍රී ලංකාව ශ්‍රී ලංකාවේ මහ බැංකුව ලෙසින් මිස ඉලංකෙයි යන නාමය මින් මතුවට අප රටේ මුදල් නෝට්ටුවලට මුද්‍රණය නොකිරීමේ නව සම්ප්‍රදායක් ද ඇති කරන ලෙස ය.

මීට වසර 13කට ඉහතදී වෙල්ලමුල්ලිවයික්කාල් මඩ වගුරේ අප රටේ මහා විනාශයක් කළ ඒ චෞරයාගේ මරණයත් සමඟ සියල්ල අවසන් යැයි සිතීම මුලාවකි. ඒ නිසා සටන් බිමේදී දිවි පුද කරමින් මේ රට ඒ රුදුරු ත්‍රස්තවාදීන්ගෙන් බේරාගත් ඒ රණවිරුවන්ගේ උදාර මෙහෙය සිහිපත් කරමින් අපේ රට නම් දෙකකින් හැඳින්වීම මෙයින් පසු නතර කිරීමට ඔබට හැකි වේවායි අපි පතමු. එමෙන්ම කොළඹ මහ බැංකු ගොඩනැඟිල්ලේ පමණක් නොව මෑතකදී මා මාතර ගිය විට එහි මහ බැංකු ගොඩනැඟිල්ලේ ද ඉලංකෙයි යන නාමය ඉවත් කිරීමටත් තවත් ප්‍රධාන නගරවල මහා බැංකු ගොඩනැඟිලිවල ඇති මේ නාම පුවරු ශ්‍රී ලංකාව යනුවෙන් නිවැරදි කිරීමට නියෝගයක් දෙන ලෙස ද ඉතා කරුණාවෙන් නව අගමැතිවරයාගෙන් අපි ඉල්ලා සිටිමු.

**ජ්‍යෙෂ්ඨ පුරාවිද්‍යාඥ මහාචාර්ය සෙනරත් පරණවිතාන පදනමේ ලේකම්**
**● සිරිසමන් විජේතුංග**




# කිරි බින්දුව කඳුළු බින්දුවක් වූ වගයි!

ලොව පුරා ඇවිලෙමින් පවතින ගැටුම්කාරී තත්ත්වයන් මධ්‍යයේ මුළු ලොවම මහා සාගතයක් අභියසට පැමිණීමේ අභියෝගයට මුහුණදී සිටී. ලොව සුපිරි බලවතුන් මිනිස් වර්ගයාගේ යහ පැවැත්ම ගැන ප්‍රමුඛ අවධානය යොමුකරනු වෙනුවට තම දේශපාලන ආධිපත්‍යය සඳහා ගැටුම් වැඩිකර ගනිමින් සිටීම අපි දස අතින් දකිමින් සිටිමු.

එක් පැත්තක යුක්රේන යුද ගැටුමය. අනෙක් පැත්තෙන් කිසිසේත් නිවා දමන්නට වුවමනාවක් නෙපෙන්වන, මැදපෙරදිග කලාපයේ දිගින් දිගටම සිදු කරමින් සිටින්නා වූ ගැටුම්ය. දැන් ඒ ගැටුම් ආසියා - පැසිපික් කලාපය තුළද මතුකෙරෙන ලකුණු පහළ වෙමින් පවතී.

ජාත්‍යන්තර බල තුලනය වෙනස් කිරීමට ගන්නා වූ උත්සාහයන් පිටුපස සිටින බලවේගයනට රතු එළිය දල්වන්නා වූ සමුළුවක් පසුගිය සතියේ ආසියාවේ පැවැත්විණ. ඒ ජපානයේ ටෝකියෝවේදීය. ඒ අමෙරිකා එක්සත් ජනපදය, ජපානය, ඕස්ට්‍රේලියාව සහ ඉන්දියාවේ සහභාගීත්වයෙනි. මේ රටවල් දැන් හැඳින්වෙන්නේ " QUAD Nations" හෙවත් "ක්වාඩ් රටවල්" ලෙසිනි. ඇතැමුන් මේ සංවිධානය ආසියාවේ නේටෝ (NATO) සංවිධානය ලෙසින් හඳුන්වන්නට පටන්ගෙන ඇත.

1940 ගණන්වලදී ඇරඹුණු නේටෝ සංවිධානයේ ආරම්භක අරමුණ වූයේ, ජර්මනිය වැනි අධිපතිවාදී බලවේගයන්ගෙන් බටහිර යුරෝපය ස්ථාවර ලෙසින් ආරක්ෂා කර ගැන්මේ සංවිධානයක් නිර්මාණය කරගැන්මයි. සෝවියට් දේශය ප්‍රමුඛ කොමියුනිස්ට් කඳවුර ප්‍රබලව සිටි අවධියේදී ඒ සීතල යුද්ධය හේතුවෙන් මේ සංවිධානයේ පැවැත්ම තවදුරටත් අවශ්‍ය ලෙසින් සැලකිණ.

සෝවියට් කඳවුරේ බිඳවැටීම සමගින් කොමියුනිස්ට් කඳවුරේ තර්ජනය පහව යෑම හේතුවෙන් තවදුරටත් බටහිරට මේ සන්ධානය (NATO) අවශ්‍යද යන ප්‍රශ්නය මතුවී තිබිණ.

එසේ වුවද 1999 දී වොෂින්ටන්හිදී නිකුත් කරන ලද හයවන උපායමාර්ගික සංකල්පය, නේටෝ සංවිධානයේ සන්ධිස්ථානයක් සටහන් කරයි. ඉන් සිදුවූයේ, යුරෝපය මුල්කරගත් සංකල්පය වෙනුවට, "Global Security Provider" හෙවත් "ගෝලීය ආරක්ෂාව සපයන්නා" භූමිකාවකට නේටෝ සංවිධානය ප්‍රවේශ වීමය.

මේ අනුව රුසියාවේ විරෝධය නොසලකා චෙකෝස්ලෝකියාව, හංගේරියාව, පෝලන්තය නේටෝ සංවිධානයට ඇතුළත් කර ගැන්ම සිදුවිණ. මේ අනුව බටහිර යුරෝපයේ ආරක්ෂාව මුල්කරගත් සන්ධානයක් වෙනුවට, Global Security Provider අරමුණට යෑමේ නව ප්‍රවේශයට අනුව ජාත්‍යන්තර ත්‍රස්තවාදයට එරෙහිවන සටනද මේ සන්ධානයේ එක් බැඳීමක් වීම සිදුව ඇත.

මේ පසුබිම පසුගිය සතියේ ජපානයේ පැවති ආසියාතික හමුව සිදුවන කාල පරාසය තුළ ජපානයට ආසන්න මුහුදු තීරයේ චීනය සහ රුසියාව ඒකාබද්ධව ගුවනින් ආරක්ෂක අභ්‍යාසවල යෙදීම සිදුවිණ. මෙම මෙහෙයුම ජපානයේ සීමාවන් තුළට නොපිවිසුණද, එය ජපානය සැලකුවේ ප්‍රකෝප කිරීමක් ලෙසිනි. අමෙරිකානු ජනපති බයිඩන්ගේ ආසියානු කලාපය තුළ ගත කළ මේ දිනවල උතුරු කොරියාව දෙසින්ද මෙවැනිම හැසිරීමක් ගැන මාධ්‍ය වාර්තා කර තිබිණ. මේ අතර මාධ්‍යවේදියෙකුගේ පැනයට පිළිතුරු දෙමින්, මෙම ආසියානු සංචාරය අතරතුර ජනාධිපති බයිඩන් තායිවානය සම්බන්ධයෙන් කළ ප්‍රකාශයට චීනය දැඩි කෝපයෙන් ප්‍රතිචාර දක්වා ඇත. බයිඩන් ප්‍රකාශ කර තිබුණේ, ප්‍රජාතන්ත්‍රවාදී තායිවානයේ ආරක්ෂාව වෙනුවෙන් අවශ්‍ය වුවහොත් තම බලය පාවිච්චි කිරීමට පසුබට නොවන බවයි.

ලෝකයේ දේශපාලන ආධිපත්‍ය සඳහා ලෝක බලවතුන්ගේ මේ ගැටුම්, ලොවපුරා ගිනිදැල් දල්වමින් සිටින පසුබිමක, මිලියන දෙසීයකට අධික ජනතාවක් ලොවපුරා බරපතළ ලෙසින් බඩගින්නේ අභියෝගයට මුහුණදී සිටින බව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දත්තයන් ලොවට හෙළිකර සිටී.

පසුගිය දිනවල පැවැති World Economic Forum හෙවත් ලෝක ආර්ථික සමුළුව ඇමතූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධානී Kristalina Georgieva ප්‍රකාශ කර සිටියේ, " ලොව පුරා සිදුවෙමින් පවතින මෙම ගැටුම් හේතුවෙන් ආහාර ද්‍රව්‍යවල මිල ගණන් අහස උසට නැගෙමින් පවතිනවා" යන්නයි.

ලොවපුරා ජනතාවගේ ජීවත්වීමේ අයිතිය අභියෝගයට ලක්ව ඇති මේ අවාසනාවන්ත තත්ත්වයන් මැද, ලොවපුරා අවුලුවා ඇති මේ යුද ගිනි සහ ගැටුම් අත්හිටුවා සාමකාමී වාතාවරණයක් ඇතිකිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මැදිහත්වීම තුළින් යම් ක්‍රියාදාමයකට අප්‍රමාදව ප්‍රවේශවීම සඳහා ලොවපුරා සිටින රටවල් බල කර යුතුව ඇත.

රටක් වශයෙන් ශ්‍රී ලංකාවද මේ ජාත්‍යන්තර තත්ත්වයන් හොඳින් අවබෝධ කරගත යුතුව ඇත. පසුගිය කාලය තුළ නොබැඳි විදේශ ප්‍රතිපත්තියෙන් බැහැරව අපේ පාලකයන් අනුගමනය කළ අදූරදර්ශී විදේශ ප්‍රතිපත්තියද ජාත්‍යන්තර තලය තුළ හැම පැත්තකින්ම බැට කන පාපන්දුවක් බවට ශ්‍රී ලංකාව ගොදුරු කිරීමට ප්‍රධාන වශයෙන් හේතුවිණ.

චිංගිස් ආයිත්මාතාව් ලංකාව ගැන මෙසේ කීවේය. "ශ්‍රී ලංකාව යනු ඉන්දියාව නමැති කිරි බුරුල්ලෙන් වැටෙන කිරි බින්දුවකි. එහෙත් ඒ කිරි බින්දුව අද කඳුළු බිංදුවක් වී තිබේ. සෞභාග්‍යය සිහිනයකට හසුවී ගොස් අභාග්‍යය දොරින් දොරට ගොඩ වැදී තිබේ."

පසුගිය දින ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රධානී Kristalina Georgieva ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කළ ප්‍රකාශයකින් මේ සටහන සමාප්ත කරන්නට කැමැත්තෙමි.

"කලක් තරමක සමෘද්ධිමත් දේශයක්ව පැවැති ශ්‍රී ලංකාවේ අද සිදුවෙමින් පවතින දෑ පිළිබඳ පින්තූරය දකින කල මගේ හදවත කම්පා වෙනවා. එය පැහැදිලිවම වැරදි කළමනාකරණයේ ප්‍රතිඵලයක්මය. දැන් සිදුවිය යුතු ඉතා වැදගත්ම දේ වන්නේ රට නැවත තිරසාර, නිවැරදි ආර්ථික ප්‍රවේශයකට යෑමයි. අප්‍රමාදව ශ්‍රී ලංකාව ණය ප්‍රතිව්‍යූහගතකරණයකට යා යුතු වෙනවා. මේ ඉදිරි සියලු කටයුතුවලට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබා දෙන්නට අපි අපේක්ෂා කරනවා. "

**● ඉම්තියාස් බාකීර් මාකාර්**

**ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා යුද හමුදාපති ධුරයෙන් විශ්‍රාම ගන්නා බව පසුගිය සති අන්තයේදී වාර්තාවිණි. එහෙත් ඔහු තව දුරටත් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි තනතුරේ රාජකාරි කටයුතු කරන බවද වාර්තා විය. මේ ඉවත් වීමත් සමගම සමාජයෙහි ඒ ගැන බොහෝ සෙයින් කතාබහට ලක්විය. එම විශ්‍රාම ගැනීම පිටුපස බරපතළ 'දේශපාලන' මැදිහත්වීමක් ඇති බවද ජනරාල් ශවේන්ද්‍ර සිල්වා දේශපාලනයට පිවිසෙන බවත් කියැවිණි. මේ සංවාදය ඒ ගැනත් හමුදාපති ධුරය තෙක් ජනරාල් ශවේන්ද්‍ර සිල්වා ආ ගමන් මග පිළිබඳ කෙටි විමසා බැලීමක් ද වෙනුවෙනි.**

# දේශපාලනය ගැන මම දන්නේ නෑ!

## ඒත් ලැබෙන අවස්ථාවන් අනුව රටට වැඩ කරන්න පුළුවන්...

## හමුදාපති උත්තර දෙයි



**යුද ජයග්‍රහණයෙන් වසර 13 කට පසුව මොකද හිතෙන්නේ?**

විවිධ දේ මතක් වෙනවා යුද්දෙ දිහා බැලුවාම. යුද්ධය පටන් ගද්දි හිටපු ආරම්භක සාමාජිකයෙක් වශයෙන් යුද්ධය ඉවර කරපු දවසේ සේනාංක දෙකක් තමයි භූමියේ ඉඳලා යුද්දෙ ඉවර කළේ. 53 සහ 58 සේනාංක. 58 සේනාංකයට අණ දුන්නු පුද්ගලයා වශයෙන් සහ හමුදාපතිවරයාට ''සර්'' භූමියේ යුද්ධය අද ඉවරයි" කියලා මුලින්ම නිල වශයෙන් දැනුම්දුන් පුද්ගලයා වශයෙන් මම අද සතුටු වෙනවා අද රටේ මේ ඉන්න ජනතාවට හුස්ම පොදක් අරගෙන සාමයෙන් සතුටෙන් ජීවත් වෙන්න පරිසරය හදලා දෙන්න මනුස්සයෙක් වශයෙන්ම රටේ පුරවැසියෙක් වශයෙන් ඉපදිලා ඒ දේ රටට කරලා දෙන්න පුළුවන් වීම ගැන අනිවාර්යයෙන් මම සතුටු වෙනවා. ආඩම්බර වෙනවා.

**දැන් තත්ත්වය ගැනත් ඒ ස්ථාවරයේ වෙනසක් නැද්ද?**

මේ වෙනකොට යුද්ධයක් නැතිව වසර දහතුනක් තව දුරටත් ගතවෙනවා. පාස්කු ඉරිදා අන්තවාදී ප්‍රහාරය ඇරුණාම ඒ කාලය තුළ ත්‍රස්තවාදයක් මේ රට තුළ තිබිලා නෑ. ත්‍රස්තවාදය මේ රටෙන් සහමුලින්ම තුරන් කරන්න පුළුවන් කියලා අපි කියපු දේ අපිට ඒ ආකාරයෙන්ම කරන්න හැකියාව ලැබුණා. මේ කාල සීමාව තුළ අපි කොවිඩ් වසංගතයට මුහුණ දුන්නා. අපි ඒ සියල්ලට මුහුණ දුන්නා. ඒ මුහුණ දුන්නු අභියෝග සියල්ලම අපි ජයගෙනත් තියෙනවා. තව යම් ජයග්‍රහණයන් කිහිපයක් ලබා ගන්න තියෙනවා. ඒවාත් අපි ජය ගන්නවා.

**මිනිස්සු යුද්ධ හමුදාව ගැන ඇහුවාම 58 සේනාංකය ගැන තමා කතා කරන්නේ. හරියට සන්නාමයක් වගේ. එහෙම සන්නාමයක් හැදුණේ කොහොමද ?**

කිසිම දෙයක් නිකම්ම ලැබෙන්නේ නෑ. 58 සේනාංකය ගත්තාම යුද්ධයේ දී වැඩිම භූමි ප්‍රදේශයක් නිදහස් කරගත්තේ 58 සේනාංකය. මුලතිව් හැරුණු කොට පූනරින්, කිලිනොච්චි, පරන්තන්, අලිමංකඩ, පුදුමාතලන් වගේම වැඩිම ප්‍රාණ ඇපකරුවන් මුදාගත් පුදුකුඩිඉරිප්පු වගේම වෙල්ලමුල්ලිවෛයික්කාල් වගේ ප්‍රධාන මර්මස්ථාන සියල්ලම අත්පත්කර ගත්තේ 58වන සේනාංකය. කිලිනොච්චියේදී 57 වන සේනාංකයේ දායකත්වය ලබාගත්තා. 53 සේනාංකයත් සහය දැක්වූවා. පුදුකුඩිඉරිප්පුවෙත් ඒ වගේම තත්ත්වයක් තිබ්බා. කිලෝමීටර් 200 කට වැඩිදුර ප්‍රමාණයක් මන්නාරම සිලාවතුරේ සිට ආවේ 58 සේනාංකය. ඒත් එක්කම ත්‍රස්තවාදීන්ගේ වැඩිම අවි ආයුධ ප්‍රමාණයක් සොයාගත්තේ 58 සේනාංකය. එදා යුද්ධය රූපවාහිනී නාලිකාවල පෙන්නද්දී වැඩිම ජයග්‍රහණ ලබපු සේනාංකය විදිහට 58 සේනාංකය ජනතාවට හුරු වෙලා තියෙනවා. 58 විතරක් නෙවෙයි හමුදාවේ සෑම සේනාංකයක්ම යුද්ධයට සුවිශේෂී දායකත්වයක් දැක්වූවා. ඊළඟ විනාඩිය ගැන හිතලා නෙවෙයි ඔවුන් කටයුතු කළේ. ඔවුන් සියලුම දෙනාට මම ස්තුතිය ප්‍රණාමය ආචාර්ය පුද කරනවා. එදා භූමියේ හිටපු කනිෂ්ඨතම සොල්දාදුවාගේ සිට උසස්ම නිලධාරියා දක්වා සියලුම දෙනාට මගේ ආචාර්ය මම පුදකරනවා. ඒ වාගේම රටට සාමය උදාකරන්න තුවාල ලැබූ සහ ජීවිතක්ෂයට පත්වූ සියලුම දෙනාට මගේ උත්තමාචාරය සහ ගෞරවය පුද කරනවා.

**මුහමාලේදී ඔබේ සේනාංකයට දරුණු ප්‍රහාරයක් එල්ලවුණා නේද ?**

මුහමාලේ තිබ්බේ අපේ තිබ්බ ඉදිරිම ආරක්ෂක වළල්ලයි. සාම සාකච්ඡා අතරතුර ත්‍රස්තවාදීන් නොදන්වා 2006 අගෝස්තු මාසේ ප්‍රහාරයක් එල්ල කළා. ඒ වෙද්දි මම හිටියේ දියතලාව ආරක්ෂක විද්‍යාපීඨයේ අණදෙන නිලධාරියා වශයෙන්. මේ ඇතිවුණු තත්ත්වයත් එක්ක ඉදිරි ආරක්ෂක වළල්ලේ හතරෙන් තුනක් විතර ත්‍රස්තවාදීන් අල්ලා ගත්තා. ඒ අවස්ථාවේ දී හමුදාපතිවරයා මාව මුහමාලේ ඉදිරි ආරක්ෂක වළල්ලේ ගුවන් සංක්‍රමික බලසේනාවේ බලසේනාධිපති වශයෙන් පත්කරනු ලැබුවා. එසේ පත්කළාට පස්සේ ඔවුන් වසර හයක් විතර අල්ලාගෙන හිටපු ප්‍රදේශයක් එක් විශාල ප්‍රදේශයක් අපි මාසයක් විතර ඇතුළත යළි නිදහස් කර ගත්තා. ඔවුන් කිව්වේ ඔවුන්ගේ ආරක්ෂක වළල්ල කවදාවත්ම කඩන්න බෑ කියලයි. නමුත් ගුවන් සංක්‍රමික බලසේනාව පැය එකහමාරක් වගේ කෙටි කාලයකින් ප්‍රහාරයක් එල්ල කරලා කිලෝමීටර් අටක් ලයින් එක කඩලා අල්ලගත්තා.

**වසර ගණනාවක යුද්ධය කෙටි කාලයකින් අවසන් කරන්න හේතුවුණු කරුණු මොනවාද ?**

දශක තුනක් කියන්නේ කෙටිකාලයක් නෙවේ. අවසන් සටනේදී ඒ කියන්නේ මාවිල්ආරුවලින් පස්සේ එවකට දේශපාලන නායකත්වය මේක එක අරමුණක් වෙනුවෙන් යොමු කළා. අනිවාර්යයෙන්ම ත්‍රස්තවාදය පරාජය කරනවා කියලා දේශපාලන නායකත්වය තීරණය කළා. ඒ දේශපාලන නායකත්වය සහ රජය විසින් මේ සඳහා සම්පත් දියුණු කරලා හමුදාවට ලබා දුන්නා. ඒ වගේම ත්‍රිවිධ හමුදාපතිවරුන් වගේම දෙවැනි පෙළත් හිටියේ වසර විස්සක් විසිපහක් අත්දැකීම් ලැබූ පළපුරුදු පිරිසක්. හමුදාවල ක්‍රමවේදය පවා වෙනස් කළා අවස්ථාවට අනුරූපව. ඒත් එක්කම මොරාල් එක හොඳ තත්ත්වයක තිබුණා. ඒ හැමදේම සූදානම් කරගෙනම තමයි සියලු දෙනාම කටයුතු කළේ. අපි පොත්පත්වල ඉගෙන ගත්තේ ත්‍රස්තවාදීන්ගේ බලය අඩුම තැනට පහර දෙන්නයි. ඒත් මගේ සේනාංකය කළේම ත්‍රස්තවාදීන්ගේ බලය වැඩිම තැනට මුලින්ම පහර දීමයි. එත් එක්කම අපේ කමාන්ඩෝ සහ විශේෂ බළකා දුරදිග විහිදුම් කණ්ඩ හදලා ත්‍රස්තවාදීන්ගේ බලප්‍රදේශ ඇතුළට ගිහින් ප්‍රහාර එල්ල කළා. විවිධ උපක්‍රම භාවිත කළා. අපි ඔවුන්ගේ ශක්තීන් සහ දුර්වලතා හොඳට අඳුරගෙන කටයුතු කළා. ඒ වගේම තමා අපිට ඉල්ලූ තරම් මිනිස් බලය ලැබුණා. මම මේ රටේ ජනතාවට ආචාර කරන්න ඕන රටේ ජනතාව හමුදාවට බැඳීම ගැන. හිටපු වීරෝධාර රණවිරුවන්ට අපි මේක ජයග්‍රහණය කරනවාමයි කියන අධිෂ්ඨානය තිබ්බා.

**ඒ කියන්නේ ත්‍රස්තවාදීන් නොසිතු යුද උපක්‍රම භාවිත කළාද ?**

අනිවාර්යයෙන්ම. මොකද එල්ටීටීඊ සංවිධානය මුලින්ම භාවිත කළේ ශොට්ගන්. නමුත් ඔවුන් අවසන් කාලයේදී මිලිමීටර් 130 කාලතුවක්කු පවා භාවිත කළා. ඒනිසා අපි අපේ යුද උපක්‍රම වෙනස් කළා. ඒවා අපි මුලින්ම පූනරින් ඇල්ලුවාම එල්ටීටීඊ සංවිධානයට කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීමේ අවස්ථාව අහිමි වුණා. ඊට පස්සේ මම හමුදාපතිතුමාගෙන් ඇහුවා අපි ඊළඟට යන්නේ පරන්තන් ද කිලිනොච්චි ද කියලා. එතුමා ඒ වෙලාවේ කිව්වා පරන්තන් අල්ලන්න කියලා. පරන්තන් ගත්තාට පස්සේ අලිමන්කඩ සහ කිලිනොච්චි එල්ටීටීඊ බලය බිඳවැටුණා. අපිට තියෙන සම්පත් අඩු වුණත් අපිට තියෙන සම්පත් අපි භාවිත කළා. උදාහරණයක් විදිහට අපි පුදුමාතලන් වලදී ලක්ෂයකට වැඩි ප්‍රාණ ඇපකරුවන් තොගයක් මුදාගත්තේ. හමුදාපතිවරයා ඒ ක්‍රියාන්විතය භාර දුන්නේ 58 සේනාංකයට. අපි කලපුව හරහා ගමන් කරද්දි අපි විවිධ උපක්‍රම භාවිත කළා. අපි අපේ සම්පත් භාවිත කරමින් විවිධ උපක්‍රම භාවිත කළා. ඒ තමයි ලෝකයෙ 'විශාලතම ප්‍රාණ ඇපකරුවන් මුදාගැනීමේ මෙහෙයුම. අපි ධනාත්මකව හැම සොල්දාදුවෙක්ම එකා වගේ ධනාත්මකව කටයුතු කරලා තමා මේ ජයග්‍රහණය ලැබුවේ. අපට තිබුණා මෙය ජයග්‍රහණය කරනවා කියන අධිෂ්ඨානය. ඒ අධිෂ්ඨානය ජනාධිපතිවරයා, ආරක්ෂක ලේකම්වරයා හමුදාපතිවරුන් ඇතුළු සියලුම දෙනා තුළ තිබුණා. බලන්න මොන පන්සලේද පහනක් පත්තු කරලා බෝධි පූජාවක් නොතිබ්බේ කියලා. අපිට ඒ දේවල් අමතක නෑ. අපිට මුල අමතක නෑ.

**ඔබේ පරමාදර්ශී හමුදා චරිතය කවුද ?**

මගේ නම් ජෙනරල් විජය විමලරත්න කියන මේ රටේ බිහිවුණ දක්ෂතම හමුදා නිලධාරියා විදිහට අපි සලකන අපේ ගජබා රෙජිමේන්තුවේ නිර්මාතෘවරයා. මම දෙවැනි ලුතිතන් වරයෙක් විදිහට ගජබා රෙජිමේන්තුවට බැඳුණු ප්‍රථම නිලධාරියා. ඒ වෙනකොට එතුමා තමා අණදෙන නිලධාරියා විදිහට ඒ වෙද්දි කටයුතු කළේ. එතුමා පළවෙනි දවසේ කියපු හැම වචනයක්ම මට මතකයි. එතුමා කියපු කරුණු අපි ඒ විදිහටම ක්‍රියාවට නැංවුවා. වත්මන් ජනතාධිපතිතුමා මගෙ අණදෙන නිලධාරියා වශයෙන් කටයුතු කළා. ඒත් එක්කම හිටපු හමුදාපති ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහත්මයා සේනාංකාධිපතිවරයකු වෙන්න ප්‍රමාණවත් ජ්‍යෙෂ්ඨත්වයක් නොමැති අවස්ථාවකදී මාව සේනාංකාධිපතිවරයෙක් බවට පත් කළා. ඒක ලොකු දෙයක්.

**කෙටි කාලයක් තුළ ඉහළට එන්නත් ශවේන්ද්‍ර සිල්වා කියන නම රටේ ජනප්‍රිය වෙන්නත් ඔබ තුළ තියෙන විශේෂ දක්ෂතා මොනවාද ?**

මම 1984 මාර්තු 05 පාඨමාලා අංක 19 එක්ක හමුදාවට බැඳෙනවා. 1985 නොවැම්බර් 16 වැනිදා අධිකාරියට පත්වෙනවා. මම දකින්නේ මට ලැබුණු ලොකුම භාග්‍යය ගජබා රෙජිමේන්තුවට සම්බන්ධ වීම. අනිත් රෙජිමේන්තුවල වෙනසක් නෙවේ. ඒ රෙජිමේන්තුවේ ඒ වෙද්දි තිබ්බ පන්නරය තමා වැදගත්. බලන්න යුද්ධය ඉවර කරපු සේනාංකාධිපතිවරු ඔක්කොම ජෙනරල් ජගත් ඩයස්, ජෙනරල් කමල් ගුණරත්න, චාගි ගාල්ලගේ, සුමේධ පෙරේරා වගේ දක්ෂ නිලධරීන් තමයි ගජබා රෙජිමේන්තුවේ හිටියේ. ඒ කට්ටිය එක්ක තමයි අපි හැදුණේ. එතකොට මට මතකයි වැල්වැටිතුරෙයි ඉඳලා තොණ්ඩමනාරු දක්වා ක්‍රියාන්විතයක් ඒ දවසවල තිබුණා. ඒක සැලසුම් කළේ ජෙනරල් විමලරත්න. එතකොට ජෙනරල් විජය විමලරත්න එක්ක ජීවිතක්ෂයට පත් වෙච්චි කර්නල් පලිපාන කියලා මගේ අණදෙන නිලධාරියා, මගේ ප්ලැටූන් කමාන්ඩර් ප්‍රසන්න වික්‍රමසූරිය, ශාන්ත විජේසිංහ අපි කණ්ඩායම තමයි තොණ්ඩමනාරු අල්ලගන්න ගියේ. ඒක ඉතාමත් විශාල ක්‍රියාන්විතයක්. ඒ ක්‍රියාවිතයේදී තමයි මට වීර වික්‍රම විභූෂණ, රණ වික්‍රම සහ රණශූර පදක්කම් ලැබුණේ. මේ පදක්කම් තුනම ප්‍රථමවරට ලබාගත් ත්‍රිවිධ හමුදාවේම දෙවැනි ලුතිතන්වරයා වුණේ මම. ඊට පස්සේ පූනරින්වල කොමා කියලා පොයින්ට් එකක ඉන්න වෙලාවේ රිවිරැස ක්‍රියාන්විතය අල්ලනවා කියලා බලඇණිය යාපනයට ගෙනාවා. යාපනය අල්ලන මෙහෙයුමේ මම අණ දෙන නිලධාරියකු ලෙස පත්කළා. හමුදාවේ අඩුම වයසකින් අඩුම කාලෙකින් අණදෙන නිලධාරියකු වුණේ මම. අදටත් ත්‍රිවිධ හමුදාවේම වැඩිම මෙඩ්ල් පළඳින පුද්ගලයා මම.

**මේ හැම දෙයක්ම කෙටි කාලයකින් ගන්න ඔබ තුළ තිබූ දක්ෂතා මොනවාද ?**

කැපවීම තමයි. ඒ වගේම මුලින්ම ජෙනරල් විජය විමලරත්නලා දාපු අඩිතාලම තමයි. මම කිසිම දෙයක් බැහැයි කියලා අතහරින්නේ නෑ. කොවිඩ් කාලෙදිත් මම ඒ දේ කිව්වා. මම විතරක් නෙවෙයි මේ වගේ අය ගොඩාක් ඉන්නවා. කොවිඩ් කාලෙදිත් පාන්දර දෙකහමාරෙ ඉඳන් උදේ 8.00 වෙද්දි හැම නාලිකාවකටම තොරතුරු ලබා දුන්නා. ජනාධිපතිතුමාගේ උපදෙස් සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජෙනරාල්තුමාගේ අධ්‍යක්ෂතුමාගේ උපදෙස් අනුව නොදන්නා කොවිඩ් එකක් මෙල්ල කළේ එහෙමයි. අපි ශ්‍රී ලාංකිකයෙක් විදිහට අපෙන් විය යුතු රාජකාරියක් තියෙනවා. හැම පුරවැසියෙකුටම වගකීමක් යුතුකමක් තියෙනවා. අපි අපේ වගකීම ඉෂ්ට සිද්ධ කරනවා නම් හරි. අපි මේ දේවල් ඇති කරගත්තේ බොහොම කැපකිරීමක් කරලා. මේවා බන්දේසියක තියලා ලබා ගත්තු දේවල් නෙවෙයි.

**ජෙනරල් ශවේන්ද්‍ර සිල්වාට හමුදා ජීවිතයේදී කරන්න බැරි වුණු දෙයක් තියෙනවද ?**

අපිට පෞද්ගලිකව කරන්න බැරිවෙච්චි දේවල් තියෙනවා. ළමයි එක්ක ඉන්න අවස්ථාව අපිට ලැබුණේ නෑ. මගේ දුවලා ඉස්කෝලේ යන කාලේ ලොකු දුවගේ පන්තියට තුන්පාරක් විතර ගිහින් ඇති. පොඩි දුවගේ පන්තියට ගිහින්ම නෑ. නමුත් හමුදා ජීවිතයේ මට කිසිම දෙයක් මඟඇරිලා නෑ.

*14 පිටුවට....*

සාකච්ඡා කළේ -
● දර්ශන ගල්ගමුව

# ඔව් "ස" ෆේල් තමයි...

## ඒ නිසානේ සජිත්ට අගමැතිකම දෙන්න හැදුවේ...



### ඇමැති හරීන් ප්‍රනාන්දු කියයි

**ආණ්ඩුව දිගින් දිගටම දැඩිව විවේචනය කළ විපක්ෂ මන්ත්‍රීවරුන් අතර ඉදිරියෙන්ම සිටි සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී හරීන් ප්‍රනාන්දු මහතා මේ වන විට නව රජයේ සංචාරක සහ ඉඩම් අමාත්‍යවරයා ලෙස කටයුතු කරමින් සිටී. ඔහු හිටිහැටියේ ගැසූ කරණම ඇතුළු කරුණු කාරණා කීපයක් පිළිබඳ විමසීම සඳහා දිවයින ඉරිදා සංග්‍රහය සංචාරක සහ ඉඩම් ඇමැති හරීන් ප්‍රනාන්දු මහතා මුණ ගැසුනෙමු. පහතින් පෙළ ගැසෙන්නේ ඇමැති හරීන් ප්‍රනාන්දු මහතා සමඟ සිදුකළ සාකච්ඡාවයි.**

ප්‍රශ්නය - ඔබ රාජපක්ෂ ආණ්ඩුව දැඩි ලෙස විවේචනය කළ විපක්ෂ මන්ත්‍රීවරයෙක්. නමුත් මේ වන විට ඔබ නව කැබිනට් මණ්ඩලයේ සංචාරක සහ ඉඩම් අමාත්‍යවරයා ලෙස කටයුතු කරනවා. නව අමාත්‍ය ධුරය ලබා ගැනීමත් සමග ඔබ නියෝජනය කරන පක්ෂයේ මන්ත්‍රීවරු ඇතුළු බොහෝ දෙනක් ඇමැති ධුරය ලබාගැනීම පිළිබඳ දැඩි චෝදනා එල්ල කරමින් සිටිනවා. ඇත්තටම නව අමාත්‍ය ධුරය ලබාගැනීම පිළිබඳව ඔබ මේ වන විට පසුතැවෙනවාද..?

පිළිතුර - තවම නැහැ. ඔය චෝදනා කරන අය දැන ගන්න ඕනා හරීන් ප්‍රනාන්දු කියන්නේ කවුද කියලා. සජබ ය වෙනුවෙන් අපි මොනවද කළේ කියලා ඒ අය දන්නවා. මේ වෙලාවේ රට පැත්තේ හිටගන්නේ නැතුව වෙන මොනවා කරන්නද? දේශපාලනය කරන්නත් රටක් ඉතුරු වෙන්න ඕන. රටේ මිනිස්සු දුක් විඳිනකොට මොන දේශපාලනයක්ද..? මේ යන විදිහට තවත් ඉස්සරහට ගියහොත් දේශපාලනයක් කරන්න රටක් ඉතිරි වෙන්නෙ නෑ. රට වැටෙමින් තිබෙන මහා අගාධය කවුරුන් හෝ ඉදිරිපත් වෙලා නතර කරන්න ඕන. අනිත් අය වගකීම් පැහැර හරින විට අපි මේවට බෙල්ල තියන්න ඉදිරිපත් වුණේ ඒ නිසයි. හරීන් මොනවද කළේ කියලා දැන් නොතේරෙන අයට ඉස්සරහට තේරේවි. ඒ නිසා කවුරු බැන්නත් කවුරු විවේචනය කළත් පසුතැවීමක් නැහැ. ඇත්තටම මම තාම හිතනවා අපට තියෙන එකම බලාපොරොත්තුව මෙය පමණයි කියලා.

**ප්‍රශ්නය - ප්‍රශ්නය තියෙන්නෙ ඇමැතිතුමා ආණ්ඩුවට හොඳටම දෝෂාරෝපණය කරපු ඔබ දැන් කොහොමද ආණ්ඩුවේ අයත් එක්ක එකට හිටගන්නෙ කියලා.**

පිළිතුර - මේ වෙලාවේ ඒක කරන්නම වෙනවා. මූණ බලාගෙන වැඩ කරන්න බැරිද. බැනපු මිනිස්සු ළඟ ඉන්නවද වගේ ඒව හිත හිත රටේ ප්‍රශ්න විසඳන්න බැහැ. ඇත්තටම මේ වෙනකොට රට තියෙන්නේ බරපතළ අගාධයකට වැටිලා. මම ඉස්සෙල්ලා කිව්වා වගේ දේශපාලනය පස්සේ කරගන්න පුළුවන්. දැන් වැටිලා තියෙන රට ගොඩගන්නයි ඕන. ඒක මගාරින්න කිසිවෙකුට බැහැ. කවුරු හරි එහෙම මඟ හරිනවා කියන්නෙ ඔහු රට වෙනුවෙන් වගකීමක් ගන්නේ නෑ කියන එක. ඕන ප්‍රශ්නෙකට මුහුණ දෙන්න අපට කොන්දක් තියෙනවා. ඇත්තටම ඔබ කියන්න මේ වෙලාවේ දේශපාලන ප්‍රශ්න ඉස්සරහට දාගෙන රටේ ප්‍රශ්න අමතක කරන්න පුළුවන්ද කියලා. මටනම් එහෙම බෑ. ඊළඟට ඡන්දය ඉල්ලනවාද නැද්ද යන්න මම හිතන්නේ නෑ. රටේ අනාගතය ඔය සේරටම වඩා මට වටින නිසයි මේ තීරණය මම ගත්තේ.

**ප්‍රශ්නය - ඔබ ඇමැති ධුරය භාරගැනීම ඩීල් එකක් කියලා සමගි ජනබලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුම චෝදනා එල්ල කර තිබුණා.**

පිළිතුර - එක සත පහක් මම කාගෙන්වත් අරගෙන නැහැ. අමාත්‍ය ධුරය සඳහා හිමි වැටුප්, ඉන්ධන ඇතුළු කිසිවක් මම ලබා ගන්නෙත් නැහැ. ඔය චෝදනා කරන අයට කියන්න තියෙන්නෙ වැරදි මිනිහාටයි ඔය චෝදනා කරන්නේ කියලා පමණයි. මට බැනලා සජබ යේ අනාගතය හදන්න බැහැ. අපට බනින්න බනින්න වෙන්නේ එහි අනාගතය නැති වෙන එක. දැනුත් අපේ පක්ෂයට අවස්ථාව තියෙනවා රට වෙනුවෙන් දෙයක් කරන්න. ඒ අවස්ථාව මග හැර ගන්න ඕන නැහැ.

**ප්‍රශ්නය - ජනාධිපතිවරයාට වැඩියෙන්ම දෝෂාරෝපණය කළ පුද්ගලයෙක් ලෙස ඔබ කොහොමද පත්වීම් ලිපිය එතුමාගෙන් හිනාවෙලා ලබා ගත්තේ?**

පිළිතුර - මම ජනාධිපතිවරයාට විරුද්ධයි. එතුමා සම්බන්ධයෙන් කළ විවේචන අදටත් එලෙසමයි. නමුත් ජනාධිපතිවරයාට විරුද්ධ වුණාට අපි ජනාධිපති ධුරයට ගරු කළ යුතුයි. කවුරු ගියත් ජනාධිපතිවරයාගෙන් පත්වීම් ලිපිය ගන්න ඕනේ ඔහොම තමයි.

**ප්‍රශ්නය - ප්‍රශ්නෙ තියෙන්නෙ ඇමැතිතුමා ඔබ මාධ්‍ය සාකච්ඡාවකදී සඳහන් කළේ අහක බලාගෙන පත්වීම් ලිපිය හිරිකිතයෙන් ගත්ත කියලා කිව්ව එක.**

පිළිතුර - හැමදාම මට වුණේ ඕක නේ. මොකක් හරි එක වචනයක් අල්ලගෙන ගහනවා. පාස්කු ප්‍රහාරයෙ කතාවෙදීත් වුණේ එයම තමයි. අපි කරපු හොඳ කතා වෙනවා අඩුයි. ඇත්තටම මම බැනපු මිනිහෙක්ගෙන් පත්වීම් ලිපිය ගන්න එක සමාජයට තේරුම් කරන්න අමාරුයි. ඒක තමයි මේ දෝෂාරෝපණය. ඇත්තටම මේ වෙලාව දෝෂාරෝපණවලට බය වෙලා වැඩ කරන්න පුළුවන් වෙලාවක් නෙවෙයි. ඇත්තටම ඒ නිසයි අපි මේ වගකීම භාරගත්තේ. මේ වැඩෙන් අපිට වරදින්නත් පුළුවන්. හරියන්නත් පුළුවන්. හරි ගියොත් අපට යන්න පුළුවන් දුර ගොඩක් දුර වැඩියි. පුද්ගලවාදයට වඩා රට වෙනුවෙන් සටන් කරන කෙනාට මගේ සහාය අනිවාර්යෙන්ම ලබා දෙනවා.

**ප්‍රශ්නය - විපක්ෂ නායකවරයා වගකීමක් ගන්න මැලි වීම ඔබේ වෙනස්වීමට හේතුවක් වුණාද ?**

පිළිතුර - සජිත් ප්‍රේමදාස මහත්තයා නිදාගෙන හිටියා. ගෲප් මීටින් තිය තිය හිටියා. රනිල් ගත්තොත් සජබ ය ඉවර බව මම එදා ඉඳන් කිව්වා. ඒක තේරුම්ගන්න ඕන අය ඒක හරි හැටි තේරුම් ගත්තේ නැහැ. නිසසල සයුරක හොඳ කපිතාන්වරු හොයාගන්න බැහැ. ඒකට කුණාටුවක් ම එන්න ඕනා. කල් මර මර ලිපි ලිය ලිය දැන් රටේ තියෙන බරපතළ ප්‍රශ්නය විසඳන්න බැහැ. සජිත් ප්‍රේමදාස මහත්තයාට මම මඩ ගහන්නේ නැහැ. එතුමා අපට ගෝලයෝ දාලා මට ගහන එක නතර කළ යුතුයි.

**ප්‍රශ්නය - මීට පෙර අවස්ථාවකදීද ඔබ සමග සමග ජන බලවේගයෙන් ඉවත්වන්න ගිය බව ඒ කාලේ වාර්තා වුණා. ඇත්තටම ඔබ හිටියේ පක්ෂය සමඟ ප්‍රශ්නයකින් නේද ?**

පිළිතුර - පක්ෂයත් එක්ක ප්‍රශ්නයක් තිබුණේ නැහැ. සජිත් ප්‍රේමදාස මහත්තයා පිටුපස යම් යම් හොල්මන් හිටියා. ඒක තමයි අපට තිබුණු ප්‍රශ්නය. ඒ පුද්ගලයෝ නායකයා හසුරන එක ගැන පක්ෂයේ ගොඩක් අය කැමති නැහැ. මෙය අද ඊයෙක ආපු ප්‍රශ්නයක් නෙමෙයි. ඒවා එහෙම වුණත් අපි සජිත් ප්‍රේමදාස මහත්තයා විශ්වාස කළා. නමුත් යම් හේතුවකට ඔහු විශ්වාසය කඩ කළා.

**ප්‍රශ්නය - ඔබ සරත් ෆොන්සේකා මහතා සමග ගැටුම් ඇති කර ගත් බව අප පසුගිය කාලයේ දැක්කා.**

පිළිතුර - යම් යම් සිදුවීම් සිදු වුණා. ඇත්තටම එතුමාට ප්‍රශ්නයක් තිබෙනවා මම ගම්පහට ආපු එක ගැන. එතුමා ඉතා හොඳ යුද සෙනවියකු බව ස්ථිරයි. නමුත් එය දේශපාලනයේදී තිබෙනවා දැයි යන්න ප්‍රශ්නයක් තිබෙනවා. සමහරුන්ගෙ බුද්ධිය පේන්නේ හැසිරීමෙන්.

**ප්‍රශ්නය - ආණ්ඩුවට එරෙහිව බරපතළ අරගලයක් තිබුණා සහ තිබෙනවා. ඔබ ඇතුළු පිරිස අමාත්‍ය ධුර ලබාගැනීම අරගලය පාවා දීමක් ලෙස සමහරුන් අර්ථ නිරූපණය කරනවා.**

පිළිතුර - කිසිලෙසකවත් අරගලය අප පාවා දුන්නේ නැහැ. අපේ මිනිහට කරන්න බැරි වුණහම කොන්ද කෙළින් තියන් අපි ඒකට බෙල්ල තිබ්බා. එපමණයි.

**ප්‍රශ්නය - රනිල් වික්‍රමසිංහ මහතා තනි මන්ත්‍රී ධුරයක් පමණක් අතේ තබාගෙන අගමැති ධුරය ලබාගැනීම ඔබ දකින්නේ කෙසේ ද?**

ප්‍රශ්නය - ඇතැම් නායකයන් අභියෝග හමුවේ හැංගෙන කොට ඔහු තනි මිනිහෙක් ලෙස වගකීම භාර ගත්ත එක විශිෂ්ටයි. අපේ වචනයෙන් කියනවා නම් පට්ටයි. ඇතැම් දේවල්වලට මම කෙතරම් දෝෂාරෝපණ කරත් රනිල් වික්‍රමසිංහ හොඳ නායකයෙක්.

**ප්‍රශ්නය - රනිල් වික්‍රමසිංහ සහ සජිත් ප්‍රේමදාස යන නායකයන්ගෙන් වඩාත් හොඳ නායකයා කවුරුන් කියලද හිතන්නේ ?**

පිළිතුර - රනිල් වික්‍රමසිංහ දක්ෂ නායකයෙක්. සජිත් ප්‍රේමදාස මහතා හොඳ සහෝදරයෙක්.

**ප්‍රශ්නය - 'ස ෆේල්' කියන එක ඔබ කාලාන්තරයක් තිස්සේ කිව්ව කතාවක්. තවමත් ෆේල් කතාව වලංගුද ?**

පිළිතුර - තවමත් ඒ කතා වලංගුයි. 'ස ෆේල්' නිසානෙ සජිත් ප්‍රේමදාස මහත්තයට අග මැතිකම ගන්න කිව්වෙ. මට ඉන්නෙ මන්ත්‍රීවරු 54 යි, ඒගොල්ලො කකුලෙන් අදිව් වගේ දේවල් කිය කිය ඉඳලා අගමැති ධුරය අතහැරිය එක හරි දෙයක් නෙමෙයි.

*14 පිටුවට....*

සාකච්ඡා කළේ -
● සිරිමන්ත රත්නසේකර

# සතියේ දේශපාලනය

# රනිල්ගේ ආණ්ඩුව නිසා හැම පක්ෂයක්ම බෙදිලා...

## ගෝඨා ගෝ ගමේත් අභ්‍යන්තර මත ගැටුම්

එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ වර්තමාන ආණ්ඩුවේ අගමැති තනතුර භාර ගත්තාට පසු රටේ දැවෙන ප්‍රශ්න රාශියකට ක්ෂණික විසඳුම් ලැබේ යැයි බොහෝ දෙනා තර්ක කළහ. රනිල් බටහිර රටවල් ප්‍රමුඛ ජාත්‍යන්තරයේ ඉතා හොඳ මිතුරකු නිසා බොහෝ දෙනා සිතා සිටියේ ඔහු පත් වූ සැනින් බටහිර රටවල් පෝළිමේ පැමිණ ලංකාවට උදව් දෙනු ඇතැයි කියාය.

දැන් රනිල් වික්‍රමසිංහ අගමැති වී සති කීපයක්ම ගතව ගොස් හමාරය. රනිල්ගේ නව පත්වීමට හතරවටින්ම ලෝකයේ රටවල්වලින් සුබපැතුම් ගලා ආ බවද සැබෑය. එහෙත් ඉන්දියාව හැරුණු විට අනෙක් කිසිදු රටකින් බලාපොරොත්තු වූ තරමට ප්‍රතිඵල නොවීය.

මේ හේතුවෙන් පසුගිය සතියේත් අපේ රටේ ජනතාව පසුවූයේ අපේක්ෂාභංගත්වයකය.

රටට වුවමනා ගෑස්ටික, තෙල් ටික, ඖෂධ ටික, කෑම ටික, පොහොර ටික ලබාගන්නට තවදුරටත් ලෝකයට ණය වීම හැර වෙනත් විකල්පයක් නොවීය. එහෙත් ප්‍රශ්නය වූයේ ණය දෙන්නට ද තවමත් කිසිවකු හෝ කිසිදු ආයතනයක් සතුටුදායක ප්‍රතිචාරයක් දක්වා නොමැති වීමය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මෙන්ම ලෝක බැංකුවේ කොන්දේසිය වූයේ රට තුළ අභ්‍යන්තර දේශපාලන ස්ථාවර භාවයක් පෙන්නුම් කරන තුරු අවශ්‍ය ණය ප්‍රමාණය ලබා දෙන්නට සලකා බැලීමක් සිදු නොවන බවය.

මෙම තත්ත්වය තුළ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මෙන්ම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂත් ඒ දෙදෙනාගේ ආණ්ඩුවත් මහ බැංකුවේ අධිපතිවරයා ප්‍රමුඛ නිලධාරි මණ්ඩලයත් පසු වූයේ මහත් උභතෝකෝටිකය ක ය.

### ● රනිල්ට දුන්නේ හිසරදයක්ද..?

ජාත්‍යන්තරයේ ප්‍රශ්න විසඳාගත හැකි මට්ටමට ශක්තිමත් ආණ්ඩුවක් හා ශක්තිමත් කැබිනට් මණ්ඩලයක් තනා ගැනීම අගමැති රනිල්ට ලෙහෙසි පහසු කටයුත්තක් වූයේ නැත.

රට ගොඩනැඟීම සඳහා සහායදීමට අමාත්‍ය මණ්ඩලයට එක්වීම පොහොට්ටුවේ ස්වාධීන වූ මන්ත්‍රීවරු සියලු දෙනා එකසේ ප්‍රතික්ෂේප කර දැමුවහ. එහෙත් පොහොට්ටුවේ තවත් පිරිසක් මෙහිදී ජනාධිපතිවරයා සමග එක්ව ඇමැති වගකීම් භාර ගත්හ. ආණ්ඩුව සර්වපාක්ෂික ආණ්ඩුවක් බවට පත්වීමට නම් පාර්ලිමේන්තුවේ සෙසු පක්ෂවලත් සහයෝගය ඔවුන්ට අවශ්‍ය විය. මේ හේතුවෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමගත් සමගි ජන බලවේගය සමඟත් ජවිපෙ ප්‍රමුඛ සෙසු ලොකු කුඩා පක්ෂ සමඟත් රජය දිගින් දිගටම සාකච්ඡා කළ අතර අගමැති මෙහිදී පුරෝගාමී කාර්යභාරයක් ඉටු කරමින් සිටියේය. එහි ප්‍රතිඵලයක් හැටියට හරින් ප්‍රනාන්දු හා මනුෂ නානායක්කාර ආණ්ඩුවට පැමිණ ප්‍රබල අමාත්‍ය ධුර දෙකක වගකීම භාරගෙන වැඩ කරන්නට වූහ. එමගින් සිදු වූයේ සමගි ජනබලවේගය තුළ ද ප්‍රබල බෙදීමක් නිර්මාණය වීමය. මනුෂ හරින් හා අගමැති රනිල් තව තවත් පුද්ගලයන් සජබෙන් ගලවා ගැනීමට දිගින් දිගටම සාකච්ඡා කරමින් සිටියහ.

ඒ අතර ආණ්ඩුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සමගද රැ දවල් මේ ගැන කතා බස් කළේය. සුරේන් රාඝවන් හා සාන්ත බණ්ඩාර මුලින්ම පැමිණ ආණ්ඩුවේ ඇමැතිකම් ලබා ගැනීම තුළ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අභ්‍යන්තර ගැටුම් උග්‍ර විය. ශ්‍රීලනිප නායක මෛත්‍රීපාල සිරිසේන ද දැඩි මතයක සිටියේය. ආණ්ඩුව සමග එක් නොවී කරන හොඳ වැඩවලට සහයෝගය දීමටත් රනිල් වික්‍රමසිංහගේ මැදිහත් වීමෙන් සිදු කෙරෙන යම් යම් රටට හානිකර දේවල්වලට විරුද්ධ වීමටත් ශ්‍රීලනිපය ශක්තිමත්ව සිටිය යුතු බව පක්ෂ නායක මෛත්‍රීපාල සිරිසේනගේ මතය විය.

පසුගිය දිනවල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාව මේ ගැන ගැඹුරින් සාකච්ඡා කළේය. එහිදී මේ දුෂ්කර අවස්ථාවේ රජය සමඟ එකතු වී රට ගොඩ ගැනීමට වැඩ කළ යුතු බව පිරිසකගේ මතය වූහ. එම සංවාදයේ ප්‍රතිඵලයක් හැටියට පසුගිය සතියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පිරිසක් රජය සමඟ එක් වූහ. එයින් නිමල් සිරිපාල ද සිල්වාට හා මහින්ද අමරවීර ට ප්‍රබල අමාත්‍යධුර දෙකක් ද හිමිවූහ. දුමින්ද දිසානායක, ලසන්ත අලගියවන්න, චාමර සම්පත් දසනායක ඇතුළු සැලකිය යුතු පිරිසක් රජය සමඟ එක්වන්නට සූදානම්ව සිටියහ. රාජ්‍ය අමාත්‍යධුර කීපයක් ද ඔවුන් වෙත පිරිනැමීමට එකඟතාවක් තිබුණි.

මෙම තත්ත්වය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අභ්‍යන්තර සමගියට ද මහත් බාධාවක් විය. පක්ෂ නායක මෛත්‍රීපාල සිරිසේන ගේ මතය වූයේ නිලතල තාන්න මාන්නවලට ලොබින් ආණ්ඩුවට යන සියලුම දෙනා ඉවත්ව ගිය පසු මධ්‍යම කාරක සභාව රැස් කර ඔවුන් ගැන දැඩි තීන්දුවක් ගත යුතු බවයි. කෙසේ වෙතත් මේ දෙපිරිස අතර පසුගිය සතියේ දිගින් දිගටම සාකච්ඡා පැවැත්විණි.

තතු දත් ආරංචි මාර්ග කියා සිටියේ අගමැති රනිල් වික්‍රමසිංහ මේ වන විට දෙමළ ජාතික සන්ධානය සමගත් මුස්ලිම් කොංග්‍රසය සමගත් ජවිපෙ ඇතුළු කුඩා කුඩා දේශපාලන පක්ෂ සමගත් ඉතා හොඳ සාකච්ඡාවක් පවත්වමින් සිටින බවයි.

තත්ත්වය මෙසේ තිබුණත් රට තුළ අරගලකාරීන්ගේ කලබලකාරී ක්‍රියාකලාපය සංසිඳවීමට මේ කිසිවක් හේතු වූයේ නැත. ගෝල්ෆේස් පිටියේ ගෝඨා ගෝ ගම නමින් හැඳින්වූ අරගල භූමියේ වැඩකටයුතු පෙර ලෙසම නිර්පාක්ෂික සාමකාමී අවිහිංසාවාදී සහ නිදහස් යන ලේබල යටතේ ක්‍රියාත්මක විය. එතැන දිවාරැයේ නතර වී සිටින අරගල කරුවන්ගේ දේශපාලනය හා ප්‍රතිපත්ති කවරක් වුවත් ලොවට පෙනෙන්නට ඔවුන් හොඳ කලාත්මක සටන්කාමීත්වයක් පෙන්නුම් කළහ. නූතනවාදී විරෝධතා සංස්කෘතියක් පෙන්නුම් කළහ.

ඒ අතරතුර එතන සිටින සමාජ ක්‍රියාකාරීන්ම අන්තරේ ශිෂ්‍යයන් හා සිවිල් සංවිධාන ක්‍රියාකාරීන් ලෙස වෙන වෙනත් තැන් වල තිබෙන අරගලවලට හා විරෝධතාවට සහභාගි වූහ. එකම පිරිස වුවත් ගෝල්ෆේස් අරගල පිටියේ එක් මුහුණුවරකුත් උසාවිය ඉදිරියේ, රනිල්ගේ කාර්යාලය ඉදිරියේ හා පාරවල් ආදී තැන්වලදී සටන්කාමී අරගලකාරී සාහසික මුහුණුවරකුත් පෙන්නුම් කරන්නට තරම් මේ පිරිස දක්ෂව සිටියහ.

මේ රටේ ඇතැම් ජනප්‍රිය විද්‍යුත් මාධ්‍ය මේ තරුණ පිරිසගේ අරගලය සාමකාමී අවිහිංසාවාදී ප්‍රබුද්ධ එකක් යැයි පෙන්වන්නට වෙන වෙනම මාධ්‍ය වීර කාව්‍ය ලියූවත් ගෝල්ෆේස් අරගල බිමේ පෙනෙන මුහුණුම අලුත්කඩේ උසාවිය අසල හෝ කොළඹ මල් පාරේ අගමැති කාර්යාලය ඉදිරිපිට හෝ පාර්ලිමේන්තු ජයන්තිපුර වටරවුමේ හෝ දකින්නට ලැබීම හේතුවෙන් මේ කවුද? කුමක් කරන්නේ ද? කියා තේරුම් ගැනීම රටේ පොදු මහජනතාවට අසීරු වූයේ නැත.

කෙසේ වෙතත් පසුගිය දින වකවානු වන විට ගෝල්ෆේස් අරගල බිමේ ද යම් යම් ගැටලු අර්බුද හා බෙදීම් දක්නට ලැබිණි. අරගල බිමට ආහාරපානාදියෙන් මුදලෙන් හා ද්‍රව්‍යවලින් ආධාර කළ කොළඹ නාගරිකයේ මුස්ලිම් ප්‍රජාව ව්‍යාපාරික ප්‍රජාව හා සංවිධාන රනිල් වික්‍රමසිංහ අගමැති වී රටේ වගකීම් භාර ගත්තාට පසු ආධාර අනුබල ලබා දීම නතර කර දැමූහ. මෙය ගෝඨා ගෝ ගමේ පැවැත්මට බරපතළ ප්‍රශ්නයක් විය. තත්ත්වය විග්‍රහ කළ ඇතැම් දේශපාලන නිරීක්ෂකයෝ කීවේ රනිල්ගේ පැමිණීමෙන් පසු අනෙකුත් දේශපාලන පක්ෂවල මෙන්ම ගෝඨාටද ගම තුළ ද දැවැන්ත බෙදීමක් උද්ගතව ඇති බවකි.

### ● ලොකු පෙට්ටියේ ඇතුල කොහොමද?

පසුගිය 23 වන සඳුදා ඇමැතිවරු කිහිප දෙනෙක් ජනාධිපති මන්දිරයේදී ඇමැති ධුර කිහිපයක් භාරගත්හ. ඩග්ලස් දේවානන්ද, නිමල් සිරිපාල, බන්දුල ගුණවර්ධන, මහින්ද අමරවීර, කෙහෙළිය රඹුක්වැල්ල, රමේෂ් පතිරණ, විදුර වික්‍රමනායක, නසීර් අහමඩ් ජනාධිපතිවරයා අතින් සිය පත්වීම් ලිපි ලබා ගත්හ. මීට පෙර දිවුරුම් දුන් කංචන විජේසේකර ප්‍රසන්න රණතුංග වැනි කිහිප දෙනෙක් ද ඒ මොහොතේ පැමිණ සිටියහ. ජනාධිපතිවරයා සමඟ ඇමැති මණ්ඩලයේ විශේෂ සාකච්ඡාවක් තිබීම ඊට හේතුවයි. මෙම අවස්ථාවට නිමල් ලන්සා මන්ත්‍රීවරයාද පැමිණ සිටීම විශේෂත්වයක් විය. පත්වීම් ලිපි ප්‍රදානය 10.25 ට පටන්ගෙන 10.45ට අවසන් විය. මෙම අවස්ථාවට අගමැති රනිල් වික්‍රමසිංහ පැමිණ සිටියේ නැත.

ඇමැතිවරු දිවුරුම් දීමෙන් පසුව නිල වැඩකටයුතු අවසන් විය. ඉන් පසුව ඔවුන් ටික වේලාවක් සාමාන්‍ය පරිදි කතාබහ කරමින් සිටියහ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් පැමිණි ඇමැතිවරුන්ට එහි සිටි බොහෝ දෙනකු සුබපතන්නට වූහ.

''අපි හිතුවේ මීට වඩා ඇමැතිවරු එහෙන් එයි කියලා...''

''එන එක තව ඉවරයක් නෑ... තවමත් රාජ්‍ය ඇමැතිවරුන්ගේ වැඩකටයුතු ඉවරයක් නැනේ... ''

මහින්ද අමරවීර ඉතා විවෘතව සියල්ලන් සමඟම කුළුපගව කතාබහ කරමින් සිටින අයුරු දක්නට ලැබිණි. බොහෝ දෙනෙක් කතා කළේ ඇමැති තනතුර හා එහි ඇති අභ්‍යන්තර වගකීම් ගැන ය...

''මේ පාර ඇමැතිකම කියන්නේ සේවයක්. වරප්‍රසාද අමතක කරලා ජනතාවට සේවය කරන්නයි මේ වෙලාවේ අපේ කැපවීම යොමුවෙන්න ඕන...''

ජනාධිපතිවරයාද මෙසේ ටික වේලාවක් කතා බහ කරමින් සිට යන්නට ගිය අතර තේ පානය කිරීමෙන් පසු සෙසු ඇමැතිවරුද විසිර ගියහ.

''ඇමැතිතුමන් ලා බරටම අරගෙන යන හැඩයි...'' සමහර නිලධාරීන් විහිළු කළහ.

''ඔව් ඔව්... ගිය පාරත් හුඟක් අයගේ පෙට්ටි ලොකුවට තිබුණා. හැබැයි ඇතුල හිස්. මේ පාර කොහොමද දන්නෑ...'' ඇමැතිවරයෙක් කීවේ පහුගිය කැබිනට් මණ්ඩලයේ වගකීම් බෙදා හදා දී තිබූ ආකාරය මතක් කරමිනි.

මෙම අසීරු අවස්ථාවේ රටේ තිබෙන වැදගත්ම අමාත්‍ය ධුරය වන මුදල් ඇමැතිකම භාරගන්නට ජනාධිපතිවරයා කිහිපදෙනකුටම ආරාධනා කළේය. එහෙත් ඒ සඳහා ස්ථිරව කැමැත්ත පළ කරන්නට තරම් ඒ කිසිවෙක් ඉදිරිපත් නොවූයේ රට මුහුණ පා සිටින ආර්ථික අර්බුදයේ තරම ගැන ඔවුන්ට හරිහමන් විශ්වාසයක් නොතිබූ නිසාය.

අවසානයේ අගමැති රනිල් වික්‍රමසිංහට එම වගකීම භාර දෙන්නට ජනාධිපතිවරයාට අවශ්‍ය විය. අගමැතිවරයාද ඒ වගකීම භාර ගන්නට පසුබට වූයේ නැත.

### ● 21 ගෙන එන්න රනිල්ගේ කැපවීම

අගමැති රනිල් මුදල් ඇමැතිකම භාර ගැනීමට සූදානම් වන බව දැනගත් වහාම කිහිප දෙනකු ඊට විරෝධය පළ කරමින් ජනාධිපතිවරයාට කරුණු කියමින් සිටින බවට අග්‍රාමාත්‍ය කාර්යාලයට ද වාර්තා වී තිබුණි. එසේම 21 වෙනි සංශෝධනය සම්බන්ධයෙන් ද නොයෙක් කතා වාර්තා වන්නට පටන් ගත්තේ මේ අතරවාරයේ ය. මෙම කටකතා හේතුවෙන් නායකයාගේ දුරකථනයට විසුමක් නොවූවේ සැවොම කතා කරමින් ඒ ගැන විමසන්නට වූ නිසාය.

සමගි ජන බලවේගය නියෝජනය කරමින් සර්වපාක්ෂික ආණ්ඩුවට එකතුවූ හරීන් ප්‍රනාන්දු ද තඩිමුඩියේ අග්‍රාමාත්‍ය කාර්යාලයට පැමිණියේ අගමැතිගෙන් මේ ගැන විමසීමටය.

''සර් සමාජයේ කතා වෙනවා 21 වෙනි සංශෝධනයෙන් රට බලාපොරොත්තු වන කාරණා කිහිපයක් ඉටු කරන්න පොදුජන පෙරමුණ ඉඩ දෙන්නේ නෑ කියලා. මොකක්ද අපි කරන්නේ.'' කියමින් හරීන් කරුණු 3 ක් අගමැතිවරයාට ඉදිරිපත් කළේය.

ද්විත්ව පුරවැසියන්ට පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට නොහැකි වන වගන්තිය, අගමැතිවරයා ඉවත් කිරීමේ බලය ජනාධිපතිවරයාගෙන් ඉවත් කොට පාර්ලිමේන්තුවට පැවරීමේ වගන්තිය හා ආයතන ප්‍රධානීන් පත් කිරීමේදී අග මැතිවරයාගේ නිර්දේශය මත පත් කිරීමේ වගන්තිය යන කරුණු 3 හරීන් ඉදිරිපත් කළ ඒවා විය.

''බය වෙන්න එපා මම කියපු විදියට වැඩ ටික කරනවා. නැතිනම් යනවා. අධිකරණ ඇමැති විජයදාස මේක හදලා ඉවරයි. පක්ෂ නායකයන්ට 21 සංශෝධන කෙටුම්පත දෙන්න කියලා මම කිව්වා. තව සති දෙකක් තියෙනවානේ පාර්ලිමේන්තුව රැස් වෙන්න. පාර්ලිමේන්තුවට මේක ආවට පස්සේ අපි බලමු.'' අගමැතිවරයා හරීන්ට කීවේය.

### ● අගමැති මහින්ද කට ඇරලා....

පසුගිය සතියේ හිටපු අගමැති මහින්ද රාජපක්ෂ රහස් පොලිස් නිලධාරීන් හමුවේ පසුගිය නම වැනි සඳුදා මේ රටේ සිදු වූ සිද්ධීන් පිළිබඳ කටඋත්තරයක් දුන්නේය. එදින උදෑසන අරලියගහ මන්දිරයේ පැවති රැස්වීම් හා එහි ස්වභාවය පිළිබඳ නිලධාරීන් මෙහිදී හිටපු අග මැතිවරයාගෙන් කරුණු විමසූ බව පැහැදිලි විය.

එම කරුණු විමසීමට පැය තුනකටත් වඩා අධික කාලයක් ගත විය. රහස් පොලිසියේ නිලධාරීන් එම රාජකාරියෙන් පසුව හිටපු අගමැතිවරයාගෙන් සමුගෙන පිටව යන විට ඒ ආරංචියට අමාත්‍යවරු 20 දෙනෙක් පමණ අගමැතිවරයා සිටි නිවසට පැමිණ සිටියහ.

අගමැතිවරයා වෙහෙසට පත්ව සිටියේ නැත. සිනාමුසු මුහුණින් තම හිතවතුන් පිළිගත් අගමැති මහින්ද ඔවුන් හා ඉතා කුළුපගව කතාබහක කළේය. ඇඳිවත පමණක් ඉතිරිවී නිවාස සහ දේපළ රාශියක් අළු දූලි බවට පත්වූ ඇමැතිවරු කීප දෙනෙක්ද එතන වූහ.

''ගියේ නැද්ද හානියට පත් වෙච්ච ඕගොල්ලන්ගේ ගෙවල් බලන්න....''

සමහර අය ඒ මොහොත වන විටත් තම තමන්ගේ නිවාසවලට මොනවා වූයේ දැයි බලන්නටවත් ගිහින් තිබුණේ නැත....

''නීතිය ක්‍රියාත්මක වෙනවා නම් අගතියට පත් වෙච්ච හැම පාර්ශ්වයකටම සාධාරණය ඉටු වෙන්න ඕන...'' හිටපු අගමැතිවරයා ඔවුන්ගෙන් සියලු විස්තර විමසමින් කීවේය.

''ඕගොල්ලන්ට මේ තරම් හානි වෙලත් ඒව ගැන විමසා බලන්නෙත් නැතුව මේ වෙලාවේ මාව බලන්නත් ආවා. කලගුණ මතක තිබීම හා අතීතය අමතක නොවීම ගැන සමහර අය මට හොඳ පාඩම් ඉගැන්නුවා... මට ඒව හරි වටිනවා.... අගමැතිවරයා කිව්වේය.

මේ අතර ඇමැතිවරු කීප දෙනෙක් තම තමන්ගේ නිවාස බලන්නට ගියේ ද පසුගිය සතියේය. ගාමිණී ලොකුගේ ද ඒ අතර විය. ගාමිණී ලොකුගේ තමන්ගේ නිවසට ගොස් සිදුවී ඇති හානිය විමසා බලන මොහොතේ ඔහුගේ පැරණි පත්තර මිත්‍රයෙක් ද එතැනට ගියේ ය. ඒ මිත්‍රයා කුමාරසිරි හෙට්ටිගේ ය....

''මේ නිවාස හා දේපළ දේශපාලනයෙන් හරි හම්බ කරපු දේවල් නෙවෙයි... මගේ ගෙට මුලින් ගැහුවේ ඔය සිද්ධි වෙන්න කලින්. පස්සේ අක්කගෙයි නංගිගෙයි ගෙවල් දෙකක් සුන්නත්දූලි කරලා...

මේ වෙලාවේ විනාශයට පත් නිවස ඉදිරියේ තිබූ හිස සුන් සමාධි බුදු පිළිමයක් ඉදිරියේ ලොකුගේ ගේ විඩාබර නෙත් දෙක නතර වූයේය....

''කෝ මේකෙ හිස....'' මිතුරා විමසුවේය.

'' අන්න තියෙනවා ගේ ඉස්සරහ රඹුටං ගහේ දෙබලක ගහලා.... බුදු පිළිමවල බෙලි කඩලා ළිංවලට වහ දමලා මේ මිනිස්සු මොනව බලාපොරොත්තු වුණාද දන්නෙ නෑ... හැබැයි එයාල කවුද, ඔවුන්ගේ මානසිකත්වයත් මොකක්ද කියන එක තමයි ඒවයින් පැහැදිලි වුණේ.....'' ලොකුගේ කීවේය.

විසිපස්වන බදාදා උදේ 10.19 ට තිබූ නැකතෙන් අභිනව මුදල් අමාත්‍යවරයාගේ වැඩ භාර ගැනීම සිදු විය.

මෙම අවස්ථාවට සහභාගි වන්නට මහාචාර්ය ජී. එල්. පීරිස්, මනුෂ නානායක්කාර, ඇතුළු ඇමැතිවරු කිහිප දෙනෙක් පැමිණ සිටියහ. ජනාධිපති ලේකම්වරයා මෙන්ම අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකනායක ද පැමිණ සිටියේය. නිමල් ලංසා මන්ත්‍රීවරයාද මෙතන සිටියේය.

පත්වීමේ වගකීම භාර ගැනීමෙන් පසුව අගමැතිවරයා ජනාධිපතිවරයා හා යම්කිසි ගැඹුරු සාකච්ඡාවක නිරතව සිටියේය. වටේ පිටේ වුන් ඇමැතිවරු කිහිප දෙනාද ඊට එක්කාසු වූහ. ඔවුන්ගේ මුහුණුවලින් පෙන්නුම් වූ ලක්ෂණ අනුව ඒ කතා කළේ යම් බැරෑරුම් කාරණාවක් බව පැහැදිලි වූහ.

අග්‍රාමාත්‍යවරයා වැඩ භාර ගැනීමෙන් මොහොතකට පසු නික්ම ගියේය.

ජනාධිපතිවරයාත් ඒ සමඟම නික්ම යෑමට සූදානම් වෙද්දී මනුෂ හා ජී. එල්. ඇමැතිවරු ඔහුව මඟ නවතාගෙන යම් කරුණක් කතා කරන්නට වූහ. එය ඊළඟට පැවැත්වෙන සාකච්ඡාව සඳහා යම් පෙර සූදානමක් විය හැකි බව පැහැදිලි විය.

### ● දැවෙන ප්‍රශ්න මෙහෙම විසඳමු...

ඉන් ටික වේලාවකට පසු ජනාධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් විදේශ රැකියා සම්බන්ධයෙන් වූ විශේෂ රැස්වීමක් ආරම්භ විය. විදේශ අමාත්‍යාංශයේ හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන්, විදේශ රැකියා ආයතනයේ සභාපති ඇතුළු නිලධාරීන්, ලංකාවේ වෘත්තීය පුහුණු ආයතනවල සභාපතිවරු ඇතුළු ඉහළ නිලධාරීන් මෙම රැස්වීමට පැමිණ සිටියහ. බැලූ බැල්මට මෙම රැස්වීම මනුෂ නානායක්කාර ඇමැතිවරයාගේ මෙහෙයවීමෙන් කැඳවන ලද අවස්ථාවක් ලෙස හැඳින්විය හැකි විය. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ ද මෙයට ඉතා උනන්දුවෙන් සහභාගි වූයේ අද පවතින ප්‍රශ්නවලට විදේශ රැකියාවලින් ලොකු පැතිකඩක් ආවරණය වන බව අවබෝධ කරගෙන සිටි නිසාය.

''අපේ තරුණ තරුණියෝ පුහුණු කරලා විදේශ රැකියාවලට යවන එකෙන් මේ රටේ දැවෙන ප්‍රශ්න දෙකකට එකවර උත්තර ලැබෙනවා. එකක් මේ රටේ තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නෙට හොඳ උත්තරයක් ලැබෙනවා. අනිත් එක රට තුළ අද තියෙන ඩොලර් හිඟයට නිසි උත්තරයක් ලැබෙනවා. හැබැයි මේක අපි හොඳ සැලකිල්ලෙන් සැලසුම් කරලා කරන්න ඕන වැඩක්. අපේ මේ තරුණ පුහුණු ශ්‍රම සම්පත ඉතා හොඳින් තෝරා බේරාගෙන ලෝකයෙන් වැඩිපුරම මුදල් ප්‍රතිලාභ ලබා ගන්න පුළුවන් හොඳ රටවල්වලට තමයි යවන්න ඕන...'' ජනාධිපතිවරයා සාකච්ඡාව පටන් ගනිමින් කීවේය.

''දැන් මොනාද අපිට මේ සඳහා බාධා තියෙන්නෙ... පුහුණු ශ්‍රමයද භාෂාවද...''

''ඔය දෙකම ගැන වෙන් වෙන් වශයෙන් ප්‍රශ්න තියෙනවා...'' නිලධාරීන් පෙන්වා දුන්හ.

''මේ වගේ වැඩි ආදායම් ලබන්න පුළුවන් විදේශ රැකියාවලට රජයේ සේවකයෝත් යවන්න පුළුවන්. ඒ ගොල්ලන්ටත් අවස්ථාවක් දෙන්න බලන්න. සල්ලි ටිකකුත් හම්බකරගෙන පිටරට අත්දැකීමකුත් අරගෙන එයාලට එන්න අවස්ථාවක් දෙමු..'' ජනාධිපති යෝජනාවක් කළේය.

''ඔව් සර් අපි දැන් රජයේ සේවකයන්ටත් අවස්ථාව දෙනවා. අපි ඊයේ චක්‍රලේඛයක් නිකුත් කළා විදේශ ආදායම් ලබන අය එම ආදායම් මෙරටට එවීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත ගැන. ඒගොල්ලො පිටරටවල් වල දී හම්බ කරල මේ රටට මුදල් එවන කොට ඒ ගොල්ලන්ටත් ප්‍රතිලාභ ලැබෙන ක්‍රමයක් අපි යෝජනා කළා.''

''ඒ වැඩපිළිවෙළට හොඳ ප්‍රතිචාර තියෙනවා. ඉදිරියේදී ඒ වැඩපිළිවෙළ ඉතා සාර්ථක වේවි....'' නිලධාරීන් පෙන්වා දුන්හ.

''වාහන පර්මිට් එකක් දීම වගේ ප්‍රතිලාභ ලබා දීම් ඉතාම හොඳ යෝජනා... අපි මේ වගේ දේවල් ඉතා නිර්මාණශීලීව සැලසුම් කරන්න ඕන.''

''සමහර රජයේ සේවකයන්ට ප්‍රශ්නයක් තියෙනවා රට ගියාම මෙහේ ජ්‍යෙෂ්ඨත්වය කැඩෙන එක ගැන...''

''මේ ගොල්ල රාජ්‍ය බැංකු හරහා සල්ලි එවන්න ඕන. එතකොට ජ්‍යෙෂ්ඨත්වය බිඳ නොවැටෙන විදියට ක්‍රමවේදයක් අපි හදමු...'' ජනාධිපති යෝජනා කළේය.

''පෝලන්තය රුමේනියාව ජපානය වගේ රටවලින් අපට හොඳ ඉල්ලුමක් තියෙනවා සර්...'' නිලධාරීන් පෙන්වා දුන්හ.

''අපේ සෞඛ්‍ය අංශයේ යම් යම් පුහුණු නිලධාරීන්ට හොඳ ඉල්ලුමක් තියෙනවා. හැබැයි ඉතින් සෞඛ්‍යටත් සේවකයෝ මදි. මෙහෙන් නිදහස් කරනවා නම් එහෙන් හොඳ ප්‍රතිලාභ ලබන්න පුළුවන්...'' මනුෂ හිනාවෙමින් කීවේය.

''පෝලන්තයේ රැකියා අවස්ථා තිබුණට කෝඩිනේට් කරන්න embassy එකක් නැති එක අපිට ලොකු පාඩුවක්...'' නිලධාරීන් කීහ.

ජපන් රටේ රැකියා ගැන වෙනම කතාබහක් ඇති විය.

ජපන් රැකියාවකට යන එක ලේසි නෑ. භාෂාව ගැන එයාලා සැලකිලිමත්. ජපන් භාෂා ලෙවල් 4 එකවත් සමත් වුණොත් විතරයි ඒවට ඉල්ලුම් කරන්න හැකි වන්නේ...''

''භාෂාව උගන්වන එක ලොකු ප්‍රශ්නයක් නෙවෙයි... කොච්චර කලක් ගත වෙනවද..?

''මාස හතරෙන් උගන්වලා පුහුණු කරලා ඉවර කරන්න පුළුවන්...'' නිලධාරියෙක් පෙන්වා දුන්නේය.

''රැකියා අවස්ථා තියෙනවා නම් එක බැච් එකකට 5000 හරි කමක් නෑ බඳවගෙන හොඳ පුහුණුවක් දීලා ඉක්මන් රැකියා අවස්ථා ලබා දෙන්න.'' ජනාධිපති කීවේය.

ජපන් භාෂාව පුහුණු කිරීම ගැන තව තවත් කතාබහ විය. විශාල රැකියා සංඛ්‍යාවක් ජපානයෙන් ලබාගත හැකි බව මනුෂ පෙන්වා දුන්නේය.

''ජපන් භාෂාව වැඩිපුරම අද උගන්වන්නෙ පුද්ගලික අංශය. ඒ වුණාට ඒවයි ගොඩක් ගණන් සැරයි.''

''වැඩි පිරිසක් බඳවා ගෙන ඒගොල්ලන්ට භාර දෙන්න. පිරිස වැඩි වුණාම ඒගොල්ලන්ට ලාභය වැඩි වෙනකොට අය කරන ෆී එක අඩු කරන්න පුළුවන්...'' ජනාධිපති උපදෙස් දුන්නේය.

''ඇමැතිතුමා මේ ගැන තානාපතිවරු එක්කත් තවදුරටත් කතා කරන්න...''

දිවයින පුරාම තරුණයන් බඳවා ගෙන විදේශ රැකියා හා භාෂා සඳහා පුහුණු කිරීම පුළුල් කිරීමට අවශ්‍ය යෝජනා හා සැලසුම් මෙම සාකච්ඡාවේදී කතාබහට ලක් වූ නිසා මෙම කතාබහ ඉතාමත්ම වැදගත් එකක් විය. සාකච්ඡාව සාර්ථක නිසා මනුෂ ඇමැතිවරයා සිටියේ ඉතාමත්ම සතුටිනි.

### ● ඇමැති දිනේෂ් වැඩ අරඹයි....

පාර්ලිමේන්තු දිනයක් නොවූවත්, සභානායක දිනේෂ් ගුණවර්ධන, පසුගිය බ්‍රහස්පතින්දා (26) හදිසියේ පාර්ලිමේන්තුවට පැමිණියේ විශේෂ කාර්යක් ඉටුකිරීම සඳහාය.

කථානායකවරයා හමුවූ ඔහු විශේෂ ලියැවිල්ලක් භාරදුන්නේය. ඒ, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය සඳහා වන කෙටුම්පතය.

''මම 20 වෙනිදා පාර්ලිමේන්තුවේ විශේෂයෙන් ප්‍රකාශයක් කළා, කෝප්, කෝපා ඇතුළු සියලු කාරක සභාවල බලතල වැඩිකරන්න, ස්ථාවර නියෝගවලට සංශෝධන කඩිනමින් ගේනවා කියලා. ඒ වචනය ඉෂ්ට කරන්නයි ආවෙ'' දිනේෂ් නිලධාරීන්ට කීවේය.

''දැන් වෙලා තියෙන්නෙ, කාරක සභා වාර්තා ඉදිරිපත් කළාට, ඉන් එහා ඒ නිර්දේශ ක්‍රියාත්මක කරවාගන්න බලතල නෑ''

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා ද වන දිනේෂ් බදාදා (25) රට පුරා සියලු දිසාපතිවරුන්ද සූම් තාක්ෂණය ඔස්සේ ඇමතීය. ඒ, රට පසුකරමින් සිටින දුෂ්කර කාල පරිච්ඡේදය තුළ, ග්‍රාම සේවා නිලධාරියාගේ සිට ඉහළටම පැවරී ඇති වගකීම සිහිපත් කර පොදු ජනතාව වෙනුවෙන් විශේෂයෙන් කළ යුතු වැඩ හඳුන්වා දීමටය.

දිනේෂ් ගුණවර්ධනගේ නායකත්වයෙන් යුතු මහජන එක්සත් පෙරමුණේ මධ්‍යම කාරක සභාවද පසුගිය බදාදා විශේෂ රැස්වීමක් පැවැත්වීය.

''ඇතිවෙමින් තියෙන ආහාර අර්බුදයට අපි පක්ෂයක් හැටියට රජයේ ඉක්මන් අවධානය යොමුකරවන්න ඕනෙ'' ම.එ.පෙ. උප සභාපති, හිටපු රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි කියා සිටියේය.

''ඒකට ආහාර නිෂ්පාදනය වැඩිකරන්න, ගොවියාට සහන දීම වේගවත් කරන්න ඕනෙ'' ම.එ.පෙ. නියෝජ්‍ය ලේකම් පා.ම. යදාමිණි ගුණවර්ධන පවසද්දී දිනේෂ් මෙසේ කීය.

''ඒ වගේම අත්‍යවශ්‍ය බෙහෙත් හිඟයකින් තොරව දෙන එකටත් ප්‍රමුඛතාව දෙන්න ඕනෙ.''

ඒ අනුව පොදු ජනතාව වෙනුවෙන් ආහාර, බෙහෙත් අර්බුදයට ආණ්ඩුව දෙන විසඳුම් වේගවත් කරවා ගැනීම උදෙසා ම.එ.පෙ. මැදිහත් වීමට තීරණය කෙරිණි.

අගමැති රනිල් වික්‍රම වික්‍රමසිංහ පසුගියදා සතියේ මාධ්‍ය ගණනාවකට කතා කළේය. විදෙස් මාධ්‍ය කීපයක්ද ඒ අතර විය. එහිදී ලෝක ප්‍රකට ආර්ථික නාලිකාවක් වූ ''බ්ලූම්බර්ග්'' මාධ්‍ය ආයතනයට ද සම්මුඛ සාකච්ඡාවක් ලබාදී තිබුණි. ඉන්දියාවේ ප්‍රධාන නාලිකාවකට සම්මුඛ සාකච්ඡාවක් දෙමින් අගමැතිවරයා කීවේ චීනය, ජපානය හා ඇමෙරිකාව අපේ මිතුරන් වුවත් ඉන්දියාව යනු අපගේ ඥාතියකු බවයි. ජාත්‍යන්තර නාලිකා සියල්ලම අගමැතිගේ දැනුම ගැන ප්‍රශංසා කළේ සාකච්ඡාවන් අවසානයේ පැවැති පෞද්ගලික සංවාදයන්හීදී ය.

අඟහරුවාදා පෙරවරුවේ නායකයා කෘෂි හා ආහාර කමිටුව හමුවූවේ ඉදිරියේදී පැමිණීමට නියමිත ආහාර හිඟය ගැන සාකච්ඡා කිරීමටය. එහිදී වගා සංග්‍රාමයකට යෑම ගැන කතා කළ අතර ගම් මට්ටමින් මෙය ඇරඹීමට අවශ්‍ය උපදෙස් අග මැතිවරයා විසින් නිලධාරීන්ට ලබා දුන්නේය. එහි පසුවිපරම් කටයුතු මහින්ද අමරවීර අමාත්‍යවරයාට හා චාමර සම්පත් මන්ත්‍රීවරයා වෙත පැවරුවේය. වජිර අබේවර්ධන හා පාලිත රංගේ බණ්ඩාරට ද ඊට සම්බන්ධ වන ලෙස අගමැතිවරයා උපදෙස් දුන්නේය.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පිරිසක් ද එදින සවස අගමැති රනිල් මුණගැසුණේ ය. 21 වෙනි සංශෝධනය ගැන මෙන්ම රාජ්‍ය ඇමැතිධුර සම්බන්ධයෙන් මෙහිදී සාකච්ඡා කෙරිණි. එහිදී අගමැති දැනුම් දුන්නේ කුමන ඇමැතිකම දුන්නත් වැටුප් හා වරප්‍රසාද නොමැතිව වැඩ කරන්නට සිදුවන බවය. අවසානයේ ජනාධිපතිවරයා සමඟ සාකච්ඡා කොට ශ්‍රීලනිපය ට හිමි රාජ්‍ය ඇමැතිධුර සම්බන්ධයෙන් අවසන් තීන්දුවකට පැමිණීමට දෙපාර්ශ්වය තීන්දු කර ගත්හ.

විදේශ අමාත්‍යාංශයේ ලේකම්ධුරය සම්බන්ධයෙන් පැමිණිලි ගණනාවක් අගමැතිවරයා වෙත ලැබී තිබුණු අතර අගමැතිවරයා එම පැමිණිලි ජනාධිපතිවරයා වෙත යොමු කර තිබුණි. අවසානයේ විදේශ සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරිනියක වන අරුණි විජයවර්ධන පත් කිරීමට කටයුතු කෙරිණි.




● බුලිත ප්‍රදීප් කුමාර

**ඔස්ට්‍රේලියාව රටට පැමිණීමෙන් ලෝකයට දෙන පණිවිඩය ඩොලර්වලින්වත් මිල කරන්න බැහැ**

# ඔස්ට්‍රේලියාව එන්නේ රටේ අර්බුදයට විසඳුම් අරගෙන

## ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලේකම් මොහාන් ද සිල්වා



**ඔස්ට්‍රේලියා ක්‍රිකට් කණ්ඩායමේ ශ්‍රී ලංකා තරග සංචාරය ලබන මස මුල සිට ආරම්භ කිරීමට සැලසුම් යොදා ඇත. එහෙත් එම සංචාරයට ඔවුන් සහභාගි වේද යන්න මෙරට තුළ පවතින අයහපත් වාතාවරණය හේතුවෙන් එය අවිනිශ්චිත තත්ත්වයකට පත්ව තිබිණි. ආසියානු කුසලාන ක්‍රිකට් තරගාවලියත් ශ්‍රී ලංකාවෙන් එපිටට ඇදී යෑමට වැඩි ඉඩකඩක් පවතී. එක් අතකට ඩොලර් අර්බුදයකට මැදිව අගාධයකට තල්ලු වෙමින් තිබෙන රටක පිටරටින් ක්‍රිකට් කණ්ඩායම් ගෙනවිත් මාස ගණන් ක්‍රිකට් ක්‍රීඩා කරවීම කෙතරම් යුක්ති සහගත දැයි තවත් පිරිසක් විමසති. මේ පැනයන්ට පිළිතුරු සොයා ගැනීම පිණිසත්, ඇතැම් අවිනිශ්චිතතාවයන් විසඳා ගැනීම සඳහාත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ලේකම් මොහාන් ද සිල්වා මහතා සමග "දිවයින ඉරිදා සංග්‍රහය" පැවැත්වූ සාකච්ඡා සටහන මෙසේ දැක්වේ.**

### ක්‍රිකට් අනාගතය සුබයි

**ප්‍රශ්නය - ඔස්ට්‍රේලියා ක්‍රිකට් කණ්ඩායමේ ශ්‍රී ලංකා තරග සංචාරය මේ වන විට අත්හැර දමන ලකුණු පහළවී තිබෙනවා. එරටින් ලැබෙන ආරංචි එතරම් හොඳ නැහැ. මේ සම්බන්ධයෙන් ඔබට ඍජු පිළිතුරක් ලබා දිය හැකිද?**

**පිළිතුර** - ඔවුන්ගේ ශ්‍රී ලංකා තරග සංචාරය ස්ථිරයි. සැලසුම් කළ පරිදි සියලු තරග පැවැත්වෙනවා. පන්දු වාර විස්සයි විස්ස තරග තුනක්, එක්දින තරග පහක්, සහ ටෙස්ට් තරග දෙකක් ඔවුන්ගේ සංචාරයට ඇතුළත් වෙනවා. එහි වෙනසක් වෙලා නැහැ. අදාළ දිනයේ, අදාළ වේලාවේදී ඔවුන් ලංකාවට පැමිණේවි.

### එල්පීඑල් මුදල් ඔක්කොම ලැබුණා

**ප්‍රශ්නය - එහෙත් ඔවුන් තවමත් ශ්‍රී ලංකාවේ තරග සංචාරය සම්බන්ධයෙන් දෙගිඩියාවකින් පසුවන බව එරට මාධ්‍ය වාර්තාවල සඳහන් වෙනවා.**

**පිළිතුර** - ඔවුන් නොපැමිණෙන බවක් ඔස්ට්‍රේලියා ක්‍රිකට් ආයතනයෙන් අපට කවදාවත් දැනුම් දීමක් කර නැහැ. අඩුම තරමේ පසුගිය 09 වෙනිදා රට තුළ දැඩි කලකෝලාහල සිදු වූ අවස්ථාවේදීවත් එවැනි දෙයක් ඔවුන් දැනුම් දුන්නේ නැහැ. බස් සහ මැති ඇමැති නිවාස ගිනිබත් කරමින් රටම භීෂණයකින් ඇළලී ගිය අවස්ථාවේදී ඔස්ට්‍රේලියාවට මේ සංචාරය අවලංගු කරන්න ඕන තරම් හැකියාව තිබුණා. ඔවුන් එම දිනවල එසේ නොකිරීම පිළිබඳව අපි ඔස්ට්‍රේලියාවට ස්තුතිවන්ත විය යුතුයි.

**ප්‍රශ්නය - රට අර්බුදයකට පත් වෙලා තිබෙන මොහොතක විදෙස් ක්‍රිකට් කණ්ඩායම් රටට ගෙනැවිත් ක්‍රිකට් සැණකෙළි පැවැත්වීම කෙතරම් සදාචාර සම්පන්නද?**

**පිළිතුර** - ඔවුන් එන්නේ අර්බුදයට විසඳුම අරගෙන. ඔවුන් එන්නේ රටේ ප්‍රතිරූපය නැවත ගොඩනඟමින්. ලෝකයේ ප්‍රධාන පෙළේ ඇතැම් රටවල් ශ්‍රී ලංකාව මේ වනවිට සංචාරයට නුසුදුසු රටක් බවට නම් කර තිබෙනවා. එය අප ඉස්සරහට පැමිණි කළු ලකුණක්. අපි ඒ කළු ලකුණු මකා ගෙන ඉදිරියට යා යුතුයි. රටක් ලෙස අපට හැමදාම මෙහෙම ඉන්න බැහැ. අපි යළි නැඟී සිටින බව ලෝකයට පෙන්වන්න ඕනා. ඊට තිබෙන හොඳම අවස්ථාව ඔස්ට්‍රේලියා ක්‍රිකට් කණ්ඩායමේ මෙම ශ්‍රී ලංකා තරග සංචාරයයි. ඒ වගේම ලංකාවට මේ එන්නේ නොදියුණු රටකින් නොවේ. ඔස්ට්‍රේලියාව කියන්නේ ලෝකයේ දියුණුම රටක්. ඔවුන් අපේ රටට පැමිණ ක්‍රිකට් ක්‍රීඩා කිරීමෙන් ලෝකයට යන සුබවාදී පණිවුඩය ඩොලර් කෝටි ගාණකටවත් මිලට ගන්න පුළුවන් දෙයක් නෙවෙයි. මේ සංචාරය වැටුණු රට ගොඩගන්න අපට ලැබුණු ආශිර්වාදයක්.

**ප්‍රශ්නය - මෙම සංචාරය සංවිධානය කිරීමෙන් රටට ලැබෙන්නේ එම කීර්තිය පමණද?**

**පිළිතුර** නැහැ. අපිට මේ වෙලාවේ නැතිම දේ ඔවුන් අරන් එනවා. ඒ තමයි ඩොලර්. රටක් ලෙස ලෝකයෙන් ඩොලර් ඉල්ලන්න සිදු වී තිබෙන මොහොතක ඔස්ට්‍රේලියා ක්‍රිකට් කණ්ඩායම මෙරටට පැමිණීමෙන් පමණක් ඩොලර් මිලියන දෙකහමාරක් පමණ රටට ලැබෙනවා. සංචාරකයෝ නැතිව පාළුවට ගොස් තිබෙන හෝටල් කාමරවල දොරවල් යළි ඇරෙන්න ගන්නවා. මේ සංචාරය මාස එකහමාරක් පමණ දීර්ඝ එකක්. එම කාලය තුළදී ඔවුන් වියදම් කරන හැම ඩොලරයක්ම ලැබෙන්නේ අපේ රටට. හෝටල්වලට එසේ සුබ කලක් උදා වෙද්දි එම හෝටල් වලට අවශ්‍ය එළවළු, පලතුරු සපයන පුද්ගලයාගේ පටන් ව්‍යාපාර දියුණු වෙනවා. ක්‍රිකට් තරග නරඹන්න එන ප්‍රේක්ෂකයන්ට කඩල ගොට්ට විකුණන පුද්ගලයාගේ පටන් අතට සල්ලි ලැබෙනවා. ත්‍රීවිල් රථ රියැදුරන්ටත් ආදායමක් එනවා.

**ප්‍රශ්නය - කොපමණ ඩොලර් ආදායමක් මෙම සංචාරයෙන් බලාපොරොත්තු වෙන්න පුළුවන් ද?**

**පිළිතුර** - ඩොලර් මිලියන දෙකහමාරක පමණ ආදායමක් බලාපොරොත්තු වෙනවා. රූපවාහිනි අයිතීන්වලින් පමණක් ඩොලර් මිලියන දෙකක පමණ ආදායමක් ඇස්තමේන්තු කර තිබෙනවා. ඒ නිසා මේ තරග සංචාරය රටට ඉතා වැදගත් වෙනවා.

ඒ වගේම ඔස්ට්‍රේලියා ''ඒ'' කණ්ඩායමත් ඊට සමගාමීව ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට නියමිතයි. ඒ කියන්නේ කෙටි කාලයක් තුළ තරගාවලි හතරක් ලංකාවේ පැවැත්වෙනවා. අපි මේ ලැබෙන්න තිබෙන දේවල් අහිමි කරගත යුතු නැහැ. ඒ වගේම විවිධ ප්‍රශ්නවලින් හෙම්බත්ව සිටින ජනතාවට තරමක් හෝ මානසික සුවයක් ලබා ගැනීමටත් මේ තරගාවලියත් ඉවහල් වේවි.

### තරග කාල සටහන සංශෝධනය කරන්න ඇහැව්වා ඒත් ඊට පරක්කු වැඩියි

**ප්‍රශ්නය - ඔස්ට්‍රේලියා කණ්ඩායම සමග පැවැත්වෙන තරගාවලියේ කාලසටහන සංශෝධනය කිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ඔස්ට්‍රේලියා ක්‍රිකට් ආයතනයෙන් ඉල්ලීමක් කළාද?**

**පිළිතුර** - ඔව්. ඒත් අපි ඊට ප්‍රමාද වැඩි වුණා. රටේ තිබෙන විදුලි අර්බුදය හේතුවෙන් සීමිත පන්දු වාර තරගාවලි 2ට පෙර ටෙස්ට් තරග පැවැත්වීමට පුළුවන්ද කියා ඉල්ලීමක් කළා. එහෙත් ඒ වන විටත් ඔස්ට්‍රේලියාව සීමිත පන්දු වාර තරග ඉලක්ක කර පුහුණුවීම් අරඹා තිබුණා. ඒ අනුව ඔවුන් අපට කිව්වේ සලසුම් කළ පරිදි පන්දු වාර 20 - 20 තරගාවලියෙන් සංචාරය ආරම්භ කර ටෙස්ට් තරගාවලියෙන් සංචාරය නිමා කිරීමට කටයුතු යොදමු කියලයි. ඒ පිළිබඳව අපි නැවත ඉල්ලීමක් කරන්න ගියේ නැහැ.

**ප්‍රශ්නය - රටේ මෙතරම් උග්‍ර බලශක්ති අර්බුදයක් තිබියදී දිවා රාත්‍රී තරග පැවැත්වීමට අවශ්‍ය විදුලි බලය ලබා ගන්නේ කෙසේද ?**

**පිළිතුර** - අපි ලංකා විදුලි බල මණ්ඩලය සමග මේ පිළිබඳව සාකච්ඡා කළා. ඔවුන් අපට එකඟ වුණා ජෙනරේටර් ලබා දී විදුලි බලය සැපයීමට.

### ඉන්දියාව සහෝදරත්වයේ හස්තය අපට දිගුකර තිබෙනවා

**ප්‍රශ්නය - ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙන් රිජ්වේ ළමා රෝහලට සහ මහරගම අපේක්ෂා රෝහලට අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ඩොලර් මිලියන දෙක ක මුදලක් පසුගියදා ලබා දී තිබුණා. එහි වටිනාකම රුපියල් වලින් කෝටි 71 ක් වෙනවා. මෙතරම් මුදලක් ලබා දෙන්න තරම් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය පොහොසත් ද?**

**පිළිතුර** - රටේ පොහොසත්ම ක්‍රීඩා ආයතනය තමයි ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය. හැබැයි එම මුදල් ලබා දීම පොහොසත්කමට එහා ගිය පරිත්‍යාගයක්. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ සභාපති ශම්මි සිල්වා මහතාගේ අදහසක් මත තමයි එම කටයුතු සිදු වුණේ. මෙවැනි පරිත්‍යාගයන් අපි ඕන තරම් කරනවා. ඒ වගේම රටේ වෙනත් ක්‍රීඩා සංගම් සහ ආයතනවලටත් අවශ්‍ය මූල්‍ය සහයෝගයන් සපයනවා. පැරාලිම්පික් ශූරයන් අගයමින් ඔවුන්ටත් රුපියල් කෝටියකට වඩා මුදල් තිළිණ ලබා දුන්නා.

**ප්‍රශ්නය - ආසියානු කුසලාන ක්‍රිකට් තරගාවලිය ශ්‍රී ලංකාවේ පැවැත්වෙනවාද?**

**පිළිතුර** - අපි තවමත් උත්සාහ කරන්නේ ශ්‍රී ලංකාව තුළ එම තරගාවලිය පැවැත්වීමටයි. එසේ නොමැති වුවහොත් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේදී ශ්‍රී ලංකාවේ සත්කාරකත්වයෙන් යුතුව එම තරගාවලිය පවත්වනවා. සත්කාරකත්වය මත හිමිවන සියලු ආදායම් අපට එහිදී ලැබෙනවා.

**ප්‍රශ්නය - එල්පීඑල් තරගාවලිය ඔස්සේ හිමිවිය යුතු සියලු මුදල් ශ්‍රී ලංකා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලැබී තිබෙනවා ද?**

**පිළිතුර** - ඔව්. ලෝකයේ පැවැති විවිධ තත්ත්වයන් මත මුදල් ලැබීමේ යම් ප්‍රමාදයක් තිබුණා. ඒත් දැන් ඒ සියලු මුදල් ලැබී තිබෙනවා.

**ප්‍රශ්නය - ඉන්දීය ක්‍රිකට් කණ්ඩායම පසුගිය ජූලි මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණීමෙන් කොපමණ ආදායමක් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට හිමි වුණා ද?**

**පිළිතුර** - එම මුදල ඩොලර් මිලියන 10ක් තරම් ඉහළ මුදලක්. ඒ කාලයේ වටිනාකම අනුව රුපියල් කෝටි 200කට වැඩියි. එහි සම්පූර්ණ ගෞරවය ඉන්දියාවට හිමි විය යුතුයි. ඒ වගේම ඉන්දීය ක්‍රිකට් කණ්ඩායමේ පුහුණුකරු රාහුල් ද්‍රාවිඩ්ට ද අපි එහිදී ස්තුතිය පුද කළ යුතුයි. ඔවුන් ගේ කණ්ඩායමේ ක්‍රීඩකයන් නම දෙනෙක්ම නිරෝධායනයට ලක්කර තිබියදීත් සංචාරය අවලංගු නොකර සියලු තරග නිමවන තෙක් ඉන්දියාව ලංකාවේ රැඳී සිටියා. ඊට පෙර ඔවුන් අතර මැදදී ලංකාවෙන් ගියානම් අපිට ඩොලර් මිලියන හතරක් අහිමි වෙනවා. ඒ සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සහ ඉන්දීය ක්‍රිකට් පාලක මණ්ඩලය අතර තිබෙන මිත්‍රත්වයත් බොහෝ සෙයින් ඉවහල් වුණා. ශම්මි සිල්වා මහතා දෙරටේ ක්‍රිකට් ආයතන අතර මේ මිත්‍රත්වය වැඩි කරගෙන තිබෙනවා.

**ප්‍රශ්නය - රටේ ක්‍රිකට් දැන් පැමිණ තිබෙන තත්ත්වය ගැන ඔබ තෘප්තිමත්ද ?**

**පිළිතුර** - නොයෙක් අභියෝග මැද අපි යම් තැනකට අද පැමිණ තිබෙනවා. ජාතික කණ්ඩායම සාර්ථකත්වයට පැමිණ තිබෙනවා. ඉතා ඉහළ දක්ෂතා දක්වන ක්‍රීඩකයන් කීප දෙනෙක් අපට ඉන්නවා. ඒ වගේම යොවුන් කණ්ඩායමේ ක්‍රීඩකයන් කිහිප දෙනෙක් අනාගතය පිළිබඳව සුබ පෙර නිමිති පහළ කර තිබෙනවා. ජාතික කණ්ඩායමට ඕනෑම අවස්ථාවක යොදා ගැනීමට සමත් ක්‍රීඩකයන් පස් හය දෙනෙක්ම ''ඒ'' කණ්ඩායමේ සිටිනවා.

● සාකච්ඡා කළේ - **කුෂාන් සුබසිංහ**

---

## දේශපාලනය ගැන....

11 පිටුවෙන්

**පෞද්ගලික ජීවිතයේ දේවල් මඟඇරීම ගැන කනගාටුවක් තියෙනවාද ?**

ළමයි වෙනුවෙන් කරගන්න බැරිවෙච්චි දේවල් මට තිබුණා. මීට වැඩිය දේවල් කරන්න තිබුණනම් කියලා හිතෙන අවස්ථාවන් නැතුවා නොවේ. ඒක තියෙනවා. නමුත් මම අද සන්තෝස වෙනවා ළමයි දෙන්නා හොඳ තත්ත්වයක ඉන්නේ අපි කරපු හොඳ දේවල් නිසා කියලා හිතන්න පුළුවන්.

**ඔබ විශාල පිරිසකට නායකත්වය දෙන නායකයෙක්. නායකත්වය ගැන අපේ තරුණ තරුණියන්ට කියන්න කිව්වොත් මොනවද කියන්නේ ?**

නායකත්වයේ ගුණාංග ගොඩක් තියෙනවා. නායකයෙක් වුණාම නායකයාට විනයක් තියෙන්න ඕන. ඒත් එක්කම නායකයෙක් හැම වෙලාවෙම තමන් යටතේ ඉන්න පුද්ගලයන්ට දෙන්න පුළුවන් සියල්ලක්ම දෙන්න උත්සාහ කරන්න ඕන. ඒත් එක්කම ඔවුන් රැකබලාගන්න පුළුවන්කමක් තියෙන්න ඕන. හරිදේ කරන්න ඕන. තමුන්ගේ අයට ඇත්ත ඇතිසැටියෙන් කියන්න ඕන. නායකයෙක් වුණාම තමුන්ගේ පොදු අරමුණ තමන් යටතේ ඉන්න අයට පැහැදිළිවම දෙන්න ඕන. ඔවුන් ඒ සඳහා දිරිගන්වන්න ඕන.

**ඔබ ඒ දේවල් ඒ විදිහටම ක්‍රියාත්මක කරනවාද ?**

ඔව්. දැන් බලන්න යුද්ධය ජයග්‍රහණය කරද්දී ඒ භූමියේ හිටිය අයගෙන් තමන්ගේ පවුලේ අයටත් එක්ක රටක් තහනම් වෙලා තියෙන එකම පුරවැසියා මම. මටත් මගේ ළමයින්ටත් ඇමෙරිකා එක්සත් ජනපදය තහනම් කරලා තියෙන්නේ. එතකොට ඒ මම භූමියේ සටන් කළ නිසා. එතකොට හමුදාපතිවරයාට ඒ තහනම නෑ. පහුගිය දවස්වල අනුරාධපුරේ, ගාල්ලේ, කුරුණෑගල වෙච්චි දේවල්වලට හමුදාපතිවරයා වගකිවයුතුයි කියලා සමහරු කියනවා. කිසිම ප්‍රශ්නයක් නෑ. ඕනම වෙලාවක අපිට වගකීම ගන්න පුළුවන් වෙන්න ඕන. අපි යටතේ ඉන්න පුද්ගලයන් රැක ගන්න ඕන. හැමකෙනෙක් සතුවම නායකත්ව ගුණාංග තිබිය යුතුයි. ඒ නිසා මම කියන්නේ නායකයෙක් වුණාම හොඳ දැනුමක් තියෙන්න ඕන. නොදන්නා දේ ගැන හැකි ඉක්මනින් ඉගෙන ගන්න ඕන. තමුන්ගේ යටතේ ඉන්න අය පොදු අධිෂ්ඨානය ඉටු කරගන්න පොළඹවන්න ඕන.

**පහුගිය 09 වැනිදා සහ ඉන් පසුව ඇතිවුණ සිද්දිවලදී යුද්ධ හමුදාව හරියට ක්‍රියාත්මක වෙලා තියෙනවාද?**

රටක හමුදාව යොදාගන්නේ එක් අවස්ථාවකදී. රට මහජන සාමය රඳවා ගැනීම පොලිසියේ වගකීමක්. පොලිසියට සහය වීම තමයි හමුදාව මෙවැනි තත්ත්වයකදී කරන්නේ. 09 වැනිදා සිදුවුණු අවාසනාවන්ත සිදුවීමේදී එක් අවස්ථාවකදී හමුදාව කැඳවනවා. ඊට පෙර අපි හදිසි අවස්ථාවලදී සහය දක්වන්න යොදවලා තිබුණා. නමුත් අපි ඍජුව සම්බන්ධ වෙන්නේ 09 වැනිදා. අපි හමුදාව විසින් සිදුකළ යුතු සියලුම දේ සිදුකළා. නමුත් සමහර තැන්වල යම් යම් සිදුවීම් සිදුවුණා. යම්කිසි පුද්ගලයෙක් හිතාමතා හෝ හමුදාවේ ක්‍රමවේදයට අනුව යමක් සිදුකර නැත්නම් අපි අනිවාර්යයෙන්ම ඒ අයට විරුද්ධවත් පියවර ගන්නවා. හමුදාව යොදවලා පැය හය හතක් ඇතුළත අපි රටේ තත්ත්වය සමනය කළා.

**රට තියෙන්නේ අමාරු තැනක. ඒ අර්බුදයෙන් මිදෙන්න හමුදාව පැත්තෙන් කළ හැකි දේ හඳුනාගෙන තියෙනවාද ?**

අනිවාර්යයෙන්ම. ඔබ දන්නවා මීට වසරකට පමණ පෙර ඉඳලා අපි කෘෂිකර්ම රෙජිමේන්තුවක් හැදුවා. ඒක හදලා හමුදාවක් විදිහට අපි ස්වයංපෝෂිත වෙන්නේ කොහොමද කියලා බැලුවා. අපි විශාල භූමි ප්‍රදේශයක අස්වද්දලා තියෙනවා. අස්වනු නෙළා ගන්නවා. ඒත් එක්ක අපි දැන් අපේ ආම්පන්න හදාගන්නවා. ඒ විතරක් නෙවෙයි අපේ අවශ්‍යතා අපි විසින්ම සපයා ගන්න අපි කටයුතු කරලා තියෙනවා. ඒත් එක්කම පතොරම් නිෂ්පාදනය සඳහා පවා පර්යේෂණ කරලා තියෙනවා. ඒත් එක්කම අපි තොරතුරු තාක්ෂණය පැත්තෙන් ඉස්සරහට ඇවිත් තියෙනවා. විනයක් ඇති විශාල කැපවීමකින් දැනුම වගේම සම්පත්වලන් පිරිපුන් හමුදාවක් අපේ රටේ තියෙන්නේ. කොවිඩ්වලට, හරිත කෘෂිකර්මයට, ගොඩනැඟිලි ආදී ඉදිකිරීම්වලට, ක්‍රීඩා භූමි පාසල්, ආගමික ස්ථාන සංවර්ධනය සඳහා අපි ඉදිරිපත් වෙලා ඉන්නවා. කළ නොහැකි දෙයක් සඳහා හෝ අපිට අවස්ථාව දුන්නොත් අපි ඒ දේ කරනවා. අපිට කරන්න පුළුවන් ගොඩක් දේවල් තියෙනවා. බැහැයි කියලා දෙයක් නෑ. අපි ඉන්නේ ව්‍යවස්ථාවට අනුව රට ආරක්ෂා කරගන්න. අපි ඒ කටයුතු කරන ගමන් අපිට දෙන්න පුළුවන් දායකත්වය අපිට පුළුවන් සෑම අවස්ථාවකදීම ලබා දීලා තියෙනවා. රටේ සහ ජනතාවගේ ආරක්ෂකයා විදිහට යුද්ධ හමුදාව ප්‍රමුඛ ත්‍රිවිධ හමුදාව රටේ ජනතාව ආරක්ෂා කරන ගමන් රටේ ජනතාව වෙත ලබා දිය හැකි ඕනෑම දෙයක් කරන්න අපි සැදී පැහැදී කැපවී ඉන්නවා.

**අපිට නැඟිටින්න පුළුවන් කියලා ඔබ හිතනවාද?**

අනිවාර්යයෙන්ම. බැහැයි කියලා දෙයක් නෑ. කොවිඩ් කාලෙදිත් කට්ටිය ඔහොමනේ කිව්වේ. අපි ඒ වෙලාවේ කිව්වා කොවිඩ් සම්බන්ධයෙන් ලෝක සිතියමේ ශ්‍රී ලංකාව හොඳ ස්ථානයකට ගේනවා කියලා. අපි ඒ දේ කළා. අදටත් කියන්න තියෙන්නේ බැහැයි කියලා දෙයක් නෑ. අපි නැඟිටින්න ඕන. මේ තියන ප්‍රශ්න බැලුවාම හැමෝම එකා වගේ නැඟිටින්න ඕන. මම හිතන්නේ අපේ තියන විවිධ අදහස් පසෙක තියලා අපි එකා මෙන් නැඟිටින්න මේක හොඳම අවස්ථාව. කුලල්කාගන්නේ නැතිව නැඟිට්ටොත් අපිට කෙටි කාලයකදී යළි නැඟිටින්න පුළුවන්.

**ඔබ දේශපාලනයට එනවාද?**

මම දන්නේ හමුදාව පිළිබඳව. අපිට ඕවා පිළිබඳ කිසිම උනන්දුවක් නෑ.

**හැබැයි ඔබ ඔය පුටුවෙන් ගියත් රටට යමක් කරන්න පුළුවන් නේද ?**

ඔව් අනිවාර්යයෙන්ම කරන්න පුළුවන්. ඒ සඳහා ලැබෙන අවස්ථාවන් අනුව කටයුතු කරන්න ඕන.

---

## ඔව් "ස" ලේල් තමයි...

11 පිටුවෙන්

**ප්‍රශ්නය - සමගි ජන බලවේගය විනාශ කිරීමේ ප්‍රයත්නයකද ඔබ නිරතව සිටින්නේ?**

**පිළිතුර** - රනිල් වික්‍රමසිංහ මහත්මයාගෙන් ගැලවිලා ඇවිත් සමගි ජන බලවේගය ගොඩනඟපු එකද විනාශ කරනවා කියන්නේ. ඒ වෙනුවෙන් වෙහෙස මහන්සිව කටයුතු කිරීමද විනාශ කරනවා කියන්නේ. අපි සජබය ගොඩනගපු මිනිස්සු. එය විනාශ කරන්න අපට බැහැ. ඉස්සරහට තේරේවි ඇත්තටම පක්ෂය හරි තැනට ගෙනාවේ කවුද කියලා. සජබය විනාශ කරනවා නම් තව කට්ටිය අරගෙන අපට එකට යන්න තිබුණා. අපි එහෙම එකක් කළේ නැහැ. දැන්වත් හරි පාරට එන්න පක්ෂයට අවස්ථාව තිබෙනවා. දැන් අභියෝග බාර ගන්න බැරි අය කොහොමද මාස හයකට පස්සෙ රට බාර ගන්නේ. එතන ප්‍රශ්නයක් නැද්ද?

**ප්‍රශ්නය - රටට ආදායම් නොලැබීම විශාල ප්‍රශ්නයක්. ඔබට ලැබී ඇති අමාත්‍ය ධුරය අර රටට ආදායම් උත්පාදනය කළ හැකි අමාත්‍ය ධුරයක්. සංචාරකයන් ගෙන්වාගැනීම ගෙන්වා ගැනීම සඳහා ඔබගේ වැඩපිළිවෙළ කෙසේද?**

**පිළිතුර** - ඒ සඳහා සුවිශේෂී වැඩපිළිවෙළක් සැකසීමට අප කටයුතු කර තිබෙනවා. සංචාරක කර්මාන්තය තුළින් ඍජු හා වක්‍ර රැකියා මිලියන තුනක් පමණ තිබෙනවා. 2018 වසරේ සංචාරකයන් මිලියන 2.3 ක් මෙරටට පැමිණ තිබෙනවා. රට තුළ තියෙන තත්ත්වය මත විදෙස් රටවල් සංචාරක සීමා පැනවීම තුළින් රටට සංචාරකයන් පැමිණීම විශාල වශයෙන් සීමාව තිබෙනවා. එම නිසා තානාපතිවරුන් සමග සාකච්ඡා කර එම සීමාවන් ඉවත් කරගැනීමට අවශ්‍ය කටයුතු කරමින් තිබෙනවා. ඒ වගේම ක්ෂේත්‍රයේ යම් යම් වෙනස්කම් රැසක් සිදු කිරීමටත් සංචාරකයන් රටට ආකර්ෂණය කර ගැනීමටත් කෙටි කාලීන සැලැස්මක් දියත් කිරීමට කටයුතු කරනවා. මම විශ්වාස කරනවා ඒ සති දෙකක් විතර යන විට සංචාරකයන් මෙරටට ගෙන්වා ගැනීමට අවශ්‍ය මාර්ගය සකස් කරගන්න හැකි වේවි කියලා.

**ප්‍රශ්නය - ඇතැම් දේශපාලන පක්ෂ මේ මොහොතේ පවතින තත්ත්වයෙන් ගොඩ යන්න නම් ඡන්දයක් පැවැත්විය යුතු බව යෝජනා කරනවා.**

**පිළිතුර** - ඔබ හිතනවද මේ මොහොතේ ඡන්දයක් තියන්න සුදුසු වාතාවරණයක් පවතිනවා කියලා. බලයට කෑදර මිනිස්සු තමයි මේ වෙලාවේ ඡන්දයක් ඉල්ලන්නේ. රට තුළ ආහාර, බෙහෙත්, විදුලිය, ඇතුළු අත්‍යවශ්‍ය දේවල් විශාල ප්‍රමාණයක් නැහැ. ඒ වගේ තත්ත්වයක් තුළ ඡන්දයක්.. ඕකට තමයි බලලෝභය කියන්නේ.

හරි නම් සියලු දෙනාම අඩුම තරමේ මාස හයකටවත් එකතු වෙන්න ඕන. අපි නිධානයක් උඩ ජීවත්වෙන හිඟන ජාතියක්. මේ තත්ත්වය අපි වෙනස් කරන්න ඕනි නැද්ද. ඒක මෙහෙම කතා කරලා කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. කවුරු කවුරුත් එකට එකතු වෙන්න ඕන. රට කෙළින් කරන්න නම් එකමුතුකම අත්‍යවශ්‍යයි.

## ශ්‍රීලනිප 4කට රාජ්‍ය...

මේ පිළිබඳව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහලේකම් දයාසිරි ජයසේකර මහතාගෙන් විමසූ අවස්ථාවේ ඔහු සඳහන් කළේ තමාට ඒ පිළිබඳව නිලවශයෙන් තොරතුරු ලැබී නොමැති බවය. කෙසේ වෙතත් තමා කිසි විටෙකත් පක්ෂයේ තීන්දු තීරණවලට පිටින් ගොස් ආණ්ඩුවේ ඇමැතිධුර ලබාගැනීමට කටයුතු නොකරන බවද ඔහු සඳහන් කළේය.

## රාජ්‍ය වියදම බිලියන ....

දැනට මේ වසර (2022) ඉදිරිපත්ව ඇති රාජ්‍ය අයවැය වෙනුවට නව අන්තර්කාලීන අයවැයක් ඉදිරිපත් කිරීමට රජය තීරණය කර ඇති අතර එම අයවැය මගින් මෙම වියදම් කප්පාදුව සිදුවීමට නියමිතව ඇත.

විශේෂයෙන් රජයේ ප්‍රාග්ධන වියදම් කප්පාදුවෙන් මේ වියදම් අඩු කිරීමට මහ භාණ්ඩාගාරය අපේක්ෂා කරයි. මේ අනුව විවිධ අංශවලින් ප්‍රාග්ධන වියදම් සඳහා වැය කිරීමට වෙන්කර තිබූ මුදල් ඉතිරි කරගෙන ඒවා ජනතාවට සහන ලබාදීමට යොදා ගැනීමට රජය සැලසුම් කර ඇත.

අග්‍රාමාත්‍ය හා මුදල් ඇමැති රනිල් වික්‍රමසිංහ මහතා ද පවසන්නේ අන්තර්කාලීන අයවැයෙන් වියදම් කප්පාදුවට ප්‍රමුඛතාව ලබාදෙන බවය. ඒ අතරම බදු ආදායම් වැඩිකර ගැනීමට අපේක්ෂා කරන බවද හෙතෙම කියයි.

## විදුලි අවුල ලිහන්න...

එමෙන්ම ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගේ ඉහළ දායකත්වයක් එක්කර ගැනීමට සහය දෙන ලෙසද ජනාධිපතිවරයා විදුලි බල ක්ෂේත්‍රයෙ ප්‍රවීණයන්ගෙන් ඉල්ලීමක් කර තිබේ.

සමස්ත විදුලි ඉල්ලුමෙන් 70%ක් පුනර්ජනනීය බලශක්ති උත්පාදනයෙන් ලබාගැනීම රජයේ ඉලක්කය වී ඇතත් මේ වනවිට මෙගාවොට් 700 කට ආසන්න විදුලි ධාරිතාවක් සූර්ය බල ශක්තියෙන් ජනනය කළ හැකිව තිබෙන නමුත් විදුලි බල ඉංජිනේරුවරුන්ගේ විරුද්ධත්වය මත එය ඉටුකර ගැනීමට නොහැකි වී ඇති බව සඳහන් වේ.

පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් විදුලිබල උත්පාදනයට දායක කර ගැනීමේ දී පවතින ගැටලු පිළිබඳව සොයා බැලීමට කොළඹ කොටුව ජනාධිපති මන්දිරයේ පැවැති සාකච්ඡාවේදී ජනාධිපතිවරයා මේ බව පැවසීය.

ප්‍රධාන විදුලිබල පද්ධතියේ දැනට පවතින ධාරිතාව මත මෙගාවොට් දහසකට ආසන්න නව විදුලි උත්පාදනයක් එක්කර ගත හැකි බව විදුලිබල මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරී (සම්ප්‍රේෂණ) පී. ඩබ්. හෙන්දහේවා මහතා කියයි.

ඛනිජ තෙල් යොදාගනිමින් විදුලි ඒකකයක් නිෂ්පාදනයට රුපියල් සියයකට සහ ගල් අඟුරු යොදා ගනිමින් විදුලි ඒකකයක් නිෂ්පාදනයට රුපියල් පනහකට අධික පිරිවැයක් දැරීමට සිදු වේ. ඒ වෙනුවට පුනර්ජනනීය බලශක්තිය යොදා ගැනීමෙන් ඩොලර් බිලියන 300 කට අධික මුදලක් වාර්ෂිකව ඉතිරි කරගත හැකි බව මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් දමිත කුමාරසිංහ මහතා සඳහන් කළේය.


තාප බලයෙන් විදුලි උත්පාදනයට මසකට ඩොලර් මිලියන 100 කට අධික මුදලක් වැය වේ. ඒ අනුව පවතින මිල ගණන් යටතේ තවදුරටත් විදුලිය සැපයීම දුෂ්කර කාර්යයක් බව විදුලිබල සහ බලශක්ති අමාත්‍ය කංචන විජේසේකර මහතා පැවසීය. සූර්ය බලශක්තියෙන් විදුලි උත්පාදනය සඳහා පාසල්, රෝහල් ඇතුළු රජයේ ගොඩනැඟිලිවල වහල ප්‍රයෝජනයට ගැනීමෙන් විශාල භූමි ප්‍රමාණයක් ඉතිරි කරගත හැකි බව පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය අනිල් ජාසිංහ මහතා පැවසීය.

## මනූෂ ජපන් රස්සා ...


ලබාදෙන ලෙසට කම්කරු සහ විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මහතා මෙරට ජපාන තානාපති කාර්යාලයේ භාරකාර ජ්‍යෙෂ්ඨ තානාපති නිලධාරී කට්සුකී කොටාරා මහතාගෙන් ඉල්ලීමක් කර තිබේ.

දෙරට අතර සම්බන්ධතා ශක්තිමත් කරගැනීම පිළිබඳව මෙන්ම ජපානයේ වැඩි රැකියා අවස්ථාවන් තරුණ තරුණියන්ට ලබා දීමට ඇති හැකියාව ගැනත් අවධානය යොමු කර ඇත.

මේ වන විට ජපානයේ වැඩි
රැකියා අවස්ථා ප්‍රමාණයක් විවෘතව පවතින්නේ භාෂාව හදාරා ඇති තරුණ තරුණියන්ට පමණක් වන නිසා ඉදිරියේ දී භාෂා ප්‍රවීණතාවක් නොමැති තරුණ තරුණියන්ට
රැකියා අවස්ථා ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන ලෙසට කම්කරු සහ විදේශ රැකියා ඇමැතිවරයා ජපාන තානාපති කාර්යාලයේ භාරකාර ජ්‍යෙෂ්ඨ තානාපති
නිලධාරිවරයාගෙන් ඉල්ලා ඇත. ඒ අනුව ජපානයට ගොස් භාෂාව හදාරා
රැකියාවක යෙදීමේ අවස්ථාව, පාසල් හැර ගිය තරුණ තරුණියන් දහසකට ලබා දෙන ලෙසට ඉල්ලීමක් කර තිබේ. ඒ සම්බන්ධයෙන් යහපත් ප්‍රතිචාරයක් දක්වමින් කොටාරා මහතා පවසා ඇත්තේ වැඩි රැකියා අවස්ථාවන් ලංකාවට ලබා දීමට ජපානය සෑම විටම කටයුතු කරමින් සිටින බවය. විශේෂයෙන්ම සාත්තු සේවක ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා ශ්‍රී ලාංකිකයන් වෙත ලබාදීමට ජපානය වැඩි කැමැත්තකින් සිටින බව ද, ජපානයේ වියපත් ජනගහනය ඉහළ යමින් තිබෙන නිසා මෙම ක්ෂේත්‍රයේ රැකියා අවස්ථාවන් වර්ධනය වන බව ද පවසා තිබේ.



# කාන්තාවකට ඇන්න එළුවා තෙවසරක් හිරේ



• මහින්ද මහත්තයා කියනවාලු මෙහෙම කරයි කියලා දන්නවා නම් අරලියගහ මන්දිරේට ආපු අයට යන්න දෙන්නේ නෑ කියලා

• ඉතිං.....නායකයෙක් වුණාම දුරදක්නා නුවණකුත් තියෙන්න එපායැ බං...!

කීර්ති වර්ණකුලසූරිය

කාන්තාවකට අංවලින් ඇන මරුමුවට පත් කිරීමේ සිද්ධියක් මත අප්‍රිකානු අධිකරණය එළුවකුට වසර 3ක සිර දඬුවමක් නියම කර ඇත. පාර හරහා මාරුවන අවස්ථාවේ පිටුපසින් පැමිණි එළුවා ඇයට අංවලින් ඇන තිබේ.

අදු වාපින් නමැති කාන්තාවගේ හිසට මුලින්ම ඇන ඇති එළුවා පසුව පපුවට ඇන ඇත.

පුද්ගලයන් රැසක්ම එළුවාට එරෙහිව සාක්කි දී තිබේ.

## නමයට නමක් සොයයි...

ඊට අදාළව නම් කිහිපයක්ම ලැබී ඇති බව පිවිතුරු හෙළ උරුමයේ නායක හිටපු ඇමැති උදය ගම්මන්පිල මහතා පැවසීය.

කලින් පක්ෂ 10ක් ව තිබූ එම එකමුතුව දැන් පක්ෂ 9ක් බවට පත්ව ඇති බව දේශපාලන එකමුතුවේ ජ්‍යෙෂ්ඨ ප්‍රකාශකයෙක් පැවසීය.

ඊට හේතුවී ඇත්තේ ටිරාන් අලස් මහතා ඇමැති ධුරයක් ලබාගෙන (එක්සත් මහජන පක්ෂය) තිබීමය. ඒ අනුව එම 10 දැන් 9ක් වී ඇත. ඊට ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ, ලංකා සම සමාජ පක්ෂය, ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂය, ජාතික නිදහස් පෙරමුණ, පිවිතුරු හෙළ උරුමය, ජාතික කොංග්‍රසය, විජය ධරණි ජාතික සභාව, යුතුකම ජාතික සංවිධානය ඇතුළත් වෙයි.

## ඖෂධ හිඟයෙන්...

හිඟ වීමෙන් සෞඛ්‍ය සේවාව තවදුරටත් පවත්වාගෙන යෑමට නොහැකි තත්ත්වයේ දැඩි අර්බුදයක් නිර්මාණය වී ඇතැයි සමස්ත ලංකා වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සඳහන් කර සිටී.

වකුගඩු රෝගීන් භාවිත කරන අත්‍යවශ්‍ය ඖෂධ, රසායනාගාර පරීක්ෂණ සඳහා භාවිත කරන රසායනික ප්‍රතිකාරක ඇතුළු අත්‍යවශ්‍ය සෞඛ්‍ය උපකරණ මෙන්ම මුත්‍රා බට, ස්වසන උපකරණ සම්බන්ධ කොටස්, සේලයින් පවා මෙරට රෝහල් පද්ධතියෙන් දිනෙන් දින අවසන් වෙමින් පවතින බවද එම සංගමය පැවසීය. මීට අමතරව රෝහල් තුළ නේවාසික රෝගීන් සඳහා සපයන ආහාර වෙනුවෙන් සිදු කරනු ලබන ගෙවීම් පවා නතර වන තත්ත්වයක් මතුව ඇති බවත්, රෝගී සත්කාරක සේවාව ගුණාත්මකව පවත්වා ගැනීමට නම් වෛද්‍යවරුන් ඇතුළු සමස්ත රෝහල් කාර්ය මණ්ඩලයට අත්‍යවශ්‍ය මෙන්ම නියමිත මොහොතේ රෝහල් කරා පැමිණිය යුතු බවද එම සංගමයේ ලේකම්, වෛද්‍ය ජයන්ත බණ්ඩාර මහතාගේ අත්සනින් යුත් සෞඛ්‍ය ලේකම්වරයාට යොමු කළ ලිපියෙහි සඳහන් වේ.

## ශෂීට දුන් දඬුවම...

මෙම අනිවාර්ය සිර දඬුවමට අමතරව චූදිතට රුපියල් ලක්ෂයක දඩයක් ගෙවීමටද නියම කළ මහෙස්ත්‍රාත්වරයා එම දඩය නොගෙවන්නේ නම් මාස 06ක අමතර සිරදඬුවම් ලබා දීමටද නියෝග කළේය.

සැකකාරියට එරෙහිව ගොනු කර ඇති එම චෝදනාව පැමිණිල්ල විසින් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කර ඇති බවට අධිකරණය නිගමනය කිරීමෙන් අනතුරුව අධිකරණය ඇමැතූ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් දිලීප පීරිස් මහතා මෙය චේතනාන්විතව සිදු කළ වංචනික ක්‍රියාවක් වන බැවින් එවැනි වැරදි සිදු කරන සෙසු පිරිසට ද පාඩමක් ඉගෙනගත හැකි අයුරින් උපරිම දඬුවම් ලබා දෙන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටියේය.

සිය සැමියා දැරූ ඇමැති පදවියේ නිල බලය හා දේශපාලන බලය යොදාගනිමින් එම වංචනික ක්‍රියාව සිදු කර ඇති බවත් ඒ සඳහා එවකට අදාළ අංශවල ප්‍රධානීන් ලෙස කටයුතු කළ රාජ්‍ය නිලධාරීන්ගේ සහාය ලැබී ඇති බවත් එහිදී අධිකරණයට පැවසූ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා එබැවින් අධිකරණයේ එම තීන්දු ප්‍රකාශය රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යවන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටියේය.

පැමිණිල්ල මෙහෙයවූ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයා පැවසූ පරිදිම එම ක්‍රියාවලියේ දී රාජ්‍ය නිලධාරීන් දේශපාලන බලයට නතුව අයුතු ලෙස කටයුතු කර ඇති බව තම අධිකරණයට ද පෙනීයන්නේ යැයි සිය තීන්දුව නිකුත් කරමින් පෙන්වාදුන් මහෙස්ත්‍රාත්වරයා සුදුසු කටයුතු සඳහා තීන්දුවේ සහතික පිටපතක් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යවන ලෙසටද අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාට නියෝග කළේය.

එම ගමන් බලපත්‍රය ලබා ගැනීමේ ක්‍රියාවලියේදී එල්ල වී ඇති දේශපාලන බලය කොතෙක්ද යත් පැවසුවහොත් එක් දින සේවය යටතේ ඉල්ලුම් කළ එම ඉල්ලුම්පත්‍රය සඳහා අවශ්‍ය මුද්දර පවා ලබා දී ඇත්තේ රාජ්‍ය නිලධාරීන් බවත් විනාඩි කිහිපයක් හෝ පෝලිමක නොසිටි සැකකාරියට පැය කිහිපයක් ඇතුළතදී බල පත්‍රය ලබාදී ඇති බවත් දිලීප පීරිස් මහතා එහිදී අධිකරණයට පැවසීය.

එම සැකකාරිය අවිවාහක දරුවන් දෙදෙනකුගේ මවක් වන බැවින් හා පසුගිය 09 දා රටේ ඇතිවූ කලහකාරී සිදුවීම්වලදී ඇගේ නිවස ගිනිතබා විනාශ කොට ඇති බැවින් සිර දඬුවම් නියම නොකර ලිහිල් දඬුවමක් නියම කරන්නැයි සැකකාරිය වෙනුවෙන් පෙනීසිටි ජනාධිපති නීතිඥ ශවේන්ද්‍ර ප්‍රනාන්දු මහතා අධිකරණයෙන් ඉල්ලාසිටි නමුත් අධිකරණය එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය.

කූඨ ලේඛන ඉදිරිපත් කර නීති විරෝධී අන්දමින් ජාතික හැඳුනුම්පත් තබා ගැනීම ඇතුළු චෝදනා යටතේ එම සැකකාරියට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තවත් නඩුවක් මෙම අධිකරණය හමුවේ පවරා තිබූ අතර වැඩිදුර විභාගය ඉදිරියේදී පැවැත්වීමට නියමිතය.

දේශපාලන බලය ගිලිහී යෑමෙන් අනතුරුව දේශපාලන පළිගැනීමක් ලෙස සිය සේවාදායිකාවට එරෙහිව නඩු පවරා ඇති බවට විත්ති පාර්ශ්වය පෙන්වා දී ඇතත් එවැනි කරුණක් තම අධිකරණයට පෙනී නොයන්නේ යැයිද මහෙස්ත්‍රාත්වරයා එමගින් වැඩදුරටත් පැවසීය.

2010.09.13 දා සහ 2015.02.26 වැනිදා අතර කාලයේදී එම වරද සිදුකිරීමෙන් ආගමන සහ විගමන පනත යටතේ ගැනෙන වැරදි සිදු කළ බවට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පොලිස් පරීක්ෂක ජයන්ත වික්‍රමසිංහ මහතා අධිකරණයට කළ පැමිණිල්ලක් අනුව මෙම නඩු විභාගය පැවැත්විණි.

මේ අතර පූර්වගාමී ප්‍රධාන මහෙස්ත්‍රාත්වරයා විසින් ශෂී වීරවංශ මහත්මියට නියම කළ සිර දඬුවම් ඇතුළු දණ්ඩනයන්ට එරෙහිව කොළඹ මහාධිකරණය හමුවේ ප්‍රතිශෝධන අයදුම්පතක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බැවින් එම කොන්දේසියට යටත්ව ඇය ඇප මත මුදා හරින ලෙස ඉල්ලා නීතිඥ ආර්. ඒ. වී. රණවක මහතා ගොනු කළ ඇප ඉල්ලීමේ අභියාචනාව සලකා බැලීම සඳහා ලබන 30 වැනිදා කැඳවීමට කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් හර්ෂණ කැකුණවල මහතා ඊයේ පස්වරුවේ නියෝග කළේය.

# ටික දිනක් වැඩ කළත් රාජ්‍ය සේවක වැටුප් කප්පාදුවක් නෑ

චමින්ද සිල්වා

රාජ්‍ය සේවකයන් අංශ ප්‍රධානියාගේ ඉල්ලීම මත දින කීපයක් වැඩ කරනු ලැබුවත් ඔවුන්ගේ මාසික වැටුප් කප්පාදුවක් නොකරන බව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් ප්‍රියන්ත මායාදුන්න මහතා පැවසීය.

රාජ්‍ය සේවකයන් මගින් මහජන අවශ්‍යතා සපුරා දිය හැකි සංඛ්‍යාව තෝරාගැනීම එම ආයතනයේ ප්‍රධානියාට ලබාදී තිබෙන බවත් සිය සේවා ස්ථානයේ රාජකාරි අඛණ්ඩව කරගෙන යෑම සඳහා සේවාමුර වශයෙන් හෝ කාණ්ඩ වශයෙන් සේවකයන් ගෙන්වීමට ඔවුන් වෙත බලය පවරා දී ඇති බවත් ඒ මහතා පැවසීය.

රටේ පවතින ඉන්ධන අර්බුදය ඇතුළු ගැටලු කිහිපයකට විසඳුමක් ලෙස රාජ්‍ය සේවකයන් සීමාකර ගෙන්වීමට රජය තීරණය කරනු ලැබුවේ ආර්ථිකය යම් තත්ත්වයකට පත් වන තෙක් බව ද ඒ මහතා පැවසීය.

ඇතැම් අත්‍යවශ්‍ය නොවන රාජ්‍ය ආයතනවල සේවකයන් සාමාන්‍ය පරිදි රාජකාරි කරන බවට වාර්තා වන බවත් එසේ ඔවුන් පැමිණෙන්නේ වැටුප් කප්පාදුවක් සිදුවේ යැයි අනියත බියකින් බවත් මායාදුන්න මහතා පැවසීය.

එම නිසා රාජ්‍ය සේවකයන් ආයතන ප්‍රධානියා විසින් අත්‍යවශ්‍යම සේවාවලට ගෙන්වාගෙන ඉතිරි සේවකයන් නිවසේ සිට වැඩ කිරීමට කටයුතු කළත් ඔවුන්ගේ වැටුප් කප්පාදුවක් නොකර වැටුප් ගෙවීමට කටයුතු කරන බවද ලේකම්වරයා වැඩිදුරටත් පැවසීය.

# සාමකාමීව උද්ඝෝෂණය කළ අය අත්අඩංගුවට ගැනීම නවත්වන්න

### රංජිත් මද්දුම බණ්ඩාර පොලිස්පතිට ලියයි

ඉකුත් 09 වැනිදා ගෝල්ෆේස්හිදී ඇතිවූ ගැටුම පාදක කරගෙන ඊට පෙර පැවති සාමකාමී විරෝධතා හා උද්ඝෝෂණවලට දායක වූවන් අත්අඩංගුවට ගැනීම වැළැක්වීමට වහාම පියවර ගන්නා ලෙස සමගි ජනබලවේගය පොලිස්පතිවරයාගෙන් ඉල්ලා ඇත.

සෘජුව යම් ප්‍රචණ්ඩ ක්‍රියාවලට දායකවූවන් අත්අඩංගුවට ගැනීමට කටයුතු කළ ද අනෙකුත් පිරිස් අත්අඩංගුවට ගැනීම සිදු නොකළ යුතු බව ද එම පක්ෂයේ මහ ලේකම් රංජිත් මද්දුම බණ්ඩාර මහතා පොලිස්පති සී. ඩී. වික්‍රමරත්න මහතා වෙත ලිපියක් යවමින් ඉල්ලා ඇත.

# ලංගමට බිලියන 3.4ක පාඩුවක්

ලලිත් චාමින්ද

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2021 වසරේදී රුපියල් බිලියන 3.4ක පාඩුවක් ලබා ඇති බැව් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 වර්ෂයට අදාළව නිකුත් කොට ඇති වාර්ෂික වාර්තාවේ සඳහන් වේ.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2020 වර්ෂයේදී රුපියල් බිලියන 2.2ක අලාභයක් ලබා තිබුණි. එම අලාභය 2021 වර්ෂයේදී රුපියල් බිලියන 3.4 දක්වා වැඩි වී ඇත. එමෙන්ම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉකුත් වර්ෂයේ (2021) සමස්ත ආදායම රුපියල් බිලියන 26.9ක් දක්වා සියයට 13.7කින් අඩු වී ඇත. සමස්ත වියදම රුපියල් බිලියන 30.4ක් වූ අතර වියදම සියයට 9.1කින් අඩු වී ඇති බවද මහ බැංකු වාර්තාවේ සඳහන් වේ.

කෙසේ වුවද රජය මගින් ඉකුත් වර්ෂයේදී ආර්ථික වශයෙන් ප්‍රතිලාභ නොලැබෙන මාර්ගවල ප්‍රවාහන සේවා යෙදවීමට හා සහනාධාර වාර ප්‍රවේශපත්‍ර සඳහා රුපියල් බිලියන 12.2ක සහනාධාර මුදලක් ලංගමයට ලබාදී තිබුණි. ඉකුත් වර්ෂයේ දී ශ්‍රී ලංගමයේ ධාවන කිලෝමීටර් ගණන සහ මාර්ග කිලෝමීටර් ගණන පිළිවෙළින් සියයට 19.7 කින් හා සියයට 28.4 කින් පහළ ගොස් තිබූ බවද මහ බැංකු වාර්තාවේ සඳහන් වේ.

# ඉන්න මන්ත්‍රීලාගෙන් අලුත් දේශපාලන පක්ෂයක්

නෝමන් පලිහවඩන

පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ එකමුතුවකින් සැදුම්ලත් අලුත් දේශපාලන පක්ෂයක් ආරම්භ කිරීමට මන්ත්‍රීවරුන් පිරිසක් අතර මේ දිනවල කතාබහක් පැවැත්වෙන බව දේශපාලන ආරංචි මාර්ග සඳහන් කරයි.

දැනට රටේ පැනනැඟී ඇති තත්ත්වය අනුව පාර්ලිමේන්තු මැති ඇමැතිවරුන් මුහුණ දී තිබෙන විවිධ ප්‍රශ්න අසීරුතාවන් අනුව අලුතින් දේශපාලන පක්ෂයක් බිහිකිරීමේ අරමුණ ඇතිව මෙම සාකච්ඡා පැවැත්වේ.

මේ අතර ආණ්ඩු පාර්ශ්වයේ ඇතැම් හිටපු ඇමැතිවරුන්ගේ ක්‍රියාකලාප පිළිබඳව පැහැදීමක් නැති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කීපදෙනෙකු ද අලුත් දේශපාලන පක්ෂය ආරම්භ කිරීමට කැමැත්ත පළකර ඇතැයි ද වාර්තා වේ.

# මුල් කාර්තුවේදී නිමි තේ නිෂ්පාදනය කිලෝ මිලියන 4කින් පහළට

ලලිත් චාමින්ද

මෙම වර්ෂයේ (2022) මුල් කාර්තුවේ දී නිමි තේ කිලෝ ග්‍රෑම් මිලියන 04ක පමණ නිෂ්පාදනය අඩු වී ඇතැයි ද ඉන් ඇමෙරිකානු ඩොලර් මිලියන 73ක පමණ ආදායමක් අහිමි වී ඇතැයි ද පුද්ගලික තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමයේ සභාපති ලයනල් හේරත් මහතා පවසයි.

රසායනික පොහොර තහනම් කිරීමේ ප්‍රතිඵල මේ වන විට ලැබෙමින් පවතින බවත් කිලෝ 50 තේ පොහොර කොට්ටයක මිල රුපියල් විසිදහසත් තිස් දහසත් අතරේ පවතින බවත් ලයනල් හේරත් මහතා සඳහන් කරයි. පොහොර මිල වැඩිවීම තේ වතු හිමියන්ට දරාගත නොහැකි බවත් මෙම තත්ත්වය නිසා තේ වතු හිමියන්ගෙන් විශාල පිරිසක් රසායනික පොහොර භාවිතයෙන් ඉවත්ව ඇති බවත් හෙතෙම පවසයි. මේ නිසා අමු තේ දලු නිෂ්පාදනය මෙන්ම තේ දලුවල ප්‍රමිතිය ද අඩුවී ඇති බව ද තේ කර්මාන්තශාලා හිමියන්ගේ සභාපතිවරයා පවසයි.

අපේ රටේ නිමි තේ නිෂ්පාදනය දිගින් දිගටම අඩුවුවහොත් තේ නිෂ්පාදනය කරනු ලබන වෙනත් රටවල් අපිට හිමි ලෝක තේ වෙළෙඳපොළ අල්ලා ගැනීමේ අවදානමක් පවතින බවද ලයනල් හේරත් මහතා කියයි. එසේම පවතින ඉන්ධන අර්බුදය ද තේ කම්හල් සඳහා දැඩි ලෙස බලපා ඇති බව ද ප්‍රවාහනයේදී මෙන්ම අමු දර සැපයීමේ දී ද මෙය තේ කම්හල් හිමියන්ට දැඩි ලෙස බලපා ඇති බව ද ලයනල් හේරත් මහතා පෙන්වා දෙයි. අමු තේ දලු සඳහා ඉහළ මිලක් මේ වන විට ලැබී ඇතත් නිෂ්පාදන මිල වැඩි වී ඇති බව පවසන තේ කම්හල් හිමියන්ගේ සංගමයේ සභාපතිවරයා මේ නිසා කඩනමින් සහනදායී මිලකට තේ පොහොර ලබාදීමට කටයුතු කළ යුතුව ඇති බවද වැඩිදුරටත් සඳහන් කරයි.

# යූරියා ඉක්මනින් එවන්න ඉන්දියාව කඩිමුඩියේ වැඩ

උපාලි ද සේරම්

ඉදිරි යල කන්නය සඳහා වී ගොවීන්ට සහන මිලට ලබා දීමට ශ්‍රී ලංකා රජය ඉන්දීය රජයෙන් ඉල්ලා ඇති යූරියා පොහොර කඩිනමින් ලබාදීමට ඉන්දීය රජය එකඟතාවය පළකර ඇත.

ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික අර්බුදය හමුවේ යූරියා පොහොර ආනයනය සඳහා ඩොලර් නොමැතිකම මත අගමැති රනිල් වික්‍රමසිංහ මහතා විසින් ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි මහතාගෙන් මෙම ඉල්ලීම කර තිබිණි.

ඒ අනුව යූරියා මෙට්‍රික් ටොන් 65,000ක් ඉන්දීය රජය මගින් ශ්‍රී ලංකාවට ලබාදීමට නියමිතය.

ඉන්දීය රජය විසින් යූරියා පොහොර අපනයනය තහනම් කර ඇත. නමුත් රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් පැවති සාකච්ඡා අනුව ශ්‍රී ලංකාවට මෙම යූරියා පොහොර ලබාදීමට පියවර ගන්නා බව ඉන්දීය රජය දැනුම් දී තිබේ.

මෙම පොහොර තොගය ඉදිරි සතියේදී ලංකාවට එවීමට නියමිත බව ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් කාර්යාල ආරංචිමාර්ග සඳහන් කරයි.

## ඔමික්‍රෝන් සැර බාලයි...

වීම පහළ අගයක් ගෙන ඇත්තේ ඔමික්‍රෝන් ප්‍රභේදය සැර බාලවීම නිසා බව සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, විශේෂඥ වෛද්‍ය, හේමන්ත හේරත් මහතා දිවයින ඉරිදා සංග්‍රහයට ප්‍රකාශ කළේය.

ජනතාවගෙන් බහුතරයක් කුමන හෝ එන්නත් මාත්‍රා කිහිපක් ගෙන තිබීමත්, ඒ ඔස්සේ ලැබෙන ප්‍රතිශක්තිකරණයත් නිසාවෙන් ශ්‍රී ලංකාවට කොවිඩ් සහනයක් උදාවී තිබීම සතුටුදායක තත්ත්වයක් බවද ඔහු සඳහන් කළේය. ඒ අනුව දිනකට හමුවන කොවිඩ් රෝගීන් ගණන 20කට වඩා අඩු වී ඇතැයි ද පැවසීය.

කොවිඩ් නිරෝධායන මධ්‍යස්ථාන අවම වී ඇති බවත් එනමුත් ක්ෂණිකව පැමිණිය හැකි හදිසි අවස්ථාවන් වෙනුවෙන් ඒවා සූදානම්ව පවතින බවත් වෛද්‍ය හේමන්ත හේරත් මහතා පැවසීය. දැන් රටේ කොවිඩ් නැතැයි යන අදහසේ නොසිට මුව ආවරණ පැළඳීම ඇතුළු සෞඛ්‍ය පුරුදු නිබඳව ආරක්ෂා කළ යුතු බවද අවධාරණය කළේය.

# විදුලි කප්පාදුව දීර්ඝ වෙයි

චමින්ද සිල්වා

නොරච්චෝල ගල්අඟුරු බලාගාරයේ යන්ත්‍ර දෙකක් අලුත්වැඩියා කටයුතු සඳහා ලබන මස මැද දී නතර කිරීමට සිදුවන නිසා විදුලි කප්පාදුව දීර්ඝ වීමේ අවදානමක් මතුව තිබේ.

නොරොච්චෝල ගල්අඟුරු බලාගාරයේ යන්ත්‍ර 03 කින් නිපදවන මෙගාවොට් 900ක ධාරිතාවයෙන් මෙගාවොට් 810 ක් ජාතික විදුලිබල පද්ධතියට එක්කර තිබේ. ඉතිරි මෙගාවොට් 90 බලාගාරයේ අවශ්‍යතාවය සඳහා යොදා ගැනේ. මේ වනවිට බලාගාරයේ යන්ත්‍ර 03ක්ම ක්‍රියාත්මක කරමින් පැවැතියත් වසර 06 කින් සිදුකළයුතු අනිවාර්ය අලුත්වැඩියා කටයුතු සඳහා එක් යන්ත්‍රයක් ලබන මස (ජූනි) 18 වැනිදා නවතා දැමීමට කටයුතු කෙරේ. මෙහි නඩත්තු කටයුතු සිදුකර විදුලිය නිපදවීම සඳහා දින 75 ක් පමණ අවමවශයෙන් ගතවන බව විදුලිබල මණ්ඩලයේ මාධ්‍ය ප්‍රකාශක ඉංජිනේරු ඇන්ඩෲ නවමුනි මහතා පැවසීය. එම යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමත් සමග අනෙක් යන්ත්‍රය නවතා එහි අලුත්වැඩියා සිදුකර එයද ක්‍රියාත්මක කිරීමට දින 75 ක් ගතවන බවද ඔහු කීවේය.

බලාගාරයේ අනෙක් යන්ත්‍රය 2011 දී ආරම්භ කර තිබෙන අතර එය 2017 වර්ෂයේදී අලුත්වැඩියා කටයුතු සිදුකර තිබෙන බවද ඒ මහතා කීය.

මේ දිනවල විදුලි නිෂ්පාදනයෙන් වැඩි ප්‍රමාණයක් ජල විදුලියෙන් නිපදවන අතර වර්ෂාව අඩුවීමක් සිදුවුවහොත් ජල විදුලි නිෂ්පාදනය අඩුවීම සහ නොරොච්චෝල බලාගාරවල විදුලි ධාරිතාව අඩුවීම නිසා දැනට සිදුකරන විදුලි කප්පාදුව දීර්ඝ වීමේ අවදානමක් පවතින බව විදුලිබල මණ්ඩල අභ්‍යන්තර ආරංචිමාර්ග පවසයි.

# ශ්‍රී ලංකාවේ දුක බලන්න ඉන්දීය-ජපන් සන්ධානයක්

ප්‍රභාත් විතාන

අර්බුදයට පත්ව සිටින ශ්‍රී ලංකාවට ආධාර කිරීම සඳහා එක්ව කටයුතු කිරීමට ඉන්දියාව සහ ජපානය එකඟ වී ඇති බව ජපාන රජය පවසයි.

ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝදි සහ ජපාන අගමැති ෆුමියෝ කිෂිඩා අතර පසුගිය දා ටෝකියෝ නුවර පැවැති සාකච්ඡාවකින් අනතුරුව මේ බව ප්‍රකාශ කර තිබේ.

ඉන්දීය - ජපාන අග්‍රාමාත්‍යවරුන් පසුගිය 24 වැනිදා ටෝකියෝ නුවර පැවැති රාජ්‍ය නායක සමුළුවට එක්වීමෙන් අනතුරුව බලශක්ති, ආයෝජන හා ආරක්ෂක ඇතුළු ක්ෂේත්‍රවල ද්විපාර්ශ්වීය සාකච්ඡා පවත්වා තිබේ.

මෙම හමුවෙන් පසු ඔවුන් ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබඳව සාකච්ඡා කළ බවත් වත්මන් ආර්ථික අර්බුදය සහ රටේ මානුෂීය තත්ත්වය පිරිහීම සම්බන්ධයෙන් ඔවුන් එකිනෙකා සමග සහයෝගයෙන් කටයුතු කරන බවත් තහවුරු කළ බව ජපාන විදේශ කටයුතු අමාත්‍යාංශය නිවේදනයක් නිකුත් කරමින් සඳහන් කර සිටී.

# ආර්ථික ඝාතකයන්ට දඬුවම් දෙන්න

### සර්වපාක්ෂික අරගලකරුවෝ

පසුගිය කාලයේ රටේ අර්බුද රාශියක් ගොඩනඟමින් ජාතික ආර්ථිකය විනාශ කිරීමට කුමන්ත්‍රණය කිරීමේ වරදට වග කිවයුතු අය වහාම අත්අඩංගුවට ගෙන පවතින නීති ප්‍රතිපාදන අනුව ඉහළම දඬුවම් ලබා දිය යුතු බව සර්වපාර්ෂික අරගලකරුවෝ නිවේදනයක් නිකුත් කරමින් කියා සිටිති.

පසුගිය කාලයේ විදේශ සංචිත කළමනාකරණය කිරීමේ කිසිදු එකඟතාවයක් මහ බැංකුවේ මුදල් මණ්ඩල සාමාජිකයන් අතර නොපැවැති බව එහි මුදල් මණ්ඩල සාමාජිකයකු ලෙස කටයුතු කළ ජ්‍යෙෂ්ඨ නිලධාරියකු කළ ප්‍රකාශයකින් එය පැහැදිලි වනබව එහි දක්වේ.

එම නිකුත් කර ඇති නිවේදනයේ මෙසේද සඳහන් වේ.

2020 වර්ෂයේදී කෝවිඩ් - 19 වසංගතය නිසා ලෝකයේ රටවල් රැසක ආර්ථික අස්ථායිතා ඇති වෙමින් තිබියදී ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබාගැනීමට හැකියාව තිබිණි. නමුත් ඒ සම්බන්ධයෙන් වන තාක්ෂණික ඇගයීම්කරණ ක්‍රියාවලිය ආරම්භ වූ පසු ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ශ්‍රී ලංකාවේ ණය ගෙවීමේ හැකියාව ගැටලුසහගත බව මෙරට නියෝජිතයන්ට දන්වා ඇති අතර එම නිසා උපදේශකයන් පත් කරන ලෙස නිර්දේශ කර ඇත. නමුත් එවකට ආර්ථික කළමනාකරණය සිදු කළ කණ්ඩායම එම නිර්දේශවලට විරුද්ධතාව පළකර තිබේ.

මෙම කෝප් විමර්ශනය අතරතුරදී හෙළි වූ ජාතික ආර්ථික සම්බන්ධයෙන් වූ සංවේදී කරුණු හා පුද්ගල මැදිහත්වීම් කෙරෙහි මේ රටේ ජනතාව විශේෂ අවධානයක් යොමු කළ යුතුය. අද වනවිට රටේ ඉන්ධන, ගෑස්, ඖෂධ ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟයෙන් මිලියන ගණනාවක ශ්‍රී ලාංකිකයන් පීඩා විඳින අතර නුදුරේදීම ආහාර ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟයක් ද පැමිණීමට නියමිතව තිබේ.

# ‘ගෝල්ෆේස් ප්‍රහාරය’ ගැන විමර්ශන කරන නිලධාරීන්ට පොලිස් ලොක්කෙකුගෙන් බලපෑම්

හේමන්ත රන්දුණු

ගාලුමුවදොර අරගල භූමියට එල්ල වූ ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශන පවත්වන අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරීන්ට පොලිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියකු විවිධ බලපෑම් එල්ල කරන බව පොලිස් ආරංචිමාර්ග පවසයි.

මෙම උසස් නිලධාරියාගේ බලපෑම් එල්ලවීම නිසා ඇතැම් විමර්ශන නිලධාරීන් දැඩි අසීරුතාවට පත්ව ඇති බව ද වාර්තා වෙයි. ළඟදී පොලිස් දෙපාර්තමේන්තුවෙන් ඉවත් වීමට සූදානමින් සිටින මෙම උසස් පොලිස් නිලධාරියා ගාලුමුවදොර ප්‍රහාරයේදී තමන්ට එල්ල වී තිබෙන චෝදනාවලින් බේරීමට මේ ආකාරයට විමර්ශන නිලධාරීන්ට බලපෑම් එල්ල කරමින් සිටින බව ද වාර්තා වෙයි. තමන්ගේ නිවැරදිභාවය පෙන්වීමට අවශ්‍ය ආකාරයට විමර්ශනය පවත්වාගෙන යෑමට විමර්ශන නිලධාරීන්ට විවිධ අයුරින් බලපෑම් කිරීම නිසා ඉදිරි කටයුතු කරගෙන යෑමට එම නිලධාරීන්ට අසීරු තත්ත්වයක් මතු වී ඇත.







# හාල් එළවළු නැති රටේ මස් බිත්තරත් කලා හමාරයි!

## ආර්ථිකයට මුක්කු ගැසූ තවත් කර්මාන්ත දෙකක ඛේදාන්තය...

- ඉදිරියේදී මස්, බිත්තර මිල තවත් වැඩි වෙනවා...
- මේ වෙනකොට කුකුළු ගොවිපළවල් 80% ක් වැහිලා...
- ආහාර ලබාදී නඩත්තු කරන සතුන් කෝටි 13ට වැඩියි...
- රටේ ප්‍රෝටීන ඌණතාව තවත් ඉහළ යනවා...

දිරාපත් වෙමින් තිබෙන විසල් ගොඩනැඟිලි වල්වැදී තිබේ. එම ගොඩනැඟිලි සමීපයෙහි නතර කර තිබෙන ලොරි, ට්‍රැක්ටර්, ටිපර් රථවල රෝද මත වේ හුඹස්ය. සේවකයන් දුව පැන වැඩ කළ, මෙරට ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාදුන් සත්ත්ව ගොවිපළවල් පාළු වී ඇති අයුරු දකින විට සිත තෝන්තු විය. හදවත හිරිවැටිණි. හෙට, අනිද්දා වෙනකොට මස් කෑල්ලක්, බිත්තරයක් කන්න නැතිවන බව පසක් වන විට බඩ, පපුව පත්තු වී ගියේය. එහෙත් කළ හැකි කිසිවක් නැත. ඉස්තාලය බිඳගෙන අශ්වයා පැන ගොස් හමාරය.

මේ වනවිට මෙරට මස්, බිත්තර කර්මාන්තයේ ග්‍රාමීය සත්ත්ව ගොවිපළවල් 80% කට ආසන්න සංඛ්‍යාවක් වැසී ගොස් ඇති බව වාර්තා වේ. මෙරට මස්, බිත්තර කර්මාන්තයේ 70% ට වැඩි සත්ත්ව ගොවිපළවල් සංඛ්‍යාවක් පිහිටා තිබෙන වයඹ පළාතේ පමණක් කුඩා පරිමාණයේ සත්ත්ව ගොවිපළවල් විශාල සංඛ්‍යාවක් වැසී ගොස් ඇති බව සමස්ත ලංකා බිත්තර නිෂ්පාදනකරුවන්ගේ සංගමයේ සභාපති ආර්. එම්. සරත් රත්නායක මහතා අපට කීවේය. දූන් අප සිටිනුයේ ද වයඹ පළාතේ හෙට්ටිපොළ, පන්නල, කොබෙයිගනේ ප්‍රදේශයේ වැසී ගිය කුකුළු ගොවිපළක් තුළය. නටබුන් බවට පත්වෙමින් තිබෙන මේ කුකුළු ගොවිපළේ අප නතර වූයේ එම භූමියේ මිනිස් පරාන දෙකක් සිටින අයුරු දුටු නිසාය. වාරියපොල, හෙට්ටිපොළ, නිකවැරටිය ආදී අසල්වාසී ගම්මානවල ඇවර වූ ඇතැම් සත්ත්ව ගොවිපළවල මිනිසෙක් නොව, සුනඛයෙක්වත් දකගැනීමට නොලැබිණි. එමෙන්ම ඇවර වූ ඇතැම් සත්ත්ව ගොවිපළවල් කොහු කර්මාන්ත ලෙස නැවත විවෘත කර තිබෙන අයුරු ද විටින්, විට ඇස ගැටිණි.

**වැසී ගිය කුකුළු ගොවිපළක හිමිකරුවෙක් කියන කතාව...**

''ෆාම් එක කරගන්න බැරිව සතුන් ටික විකුණපු අලුත කොහු කර්මාන්තයක් ආරම්භ කරන්න අදහසක් තිබුණා. ඒත් ණය මුදලක් ගන්න ක්‍රමයක් නැති වුණා. ඒ තරමට අපි බැංකුවලට ණය වෙලා. දූන් අපිට කරකියා ගන්න දෙයක් නෑ. බැංකුවලින් ණය වාරික ඉල්ලල කතා කරනවා. ලීසිං කොම්පැණිවලින් කතා කරනවා. ආදායමක් නැතිව අපි කොහොම ගෙවන්නද? අපේ ෆාම් එකේ සේවකයො දහසයක් වැඩ කළා. අද ඒ කිසිම කෙනෙකුට රස්සාව නෑ. පහුගිය කාලේ නම් ඒ මිනිස්සු කොහු මෝල්වල හරි වැඩට ගියා. ඉන්ධන ගැටලුව දැඩිව උත්සන්න වීමත් එක්ක කොහු මෝලුත් කරගෙන යන්න බැරි තත්ත්වයට පත්වෙලා. අද වෙනකොට මේ ප්‍රදේශයේ කොහු මෝලුත් විශාල ප්‍රමාණයක් වහලා දාලා තියෙනවා...'' අකාලයේ වැසී ගිය එම කුකුළු ගොවිපළේ අයිතිකරු මොහොමඩ් රම්සි පෙළගැසෙන කතාවට එසේ ප්‍රවේශයක් ලබා ගත්තේය.

කම්බි දැල්වලින් ආවරණය වූ විශාල ගොඩනැඟිලිවල වහළයේ තහඩු ගැල වී ගොස්ය. ගොඩනැඟිලි ඇතුළත එකම කුණු ගෙ ාඩකි. අවට කැලෑව අරක් ගෙනය. ඇත, මෑත දුවන මගේ දෑස් රම්සිගේ හඬ අසල නතර විය.

''ගොවිපළ වහලා දූන් මාස තුනකට වැඩියි. අපේ තාත්තා අවුරුදු ගානක් කරගෙන ආව ගොවිපළ. හොඳට ආදායම් තිබුණා. කොරෝනා පැතිරිලා රට වැහුවට පස්සෙ අපේ නිෂ්පාදන වෙළෙඳපොළට නිකුත් කරගන්න බැරිව කුණු වෙලා ගියා. එතැනින් කඩා වැටෙන්න ගත්ත කර්මාන්තය දිගටම වැටුණා. ආර්ථික අර්බුදය පැමිණීමත් සමඟ අපේ කර්මාන්තයේ විනාශය වේගවත් වුණා. ගැටලු උත්සන්න වෙනකොට අදාළ බලධාරීන්ට, නිලධාරීන්ට වාචිකව, ලිඛිතව දැනුම් දුන්නා. ඒ කිසිම කෙනෙක් අපිට ඇහුම්කන් දුන්නෙ නෑ. කර්මාන්තයේ පරිහානිය ගැන සොයා බැලුවේ නෑ. දූන් සියල්ල ඉවරයි. මේ වෙනකොට අපේ කර්මාන්තකරුවන් හුඟදෙනෙක් ණයකාරයො වෙලා. හෙට, අනිද්දා වෙනකොට ණය ගෙවාගන්න බැරිව මිනිස්සු සියදිවි හානි කරගන්න ඉඩ තියෙනවා...'' දිගු සුසුමක් පිට කළ මොහොමඩ් වල්වැදුණු ගොඩනැඟිලි දෙසත්, එක්තැන් වූ ලොරි රථ දෙසටත් දෑස් යොමු කළේය. ඒ දෑස් බොඳය. අසරණකමේ පතුලටම වැටී සිටින බව ඔහුගේ කතාවෙන් වැටහිණි. ඔහු පමණක් නොව පවතින අර්බුදය හමුවේ වසා දමුණු කුකුළු ගොවිපළ දෙකක හිමිකරුවන් ද අත්ව ඇති ඛේදජනක තත්ත්වය ගැන කම්පනයෙන් යුක්තව අපට කීවේය. ඒ පුද්ගල කතාවලට වඩා මෙරට සමස්ත මස්, බිත්තර කර්මාන්තයේ කඩාවැටීම ගැන සමස්ත ලංකා බිත්තර නිෂ්පාදනකරුවන්ගේ සංගමයේ සභාපති ආර්. එම්. සරත් රත්නායක කියන කතාවට අපි ප්‍රමුඛතාව දුන්නෙමු.

**සමස්ත ලංකා බිත්තර නිෂ්පාදනකරුවන්ගේ සංගමයේ සභාපති කියන කතාව...**

''මෙරට කුකුළු මස්, බිත්තර කර්මාන්තයේ ග්‍රාමීය ගොවිපළවල් 5000 ක් විතර තියෙනවා. මහා පරිමාණ, මධ්‍ය පරිමාණ ගොවිපළවල් 120 ක් විතර තියෙනවා. වයඹ පළාතේ පමණක් කුකුළු මස්, බිත්තර කර්මාන්තයෙන් යැපෙන ඍජු සහ වක්‍ර රැකියාකරුවන් ලක්ෂ 08 ආසන්න පිරිසක් ඉන්නවා. මේ වෙනකොට මස්, බිත්තර කර්මාන්තයේ 80% ට ආදායම් මාර්ග අහිමි වෙලා තියෙනවා. සේවකයො හයසීයක් විතර වැඩ කරපු අපේ ෆාම් එකෙත් දූන් වැඩ කරන්නේ සේවකයො එකසිය පනහයි. මෙහෙම හරි අපි ඉතුරු වෙලා ඉන්නෙ මහා පරිමාණයෙන් කර්මාන්තය කරගෙන ගිය නිසයි...'' සරත් රත්නායකගේ කතාවට අපි කෙටි විරාමයක් තැබුවෙමු.

මෙරට මස් පරිභෝජනය විශාල වශයෙන් අඩු වී ඇති බව වාර්තා වේ. 2020 වර්ෂය වනවිට කිලෝ දහයක්ව පැවැති වාර්ෂික ඒකපුද්ගල කුකුළු මස් පරිභෝජනය මේ වනවිට සැලකිය යුතු මට්ටමකින් පහත වැටී ඇත. එයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ මස් මිල ඉහළ යෑමය. මේ වන විට කුකුළු මස් කිලෝවක මිල රුපියල් දහකට ආසන්නය. සාමාන්‍ය බොයිලර් කුකුළෙකුගේ බර කිලෝවයි, ග්‍රෑම් 400 ට ආසන්නය. පාරිභෝගික ජනතාවට එවැනි කුකුළෙක් මිලදී ගැනීමට රුපියල් 1400 ක් 1500 ක් අතර මුදලක් වියදම් කිරීමට සිදුව ඇත. එමෙන්ම ආර්ථික අර්බුදයට පෙර රුපියල් 350 ට 400 ට තිබුණු ඌරු මස් කිලෝව අද රුපියල් 750 ත් 1200 දක්වා මිල ඉහළ ගොස් තිබේ. රුපියල් 750 ට 800 ට අලෙවි වූ හරක් මස් මස් කිලෝව දූන් රුපියල් 1800 ට ආසන්නය. එළු මස් කිලෝව රුපියල් 2200 ත් 2500 ක් දක්වා මිල ඉහළ ගොස් තිබේ. මස්, බිත්තර මිල මෙතරම් වැඩිවීමට බලපා ඇති ප්‍රධාන සාධකය සත්ව ආහාර මිල ඉහළ යෑම සහ සත්ව ආහාරවලට තිබෙන දැඩි හිඟතාව බව වෛද්‍ය මංගල අමරසිංහ මහතා ද අප සමඟ පවසා සිටියේය. හේ කුකුළු සෞඛ්‍ය, පෝෂණය සහ සත්ත්ව පාලනය පිළිබඳ විශේෂඥයෙකි. උපදේශක පශු වෛද්‍ය මංගල අමරසිංහ පවසන ආකාරයට ආර්ථික අර්බුදයට පෙර මෙරට මස්, බිත්තරවලින් ස්වයංපෝෂිත මට්ටමේ තිබුණු රටකි.

**උපදේශක පශු වෛද්‍ය මංගල අමරසිංහ....**

''2000 වර්ෂය වන විට මෙරට වාර්ෂික ඒකපුද්ගල කුකුළු මස් පරිභෝජනය කිලෝ තුනයි. ක්‍රමයෙන් වර්ධනය වෙමින් 2020 වර්ෂය වන විට වාර්ෂික ඒකපුද්ගල කුකුළු මස් පරිභෝජනය කිලෝ දහයක් බවට පත් වෙලා තිබුණා. ඒක හොඳ ප්‍රවණතාවක්. ඒත් පවතින ආර්ථික අර්බුදය සමඟ වාර්ෂික ඒකපුද්ගල කුකුළු මස් පරිභෝජනය කිලෝ හයකටත් අඩු මට්ටමකට පහළ බැහැලා තියෙනවා. සත්ත්ව ආහාර මිල ඉහළ යෑමත් සමඟ තවදුරටත් මස් මිල වැඩි වී පරිභෝජනය අඩුවීමේ ප්‍රවණතාව වැඩියි...'' පහතින් පෙළගැසෙන්නේ සමස්ත ලංකා බිත්තර නිෂ්පාදනකරුවන්ගේ සංගමයේ සභාපති ආර්. එම්. සරත් රත්නායක සහ පශු වෛද්‍ය මංගල අමරසිංහගේ පොදු හඬය.

''අපේ ගොවියො බහුල වශයෙන් සතුන්ට ආහාර වශයෙන් ලබා දෙන්නේ රයිස් පොලිෂ්, හුණුසහල්, බඩඉරිඟු, පුන්නක්කු සහ සෝයා. රුපියල් 10-15 ට බිත්තර මිල තියෙනකොට මෙරට වෙළෙඳපොළේ රයිස් පොලිෂ් කිලෝ එකක් මිල වුණේ රුපියල් 45-48 යි. මේ වෙනකොට රයිස් පොලිෂ් කිලෝ එකක් රුපියල් 110-120 යි. රුපියල් 55 ට තිබුණු හුණුසහල් කිලෝ එක දූන් 145 යි. බොල් හාල් 125 යි. පිදුරු ට්‍රැක්ටරය රුපියල් 5000 යි. දහයියා බෑගයක මිලත් රුපියල් 100 ත් 140 ත් අතර මිලක් වෙනවා. කුකුළන් දහසක ගොවිපළකට දහයියා බෑග් 60 ක් ඕනෑ. ඒ වගේම රුපියල් 35 තිබුණු පුන්නක්කු කිලෝව අද රුපියල් සීයට ආසන්නයි. සෝයා කිලෝ එක රුපියල් 400 යි. බඩඉරිඟු කිලෝ එකක් රුපියල් 175 යි. දේශීය සත්ව ආහාරවල මිල 150% න් සහ සමහර සත්ව ආහාරවල මිල 200% න් විතර ඉහළ ගිහින් තියෙනවා. පසුගිය වර්ෂයේ මාර්තු මාසය වන විට රුපියල් 85 ට තිබුණු බොයිලර් කුකුළු කෑම කිලෝව මේ වන විට රුපියල් 345 දක්වා වැඩි වෙලා තියෙනවා. ඒ වගේම කුකුළු මස් කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍යවලින් බඩඉරිඟු, සොයා ඇතුළුව 75% ක් ආනයනය කරන්නේ පිටරටවලින්. ආනයනික අමුද්‍රව්‍ය 11 ක් තියෙනවා. මේ වන විට ආනයනික අමුද්‍රව්‍යවල මිල 300% න් ඉහළ ගිහින් තියෙනවා. විශේෂයෙන්ම සතුන්ට ලබාදෙන සියලුම විටමින් වර්ගවල මිල 400% න් විතර ඉහළ ගිහින් තියෙනවා. මේ මිල වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තියන්නේ ඩොලර් හිඟවීම...'' පශු වෛද්‍ය මංගල අමරසිංහගේ හඬ උස් විය.



පශු වෛද්‍ය මංගල අමරසිංහ



ආර්. එම්. සරත් රත්නායක



මොහොමඩ් රම්සි

''වැට් එක නැතිව දූන් බොයිලර් කුකුළු කෑම කිලෝ පනහක මල්ලක් රුපියල් 17250 ක් විතර වෙනවා. දවස් තිහකට වැඩි සෑම කුකුළන් හයදෙනකුට කෑම කිලෝ එකක් දෙන්න ඕනෑ. එක සතෙකුට කෑම ග්‍රෑම් 150 ක් දවසකට දෙන්න ඕනෑ. ඒ වගේම එක සතෙකුට ආහාර වෙනුවෙන් දවසකට ආසන්න වශයෙන් රුපියල් 51 ක මුදලක් වියදම් වෙනවා. දවස් තිස්අටක් වෙනකොට කුකුළෙකුට කෑම කිලෝ 3 යි, දශම පහක් කවන්න ඕනෑ. ඒ වගේම අපි මේ කතා කරන මොහොත වෙනකොටත් මේ රට පුරා කුකුළු ෆාම්වල සහ අභිජනන ගොවිපළවල ජීවත්වන කුකුළන් සහ කිකිළියන් සංඛ්‍යාව මිලියන 32 ක්. බිත්තර ලබාදෙන කිකිළියන් පමණක් කෝටි තුනහමාරක් ජීවත් වෙනවා. ඒ සතුන්ගේ ආහාර සඳහා වසරකට අවම බඩඉරිඟු පමණක් මෙට්‍රික් ටොන් ලක්ෂ හතරක් අවශ්‍ය වෙනවා. ආසන්න වශයෙන් බඩඉරිඟු මෙට්‍රික් ටොන් තිස්තුන්දහසක් මාසයකට අවශ්‍ය වෙනවා. කිලෝ දෙකක කුකුළෙක් නිෂ්පාදනය කරන්න වැය වන මුදලින් 70% ක් වියදම් වෙන්නේ කෑම සඳහා. බඩඉරිඟු සහ අනෙකුත් සත්ව ආහාර නැති වෙලා නිසි වෙලාවට සතුන්ට කෑම දෙන්න බැරි වුණොත් පෝෂණය අඩුවීමත් එක්ක ප්‍රතිශක්තිය අඩු වෙලා කුකුළු ෆාම්වලට ලෙඩ රෝග බෝවීම වැඩි වෙනවා. සාමාන්‍යයෙන් මෙරට කුකුළු කර්මාන්තයේ සතුන්ගේ මරණ අනුපාතය 4% යි. සත්ව ආහාර හිඟයත් සමඟ මේ වෙනකොට ෆාම්වල සත්ව මරණ අනුපාතය 8% ක් බවට පත් වෙලා තියෙනවා...''

''ඒ වගේම කුකුළු පැටවකුගේ මිල රුපියල් 100 ක් 125 ක් වෙනවා. කිලෝ දෙකක් බරැති කුකුළෙක් හැදීමට විදුලිය, දහයියා, කම්කරු වියදම් රුපියල් 40 ක් එකතු වෙනවා. වෙනත් වියදම් එකතු වෙලා එනකොට කිලෝ දෙකක් බරැති කුකුළෙක් හදාගන්න රුපියල් 70 ත් 80 අතර වියදමක් යනවා. කෑම, එන්නත්, බෙහෙත් වියදම එකතු වුණාම කිලෝ දෙකක බරැති කුකුළෙක් නිෂ්පාදනය කරන්න රුපියල් 1400 ක් විතර වැය වෙනවා. ඒ වගේම පවතින ජීවන වියදමත් එක්ක කුකුළු ෆාම් එකක වැඩ කරන කම්කරුවකුට කෑම, බීම නැතිව දවසකට රුපියල් 1500 ක් ගෙවන්න ඕනෑ. නිෂ්පාදන වියදම වැඩිවීමත් එක්ක එවැනි වේතනයක් ලබාදීම කර්මාන්තකරුවන්ට ගැටලුවක් වෙලා තියෙනවා. ඊට බාහිරව ප්‍රවාහන වියදම වැඩි වෙලා තියෙනවා. ඒ වගේම පළමු දින දහයේදී පුංචි කුකුළු පැටවුන්ට රස්නය ලබා දෙන්න ඕනෑ. අවශ්‍ය රස්නය ලබාදීලා පළමු දින දහයේදී ග්‍රෑම් 300 ක් බර එන්න කුකුළු පැටවු ලොකු කරගන්න බැරි වුණොත් හැදීම බාල වෙනවා. සාමාන්‍යයෙන් ෆාම්වල කුකුළු පැටවුන්ට රස්නය ලබාදෙන්නෙ ගෑස්වලින් හෝ දරවලින්. පවතින අර්බුදය තුළ ගෑස් නෑ. දරත් ගණන්. මෙරට සත්ව ආහාර නිෂ්පාදනයත් මහා පරිමාණයෙන් අඩු වෙලා. වැඩි මිලට ගන්නවත් සත්ව ආහාර නෑ. පිටරටවලින් කරන ආනයනයටත් සීමා පනවලා තියෙනවා. ඩොලර් හිඟය නිසා නිසි වේලාවට ණයවර ලිපි නිකුත් කිරීමට නොහැකි වෙලා ගනුදෙනුකරුවන් අතර විශ්වාසය පලුදු වෙමින් තියෙනවා. මේ ගැටලුවට විසඳුමක් නොලැබෙන්න මෙරට පුරා තියෙන සුළු, මධ්‍ය, මහා පරිමාණ සියලු කුකුළු ෆාම් හයදහසම වැහිලා යන්න පුළුවන්. එවැනි තත්ත්වයක් උදා වුණොත් කුකුළු ෆාම් තුළ සේවය කරන සේවකයන් වගේම වක්‍රාකාරයෙන් කර්මාන්තයට සේවය සපයන ලක්ෂ දහයකට වැඩි පිරිසකගේ ආදායම් අහිමි වෙලා ගැටලු රාශියකට මුහුණ දෙන්න වෙනවා...''

''ඒ වගේම මස් නිෂ්පාදනය සඳහා කරගෙන යන අනෙකුත් සත්ත්ව ගොවිපළවලටත් මේ ගැටලුව පොදුයි. හරක්ට, ඌරන්ට කුකුළන්ට වඩා කෑම ප්‍රමාණයක් ලබාදෙන්න ඕනෑ. ආහාර ලබාදීලා ඇති කරන කුරුල්ලො ඉන්නවා. සුරතලේ ඇති කරන සතුන් ඉන්නවා. මිනිසුන් විසින් ආහාර ලබාදීලා නඩත්තු කරන සතුන් කෝටි 12 ක් 13 ක් මේ රටේ ඉන්නවා. ආහාර හිඟය මිනිසුන්ට වගේ සතුන්ටත් දැඩිව බලපානවා. ඒත් අදටත් මේ රටේ ජීවත්වන සතුන්ගේ පෝෂණය ගැන ආණ්ඩුවේ අවධානය යොමු වෙලා නෑ. ඒ වගේම ඉදිරියේදී මස්, බිත්තර මිල තව, තවත් ඉහළ යයි. එවැනි තත්ත්වය මස් බිත්තර පරිභෝජනය තවත් අඩු වෙනවා. රටේ ප්‍රෝටීන උණතාව තවත් ඉහළ යනවා. අර්බුදයෙන්, අර්බුදයට පත් වෙලා අපට වෙන දේ හිතාගන්නවත් බැරි වෙනවා...'' පශු වෛද්‍ය මංගල අමරසිංහ සහ සරත් රත්නායක මෙරට මස් කර්මාන්තය වැටී තිබෙන භයානක තත්ත්වය ගැන එසේ පැහැදිලි කරන විට පෝෂණවේදීන් කියන කතාවටත් අපි සවන් දුන්නෙමු.

**පෝෂණවේදීන්ගේ මතය....**

මෙරට පෝෂණවේදීන්ගේ මතය අනුව අප ජීවත්වන සමාජයේ කුඩා දරුවන්, ක්‍රියාශීලී වැඩිහිටියන්, මහලුවියේ පසුවන්නන් යන ඕනෑම කාණ්ඩයක පුද්ගලයන්ගේ දෛනික පෝෂණ අවශ්‍යතාවයේදී සමබල ආහාර වේලක් ගත යුතුය. එම සමබල ආහාර වේලට ප්‍රෝටීන් සහිත ආහාර අනිවාර්යෙන්ම අන්තර්ගත විය යුතුය. ප්‍රෝටීන අපට අවශ්‍ය වන්නේ දේහ වර්ධනය සඳහා ශරීරය තුළ සිදුවන විවිධ ජීව ක්‍රියාවන්ගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් ඇමයිනෝ අම්ල සපයන පෝෂක සංඝටකය ලෙසය. එම ඇමයිනෝ අම්ලවලින් 09 ක් මිනිසාගේ ශරීරය තුළදී නිෂ්පාදනය කරගත නොහැක. එමෙන්ම එම ඇමයිනෝ අම්ල අත්‍යවශ්‍ය ඒවා ලෙස හැඳින්වේ. එම අත්‍යවශ්‍ය ඇමයිනෝ අම්ල මිනිස් ශරීරයට ලබාගත හැකි වනුයේ සත්ත්ව ප්‍රෝටීනවලින් පමණි. ඒ අනුව කුකුළු මස් හෝ මාළු නිර්දේශිත ප්‍රමාණවලින් දෛනික ආහාර වේලට එකතුකරගත යුතු බව පෝෂණවේදීන්ගේ අදහසය. එමෙන්ම මිනිසාගේ පෝෂණ අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීමට වඩාත් ආරක්ෂාකාරී, සෞඛ්‍යාරක්ෂිත සත්ත්ව මාංශ ප්‍රෝටීන සපයන ආහාර ප්‍රභේදය වනුයේ කුකුළු මස්ය. ලාභදායී සත්ත්ව මාංශ ප්‍රෝටීන සපයන ආහාර ප්‍රභේදය ලෙස කුකුළු මස් ලෝකයේ බොහෝ රටවල ප්‍රසිද්ධය. එමෙන්ම වෙළෙඳපොළේ පවතින ගව, එළු, ඌරු මස්වල අඩංගු සංතෘප්ත මේද අම්ලවලට වඩා කුකුළු මස්වල අඩංගු සංතෘප්ත මේද අම්ල ඉතා අවමය. සත්ත්ව මාංශවලින් අවම සංතෘප්ත මේද අම්ල අඩංගු වන්නේ මාළුවලය. සංතෘප්ත මේද අම්ල බෝ නොවන රෝග වර්ධනයට ප්‍රධාන හේතුවකි. එමෙන්ම අසංතෘප්ත මේද අම්ල මිනිසාගේ පෝෂණයට ඉතා වැදගත්ය.

මාළු සහ මස් පාරිභෝජනයේ වැදගත්කම ගැන තවත් පුළුල්ව විස්තර කිරීමට හැකිය. එහෙත් දූන් ඒ ගැන කතා කිරීම දුකකි. මේ වන විටත් මෙරට බොහෝ දිළිඳු පවුල්වල මාසයකට එක කෑම වේලකට හෝ මස්, මාළු එකතු කරගැනීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බව රහසක් නොවේ. දූනටත් මෙරට ජන සමාජයේ ප්‍රෝටීන් ඌණතාවක් තිබෙන පසුබිමක අනාගතයේදී එම තත්ත්වය වර්ධනය වීමට තිබෙන ඉඩ බොහෝ වැඩිය. වයස අවුරුදු තුනත්, පහළොවත් අතර දරුවන්ගේ වර්ධනයට මේද කොටස්, සත්ව ප්‍රෝටීන් අත්‍යවශ්‍යය. එමෙන්ම වැඩිහිටි ජනතාවට බෝ නොවන රෝගවලින් පාලනය වී නිරෝගී සම්පන්න ජීවිතයක් ගතකිරීමට ප්‍රෝටීන් බහුල සමබල ආහාර වේලක් අත්‍යවශ්‍යයි. එහෙයින් මස් මාංශ පරිභෝජනය අඩුවන මෙරට අනාගතයේදී පෝෂණ ඌණතා සහිත ළමයි බිහිවීමට ඇති ප්‍රවණතාව ඉතා ඉහළය. රට තුළ බෝනොවන රෝග උත්සන්න වීමට ඇති ප්‍රවණතාව වැඩිය.

එහෙත් මස්, මාළු, බිත්තර නොකන මිනිසුන් ද නිරෝගීමත් ජීවිත ගත කරන බව අමතක නොකළ යුතුය. තිරිසන් අපාය තුළ ශාක භක්ෂක සත්වයන් ජීවත් වෙති. එහෙයින් සත්වයාගේ පැවැත්මට ප්‍රෝටීන් ලබාදෙන්නේ මාස්, මාංසවලින්ම පමණක් නොව, ශාක ආහාර තුළින්ද ප්‍රෝටීන් උත්පාදනය කෙරේ. මෙරට ජනතාවගේ ප්‍රධාන ප්‍රෝටීන් ප්‍රභවය ශාක ආහාරයක් වන බත්ය. එහෙත් ශාක ආහාරවලින් සත්ත්ව ප්‍රෝටීන් නොලැබේ. ශක්ති සම්පන්න නිරෝගීමත් ජීවිතයක් ගත කිරීමට සත්ත්ව ප්‍රෝටීන් අත්‍යවශ්‍ය බව පෝෂණවේදීන්ගේ මතයයි. එහෙත් මස්, බිත්තර මිල වේගයෙන් ඉහළ යන පසුබිමක නිරෝගී සම්පන්නව ජීවත්වීමට ශාක ප්‍රෝටීන බහුල සමබල ආහාර වේලක් පිළියෙල කරගැනීමට අවශ්‍ය දූනුම හෝ ජනතාවට ලබාදීම පවතින රජයේ වගකීමකි. එළවළු, පලතුරු මිල ද විශාල වශයෙන් වැඩි වී තිබෙන පසුබිමක මස්, මාළුවලින් තොර සමබල ආහාර වේලක් පිළියෙල කරගැනීම ද මෙරට බහුතරයකට ගැටලුවකි. එවැනි තත්ත්වයක රට තුළ පෝෂණ ඌණතාවක් උද්ගතවීම නොවැළැක්විය හැකි කාරණයක් බව සැබෑය.

● තරංග රත්නවීර



# සංස්කාර ලෝකයේ නොලැබෙන සමාව

පිංවත ඔබ සතුටින් සිනාසෙන්න කැමතිද. අපි හැමෝටම සතුටින් සිනාසෙන්න බැහැ. අද දවසේ සතුටින් නොසිනාසුන ජීවිත සමාජයේ මොනතරම් නම් ඇතිද. සතුටෙන් සිනාසෙනවා කියන්නේ පෙර කුසල් සංස්කාරයන්ගේ ඵලයක්. ඔබ අතීත සංසාරයේ අනුන්ව ශීලයෙන්, මෛත්‍රියෙන්, ත්‍යාගයෙන් සතුටුකරලා තිබෙනවා. වර්තමානයේ පිංවත් ඔබ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් පෝෂණය වූ ශීලයෙන්, මෛත්‍රියෙන්, ත්‍යාගයෙන් අනුන්ව සතුටු කරනවද. එසේත් නැතිනම් කාමච්ඡන්දයන් තුළින්, අරක්කු, මත්ද්‍රව්‍ය තුළින්, මිච්ඡා වාචාවන් තෙපලමින්, අනුන්ව සතුටු කරනවාද. පිංවත ධර්මානුකූල සතුට පිටිපස්සේ තිබෙන්න ඕනේ පංචනිවරණයන් නොවේ, සප්ත බොජ්ජංගයන්මයි. පංචනීවරණයන් තුළින් ඔබ ලබන මිච්ඡා සතුට අනාගත පටිච්චසමුප්පන්න භවගමනේ අපේ සතුට සහ සිනහව අතුරුදන්කොට දමන්න පුළුවන්. පිංවත ධර්මය සහ අධර්මය කියන දෙපැත්තේ ඔබේ කකුල් දෙක තබාගෙන ජීවත්වෙන්න එපා. උදේට බුද්ධ වන්දනාවන් කරනවා, සවසට ශිල්පද දුර්වල කොටගන්නවා. පසළොස්වක පොහොය දිනයට දන් පූජා කරනවා, මාසේ ඉතිරි දිනවල මනුෂ්‍ය ධර්මයන් අමතක කොට මුදල් සොයනවා. හොඳින් සද්ධර්මය ශ්‍රවණය කරනවා. හොඳින්ම ලෝභ, ද්වේශ, මෝහ, ධර්මයනුත් වඩනවා. පිංවත ඔබ ඔබට අවංක වෙන්න. අහිංසක ඔබ, ඔබට බොරු කරන්න එපා. ඔබ ඔබට බොරු කෙරුවොත් බොරුව ඔබට අවංක වේවි.

පිංවත බොරුව අපිට අවංක වුණොත්, අපේ ලෝකයේ බොරුවමයි දිනන්නේ. බොරුව අපිට දිනා දෙන ලෝකය තමයි, සතර අපාය කියලා කියන්නේ. දිව්‍ය ලෝකවල සහ මනුෂ්‍ය ලෝකයේ පමණක් නොවේ ලස්සන සුරූපී පිරිමින් සහ කාන්තාවන් සිටින්නේ. පරදත්තරූපජීවී ප්‍රේත ලෝකවල ද බොහොම ලස්සන සුරූපී පිරිමි සහ කාන්තා ප්‍රේත ප්‍රේතියන් සිටිනවා. පිංවත් ඔබ මෙහෙම සිතන්නකෝ, අපේ රටේ ටෙලිනාට්‍යවල රඟපාන පිංවත් සුරූපී රංගන ශිල්පිනියක් ගන්න. සුරූපී තරුණ ඇය අලුත්, පිරිසිදු, සුදු සායකින් සහ සුදු බ්ලවුස් එකකින් සැරසිලා සිටින්නේ. ඇයගේ ඇඳුම බොහෝම සංවරයි. ඇය කළු පැහැ අච්කණ්ණාඩියකුත් පැළඳගෙනයි සිටින්නේ. ඇයගේ ලාලිත්‍යයෙන් යුත් කෙස් කළඹ ගෙල දක්වා වැටී තිබෙනවා. මේ සියල්ලම තිබුණත් ඇයගේ මුවගේ සිනහව සහ සතුට අතුරුදන් වෙලා. එහෙත් ඇය ප්‍රසන්නයි. පිංවත ඉහත ස්වභාවයේ ප්‍රේතියන් පරදත්තරූපජීවී ප්‍රේත ලෝකයේ සිටින්නට පුළුවන් යැයි භික්ෂුව විශ්වාස කරනවා. පිංවතුනි ඉහත උදාහරණය භික්ෂුව ඔබට සිහිපත් කළේ, කුසලය සහ අකුසලය යන අර්ථයන් දෙක තුළ, ඔබේ කකුල් දෙක තබා ගැනීමේ භයානක භව අනතුර, පිංවත් ඔබට මතුකොට දීමටයි.

මෙවැනි සුන්දර අහිංසකාවියන් පරදත්තරූප ජීවී ප්‍රේතියන් ලෙස පටිච්චසමුප්පන්නව උපත ලබන්නේ, තෘෂ්ණා පච්චයා උපාදානං කියන ධර්මතාවය හේතුවෙන්. පෙර මනුෂ්‍ය ජීවිතයේදී මෛත්‍රිය වැඩුවා, අනුනට ආහාරපාන, ඇඳුම් පැළඳුම් නිර්ලෝභීව දුන්නා. හැබැයි ශිල්පද දුර්වලකොටගනිමින්, කාමච්ඡන්දයන් මැනවින් පුහුණු කළා. පිංවත හරිම පරිස්සමින්, අරක්කු කඩ, සම්බාහන ආයතන, ගණිකා නිවාස, අනියම් සම්බන්ධතා, කාමච්ඡන්දයන්, බොරුව, සොරකම සමාජයේ පාලනයකින් තොරව සමාජගත වෙනවා. ගෞරවණීය පිංවත මෛත්‍රිය වැඩුවාය කියලා, අනුනට උපකාර කළාය කියලා, අනෙක් පැත්තෙන් ඔබ ශිල්පද දුර්වලකොටගෙන කාමච්ඡන්දයන් වැඩුවොත්, සංස්කාර ලෝකයෙන් සමාවක් නම් නොලැබෙන්න පුළුවන්. පිංවත ඉහත සටහන කියෙව්වාම ඔබට බියක් ඇති වුණාද, එසේත් නැතිනම් ඉහත සුන්දර තරුණ ප්‍රේත අහිංසකාවිය කෙරෙහි ආදරයක් ඇතිවුණාද. පිංවත ඔබ තවමත් ප්‍රමාද නැහැ. ඔබේ දෑස් පියාගෙන ඉහත සකස් වූ සිතුවිලි චිත්තානුපස්සනාවෙන් දකින්න. ඉහත සුන්දර ප්‍රේත අහිංසකාවිය අට්ඨික සංඥාවෙන් දකින්න. මෙය සටහන් තබන භික්ෂුව මරණානුස්සතියක් කොට දකින්න. මේ සියලු ධර්මතාවයෝ ධම්මානුපස්සනාවෙන්ම අනිත්‍ය යැයි දකින්න. පිංවත ලෝකය හරිම සුන්දරයි උතුම් චතුරාර්ය සත්‍යය ධර්මයන්ට අදාළව සතිය සිහිය ඔබ ළඟ තිබෙනවා නම්. දැන් වෙලාව රාත්‍රී අටට විතර ඇති, මේ නිහඬ රාත්‍රියේ "සටහන ලියනවාය" කියන සංඥාව පමණක්මයි භික්ෂුව තුළ තිබෙන්නේ. ඉතිරි සංඥාවෝ නිරුද්ධවෙලා. භික්ෂුව සටහන ලියනවාය කියන සංඥාවත් බැහැර කරලා පටිච්චසමුප්පාද ධර්මයන්ට සිත යොමු කරනවා. ජීවිතය තුළ, ලෝකය තුළ සොයන්න දෙයක් නැහැ. සොයන්න යැයි සකස්වෙන ඵස්සය, සතරසතිපට්ඨාන ධර්මයන්ගෙන් විනිවිද දකින්නයි තිබෙන්නේ. එවිට ඔබේ ලෝකය පටිච්චසමුප්පාද ධර්මයම වෙනවා. පටිච්චසමුප්පාද ධර්මයන්ගේ සමුදය සහ නිරෝධයම වෙනවා.

පිංවත ඔබ ඔබේ අම්මා තාත්තාට සලකනවාද, අම්මා තාත්තව සතුටු කරනවාද. සමහරක් පිංවතුන්ලා අම්මා තාත්තලාව සතුටු කරනවා හුඟාක් අඩුයි. අනේ



මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

බුදුරජාණන් වහන්සේට කෘතවේදී වෙන්න මහාබ්‍රහ්මයා අපේ ගෙදරට ගෙනත්දීලා තිබෙනවා. සංස්කාර පච්චයා විඤ්ඤාණ කියන ධර්මතාවය හේතුවෙන් සකස්වෙන, අතීත අකුසල් දැනීම් නිසාම, දෙමාපියන්ගේ මහා බ්‍රහ්ම ගුණයන් අපිට දුර්වලවෙලා පෙනෙන්නට පුළුවන්. ඒ දෙමාපියන් සතු මහාබ්‍රහ්ම ගුණයන්ගේ වරදක් නොවේ අවිද්‍යාවේ වරදයි. පිංවත වරද අවිද්‍යාවටම භාරදීලා පිංවත් දෙමාපියන් මහා බ්‍රහ්මයා ලෙසම දකින්න. දරුවන් දෙමාපියන්ට උපස්ථාන කරද්දී දරුවන්ට ගොඩාක් පිං වැඩෙනවා. පින කියලා කියන්නේ වර්ණය, සැපය, බලය, ආයුෂයට. උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් පෝෂණය වූ ස්වභාවික වර්ණය, සැපය, බලය වගේම ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් පෝෂණය නොවූ කෘතිම වර්ණය, සැපය, බලයකුත් සමාජය තුළ දක්නට තිබෙනවා. මේ කෘතිම වර්ණය, සැපය, බලය ජීවිත ගතවෙන්නේත් පෙර පින නිසාමයි. නමුත් එම පෙර පින, නැවත පින් වැඩෙන ආකාරයෙන් ධර්මානුකූලව කළමනාකරණය කරගන්න දක්ෂ නැහැ. ඒ නිසාම කෘතිම වර්ණය, සැපය, බලය සොයාගෙන මුදල් වියදම්කොට අපි සුන්දර කඩපිල් ගාණේ යනවා. නගරයේ කඩසාප්පුවල සෙනග පිරිලා, වයෝවෘද්ධ දෙමාපියන්ගේ කාමරයේ වැඩසිටින්නේ බුදුරජාණන් වහන්සේගේ පිළිම වහන්සේ පමණක්මයි.

දයාබර දෙමාපියනි, මහා බ්‍රහ්මයා කවදාකවත් හඬන්නේ නැහැ. මහ බ්‍රහ්මයාව හඬවන්නත් බැහැ. සප්තබොජ්ජංගයෝ වැඩුන ධ්‍යාන සුවයමයි බ්‍රහ්ම ජීවිතවල ආහාරය වෙන්නේ. කාමයෝ තාවකාලිකව නිරෝධය කොට ධ්‍යාන සුවයෙන් ගතකරන රූපී සහ අරූපී බ්‍රහ්මතල බ්‍රහ්මයෝ සහ කාමයෝ පරිපූර්ණ වශයෙන්ම නිරෝධය කළ අනාගාමීඵල අවබෝධයන් ලැබූ බ්‍රහ්මයින්ට, දෙවියන්ට සහ මනුෂ්‍යයින්ට වගේ කුසගින්නක් දැනෙන්නේ නැහැ. කාමයන් බැහැර කළ ඔවුනගේ ආහාරය සප්තබොජ්ජංගයෝමයි. දෙමාපියනි ඔබේ සිත රිදවන දරුවන් ඉදිරියේ උපේක්ෂාවෙන් ලෝකය දකින්න. පිංවත් දෙමාපියන් උපේක්ෂාවෙන් ලෝකය දකින්නේ කොහොමද කියලා දන්නවාද. ධර්මයේ උපේක්ෂාව ඉබේ ඇතිවෙන්නේ නැහැ. චතුරාර්ය සත්‍යය ධර්මයන් කෙරෙහි හොඳින් සිහිය ඇතිකොටගන්න ඕනේ. පිංවත් දෙමාපියන් තුළ සතිසම්බොජ්ජංගය මෝදුවෙන කොට, ඔබ දකිනවා සංස්කාර පච්චයා විඤ්ඤාණං, අනේ මගේම අතීත අකුසල් සංස්කාර නිසාමයි, මගේම දරුවන් මගේ සිත රිදවන්නේ කියලා. දෙමාපියනි ලෝකයේ වැරදිකරුවෙකුත් නැහැ. ලෝකයේ නිවැරදිකරුවෙකුත් නැහැ. ලෝකය කියන්නේ අවිද්‍යාවයි. බලන්නකෝ ධර්මයේ උපේක්ෂාව තුළ ජීවිතය මොනතරම් නිදහස්ද කියලා. පිංවත් දරුවන් නිසා ඊයෙත් සිත රිද්ද ගත්තා නේද. දෙමාපියනි ආයෙමත් සිත රිදවා ගන්න එපා. දෙමාපියනි ඔය මහා බ්‍රහ්ම දෑසට නැගෙන උණුසුම් කඳුළු කැට, ඔබට අයිති කඳුළු නොවේ. ඔය කඳුළු අයිති අනිත්‍ය වූ ඵස්සය හේතුවෙන් සකස්වෙන, අනිත්‍ය වූ විඳීම්වලටයි. ඔය කඳුළු ඵස්සයේ අවිද්‍යාවටම භාරදීලා ඔබලා නිදහස් වෙන්න.

පිංවත් දෙමාපියනි ඔබ විඤ්ඤාණය නමැති මැජික්කරුවා හඳුනනවාද. සංස්කාර විසින් නඩත්තු කරන හරිම ඇස්බැන්දුම් කාරයෙක්. බුදුරජාණන් වහන්සේ විඤ්ඤාණයට වධකයා කියලත් කියනවා. විඤ්ඤාණය අපිව ආදරය උපයෝගී කරගෙන වධයට පත්කරනවා. පිංවත් දෙමාපියනි, ඔබේ පිංවත් දරුවන් ඔබට හොඳින් ආදරය කරනවා නම්, හොඳින් පෝෂණය කරනවා නම්, තෘෂ්ණා පච්චයා උපාදානං කියන ධර්මතාවය තුළ එයත් දෙමාපියන්ට බලවත් අනතුරක්මයි. දරුවන්ගේ ඵස්සය නිසා සැප වේදනාවන්මයි ඔබලා තුළ සකස්වෙන්නේ. පිංවත් දරුවන් හේතුවෙන් දෙමාපියන් ලබන්නේ සැප වේවා, දුක් වේවා ඵස්සය අයිති අවිද්‍යාවට. දෙමාපියනි ඔබේ දරුවන් නිසා ඔබ තුළ සකස්වෙන සෑම සැප, දුක්, උපේක්ෂා, විඳීමක්ම අයිති ඔබට නොව දුකේ උල්පත වන අවිද්‍යාවටමයි. දරුවන්ගේ ආදරය, සෙනෙහස ලබන්න කුසල් සංස්කාර හේතුවෙන් සකස්වෙන දැනීම්, මගේ ආදරණීය දරුවන් හැටියට නොව, අවිද්‍යාව හැටියටම දකින්න.

බුදුරජාණන් වහන්සේ පිංවත් දෙමාපියන්ට මහාබ්‍රහ්මයා යැයි කියන්නේ මොනතරම් නම් මහා කරුණාවකින්ද. මහාමායා උත්තමාවියව ජාති, ජරා, ව්‍යාධි, මරණයන්ගෙන් නිදහස් කරන්න බුදුරජාණන් වහන්සේ තුසිතයට වැඩියේ මොනතරම් නම් මහාකරුණාවකින්ද. මහා බ්‍රහ්මයා යැයි කියන්නේ කාමලෝකය ඉක්මවා ගිය උත්තමයෙක්. පිංවත් දෙමාපියන්ට බුදුරජාණන් වහන්සේ තමන්ගෙන් දරුවන් උදෙසා විය යුතු යුතුකම් කොටසක් පනවනවා. දෙමාපියන්ගෙන් දරුවන්ට විය යුතු අවසාන යුතුකම තමයි දරුවන්ට දේපළ පවරලා විවාහකොටදීම. ඉන් පස්සේ දෙමාපියන්ට මුණුපුරු, මිණිපිරියන්ව සුරතල් කරන්න කියලා, බුදුරජාණන් වහන්සේ පනවන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේ එසේ කරන්නේ දෙමාපියන්ගේ උපාදානයන් කාමලෝකයෙන් එතෙර කරන්න. එවිටයි දෙමාපියන් සැබෑම බ්‍රහ්මයෙක් වෙන්නේ. පිංවත් දෙමාපියනි, දරුවන්ගෙන් නිදහස් වෙච්ච ඔබ, කාම ලෝකයෙන් ඔබ්බට සිත පිහිටවලාද තිබෙන්නේ. කාමලෝකයෙන් ඔබ්බට සිත පිහිටනවාය කියලා කියන්නේ අනාගාමී බ්‍රහ්මඵලවල සිත පිහිටීමයි.

පිංවත් දෙමාපියනි, දිව්‍ය දරුවන් වේවා, මනුෂ්‍ය දරුවන් වේවා, මේ සෑම දරුවෙක්ම අයිති, අවිද්‍යාවට බව නුවණින් දකින්න. දරුවන්ගේ ජීවිතය පටිච්චසමුප්පාද ධර්මයන් තුළ විසිරුවා දකින්න. එවිටයි දෙමාපියන් වන ඔබ වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මහාබ්‍රහ්මයෙක් වෙන්නේ. මෙය සටහන් තබන භික්ෂුවට නම් මහාබ්‍රහ්මයෙක් වෙන්න බැරි වුණා. ඒ කියන්නේ තාත්තා කෙනෙක් වෙන්න බැරි වුණා. ඒත් පිංවත් දෙමාපියනි ඔබලා හරිම වාසනාවන්තයි. ඒ පිංවන්ත වාසනාවට අවිද්‍යාවේ කකුලෙන් ගහන්න එපා. දරුවන්ගෙන් නිදහස් වෙච්ච දෙමාපියන් තවදුරටත් කාම ලෝකය සුරතල් කරන්නත් එපා. දරුවන් ගැන මතකයන් ධම්මානුපස්සනාවෙන්ම විනිවිද දකින්න. පිංවත් දෙමාපියනි, බුදුරජාණන් වහන්සේ ඔබලාට මහාබ්‍රහ්මයා යැයි දේශනා කළේ, මරණින් පසුව සතර අපායට යන්න නොවේ. නැවත දිව්‍ය, මනුෂ්‍ය ජීවිත ලබන්න නොවේ. දෙමාපියන් සතු උතුම් බ්‍රහ්ම ගුණයන් තම ආදරණීය දරුවන්ටත් හොඳින් පුහුණුකරලා, දරුවන්ගේ වගකීම්වලින් නිදහස් වෙලා, මරණින් පසු වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම කාම, රාග, පටිසයන්, නිරෝධය කළ බ්‍රහ්මයෙක් වෙන්නමයි. පිංවතුනේ භික්ෂුව මේ සටහන් තබන්නේ බුදුරජාණන් වහන්සේගේ උත්තරීතර මහා කරුණා ගුණයයි. පරම්පරාවෙන්, පරම්පරාව නිවනට යොමු කරන උත්තරීතර මහා කරුණා ගුණයයි.

පූජ්‍ය රාජගිරියේ

● අරියඥාන ස්වාමින්වහන්සේ

# සෝහිත හිමි වැඩ සිටියා නම්

මෝහාන්ධකාරයට ගිනිහුල දල්ලා
පෙරමුණට පැමිණි
පෙරගමන්කරුවා ඔබයි
කසාවත පෙරවූ බෝසත් ඇත් රජුනි
ගිනිහුල ඔබ දැල්වූ ඔබේ අතම දවා
ගිලිහී ගියත් එදා
කසාවත පෙරවූ බෝසත් ඇත් රජුනි
යොවුනත් අත ඔබේ ගිනිහුල දැල්වෙනවා
ඒ දකින්න අද ඔබ හිටියා නම්...

ගුණමකුවන් අතරේ ඔබ පෑ ආලෝකේ
උඩුහුළඟට අල්ලා දැල්වූ ගිනිහුල සේ
ඔබේ අතම දවා දැඩි වේදනා නැගෙද්දී
තෙද හදවත හෙලූ සුසුම්
කසාවත පෙරවූ බෝසත් ඇත් රජුනි
ගිලිහී වැටුණත් ඔබේ අතින් එදා
යොවුනත් අත ඔබේ ගිනිහුල දැල්වෙනවා
ඒ දකින්න අද ඔබ හිටියා නම්...

ඔබ නැති ගන අඳුරේ ලක්මව වැළපෙද්දී
ගම වැදුනා ආයේ හොර වැදි දෙටු බෑයෝ
දළ ඇතුන් මරා ගජමුතු සෙවූ සොරුන් සේ
උන් ලක්බිම නිධන් හොරූ
කසාවත පෙරවූ බෝසත් ඇත් රජුනි
ගිලිහී වැටුණත් ඔබේ අතින් එදා
යොවුනත් අත ඔබේ ගිනිහුල දැල්වෙනවා
ඒ දකින්න අද ඔබ හිටියා නම්...





ලෂන් බුලත්සිංහලයන් මේ පද පබඳින්නේ අන් කවරෙකුටවත් නොව අප කතානායකයාණෝ මාදුළුවාවේ සෝහිත හිමියන්ටයි. උන්වහන්සේගේ නම ඇසෙන සැම විටම නව ජීවයක් ලද්දාක් මෙන් හැඟීමක් ගතට සිතට දැනෙයි. ඒ රූප කාය මැවී පෙනෙයි. වර්තමාන සමාජ, දේශපාලන අර්බුදයත් සමග අද එදාටත් වඩා උන්වහන්සේගේ අඩුව රටට දැනෙයි. අද වන විට අප රට පෙර නොවී විරූ තත්ත්වයකට පත්ව ඇත. බඩු මිල දරා ගත නොහැකි ලෙස ඉහළ යමින් පවතී. වැඩි මිලට හෝ ලබාගත් ආහාර ද්‍රව්‍ය පිස ගැනීම ද දුෂ්කර ය. දිනපතා කෙරෙන විදුලි කප්පාදු නිසා ජන ජීවිතය අවුල් වී ඇත. විදුලිය පදනම් කරගත් සුළු සහ මහා ව්‍යාපාර අමාරුවේ වැටී ඇත. විවිධ පෝලිම් රට පුරා දකින්නට ඇත. පෝලිම්වල මිනිස්සු මියැදෙති. බෙහෙත් හිඟය ක්‍රමයෙන් උත්සන්න වෙමින් පවතී. ආර්ථිකයෙන් පටන් ගත් අර්බුදය මුළුමහත් දේශපාලන ව්‍යුහය සහ සමාජය වෙලා ගෙන ඇත. ගාලු මුවදොර ප්‍රමුඛව අලුත් පන්නයේ අරගල භූමි නිර්මාණය වී ඇත. ඉදින් සෝහිත හිමි වැඩ සිටියා නම් අපට කෙතරම් ශක්තියක්දැයි නිරන්තරයෙන් සිහිපත් වේ. මාදුළුවාවේ සෝහිත හිමියන් යනු සැම විටම සාධාරණ සමාජයක් උදෙසා කැපවූ පරහිතකාමී යතිවරයාණන් වහන්සේ නමකි. මැයි මස 29 වැනිදා උන්වහන්සේගේ 80 වැනි ජන්ම දිනය යෙදී තිබේ. මේ ඒ නිමිත්තෙනි.

පක්ෂ දේශපාලනයෙන් තොරව අසාධාරණයට, අයුක්තියට එරෙහි ව හඬ නැගීමටත්, සුදුසු තැන්හි වැරැදි පෙන්වා අනුශාසනා කිරීමටත් සෝහිත හිමියෝ කිසිදා බිය නොවූහ. උන්වහන්සේ වටා සිටිනවුන්ට කිසිදු, චිත්ත පීඩාවක් ඇති නොකර දේශීය මෙන්ම දේශාන්තරවල පවා ජනයා තුළ ප්‍රියත්වයක් ඉපදවීමට උන්වහන්සේ සතු ගුණ සමුදාය, ව්‍යක්ත බව හා වාසනා ගුණයත්, ධී ශක්තියත් නො අඩුව බලපාන්නට ඇත. උන්වහන්සේ ළඟට බැඳි බොහෝ චරිත බැබලී, උන්වහන්සේට ගරහා අපවාද නගා අතහැර ගොස් ය. බලය ලබා ගැනීමට නොව බලය හැසිරවිය යුතු මග භික්ෂුවගේ උරුමය බව උන්වහන්සේ දැන සිටියහ. ඍජු ප්‍රතිපදාවෙන්, සාසනාලයෙන්, සමයාලයෙන් යුක්ත ව අයුක්තියේ දි අසාධාරණයේ දී නිර්භීතව හඬ නැගීමට උන්වහන්සේ දෙවරක් නොසිතූහ. ජන සමූහයකට කිසියම් කරුණක් ඒත්තු ගැන්වීමට නායකයකු සතු විය යුතු කථන කුසලතාව උන්වහන්සේට නො අඩුව තිබුණි. මේ නිසා ම දේශපාලන නායක නායිකාවෝ ද උන්වහන්සේගේ අවවාද අනුශාසනා නිරන්තරයෙන් අපේක්ෂා කළහ. රූපකායෙන්, හඬ පෞරුෂයෙන් ශ්‍රාවක සිත් සතන් වශී කරනවා සේ ම ජාති වාත්සල්‍යයෙන් නැගූ සිංහනාදය සිහිපත් වනවිට අපගේ මතකයට නිතැතින්ම පැමිණෙන්නේ කුඩාපොළ හිමි, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, වාරියපොළ සුමංගල හිමි වැනි ජාතික සටනේ පුරෝගාමී භික්ෂූන්වහන්සේලා ය.

අසන්නාගේ ප්‍රබෝධය ඇති වන පරිදි චිත්තරූප මැවෙන ආකාරයට පැරැණි කතා කීමට සෝහිත හාමුදුරුවෝ ඉතා දක්ෂ ය. උන්වහන්සේ ධර්ම දේශනා උදෙසා නොවැඩිය ගමක් ලංකාවේ නැති තරම් ය. ශ්‍රාවකයන් වශී කළ හැකි ධර්ම සන්නිවේදන හැකියාව ඊට බලපා ඇති ප්‍රධාන හේතුවකි. පිරිස අනුව, වෙලාව අනුව කරුණු ගෙනහැර දක්වමින් උචිත පරිදි හඬ පාලනය කරමින්, ගැළපෙන උපුටන යොදා ගනිමින් සිදු කරන ධර්ම දේශනා ශෛලිය උන්වහන්සේටම අනන්‍ය වූවකි. වරෙක ආචාර්ය හෙන්රි පීබල්, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් පිළිබඳ මෙවැනි ප්‍රකාශයක් කර තිබේ. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ගේ හඬ සමුද්‍ර ඝෝෂය වැනි ය. රළ නංවයි. ඈතට ඇසෙයි. මේ ප්‍රකාශය මාදුළුවාවේ සෝහිත හිමියන්ට ද ඉතා යෝග්‍ය ය. උන්වහන්සේගේ ගැඹුරු නින්නාද ස්වරය සියල් සිත් ආකර්ෂණය කරවයි. එය කිසිවෙකුටත් අනුකරණය කළ නොහැකි ය. අනුකරණය කළ යුතු ද නැත. සෝහිත හිමියන් කලාකරුවන් අතර ද ඉතා ප්‍රියශීලී හිමි නමකි. මේ නිසා නිරන්තරයෙන් කලාකරුවෝ සිය වැඩ කටයුතුවලට උන්වහන්සේ සහභාගි කර ගැනීමට විශේෂ කැමැත්තක් දක්වති. උන්වහන්සේ ද කවිය, ගීතය, නවකතාව, චිත්‍රපටය ආදි සකල විධ කලාවන් සුදුසු තැන්හි ඇගයීමට කිසිවිටක පසුබට නොවූ හ. කලා නිර්මාණ උදෙසා උන්වහන්සේ ඉදිරිපත් කළ යම් යම් ප්‍රකාශ සුළු කොට තැකිය යුතු නොවේ.

1942 වසරේ මැයි මස 29 වැනි දින කොළඹ දිස්ත්‍රික්කයේ පාදුක්කට ආසන්න මාදුළුවාව නම් ග්‍රාමයේ උපත ලද සෝහිත හිමියන්ගේ ගිහි කල නාමය වන්නේ පතිරගේ දොන් රත්නසේකරයි. 1955 වසරේ මැයි මස 09 වැනි දා පැවිදි දිවියට පත්වූ උන්වහන්සේ විද්‍යාලංකාර පිරිවෙනින් පිරිවෙන් අධ්‍යාපනය ලබා ගෙන 1962 වසරේදී උපසම්පදාව ලබාගත් සේක. යක්කඩුවේ ප්‍රඥාරාම, කොටහේනේ පඤ්ඤාකිත්ති වැනි මහා යතිවරුන්ගේ පහස ලැබූ විදුලකර බිම සෝහිත හිමියන්ට මහත් ආශීර්වාදයක් විය. 1963 වසරේදී උසස් අධ්‍යාපනය සඳහා විද්‍යෝදය විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ උන්වහන්සේ 1967 වසරේදී ඉතිහාසය දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් ලබා ගනිමින් උපාධිය සමත් විය. බළන්ගොඩ අනඳ මෙත් මහා නාහිමියන්, හේන්පිටගෙදර ඥානසීහ හිමි, කලුකොඳයාවේ පඤ්ඤාසේකර මහනාහිමි, ගනේගම සරණංකර හිමි, මහාචාර්ය මැන්දිස් රෝහණධීර, මහාචාර්ය හේම එල්ලාවල, මහාචාර්ය මාලනී ඇඳගම, වැනි උගතුන් රැසකින් ශිල්ප ඥානය ලැබූ උන්වහන්සේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති ලෙසත් කටයුතු කළහ. උඩුවේ නාලන්දාරාම පිරිවෙනින් ගුරු දිවිය ඇරඹූ උන්වහන්සේ ගංගොඩවිල සුභද්‍රාරාම පිරිවෙනේ නියෝජ්‍ය පරිවේනාධිපති ලෙසත්, ඇතුල්කෝට්ටේ පැරකුම්බා පිරිවෙනේ පරිවේනාධිපති ලෙසත් කටයුතු කරන ලදී.

සිංහල බලමණ්ඩලය, මවුබිම සුරැකීමේ ජාතික ව්‍යාපාරය, ජාතික සංඝ සභාව, සමස්ත ලංකා අමද්‍යප තරුණ සංවිධානය, වීර විදහන, ජාතික වීර පදනම, සාධාරණ සමාජයක් සඳහා වූ ජාතික සංවිධානය වැනි සංවිධාන රැසක් ආරම්භ කිරීමට මූලිකත්වය ගත් උන්වහන්සේ ඉන් බොහොමයකම ආරම්භක සභාපති ලෙස කටයුතු කළහ. 1975 වසරේ පෙබරවාරි 02 වන දින මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙනේ අනගාරික ධර්මපාල පිළිරුව අභියස සමස්ත ලංකා අමද්‍යප තරුණ සංවිධානය බිහි වීම, කොළඹ සිට රුවන්වැලිසෑයට පාගමනින් ගොස් ත්‍රස්තවාදී ගැටලුව පිළිබඳ දුටුගැමුණු රජතුමාට සන්දේශයක් භාර දීම, 1982 සරච්චන්ද්‍රයන්ගේ ධර්මිෂ්ඨ සමාජය කෘතිය එළිදක්වන උළෙලට සිදුවූ මැර ප්‍රහාරය, 1986 හෙද වැඩ වර්ජනය, 1987 අභයාරාම ඓතිහාසික මැයි දින රැලිය, 1987 ඉන්දු ලංකා ගිවිසුමට විරුද්ධව සිදු කළ සත්‍යග්‍රහය, 1993 වසරේ ලලිත් ඇතුලත්මුදලි මැතිතුමන්ගේ අවමංගල්‍ය උත්සවයට කඳුළු ගෑස් ගැසීම, සුනාමියෙන් අවතැන්වූවන්ට ආධාර පිණිස ගිය මුදල් පිණ්ඩපාතය වැනි ඓතිහාසික අවස්ථා රැසක කැපී පෙනෙන කාර්ය භාරයක් සිදු කිරීමට උන්වහන්සේට හැකියාව ලැබුණි. මෙරට දේශපාලන ඉතිහාසයේ මර්මස්ථානයක් බවට කෝට්ටේ ශ්‍රී නාග විහාරය පත්වන්නේද මෙකී සමාජ දේශපාලන කාර්යභාරය හමුවේ ය.

අනුරාධපුර යුගයේ සිටම ජාතික ආගමික කටයුත්තකදීම භික්ෂූන් වහන්සේ මූලිකත්වය ගෙන කටයුතු කළ අතර එළාර දුටුගැමුණු යුද සමයේ ඇතැම් හිමිවරු සිවුරු අතහැර යුද්ධයට ගියහ. බොහෝ රජවරුන්ට ආරක්ෂක ස්ථානය වූයේ පන්සලයි. රජුන්ට දේශපාලනයට උපදෙස් ලබාදුන් මුල් භූමිය වූයේ පන්සලයි. මෙකී සමාජ සන්දර්භය තුළ භික්ෂූන් වහන්සේගේ කාර්යභාරය සුළු කොට තැකිය නොහැක. රටට දැයට උවදුරු එන සැමවිටම පෙරමුණ ගන්නා ජනතාවාදී යතිවරු බිහිවන්නේ රටේත් ජනතාවගේත් පිනට ය. මේ මොහොතේ රට නිසි තැනට ගෙන ඒමට පැවිදි සමාජයෙන් හෝ ගිහි සමාජයෙන් නායකයෙකු බිහි විය යුතු ය. නිසි දැක්මක් ඇති නායකයෙකු බිහි විය යුතු ය. සෝහිත හාමුදුරුවන්ට පක්ෂ දේශපාලනයක් තිබුණේ නැත. පවතින රජයට ජය ඝෝෂා කරනවා වෙනුවට උන්වහන්සේ සැම විටම වැඩ සිටියේ නිවැරදි තැන ය. උන්වහන්සේ හැමවිටම සිදු කළේ විපක්ෂයේ කාර්යභාරයයි. විටෙක එය උඩුගම් බලා යාමක් වැනි ය.

සැබවින්ම සෝහිත හිමි වැඩ සිටියා නම් අද කුමක් සිදු වේ ද? උන්වහන්සේ අරගල භූමියට වැඩිය හැකියයි කෙනෙක් සිතිය හැක. ඇතැම් විට උන්වහන්සේ පවතින දේශපාලන අස්ථාවර භාවය ගැන දේශපාලනඥයන්ට සිය නොසතුට ප්‍රකාශ කරනු ඇත. ජාති භේද, පක්ෂ භේද නොසලා රට අවධි කළ යුතු යැයි රට වැසියන්ට පහදා දෙනු ඇත. මේ මොහොතේ රට නිසි මගට ගැනීමේ සටනට නායකත්වය දෙනු ඇත. උන්වහන්සේගේ ඒ පරාර්ථකාමී චර්යාව, නොපසුබස්නා වීර්ය අද අප තුළ ද ගොඩනැගිය යුතු ය. අපි සැබවින්ම සෝහිත සමරනවා යනු උන්වහන්සේගේ ඒ දර්ශනය ඉදිරියට ගෙන යෑමයි. පිළිම තැනීම, ගුණ කථන කිරීම, පුෂ්පෝහාර කිරීම, ගුණ ගී ගැයීම, දන් පින් දී සැමරීම එක් සැමරීමකි. එසේම උන්වහන්සේගේ දර්ශනය ඉදිරියට ගෙන යෑම ද උන්වහන්සේ අවලෝකනය කිරීමකි. භික්ෂූන්වහන්සේලා සිටිති. මෙරටත් වැඩ සිටිති. එරටත් වැඩ සිටිති. එහෙත් මාදුළුවාවේ සෝහිත හිමි ලා වැඩ සිටියේ එක් නමකි. උන්වහන්සේ අපේ කාලයේ වාදීභසිංහයාණෝ ය. උන්වහන්සේ අපවත් වූ මොහොතේ සමුද්‍ර වෙත්තසිංහයන් ලියූ කවකින් මේ ලිපිය අවසන් කරමි. එය අදටත් දැනෙන පද පෙළකි.

"සිංහ නාදයෙන් මුළු රට අවදි කළ
සිංහයා නිදයි අවසන් නින්ද තුළ
නොඇසේ අබිරු සිහනද දෑ සටන්වල
පාළුයි ඔබ නැතිව ලක් මෑණිගේ උකුළ"

● අමිල ලොකුමාන්නගේ
කථිකාචාර්ය ජනමාධ්‍ය අධ්‍යයනාංශය
ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය

# කවි මුතු

සංස්කරණය - රුවන් ජයවර්ධන

## සඳ සහ හුස්ටන් නුවර

නැඟ
නිව්යෝර්ක් නුවර අහසට
සේකරගෙ කවිසිත
අවදි කළ
ඒ සඳ ම
පායා ඇත අද
හුස්ටන් නුවර අහසට

එහි එළිය පරයන
මහ විදුලි එළි මැද
එය විඳින්නෙක් වෙද?
නිබඳ දිව යන
සිහිල් රිය තුළ

සේකරට මෙන් මට ද
සිහිවෙයි

සිහි වී හදවත සිරවෙයි
පෘථිවියේ අනෙක් පස
දුක ම අනුභව කරමින්
වෙසෙන
නෑ මිතුරන් රට වැසියන්
විඳින දුක

මේ සඳ ම හෙට
පෑයූ විට
මගේ මවුබිම අහසට
එහි සිරි
විඳින්නෙක් වෙද?

ජීවිතය සොයමින්
ගිනිගත් හිසින් ඇවිදින
මිනිසුන් අතර

මිනිසුන් පෙළා තවමත්
නිදුකින් යෙහෙන් වැජඹෙන
පව්වුන් අතර

• අනුර බී. සෙනෙවිරත්න

## කඳුළු කී කතාව

අහස තරමට උස
දිග පළලක් නැති
අහස් ගැබ සේ
ඉමක් කොනක් නැතිව
හදපිරී ගෙවීගිය සෙනෙහස
සඳ එළිය සේ සැනසුවා
අපේ හදවත් පතුල

අමතක නොවන එක දවසක
දෑස කඳුළින් තෙමී
ඔබ කියූ කිසි දෙයක්
මට මතක නැහැ තමයි
පිරිමි ඇස තුළ දුටු
එකම කඳුළත් ඔබයි

අතහැරී ගිය දිවියෙ
ඔබේ සෙනෙහස මතුව
මට කියයි
''කෙලෙස අතහැර යනු
සදහටම ඔබෙන් මම''

• කමලා ධර්මලතා ජයසූරිය

## ප්‍රේමයේ මුල්

ගල්වලත් මල් පිපුනැකී
ඉරක් නොදකින කරුවලේ
වැටෙන උල්කාවල ගැටී
කවද නිවුන ද තරු එළී...

වැලඳ ගන්නට ඉඩ දිදී
හැරයෑම ප්‍රේමය තමා
ආදරය මල්වල වගේ
මුල්වලත් හමු විය හැකී...

• පූර්ණිමා මදුශානි

## හරිද?

| | |
|---|---|
| කුසගිනි වැ දැඩි | කොට |
| ළදරු බැගිර දෙනැ | විට |
| හඬ නොයනු වටැ | පිට |
| හර ද තදකොට වසාලනු | කට |

• කැප්පිටියාගොඩැ කල්‍යාණවංස හිමි

## ආගමනය හා විගමනය

නයින් පොළඟුන් වියරු විසකුරු
තියුණු අසිපත් කිණිසි මගහැර
මලෙක පහනෙක ඇවතුමින් බැඳි
සනහ සනහා තබන පියවර
අනෝමා තෙර ගැලූ මෙත් සිත
කසාවත් සිතුවිලිම පෙරවුණ

සටන් හැම දිවි බිමෙහි අත්හළ
සමිඳ පා වැඳ ගනිමි අවසර

යෝධ මහකුල දෙරණ සමවැද
අකම්පිත සිත ලිහුණි කොයි තැන
පුබුදුවා මල් ලොවම සරසන
දිගැසි නෙතු දුටු සැලින මහදද
අරණ නැඟී හැම පොහොය පුන් සඳ
එදා පා වැඳ සිටි එකත්පස

මෙදා වැද එහිම්ම මැදුරු හද
උරිස් පැළව කැලුම් විහිදන

• රණතුංග මල්ලවආරච්චි

## පෙරුම් පිරුවත් නිරතුරු

දිදුලන තරුපති වෙන්න
හැකිවෙද මුළු අඹරෙම
පිරිපුන් නර වෙන්න
ප්‍රේමයක් ඇති වුණත්
කෙනෙකුට ඒ හා වෙන්න
නැති ද තව හැඩ
පායන තරු මිණි එක්ක
මහ වැස්සත් එනවා කියා
ආතම්මා කීවේ මොරසූර වැස්ස කියා
දැන් චූට්ටක් වගෙ දියුණු නිසා
වැහි කබා හැම සොයා ගියා
නොතෙමී හැම සිටිය නිසා
දැන් හදවත දන්න නිසා
ආවත් තව අඳුරු වලා
මං ළඟ ඇත වැහි කබා තියා

• සංජු ඩී. ජයසිරි

## පුදසුනක් නැති මලක්...

ප්‍රේමයේ සියුම් තැන් අතැර දුර යා නොහැකි
ස්නේහයේ සර පුවරු සෙමින් පිරිමැදිය යුතු
එලෙස ඔබ පෙමට අත්පොත් තැබුවෙ සිතින් බැති
මහද පුදසුනක් කොට හිඳිමි ලෙස සසර ගති

ඇසින් ඇස නොගැටී තැන්වලත් මහ ලොකු පෙමක්
ඇති වගට ලෝකයට අපි හොඳම නිදසුනක්
අතින් අත නොඅල්ලා ගමන් යන හිත් වලත්
සුන්දරම හැඟුම් ඇත වුණත් එය සරදමක්

හිරු ළඟත් තරුවකත් සඳ පිපුණු තැන් වලත්
ඔබේ ඇස හරි පෙමින් මගෙ ඇසට මුණගැසෙත්
කවුරුත් ගන්නෙපා ඇස්වහක් කටවහක්
මැණිකක්ම නොවෙයි නුඹ නිල් මැණික් පිරි ගඟක්

රිදෙව්වත් මුදු හිතක් පුදසුනක් හිමි මලක්
සැලි සැලී තුරු අගක පුදසුනක් නැති මලක්
හඬා නොහඬා දරන හැටි හරිම බැති පෙමක්
එවන් සුවඳක් මලක් යායකට අරුමයක්....

• චූලා දමයන්ති හේමමාලා

## පිංගුත්තර නොකී කවිය

මියුලු නගරේ සිසිල් සෙවණේ
දිසාපාමොක් ඇදුරු ඇසුරේ
ලබාගන්නෙමි සියලු සිප්සත
දකින්නට ලෝකයක් තිසිලෙස

ඔබ ලබාදුන් ශිල්ප අතරේ
හැඳිනගත්තෙමි දුකද සසරේ
මහෞෂධ පඬිරුවන පසුපස
පෙරුම් පිරුවෙමි එතෙර යන්නට

ලෝකයක් නොදිටීය ඒ වග
සැලකුවේ පිංගුත්තරම ලෙස
හොඳම සිසු වුණ නිසා සිප්හල
එල්ලීය දූ කුමරි මා කර

රෝසමල වන් රුවැති කුමරිය
නොදුටුවා නොව ඇගේ රුසිරිය
පෙරුම් පුරනා සසර හුරුවට
දුටිමි ඒ රුව යටින් අනියත

දිඹුල් ගස උඩ තබා ඒ දුක
කොටුකළෙමි කටුගසා ඒ වට
ලෝකයක් නොදිටීය ඒ වැට
සැලකුවේ පිංගුත්තරම ලෙස

• ධර්මසිරි මහකුඹුර

## රෑහි සංධ්වනිය

ගයන විට තොප
එකලාව දෙකලාව තෙකලාව
ඇරඹුමෙහි
මියුරු සංධ්වනියක් වීය එය
පෙර දවස නො ඇසුව

මදනලක් සේ
වෙණ තතක් හඬවන
සිහින් පොද වැස්සක් සේ
ඉසියුම් හැඟුම් උපදන
අරුණලු සේ
මුදු සුමුදු පෙති පුබුදන

රාශිභූතව දින දින
නැතිව අතොරක්
නඟනවිට වැලි වැලි
ඝෝෂයක් විය රළු
එකී සංධ්වනිය ම
අවුළුවන මගෙ රෝෂය

බින්දේ වුව ද නිදහස
එහෙත් නො කිපෙමි මම
රෑහැයියන් වන නිසා තොප
මිනිසෙක් වන නිසා මම



• රංජිත් මල්ලියාවඩු

## සමනල් මවකගෙන්

යොවුන් පියාපත් ලද
මා බොළඳ සමනලිය
මල් රොන් සුවඳ මුසු
මිතුරු මඳනල කැටුව
ඉගිල යයි නුඹ දුර

දුහුල් හිම නිල පැලඳ
ගිනිකඳු දෑස් දල්වන
ගොදුරු ඉව අස මෘග රැළ
තපස් රකිනුය වනපෙත
මනලොල්ය සුහුඹුල් නුඹ

පැලඳ මුදු පෙති පෙරා මධු මී
වෙස් වලාගත් බාඳුරා මල්
දැක ඉපිල ගොස් වැලඳගන්නට
පෙර ගමන් යැයි නිමල හිත
දුරින් දුටු සඳ නොපෙනේය මිස

සැඩ කුණාටුව එරෙහි වූ කල
මිතුරු නල වුව හැරයාවි නුඹ
නමදින්නට පෙර සමන් ගිරි හිස
මියැදුණොත් නම් දැවෙයි මව් ළය
දෙව්ලොවින් ලද තුටු පඬුර නුඹ

• රුවනමලී දීපිකා කොඩිකාර






උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2022 මැයි මස 29 වැනිදා ඉරිදා හෝමාගම පිහිටි උපාලි යන්ත්‍රාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.